# බුද්ධ ධර්මය

## 9 ශ්‍රේණිය

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව



සියලු ම පෙළපොත් ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් ලබා ගැනීමට
www.edupub.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

ප්‍රථම මුද්‍රණය :- 2017
දෙවන මුද්‍රණය :- 2018
තෙවන මුද්‍රණය :- 2019
සිව්වන මුද්‍රණය :- 2020

සියලු හිමිකම් ඇවිරිණි

ISBN 978-955-25-0358-0

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
හොරණ, මිදෙල්ලමුලහේන, තල්ගහවිල පාර, අංක 65C හි පිහිටි
සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ (පුද්ගලික) සමාගමෙහි
මුද්‍රණය කරවා ප්‍රකාශයට පත්කරන ලදි.

Published by : Educational Publications Department
Printed by : Karunaratne and Sons (Pvt) Limited

# ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා  ඔබ ම ය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති  අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ  අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ  අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්‍ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

## අධ්‍යාපන අමාත්‍යාංශයේ බෞද්ධ උපදේශක මණ්ඩලය විසින් අනුමත කරන ලද ගුරු වන්දනා ගාථාව සහ අධිෂ්ඨාන පද්‍යය

### ගුරු වන්දනා ගාථාව

ඕවාද සිප්ප දානේන
සික්ඛාපේති මමං ගරු
සගාරවේන චිත්තේන
අහං වන්දාමි තං ගරුං

ඔවා සිප් දීමෙන
මා හික්මවන පේමෙන
ඇදුරු හද බැතියෙන
වඳිම් ගරු සිත පෙරටු කරමින

### පාසල් උදෑසන රැස්වීම අවසානයේ කෙරෙන අධිෂ්ඨානය

තෙරුවන පුදා සිහිකර මාපිය දෙදෙන
ගුරු සිත දිනා ඔප කර ගෙන ගුණ නුවණ
කරමින සබා විදුහල් මැණිගෙ සිහින
සුරකිමි සදා මගෙ රට ජාතිය සසුන

(රචක: පූජ්‍ය ගන්තුනේ අස්සජි හිමි)

# පෙරවදන

දියුණුවේ හිණිපෙත කරා ගමන් කරනා වත්මන් ලොවට, නිතැතින්ම අවැසි වනුයේ වඩාත් නව්‍ය වූ අධ්‍යාපන ක්‍රමයකි. එමඟින් නිර්මාණය කළ යුත්තේ මනුගුණදම් සපිරුණු හා කුසලතාවලින් යුක්ත දරුපරපුරකි. එකී උත්තුංග මෙහෙවරට ජව බලය සපයමින්, විශ්වීය අභියෝග සඳහා දිරියෙන් මුහුණ දිය හැකි සිසු පරපුරක් නිර්මාණය කිරීම සඳහා සහාය වීම අපගේ පරම වගකීම වන්නේ ය. ඉගෙනුම් ආධාරක සම්පාදන කාර්යය වෙනුවෙන් සක්‍රීය ලෙස මැදිහත් වෙමින් අප දෙපාර්තමේන්තුව ඒ වෙනුවෙන් දායකත්වය ලබා දෙන්නේ ජාතියේ දරුදැරියන්ගේ නැණ පහන් දල්වාලීමේ උතුම් අදිටනෙනි.

පෙළපොත විටෙක දැනුම් කෝෂ්ඨාගාරයකි. එය තවත් විටෙක අප වින්දනාත්මක ලොවකට ද කැඳවාගෙන යයි. එසේම මේ පෙළපොත් අපගේ තර්ක බුද්ධිය වඩවාලන්නේ අනේකවිධ කුසලතා පුබුදු කරවාගන්නට ද සුවිසල් එළි දහරක් වෙමිනි. විදුබිමෙන් සමුගත් දිනක වුව අපරිමිත ආදරයෙන් ස්මරණය කළ හැකි මතක, පෙළපොත් පිටු අතර දැවටී ඔබ සමඟින් අත්වැල් බැඳ එනු නොඅනුමාන ය. මේ පෙළපොත සමඟම තව තවත් දැනුම් අවකාශ පිරි ඉසව් වෙත නිති පියමනිමින් පරිපූර්ණත්වය අත් කරගැනුමට ඔබ සැම නිරතුරුව ඇප කැප විය යුතු ය.

නිදහස් අධ්‍යාපනයේ මහානර්ඝ ත්‍යාගයක් සේ මේ පුස්තකය ඔබ දෝතට පිරිනැමේ. පෙළපොත් වෙනුවෙන් රජය වැය කර ඇති සුවිසල් ධනස්කන්ධයට අර්ථසම්පන්න අගයක් ලබා දිය හැක්කේ ඔබට පමණි. මෙම පාඨ්‍ය ග්‍රන්ථය මනාව පරිශීලනය කරමින් නැණ ගුණ පිරි පුරවැසියන් වී අනාගත ලොව ඒකාලෝක කරන්නට දැයේ සියලු දූ දරුවන් වෙත දිරිය සවිය ලැබේවායි හදවතින් සුබ පතමි.

පෙළපොත් සම්පාදන කාර්යය වෙනුවෙන් අප්‍රමාණ වූ සම්පත්දායකත්වයක් සැපයූ ලේඛක, සංස්කාරක හා ඇගයුම් මණ්ඩල සාමාජික පිරිවරටත් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සැමටත් මාගේ හදපිරි ප්‍රණාමය පුදකරමි.

**පී. එන්. අයිලප්පෙරුම**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල
2020.06.26

**නියාමනය හා අධීක්ෂණය :**

**පී. එන්. අයිලප්පෙරුම**

අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**මෙහෙයවීම :**

**ඩබ්ලිව්. ඒ. නිර්මලා පියසීලි**

අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් (සංවර්ධන)

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**සම්බන්ධීකරණය :**

**ඩී. එම්. ජයන්ත පුෂ්පකුමාර**

නියෝජ්‍ය කොමසාරිස් (පාලන)

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**සංස්කාරක මණ්ඩලය :**

1. **පූජ්‍ය දේවාලේගම මේධානන්ද ස්වාමීන් වහන්සේ**
   විශ්‍රාමික මහාචාර්ය, කැලණිය විශ්වවිද්‍යාලය

2. **අති පූජ්‍ය ගන්තුනේ අස්සජි මහානායක ස්වාමීන් වහන්සේ**
   විශ්‍රාමික කථිකාචාර්ය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

3. **ආචාර්ය, පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන ස්වාමීන් වහන්සේ**
   නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය

4. **මහාචාර්ය උදිත ගරුසිංහ**
   පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

**සිංහල භාෂා සංස්කරණය :**

1. **මහාචාර්ය නිමල් මල්ලවආරච්චි**
   අංශාධිපති (සිංහල අධ්‍යයන අංශය)
   කැලණිය විශ්වවිද්‍යාලය

2. **අයි. රංජිත්**
   අධ්‍යක්ෂ (හිටපු)
   ග්‍රන්ථ ප්‍රකාශන මණ්ඩලය
   අධ්‍යාපන අමාත්‍යාංශය

**ලේඛක මණ්ඩලය :**

1. **පූජ්‍ය කොටනෙළුවේ පුඤ්ඤානන්ද ස්වාමීන් වහන්සේ**
   සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
   අධ්‍යාපන අමාත්‍යාංශය

2. **පූජ්‍ය උඟුරුගමුවේ අස්සජී ස්වාමීන් වහන්සේ**
   උපගුරු, ශ්‍රී ගංගාතිලක මූලික පිරිවෙන, පානදුර

3. **පූජ්‍ය දියගම නාරද ස්වාමීන් වහන්සේ**
   ගුරු සේවය, සුභද්‍රාරාම විද්‍යායතන පිරිවෙන, ගංගොඩවිල, නුගේගොඩ

4. **උදයරුවන් මල්ලිකාරච්චි**
   විදුහල්පති, ඉහළ බෝමිරිය කනිෂ්ඨ විද්‍යාලය, කඩුවෙල

5. **ආර්.ඒ. ගුණවර්ධන**
   ගුරු උපදේශක, ගිරි/ රුවන්ගිරි මධ්‍ය මහා විද්‍යාලය, බෝගමුල්ල

6. **ආර්. එම්. ටී. ටී. රත්නායක**
   ගුරු සේවය 2-II, ශ්‍රී විමලධර්ම මහ පිරිවෙන, දංගොල්ල, මහනුවර

**සෝදුපත් කියවීම :**

**එස්. බී. එම්. නිමල් ධර්මසිරි**
අධ්‍යාපන අධ්‍යක්ෂ (ආගමික හා සාරධර්ම අංශය)
අධ්‍යාපන අමාත්‍යාංශය

**චිත්‍ර සහ පිටකවර නිර්මාණය :**

**ඩබ්. පී. සුසිල් ජයශාන්ත පෙරේරා**

**පරිගණකගත කිරීම සහ පිටු නිර්මාණය :**

**පී. ඒ. ශයිනි ඉමල්ෂා විජේවර්ධන**
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

# පටුන


| | | පිටු අංකය | නිපුණතා මට්ටම |
|---|---|---|---|
| 01. | සම්බුද්ධ පරිනිර්වාණ සමය | 1 | 9.1.1 |
| 02. | බුදු සිරිතෙහි විශිෂ්ට ලක්ෂණ | 8 | 9.1.2 |
| 03. | අනුත්තර පින් කෙතය සඟ ගණ | 16 | 9.1.3 |
| 04. | වඳිමු සැදැහෙන් උතුම් පුද බිම් | 22 | 9.2.1 |
| 05. | සිහිය පිහිටුවා හුස්ම ගනිමු | 29 | 9.2.2 |
| 06. | රජගෙදරින් මෙහෙණවරට | 34 | 9.2.3 |
| 07. | ධම්ම පදයෙන් බිඳක් | 44 | 9.2.4 |
| 08. | උතුම් පැවැත්මෙන් දිවි මං සරු කරමු | 50 | 9.2.5 |
| 09. | සීල සුගන්ධය ම උතුම් වන්නේ ය | 55 | 9.3.1 |
| 10. | ඉටු කරමු යුතුකම් | 61 | 9.3.2 |
| 11. | බුදුබව පැතූ බලංගොඩ මහානායක හාමුදුරුවෝ | 68 | 9.4.1 |
| 12. | අටලෝ දහම | 73 | 9.4.2 |
| 13. | වැවයි දාගැබයි ගමයි පන්සලයි | 78 | 9.5.1 |

| | | පිටු අංකය | නිපුණතා මට්ටම |
|---|---|---|---|
| 14. | නිබ්බාන පරමං සුඛං | 83 | 9.6.1 |
| 15. | දුකින් මිදෙන මග උගනිමු | 89 | 9.6.2 |
| 16. | නොකර පව්කම් කරමු පින්කම් | 95 | 9.6.3 |
| 17. | හේතුව ඵලය වෙයි ඵලය හේතුව වෙයි | 102 | 9.6.4 |
| 18. | සාමකාමී ජීවිතයක් ගත කරමු | 107 | 9.7.1 |
| 19. | ආරෝග්‍ය පරමාලාභා | 115 | 9.7.2 |
| 20. | ගැටලු විසඳන සසුන් පිළිවෙත | 120 | 9.8.1 |
| 21. | සුරකිමු හෙළ කලා කෙත | 130 | 9.8.2 |
| 22. | ණය නොවී සතොසින ගෙවමු දිවිමග දැහැමින | 138 | 9.9.1 |
| 23. | රාජා භවතු ධම්මිකෝ | 144 | 9.9.2 |
| 24. | නිවන් මගෙහි බීජය ශ්‍රද්ධාවයි | 153 | 9.10.1 |

# 01 සම්බුද්ධ පරිනිර්වාණ සමය



සිදුහත් බෝසතාණන් වහන්සේ වෙසක් පුන් පොහෝ දිනක උතුම් වූ බුද්ධත්වයට පත් වූ සේක. එතැන් පටන් පන්සාළිස් වසක් පුරා මහා කරුණාවෙන් ලෝකයාට දහම් මග පෙන්වාදුන් උන් වහන්සේ අවසන් වස්කාලය ගත කළේ බේලුව ගමෙහි ය. තවත් දස මාසයකින් තමන් වහන්සේ පිරිනිවන් පා වදාරන බව ඉටා ගත්තේ එහි දී ය.

මේ අතර බුදුරදුන්ට ලෝහිත පක්ඛන්දිකා නම් බලවත් වේදනා සහිත මාරාන්තික වූ රෝගයක් හටගැනිණි. උන් වහන්සේ ඉදිරියට දස මාසයක් ම එම රෝගය යළි මතු නොවන ලෙස සමාපත්ති බලයෙන් යටපත් කළහ. රෝගී භාවයෙන් මිදී බුදුරදුන් සුවසේ වැඩ සිටිනු දුටු ආනන්ද මාහිමියෝ බලවත් සැනසිල්ලකින් උන් වහන්සේ සමීපයට පැමිණ මෙසේ පැවසූහ. "ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ රෝගී ව සිටිනු දුටු මට බලවත් ශෝකයක් හටගැනිණි. මම සිහිය උපදවාගත නොහැකි තත්ත්වයකට පත්වීමි. දැන් ඔබ වහන්සේ ඉන් මිදී සිටිනු දකින මාගේ සිතට ඇතිවනුයේ අපරිමිත සොම්නසකි. බුදුරජාණන් වහන්සේ ශ්‍රාවකයන් හට අවසාන අවවාදය වදාරා මිසක පිරිනිවන් නොපානසේකැ යි, සිතීමෙන් යන්තම් සිතට අස්වැසිල්ලක් ඇතිකරගත හැකි ය." මේ අසා සිටි බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළහ. **ආනන්ද ය, මම කිසිදු සැඟවීමක් නොකොට ධර්මය මනාව හෙළිදරවු කොට දේශනා කළෙමි. ගුරුමුෂ්ටි කිසිවක් තබා නොගතිමි. ආනන්ද ය, භික්ෂූන් වහන්සේලා පාලනය කරමියි කියා හෝ උන් වහන්සේලා මා උදෙසා ජීවත්විය යුතු ය කියා හෝ කිසිදු අදහසක් මා තුළ නොමැත. මම දැන් අසූවැනි වියට පත් ව සිටිමි. දිරාගිය ගැලක් උණපතුරු ආදිය තබා බැඳ පවත්වාගෙන යන්නේ යම් සේ ද මාගේ ශරීරය ද එපරිද්දෙන් ම පවතී. ආනන්ද ය, එබැවින් තමා ම තමාට පිහිට කොට, ධර්මය ම සරණකොට වාසය කරන්න."**

බේලුව ගමෙහි ගත කළ වස් කාලය නිම කළ බුදුරජාණන් වහන්සේ සැවැත් නුවරට වැඩම කළහ. තමා ළඟින් ඇසුරු කළ ශ්‍රාවකයන් හා දායක පිරිස් අවසන් වරට දැකබලා ගැනීමේ කැමැත්ත මත එහි මඳ කලක් වැඩ සිටිමින් තව සිව් මසකින් තමන් වහන්සේගේ පරිනිර්වාණය සිදුවන බව වදාළහ. එය ඇසූ පෘථග්ජන භික්ෂූන් වහන්සේලාගෙන් සමහරෙක් කඳුළු වගුරවමින් හඬා වැළපුණහ. ඇතැම් භික්ෂූන් වහන්සේලා 'අපි කුමක් කරන්නෙමු ද?'යි සිත සිතා තැන තැන රැස්වී කතා කරමින් හුන්හ. රහතන් වහන්සේලාට


නොමිලයේ බෙදා හැරීම සඳහා ය.

ධර්ම සංවේගය පහළ විය. එහෙත් ඒ අතර සිටි ධම්මාරාම නම් භික්ෂූන් වහන්සේ සෙසු භික්ෂූන් වහන්සේලා හා කතාබහට නොගියහ. ශෝකී ව හඬා නොවැළපුණහ. 'බුදුරදුන් පිරිනිවීමට පෙර රහත් වන්නෙමි' යි දැඩිසේ අදිටන් කරගත් උන් වහන්සේ පසෙකට වී හුදෙකලාව ධර්මය ආවර්ජනය කරමින් බවුන් වඩන්නට වූහ. භික්ෂූන් වහන්සේලා ධම්මාරාම තෙරුන්ට චෝදනා කරන නියායෙන් ඒ බව බුදුරදුන්ට සැළකර සිටියහ. එවිට බුදුරජාණන් වහන්සේ ධම්මාරාම තෙරුන් කැඳවා මේ කියන දේ සැබෑවක් දැයි විමසූහ. ධම්මාරාම තෙරුන් වහන්සේ තමන්ගේ අදහස කීහ. බුදුරදුන් එහි දී වදාළේ "**මහණෙනි, මට හිත ඇති සෑම කෙනෙක් ම මෙම ධම්මාරාම තෙරුන් ආදර්ශයට ගත යුතු ය. මල් සුවඳ ආදියෙන් මා පුදන්නෝ නිසි ලෙස මා පුදන්නෝ නොවෙති. ධර්මානුකූල ව පිළිවෙත් පුරන්නෝ ම මා පුදන්නෝ වෙති**" යි, කියායි. මෙයින් අපට බුදුරදුන් උගන්වා ඇත්තේ ආමිස පූජාවට වඩා ප්‍රතිපත්ති පූජාව උසස් බවයි. එසේ ම උන් වහන්සේ අපේක්ෂා කොට ඇත්තේ තමන් වහන්සේට පුද සිරිත් කරන ශ්‍රාවකයන් නොව, තමන් වහන්සේ පෙන්වා වදාළ දුකින් මිදීමේ මග අනුගමනය කරන ශ්‍රාවකයන් බව ය.

මේ අතර සැරියුත් මහරහතන් වහන්සේ තම ආයු කාලය අවසන් වන බව වටහාගෙන බුදුරදුන් වෙත පැමිණ වැඳ පිරිනිවීමට අවසර ගත්හ. මිථ්‍යාදෘෂ්ටික ව සිටි සිය මෑණියන් සොයා නාලක ගමට වැඩම කළ සැරියුත් තෙරණුවන් එහි දී මෑණියන් තිසරණයෙහි පිහිටුවා එහි දී ම පිරිනිවන් පා වදාළ බව සඳහන් වෙයි. බුදුරජාණන් වහන්සේ උන් වහන්සේගේ සිරුර ආදාහනය කරවා සෑයක් ද ඉදිකරවා රජගහ නුවර බලා වැඩම කළ සේක. සැරියුත් තෙරුන් පිරිනිවී දෙසතියකින් මුගලන් තෙරණුවෝ ද බුදුරදුන් වෙත වැඩම කර අවසර ගෙන කාලසිලාවේ දී පිරිනිවන් පෑහ. බුදුරජාණන් වහන්සේ මුගලන් තෙරණුවන්ගේ ආදාහන කටයුතු ද කරවා සෑයක් ඉදිකරවීමෙන් අනතුරුව උක්කවේලා නියම්ගමට වැඩම කළහ. නැවතත් විශාලා මහනුවරට වැඩම කළ උන් වහන්සේ එහි චාපාලචේතිය නම් ස්ථානයෙහි විසූහ. එහි දී ආනන්ද හිමි අමතා මෙසේ වදාළහ. **"ආනන්ද ය, සතර ඍද්ධිපාද මැනවින් ප්‍රගුණ කළ කෙනකුට කැමැතිනම් ආයු කල්පයක් හෝ ඊට වඩා මඳක් වැඩි කාලයක් හෝ ජීවත්විය හැකි ය. තථාගතයන් වහන්සේ එකී සතර ඍද්ධිපාද වඩා ඇති හෙයින් ඒ සඳහා සමත්කම් දක්වන්නාහු ය."**

බුදුරදුන්ගේ මෙම ප්‍රකාශයෙහි අදහස තේරුම් ගැනීමේ හැකියාවක් ආනන්ද හිමියන්ට ඒ මොහොතේ නොතිබිණි. ඒ බුද්ධ පරිනිර්වාණය ගැන සිතමින් බලවත් සිත් වේදනාවකින් සිටි හෙයිනි. එබැවින් ආයු කල්පයක් හෝ ඊට වඩා මඳක් වැඩි කලක් වැඩවාසය කරන ලෙස ඇරියුම් කිරීමක් සිදු නොවුණි. ඉක්බිති බුදුරජාණන් වහන්සේ ආයු සංස්කාරය අත් හැරියහ. තව තුන් මසකින් පිරිනිවන් පානා බව ප්‍රකාශ කළහ. එවිට ආනන්ද හිමියෝ දැඩි ලෙස කම්පාවට පත් ව ආයු කල්පයක් වැඩ වෙසෙන ලෙස තෙවතාවක් ම ඉල්ලා සිටියහ. එවිට "ආනන්ද ය, එම ඉල්ලීම සිදු කිරීමට මෙය අවස්ථාව නොවේ" යැයි ප්‍රකාශ කරමින් බුදුරජාණන් වහන්සේ එය ප්‍රතික්ෂේප කළහ. ආනන්ද හිමි

එම ඉල්ලීම සිදු කළ යුතු ව තිබුණේ බුදුරජාණන් වහන්සේ ආයු සංස්කාරය අත් හැරීමට පෙරයි.

මෙම ප්‍රකාශයෙන් පසු සම්බුද්ධ පරිනිර්වාණය පිළිබඳ දැනුම් දීම සඳහා ආනන්ද මාහිමියන් මගින් විශාලා මහනුවර කූටාගාර ශාලාවට භික්ෂූන් වහන්සේලා රැස්කරවූ බුදුරජාණන් වහන්සේ මෙසේ ප්‍රකාශ කළහ. **"මහණෙනි, කරුණාවෙන් ඔබ සැම අමතමි. සියලු සංස්කාර ධර්ම නැසෙන ස්වභාවයෙන් යුක්ත ය. එළඹ සිටි සිහි ඇතිව ගුණ ධර්ම වඩන්න. මෙයින් තුන්මසක් ගිය තැන තථාගතයන් වහන්සේ පිරිනිවන් පාන සේක."**


මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය හා යශෝධරා තෙරණිය බුදුරදුන් වැඳ සමුගෙන ගොස් පිරිනිවන් පා වදාළේ ද මේ සමයේ දී ය. අවසන් වරට විශාලා මහනුවරින් පිටත්වීමට පෙර බුදුරජාණන් වහන්සේ **"ආනන්ද ය, මා විශාලා මහනුවර දකින අවසාන අවස්ථාව මෙය"** යැයි, පවසමින් සම්පූර්ණ බුදු සිරුර ආපසු හරවා ඇත් බැල්මෙන් නුවර දෙස බැලූහ. විශාලාවෙන් පිටත් වූ බුදුරජාණන් වහන්සේ පිළිවෙළින් භණ්ඩගාම, හත්ථිගාම, අම්බගාම, ජම්බුගාම යන ගම් පසුකොට භෝග නගරයට වැඩම කළහ. එහි දී සතරමහාපදේස දේශනා කළහ. ධර්මවිනය නිවැරැදි ලෙස තේරුම් ගැනීම සඳහා අනුගමනය කළ යුතු පිළිවෙත එයින් ප්‍රකාශිත ය.

අනතුරුව බුදුරජාණන් වහන්සේ භෝග නගරයෙන් පාවා නුවරට වැඩම කළහ. එහි චුන්දකර්මාර පුත්‍රයාගේ අඹවනයෙහි වැඩ විසූහ. ඒ බව දැනගත් චුන්දකර්මාර පුත්‍රයා වහා එහි ගොස් බණ අසා පැහැදී බුද්ධ ප්‍රමුඛ මහා සංඝ රත්නයට දානට ඇරියුම් කළේ ය. එදින දානය සඳහා සූකර මද්දවය නම් වූ විශේෂිත ආහාරය ද පිළියෙල කෙරිණි. මෙහි දී දස මසකට පෙර බුදුරදුන්ට ඇතිවූ ලෝහිත පක්ඛන්දිකා රෝගය යළිත් හටගැනිණි. මනා සිහිනුවණින් යුක්තව එම රෝගපීඩාව ද ඉවසූ බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලා ද පිරිවරාගෙන කුසිනාරා නුවර බලා වැඩම කළහ. අතරමග දී උන් වහන්සේට බලවත් වෙහෙසක්, ක්ලාන්ත ගතියක් සේ ම බලවත් පිපාසයක් ද හට ගැනිණ. මහ රුකක් මුල සඟල සිවුර සතරට නමා බිම එළා වැඩ සිටි උන් වහන්සේ **ආනන්ද ය මට පිපාසයි, පැන් ටිකක් සොයාගෙන එන්නැයි** වදාළහ. ආනන්ද මාහිමියෝ අසල වූ කුඩා නදියකින් පැන් ගෙන පිළිගැන්වූහ. එකල්හි ආළාරකාලාම තවුසාගේ ශ්‍රාවකයකු වූ පුක්කුස නම් මල්ලරාජ පුත්‍රයා බුදුරදුන් දැක වැඳ එකත්පසෙක හිඳගත්තේ ය. බුදුරදුන්ගෙන් බණ අසා තෙරුවන් සරණ ගිය ඔහු උන් වහන්සේට සිනිඳු සළු යුගලයක් පිදී ය. ආනන්ද මාහිමියෝ බුදුරජාණන් වහන්සේට ඒවා පෙරවූහ. ඒ මොහොතේ බුදුබව ලැබූ වේලෙහි මෙන් උන් වහන්සේගේ මුළු බුදුසිරුර ම දීප්තියෙන් බබළන්නට විය.

ඉන්පසු බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලා පිරිවරාගෙන කුකුත්ථා නදිය වෙත වැඩම කළහ. එම නදියෙන් පැන් වළඳා පැන් සනහා අසල වූ අඹ වනයට පිවිසි

උන් වහන්සේට යළිත් තද ක්ලාන්ත ගතියක් ඇතිවිය. එබැවින් චුන්ද තෙරුන් ලවා සඟල සිවුර බිම අතුරවා ගසක් මුල සිංහ සෙය්‍යාවෙන් සැතපුණහ. අනතුරුව ස්නානය කොට පැමිණි ආනන්ද තෙරුන් අමතා බුදුවන්නට පෙර සුජාතාව දුන් දානයත්, පෙර දින චුන්දකර්මාර පුත්‍රයා දුන් දානයත් එක සමාන ආනිශංස ඇති බව වදාළහ. සිය දානය නිසා බුදුරදුන් රෝගාතුර වූයේ යැයි චුන්දකර්මාර පුත්‍රයාට යම් චිත්ත පීඩාවක් ඇතිවුවහොත් ඔහුට කරුණු කියා දී සිත සනසන ලෙස ද වදාළහ.

එතැනින් පිටත් වූ උන් වහන්සේ හිරණ්‍යවතී නදියෙන් එතෙර ව කුසිනාරා නුවරට වැඩම කළහ. මල්ල රජදරුවන්ගේ උපවත්තන සල් උයන තුළ සල් ගස් දෙකක් අතර අනඳ තෙරුන් විසින් පනවන ලද සයනයෙහි සිංහසෙය්‍යාවෙන් සැතපුණු සේක. සම්බුද්ධ පරිනිර්වාණය ආසන්නව පවත්නා බව දත් පෘථග්ජන භික්ෂූන් වහන්සේලා ශෝකයට පත්ව වැළපෙන්නට වූහ. එහි දී එම භික්ෂූන් වහන්සේලා ආමන්ත්‍රණය කළ බුදුරජාණන් වහන්සේ සැදැහැතියන් විසින් දැක සංවේගය පහළ කළ යුතු ස්ථාන සතරක් පිළිබඳව වදාළහ. එනම් බුදුරදුන් උපන් තැන, සම්බුද්ධත්වය ලැබූ තැන, දම්සක් දෙසූ තැන හා පිරිනිවන් පෑ තැනයි. පිරිනිවි බුදු සිරුර කෙරෙහි සක්විති රජ කෙනකුට මෙන් උපහාර දැක්විය යුතු බව ද බුදු, පසේ බුදු, මහරහත්, සක්විති රජ යන සිවුදෙන ස්තූප තනා පිදිය යුත්තන් බව ද තවදුරටත් වදාළහ.



මේ කරුණු පවසන විට බුදුරදුන් තමා අත්හැර යන මොහොත ළඟාවන බව වටහාගත් ආනන්ද හිමියනට දරාගත නොහැකි ශෝකයක් උපන්නේ ය. උන් වහන්සේ හඬා වැළපෙන්නට වූහ. එවිට ආනන්ද තෙරුන් කැඳවූ බුදුරජාණන් වහන්සේ ධර්මාවවාදයෙන් සිත සැනසූහ. බුද්ධෝපස්ථානය මැනවින් සිදු කළ අයුරු වදාරා එය අගය කළහ. උත්සාහයෙන් ක්‍රියාකොට ඉතා ඉක්මනින් රහත්විය හැකි බව ද වදාළහ. ඒ සමගම භික්ෂූන් වහන්සේලා අමතා ආනන්ද හිමියන්ගේ ගුණ වර්ණනා කළහ.

බුදුරජාණන් වහන්සේ තමන් එදින රාත්‍රියේ පශ්චිම යාමයෙහි පිරිනිවන් පා වදාරන බව මල්ල රජදරුවන්ට ආනන්ද හිමියන් අත දන්වා යැවූයේ ඉන් පසුවයි. කුසිනාරාපුර මල්ල රජ දරුවෝ එම පුවත අසා ශෝකභරිතව බුදුරදුන් වෙත පැමිණ අවසන් වරට දැක වන්දනා කළහ. ඒ මොහොතේ සුභද්‍ර නම් පිරිවැජියෙක් බුදුරදුන්ගෙන් ප්‍රශ්න ඇසීමට ආනන්ද මාහිමියන්ගෙන් අවසර ඉල්ලී ය. ආනන්ද හිමියෝ ඊට අවසර නොදුන්හ. බුදුරජාණන් වහන්සේට මේ කතාබහ ඇසී සුභද්‍රට තමා වෙත පැමිණීමට අවසර ලබා දුන්හ. එහි දී බුදුරදුන් දෙසූ බණ අසා සුභද්‍ර සෝවන් විය. ඉන්පසු බුදුරදුන්ගේ අවසරය පරිදි ආනන්ද තෙරණුවෝ ඔහු පැවිදි කළහ. එවේලෙහි හෙතෙම විදසුන් වඩා බුදුරදුන් වැඩසිටිය දී පැවිදිව රහත් වූ අන්තිම රහත් ශ්‍රාවකයා වීමේ භාග්‍යය උදාකර ගත්තේ ය.

පසුව භික්ෂූන් වහන්සේ ඇමතූ බුදුරජාණන් වහන්සේ **'තෙරුවන් පිළිබඳ යම් සැකයක් ඇතොත් තමන් වහන්සේගෙන් විචාරා දැනගන්නා ලෙසත් එයට ඉඩක් නොලැබුණේ යැයි පසුව පසුතැවිලි නොවන ලෙසත් වදාළහ. බුද්ධ ගෞරවය නිසා ප්‍රශ්න නොඅසන්නේ නම් යහළුවකු මගින් හෝ සැක ඇති තැන් විමසන්නැ'**යි ද වදාළහ. එහෙත් කිසිවෙක් ප්‍රශ්න නොඇසූහ.

අවසාන වශයෙන් භික්ෂූන් වහන්සේ ඇමතූ බුදුරජාණන් වහන්සේ **"මහණෙනි, කරුණාවෙන් ඔබ අමතමි. සියලු සංස්කාර ධර්ම නැසෙන සුලු ය. එබැවින් නොපමාව දුකින් මිදීම පිණිස කුසල ධර්ම සම්පූර්ණ කරන්නැ"** යි අන්තිම අවවාදය දී වදාළහ.

උපවත්තන සල් උයන අකලට පිපුණු සල් මලින් ගැවසී ගත්තේ ය. බුදුරදුන්ට උපහාර කරන්නාක් මෙන් මල් රේණු හා මල් පෙති බුදු සිරුර මතට සෙමින් පතිත විය. බුදුරජාණන් වහන්සේ සිය උපතින් අසූවන විය සපිරුණු වෙසක් පුර පසළොස්වක පොහෝ දා රාත්‍රියේ අලුයම උදාවට පෙර සියලු සංස්කාර ධර්මයන්ගේ අනියත බව සිය ජීවිතයෙන් ම තහවුරු කොට අනුපදිසේස පරිනිබ්බාන ධාතුවෙන් පිරිනිවන් පා වදාළ සේක. එ සැණින් මහපොළොව කම්පා වූයේ සම්බුද්ධ පරිනිර්වාණය මුළුලොවට දැනුම් දීමට මෙනි.

රැය පහන් විය. අනුරුද්ධ තෙරුන්ගේ නියමයෙන් ආනන්ද තෙරණුවෝ බුදුරදුන් පිරිනිවන් පෑ බව මල්ල රජදරුවන්ට දැන්වූහ. ඔවුහු රැස්වී හඬා වැළපී ආදාහන කටයුතු සංවිධානය කළහ. බුදු සිරුර සත් දිනක් ම එම සල් උයනේ තබාගෙන පුද පූජා පැවැත්වූහ. අටවන දින මල්ල රජවරුන් අභිෂේක කෙරෙන ස්ථානය වූ මකුට බන්ධන නම් ශාලාවට වැඩම කරවා බුදු සිරුර එහි තැන්පත් කළහ. රජ දරුවෝ ආනන්ද මාහිමියන්ගේ උපදෙසින් බුදු සිරුර නව කසී සළුවෙන් හා නෙළු කපු පුළුන්වලින් වෙලා සුවඳ තෙල් පිරුණු රන්දෙනක බහා රන්දෙනකින් වැසූහ; සුවඳ දර පිරවූ සෑයක තැන්පත් කළහ. මල්ල කුමරුවෝ සිව්දෙනෙක් සුවඳ පැනින් හිස් සෝදා නා අලුත් වස්ත්‍රයෙන් සැරැසී චිතකයට ගිනි දල්වූහ. එහෙත් එය නොදැල්විණ. අනුරුද්ධ මහ තෙරුන් වහන්සේගෙන් එයට හේතුව විමසූ විට මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ වඩින තුරු ප්‍රමාද කළ යුතු යැයි හෙළිකරන ලදි. මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ පැමිණ බුදු සිරුර පැදකුණු කොට වැඳ සමු ගැනීමෙන් පසුව චිතකය දැල්විණි. තුන්ලොවක් සනසා වදාළ සහස්‍ර සංඛ්‍යාත ගිහි පැවිදි ශ්‍රාවක සමූහයකට දහම් මග පෙන්වා, නිවන් සුවය වෙත යොමු කළ, මහා කරුණාවෙන් හා මහා ප්‍රඥාවෙන් පිරිපුන් වූ අපේ සම්බුදුරජාණන් වහන්සේ, තවත් වසර දස දහස් ගණනක් පුරා පැතිර යන ධර්මාලෝකයක් ශේෂ කරමින් පිරිනිවන් පා වදාළේ එලෙසිනි.

## සාරාංශය

සම්බුද්ධ පරිනිර්වාණය සිදුවූයේ කුසිනාරාවේ මල්ල රජ දරුවන්ගේ උපවත්තන සල් උයනේ දී ය. පරිනිර්වාණ සමයේ බුද්ධ චරිතය හා සබැඳි සිදුවීම් රැසකි. ලෝහිත පක්ඛන්දිකා රෝගය වැළඳීම, සැරියුත් මුගලන් අගසව් දෙනමගේ පරිනිර්වාණය, මහා ප්‍රජාපතී ගෝතමී හා යශෝධරා තෙරණිවරුන්ගේ පරිනිර්වාණය, චුන්දකර්මාර පුත්‍රගේ සූකර මද්දව දානය, සුභද්‍ර පිරිවැජියාගේ පැවිදි වීම, සතර මහාපදේස දේශනා කිරීම හා අන්තිම බුද්ධ වචනය දේශනා කිරීම ද ඒ අතර වේ.

## ක්‍රියාකාරකම

1. සම්බුද්ධ පරිනිර්වාණ සමයේ සිදුවීම් තුළින් ගත හැකි වඩාත් වැදගත් ආදර්ශ පහක් අදාළ සිද්ධිය ද සමග දක්වන්න.

2. සම්බුද්ධ පරිනිර්වාණය චිත්‍රයට නඟන්න.

## පැවරුම

- සම්බුද්ධ අදාහන පූජෝත්සවය ඔබ දුටුවේ යැයි සිතා ඒ පිළිබඳව පුවත්පතක පළකිරීමට වාර්තාවක් සකස් කරන්න.

## පුහුණුවට

හන්දදානි භික්ඛවේ - ආමන්තයාමි වෝ
වයධම්මා සංඛාරා - අප්පමාදේන සම්පාදේථ.

"මහණෙනි, කරුණාවෙන් ඔබ අමතමි. සියලු සංස්කාර ධර්ම නැසෙන සුලු ය. එබැවින් නොපමාව දුකින් මිදීම පිණිස කුසල ධර්ම සම්පූර්ණ කරන්න."

පරිපක්කෝ වයෝ මය්හං - පරිත්තං මම ජීවිතං
පහාය වෝ ගමිස්සාමි - කතං මේ සරණං මත්තනෝ.

"මාගේ ආයුෂය අවසන් වෙමින් ඇත. ජීවිතය කෙළවරට පැමිණ තිබේ. ඒකාන්තයෙන් මම ඔබ හැර යන්නෙමි. මම ඔබට මැනවින් පිහිට වූයෙමි."

# 02

# බුදු සිරිතෙහි විශිෂ්ට ලක්ෂණ

නිශ්චිත අරමුණක් සාක්ෂාත් කර ගැනීම සඳහා පිරිසක් මෙහෙයවන්නා නායකයෙකි. සමාජය තුළ විවිධාකාර නායකත්ව භූමිකා දරන පිරිස් අපි දැක ඇත්තෙමු. එම නායකයින් අතර ඇතැම් අය ඉතාමත් ක්‍රියාශීලී ය; උසස් පෞරුෂත්වයකින් යුක්ත ය. එවැනි නායකත්ව සහිත සංවිධාන දියුණුවට පත්වේ. නායකත්වයෙහි දුබලතා නිසා සංවිධානයක් පිරිහීමට පත්වේ. නායකත්වය සෙසු අයට ආදර්ශවත් එකක් විය යුතු ය. බුද්ධ චරිතය පරමාදර්ශී නායකත්ව ලක්ෂණ රැසකින් සමන්විත ය. උන් වහන්සේ දිව්‍ය, බ්‍රහ්ම, මනුෂ්‍ය යන තුන් ලෝකයට ම ශ්‍රේෂ්ඨ නායකයෙකි. එම නායකත්වය හිමි වූයේ පිය උරුමයෙන් නොවේ; පරම්පරාවෙන් ද නොවේ; ජනතා ඡන්දයෙන් ද නොවේ. තමන් වහන්සේ විසින් ම ගොඩනගාගන්නා ලද ආධ්‍යාත්මික ශක්තිය තුළිනි. බුද්ධ චරිතය තුළින් ප්‍රකට කෙරෙන නායකත්ව ලක්ෂණ සමුදාය අතරින් කිහිපයක් පමණක් මෙහි දී විමසීමට ලක් කෙරේ.

## 1. ආදර්ශවත් බව

මුළු මහත් බුද්ධ චරිතය ම ආදර්ශ සම්පන්න ය. සැබෑ නායකයකු නම් ඔහු ආදර්ශවත් විය යුතු ය. සිය අනුගාමිකයන් මෙහෙයවනු ලබන්නේ නායකයා විසින් වන බැවිනි. ප්‍රථම රහතන් වහන්සේලා හැට නම ධර්ම දූත කාර්යයෙහි නිරත කරවූ බුදුරජාණන් වහන්සේ ධර්ම ප්‍රචාරය සඳහා උරුවෙල් දනව්වට වැඩම කළේ අනුගාමිකයන්ට ආදර්ශයක් සපයමිනි. ඇතැම් නායකයෝ ස්වකීය අනුගාමිකයින් යම් යම් ක්‍රියාකාරකම්වල නිරත කරවති. එහෙත් තමන් එහි නිරත නොවෙති. බුදුරජාණන් වහන්සේ සෙසු අයට උපදෙස් ලබා දී තමන් වහන්සේ ද එම උපදේශයේ පිහිටා කටයුතු කළ අවස්ථා බුද්ධ චරිතය පුරාම දක්නට ලැබේ. බමුණන් ඉගැන්වූ කුලභේදය විවේචනය කළ බුදුරදුන් පුද්ගල සමානාත්මතාව අගයමින් සිව් කුලයේ ම අයට සසුන්ගත වීමේ අවස්ථාව ලබා දීම ද ආදර්ශවත් ය. ක්ෂත්‍රිය කුලයක ඉපිද මිහිරි භෝජන වැළඳීමේ හැකියාව තිබියදීත් මහමග පිඬු සිඟා වැඩමවීම, දිවා කාලයෙහි පමණක් දන් වැළඳීම, විටෙක පාංශුකුල සිවුරු දැරීම, අල්පේච්ඡතාව ආදිය බුදුරජාණන් වහන්සේගේ ආදර්ශවත් නායකත්ව ලක්ෂණවලට නිදසුන් වේ.

## 2. චරිතවත්බව

රාගයෙන්, ද්වේශයෙන් හා මෝහයෙන් පිරුණු ලෝකයක ජීවත් වන අයකුට සුළුවෙන් හෝ තම චරිතයට හානි පමුණුවන බලවේගවලට මුහුණ දීමට සිදුවේ. ඇතැම් පුද්ගලයෝ රහසිගතව අකුසල ක්‍රියාවන්හි නිරතවෙති. නමුත් බුදුරජාණන්වහන්සේ රහසින්වත් පව් නොකළ සේක. කෙලෙස් හරිත සමාජයක ජීවත් වුව ද කිසිවිටකත් ක්ලේශයන්ට වසඟ නොවූහ. මාර දූවරුන්ගේ රංගනය හා මාගන්දියගේ සරාගී ක්‍රියාකාරකම් අබියස විරාගික වූහ. අක්කෝස භාරද්වාජ, අග්ගික භාරද්වාජ වැනි බ්‍රාහ්මණයන්ගේ හා චිංචාමාණවිකාවගේ පරිභව හමුවේ ද්වේශ සහගත නොවූහ. මේ තුළින් පිළිබිඹු කෙරෙනුයේ බුදුරදුන්ගේ චරිතවත් බවයි; පද්මාකාර ජීවිතයයි. මෙම නිකැලැල් චරිතය සමකාලීන මෙන් ම නූතනයේ බොහෝ දෙනාගේ ද ඇගයීමට ලක් වී ඇත. පුද්ගලයකු ශ්‍රේෂ්ඨ නායකයකු බවට පත්වීමට නම් චරිතවත් බව ද අත්‍යවශ්‍ය වේ.

## 3. යථාවාදී තථාකාරී බව හා යථාකාරී තථාවාදී බව

කියන දේ කරන ගුණය යථාවාදී තථාකාරී නම් වන අතර කරන දේ කියන ගුණය යථාකාරී තථාවාදී නම් වේ. ඇතැම් නායකයින් තුළ මෙම ගුණය දැක ගැනීම අපහසු ය. මෙම උතුම් ගුණය බුද්ධ චරිතය තුළින් මැනවින් ප්‍රකට වේ. බුදුරදුන් ප්‍රථම රහතන් වහන්සේලා හැට නම අමතා දුන් උපදේශ ක්‍රියාත්මක කරනු ලැබුවේ තනිව ම උරුවෙල් දනව්වට වැඩම කිරීමෙනි. ගිලනුන්ට උපස්ථාන කිරීමේ වැදගත්කම අවධාරණය කරනු ලැබුවේ සියතින් ම ගිලනුන්ට උපස්ථාන කිරීමෙන් අනතුරුව ය. එසේ ම බුදුරජාණන් වහන්සේ යමක් නොකරන්නැයි භික්ෂූන් වහන්සේලාට දේශනා කළේ තමන් වහන්සේ ද එය නොකරමින් ය. විකාල භෝජන ශික්ෂා පදය පැනවීම එයට එක් නිදසුනකි. **"මහණෙනි මම ඒකාසන භෝජනය වළඳමි. ඒකාසන භෝජනය වළඳන මම අල්පාබාධ බව ද නිදුක් බව ද පැවැත්ම ද කාය බලය ද සුඛ විහරණය ද දනිමි. නුඹලා ද ඒකාසන භෝජනය වළඳව්."** යනුවෙන් බුදුරදුන් දේශනා කළේ කියන දේ කරන කරන දේ කියන නායකයකු වූ බැවිනි.

## 4. සමානාත්මතාව

බ්‍රාහ්මණ පූජකයන් විසින් භාරතීය සමාජය චතුර් වර්ණයකට හෙවත් කුල හතරකට බෙදා තිබුණි. ඒ අනුව අදාළ මූලික මිනිස් අයිතිවාසිකම් පවා හිමි වූයේ විසම ලෙසිනි. බුදුරජාණන් වහන්සේ තම ඉගැන්වීම් තුළින් මෙන් ම ක්‍රියාකාරකම් තුළින් ද චතුර් වර්ණය ම සමාන යැයි සලකා පිළිගෙන ඇත. උන් වහන්සේ බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යන සිව් කුලයේ ම අයට සසුන්ගත වීමට අවස්ථාව ලබා දුන්හ. ගිහි කල තම පුතණුවන් වූ

රාහුල කුමරුට මෙන් ම තමන් වහන්සේට බොහෝ සේ හිරිහැර කළ දේවදත්තට ද සම මෙත් සිතින් ක්‍රියා කළහ. සිය සුළු මෑණියන් වූ මහා ප්‍රජාපතීගෝතමියට මෙන් ම පුණ්ණා දාසියට ද පැවිද්ද ලබාදීමට ක්‍රියා කළහ. තනතුරු ප්‍රදානය කිරීමේ දී උස් පහත් බේද නොසලකන ලදි. මෙලෙස බුදුරජාණන් වහන්සේගේ සමානාත්මතා ගුණය බුද්ධ චරිතය තුළ කොතෙකුත් දැකිය හැකි ය. සෑම නායකයකුට ම මෙම ගුණාංගය අත්‍යවශ්‍ය වේ.

## 5. අකම්පිත බව

ලාභ-අලාභ, යස-අයස, නින්දා-ප්‍රශංසා සුඛ-දුක්ඛ යනු අටලෝ දහමයි. සෑම පුද්ගලයකුට ම මෙම ධර්මතාවලට මුහුණ දීමට සිදුවේ. එකිනෙකට ප්‍රතිවිරුද්ධ වූ මෙම ලෝක ධර්මතාවලින් කම්පා නොවීම අකම්ප්‍ය බව නම් වේ. නායකයකු ලාභයෙහි, යසසෙහි, ප්‍රශංසාවෙහි හා සැපයෙහි දී උද්දාමයට පත් නොවිය යුතු ය. එසේ ම අලාභයෙහි, අයසෙහි, නින්දාවෙහි හා දුකෙහි දී කම්පා නොවිය යුතු ය. බුදුරදුන්ට මෙම ධර්මතාවලට අප්‍රමාණ ලෙස මුහුණ දීමට සිදු විය. ජේතවනාරාමය, පූර්වාරාමය වැනි ආරාම ප්‍රතිලාභයෙනුත් දෙව් මිනිසුන්ගෙන් ලැබුණු කීර්ති ප්‍රශංසා හමුවෙහිත් උන් වහන්සේ උද්දාමයට පත් නොවූ සේක. වේරංජා වස්කාලය තුළ දී නිසි අහරක් නොලැබීමෙන් හෝ අක්කෝසක භාරද්වාජ, චිංචාමාණවිකා ආදීන්ගේ නින්දා අපහාස හමුවේ හෝ කම්පාවට පත් නොවී සියල්ල සමසිතින් ඉවසූහ. උපේක්ෂාවෙන් යුතුව ඒවාට මුහුණ දුන්හ. එය නායකයකු සතු උතුම් ලක්ෂණයකි. මෙය තාදි ගුණය ලෙස ද හැඳින්වේ.

## 6. කාරුණික බව

අනුන්ගේ දුක් පීඩා දැක සත් පුරුෂයන්ගේ හදවත් තුළ ඇතිවන කම්පනය කරුණාව නම් වේ. සැබෑ නායකයා කවරකුට වුව ද විපතක් කරදරයක් ඇති වූ විට එය තමනට සිදු වූ දෙයක් ලෙස සිතා උපකාරය අවශ්‍ය අවස්ථාවේ ම ලබා දීමට නොපැකිලව ක්‍රියා කරයි. බුද්ධත්වයට පත්ව දිවි ගෙවූ පන්සාලිස් වසර තුළ බුදුරදුන් සෑම දිනක ම තමාගේ මුල් ම කාර්යය බවට පත්කරගත්තේ ද පිහිටවිය යුතු අය කවුරුන් ද යන්න විමසා බැලීමට ය. අලුයම් වේලෙහි මහා කරුණා සමාපත්තියට සමවැදී බුදු ඇසින් ලොව බැලූ උන් වහන්සේ දුකට පත් වූ බොහෝ දෙනාට පිහිට වූහ. මව පියා තම දරුවාට දක්වන කරුණාවටත් වැඩි කරුණාවකින් උන් වහන්සේ ක්‍රියා කළහ. සුනීත, සෝපාක, රජ්ජුමාලා, මට්ටකුණ්ඩලී, පුක්කුසාති යන අයට පිහිට වූ ආකාරය පිළිබඳ කථා පුවත් තුළින් මෙම ගුණය මැනවින් ප්‍රකට වේ. බෝසත් අවධියේ පාරමී දම් පිරුවේ ද මහා කරුණාව පෙරදැරි කරගෙන ය. මෙම ගුණාංගය කිසියම් නායකයකු සතු ව පවතීනම් ඔහු ජනතා හිතවාදී නායකයෙකි.

## 7. අගතිගාමී නොවීම

අගතිය යනු නොමග යාමයි. ඒ හේතුවෙන් කවරකු වුවද විවිධාකාර අයුක්ති සහගත සාවද්‍ය ක්‍රියාවන්ට පෙලඹේ. අගති සතරක් බුදු දහමේ දක්වේ. **ඡන්දය** හෙවත් කැමැත්ත එහි පළමු වැන්නයි. දෙවැන්න **ද්වේශය** හෙවත් තරහවයි. **බිය** හෙවත් බියගුලුකම හා **මෝහය** හෙවත් මුලාව ඉතිරි කාරණා දෙකයි. මෙසේ සතර අගතියෙන් යුත් පාලකයා අව පක්ෂයේ සඳ මෙන් පිරිහේ. එයින් තොර වූ පාලකයා පුර පක්ෂයේ සඳ මෙන් දියුණු වේ. බුදුරජාණන් වහන්සේ කිසිවිටකත් අගතිගාමී නොවූහ. දේවදත්ත තෙරුන් විසින් පඤ්චවරය ඉදිරිපත් කළ අවස්ථාවේ එය අනුමත කිරීමක් හෝ ප්‍රතික්ෂේප කිරීමක් නොකොට මධ්‍යස්ථ ප්‍රතිපදාවක පිහිටා කටයුතු කළහ. රාහුල හිමියන් ගිහිකල තම පුතණුවන් වුව ද ශාසනය තුළ කිසිදු විශේෂත්වයක් ලබාදීමට කටයුතු නොකිරීම, ගිහි පැවිදි ශ්‍රාවකයිනට තනතුරු ප්‍රදානය කිරීම, රජවරුන්ට අනුශාසනා කිරීම, විනය නීති පැනවීම ආදි ක්‍රියාකාරකම් වලදී උන් වහන්සේ අගතිගාමී නොවූහ. තමන්ට හිතවත් ව මෙන් ම අහිතවත් ව කටයුතු කළ අය පිළිබඳව ක්‍රියා කිරීමේ දී ද අගතිගාමී නොවූහ. අගතිගාමීත්වයෙන් තොර රාජ්‍ය පාලනයක් සඳහා බුද්ධ චරිතයෙන් සැපයෙන්නේ විශිෂ්ට ආදර්ශයකි.

## 8. නම්‍යශීලිත්වය

නායකයකුගේ ශ්‍රේෂ්ඨත්වය පිළිබිඹු කරන තවත් ගුණාංගයක් ලෙස නම්‍යශීලිත්වය හැඳින්විය හැකි ය. නායකයා තම අනුගාමිකයන්ගේ අදහස්වලට ඇහුම්කන් දිය යුතු ය. එහි දී සාධාරණ ව ඉදිරිපත් කෙරෙන අදහස් සැලකිල්ලට ගෙන අවශ්‍ය තැන තමන් ඒ පිළිබඳව දරන ස්ථාවරයේ වෙනසක් ඇතිකරගත යුතු ය. බුදුරදුන් එලෙස නම්‍යශීලීව කටයුතු කළ නායකයෙකි. විනය නීති පැනවීමත් ඇතැම් විට පැනවූ නීති සංශෝධනය කිරීම මෙන් ම අහෝසි කිරීමත් සිදුවූයේ ගිහි පැවිදි ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ ඉල්ලීම්වලට අනුව ය. වැසි කාලයේ භික්ෂූන් වහන්සේලාට නිශ්චිත ස්ථානයක වාසය කිරීමට නිර්දේශ කළේත් දෙමාපිය අවසරයකින් තොරව දරුවන් පැවිදි නොකරන්නැයි සුදොවුන් රජු කළ ඉල්ලීමට ප්‍රතිචාර දක්වූයේත් නම්‍යශීලී අරුත්බර ප්‍රතිපදාවක් බුදුරජාණන් වහන්සේ තුළ පැවැති නිසා ය.

## 9. ඍජු බව

නීතිය, යුක්තිය හා සාධාරණත්වය මත පිහිටා අවංක ව ක්‍රියාකිරීම ඍජු ගුණයයි. නමුත් ඇතැම් නායකයෝ සතර අගතියට නතුව වංක ව ක්‍රියා කරති. බුදුරජාණන් වහන්සේ නායකයකු වශයෙන් සාධාරණ ව ගත් තීරණ ඍජුව ක්‍රියාත්මක කළහ. මොනයම් බලපෑමක් ඉදිරියේදීවත් වෙනස් නොකළහ. ඇතැම් භික්ෂූන් වහන්සේ බුදුරදුන් ඉදිරියට

පැමිණ තමා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු නොලැබුණොත් බඹසර අත්හරින බවට අභියෝගාත්මක ව ප්‍රකාශ කර ඇත. අනවශ්‍ය ප්‍රශ්නවලට පිළිතුරු ලබා නොදීමේ ඍජු ප්‍රතිපත්තියෙහි පිහිටා සිටි උන් වහන්සේ පිළිතුරු නොදී ඒවා පසෙකින් තැබූහ. ගිහිකල පටන් මිතුරු ව සිටි ඡන්න පැවිදිවීමෙන් අනතුරුව භික්ෂූන් වහන්සේලාට පවා ආක්‍රෝශ පරිභව කිරීම හේතු කොටගෙන බ්‍රහ්ම දණ්ඩය පැනවීමට ඍජුව ම අනුදැන වදාළේ ශාසනයේ යහපැවැත්මට එබඳු ක්‍රියාමාර්ගයක් ගැනීම අවශ්‍ය ම වූ බැවිනි. විශිෂ්ට නායකත්වයකට ඍජු බව අවශ්‍ය ම ගුණාංගයක් වේ.

## 10. නිවැරැදි තීරණ ගැනීම

බුද්ධ පරිනිර්වාණය සිදුවීමට ආසන්න සමයේ බුදුරජාණන් වහන්සේ ආනන්ද හිමියන් අමතා මෙසේ ප්‍රකාශ කළහ. **"ආනන්දයෙනි, මා විසින් දේශනා කරන ලද යම් දහමක් වේද පනවන ලද විනයක් වේද එය මගේ ඇවෑමෙන් ඔබගේ ශාස්තෘවරයා වන්නේ ය."** මෙය බුදුරදුන් විසින් දුරදිග බලා ඉතාමත් නිවැරැදි ව ගන්නා ලද තීරණයක් ලෙස දැක්විය හැකි ය. බුද්ධ පරිනිර්වාණයේ සිට අද දක්වා බුදු දහම චිරස්ථායි වී ඇත්තේ එදා උන් වහන්සේ ගත් එම බුද්ධිමත් තීරණය නිසා ය. දේවදත්ත හිමියන් විසින් භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් නිර්දේශ කරන්නැයි ඉදිරිපත් කරන ලද පඤ්ච වරය සම්බන්ධව ගත් තීරණය ද ශාසන පැවැත්මට බෙහෙවින් ම හිතකර විය. එහි දී බුදුරදුන්ගේ නිගමනය වූයේ කැමැති කෙනකුට ඒවා අනුගමනය කළ හැකි බවයි. නායකයකු ගන්නා තීරණ ඉතාමත් නිවැරැදි විය යුතු ය. එය සාමාන්‍ය පුද්ගලයකු ගන්නා වූ තීරණවලට වඩා බුද්ධිමත් විය යුතු ය. එසේ නොවී ගන්නා වූ ඇතැම් තීරණ නිසා පසුතැවිල්ලෙන් යුතු ව මුළු ජීවිත කාලය ම ගෙවීමට නායකයාට වුව ද සිදුවේ.

## 11. නිවැරැදි දැක්ම

පුද්ගලයකුගේ දැක්ම ඔහුගේ ක්‍රියාකාරකම්වල පදනමයි. අප සැම කෙනකුට ම නිවැරැදි දැක්මක් තිබිය යුතු ය. එවිට ඉලක්ක සපුරා ගැනීම පහසු වනු ඇත. බුද්ධත්වයට පත්වීමට පෙර පටන් ම උන් වහන්සේට නිවැරැදි දැක්මක් තිබුණි. එනම් තමන් බුද්ධත්වයට පත්ව සසර දුක්විඳින සත්වයින් එම දුකින් මුදවා ගැනීමයි. උන් වහන්සේ මුළු ජීවිත කාලය ම කැප කළේ දුක් විඳින ජනතාව එයින් මුදවාගෙන නිර්වාණාවබෝධය ලබාදීමේ අදහසිනි. මාලුංක්‍යපුත්ත තෙරණුවන් විසින් අසන ලද ප්‍රශ්න දුකින් මිදීමට අදාළ නොවූ බැවින් ඒවා පසෙකින් තබන ලද්දේ ද නිවැරැදි දැක්මක් තිබූ බැවිනි. ආයතනයක් ක්‍රියාත්මක විය යුත්තේ කිසියම් දැක්මකට අනුව ය. පාසල මෙන් ම වෙනත් ඕනෑම ආයතනයක් ඵලදායී තැනක් වන්නේ නිවැරැදි දැක්මක් ඇතිව ක්‍රියාත්මක වුවහොත් පමණි.

## 12. ආකර්ෂණීය වාග් විලාසය

වරක් කොසොල් රජතුමා විසින් බුදුරදුන්ගේ ආකර්ෂණීය වාග් විලාසය වර්ණනා කරනු ලැබුවේ මෙසේ ය. **"ස්වාමීනී මම මරණ දඬුවම දීමට, ධනය පවරා ගැනීමට, නෙරපීමට බලය ඇති රජෙක්මි. එහෙත් මාගේ අධිකරණ විනිශ්චයේ දී පවා මිනිස්සු එකිනෙකා කතා කරති. මගේ කතාව අවසන් වන තුරු නොසිටිති. එහෙත් භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසන විට ශ්‍රාවකයන් වහන්සේලා කිවිසුම් හඬක් හෝ නොනගති. එය ආශ්චර්යයකි. දඬුවමින් හෝ අවියෙන් තොර ව මැනවින් සකස් කොටගත් මෙබඳු ශ්‍රාවක සමාජයක් බුදුසසුනෙන් බැහැර ව මම නොදකිමි."** ශ්‍රේෂ්ඨ නායකයකුට සැබවින් ම ආකර්ෂණීය වාග් විලාශයක් පැවැතිය යුතු ය. ඒ සඳහා කට හඬෙහි මධුර බව මෙන් ම වචනවල නිරවද්‍යතාව ද ගැඹුරු බව ද වැදගත් ය. එපමණක් නොව අර්ථ පූර්ණ ප්‍රිය මනාප බස්වහරක් තිබිය යුතු ය. බුරදුන්ගේ වාග් විලාසය මේ සියලු අංශයන්ගෙන් පරිපූර්ණ එකක් විය. උන් වහන්සේ දහම් දෙසන විට සුලලිත වචන ගලා ආවේ නිරායාසයෙනි. ඒ හැම වචනයක් ම ඇසූවන්ගේ සවනට අමෘතයක් මෙන් විය. ඒ වචන හෘදයංගම ය; ප්‍රියජනක ය; කනට මිහිරිය; මටසිලිටිය; එම දහම අසන පුද්ගලයාට දැනුණේ එය තමා වෙනුවෙන් ම කළ දේශනාවක් ලෙසිනි. එකල සමාජයේ දරුණු පිරිස් ලෙස සැලකුණු ආලවක, අංගුලිමාල, නාලාගිරි වැනි අය දමනය කර ගැනීමට ද බුදුරදුන්ගේ මෙම වාග් විලාශය උපකාරී විය.

## 13. ආකර්ෂණීය රූප විලාශය

සෝණදණ්ඩ බ්‍රාහ්මණයා බුදුරදුන් පිළිබඳව කළ වර්ණනය මීට නිදසුනකි. **"භවත්නි, මහණ ගොයුම්හු වූ කලී විශිෂ්ට රූප සම්පත් ඇත්තෝ ය. දැකුම් කටයුතු ය. ප්‍රසාදජනක ය. උතුම් වර්ණ සෞන්දර්යෙන් සමන්විත ය. බඹුන් සේ උතුම් රන් පැහැ ඇත්තෝ ය. උත්තම ශරීර ප්‍රභාව ඇත්තෝ ය."** මෙලෙස බුදුරදුන්ගේ රූප ස්වභාවය වර්ණනා කළ පිරිස් බොහෝ වූහ. බුදුරුව දුටුවන්ගේ නෙත් සිත් පහදවන්නක් විය. එහි කිසිදු අඩුවක් නොපෙනුණි. ඒ බැව් තහවුරු කෙරෙන කතා මෙන් ම සිදුවීම් ද සූත්‍ර දේශනා තුළ දක්නට ලැබේ. වක්කලී හිමියන් පිළිබඳ කතා පුවත තවත් එක් නිදසුනක් පමණි. වක්කලී හිමියන් පැවිදි වූයේ ම බුදුරදුන්ගේ රූ සපුව බලාගෙන සිටීමේ ආශාවෙනි. මහා පුරුෂයින් ලෙස හඳුන්වන උතුමන්ට පමණක් පිහිටන විශේෂ පුරුෂ ලක්ෂණ තිස් දෙකක් බුදුරදුන්ට හිමි විය. එම පුරුෂ ලක්ෂණ ඔපවත් කරන අනු ලක්ෂණ අසූවක් ද පිහිටා තිබුණි. මේ අසමසම රූප විලාශය අන්‍ය ආගමිකයින්ගේ පවා ප්‍රසාදයට ලක්විය. එය උන් වහන්සේගේ නායකත්වය තව දුරටත් ඔපවත් කිරීමට හේතු විය.

## 14. ස්ථානෝචිත ප්‍රඥාව

නායකයකුට බොහෝ අර්බුද හා අභියෝගවලට මුහුණ දීමට සිදුවේ. එහි දී ස්ථානෝචිත ප්‍රඥාව අත්‍යවශ්‍ය වේ. පැවිදි ජීවිතය පිළිබඳව කලකිරී සිටි නන්ද හිමියන්ට

නැවත ශාසන ඇල්ම ඇතිකරලීම සඳහා යොදන ලද ක්‍රියා මාර්ග තුළිනුත්, රූප මදයෙන් මත්ව ක්‍රියා කළ ඛේමාවන්ට රූපයේ අනිත්‍යතාව පසක් කරදීමෙනුත් පැහැදිලි වන්නේ බුදුරජාණන් වහන්සේ තුළ පැවැති ස්ථානෝචිත ප්‍රඥාවයි. එපමණක් නොව සතර පද ගාථාවක් පාඩම් කරගැනීමටවත් නොහැකි ව සිටි චුල්ලපන්ථක තෙරුන් රහත් මගට යොමු කරවීම, මියගිය පුතණුවන් තුරුලු කරගෙන ප්‍රතිකාර සොයා ගිය කිසාගෝතමියට, මරණය සියල්ලන්ට ම උරුමයක් බව පසක් කර ගැනීමට මග පෙන්වීම ආදියෙනුත් ප්‍රකට කරනුයේ උන් වහන්සේගේ ස්ථානෝචිත ප්‍රඥාවයි. මෙය නායකයකු සතු විශිෂ්ට ලක්ෂණයකි.

## 15. බහුශ්‍රැත බව

බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව හෙවත් පිරිපුන් දැන උගත්කම බහුශ්‍රැත බව නම් වේ. මෙලොව ඇසූ පිරූ තැන් ඇති ශ්‍රේෂ්ඨතම නායකයාණෝ බුදුරජාණන් වහන්සේ ය. උන් වහන්සේ දැනගත යුතු සියල්ල දැන සිටි බැවින් සර්වඥ නම් වූහ. තුන්ලෝකයේ ම පිරිස් බුදුරදුන්ගේ නායකත්වය පිළිගැනීමට උන් වහන්සේගේ බහුශ්‍රැත බව ද හේතු විය. ත්‍රිපිටක ධර්මයෙහි අන්තර්ගත කරුණු විමසීමේ දී නිබඳ ව ම ප්‍රකට වනුයේ බුදුරදුන්ගේ බහුශ්‍රැත බවයි. බොහෝසූත්‍ර උන් වහන්සේ දේශනා කර ඇත්තේ මිනිසුන්ට ය. ඇතැම් සූත්‍ර දේශනා කර ඇත්තේ දෙවියන්ට ය. මහා මංගල, පරාභව, මහාසමය වැනි සූත්‍ර ඒ සඳහා නිදසුන් වේ.

බුදුරජාණන් වහන්සේ මැනවින් දැන සිටියේ නිවන් මගම පමණක් නොවේ. පුද්ගලයකුගේ කායික සෞඛ්‍යය මෙන්ම මානසික සෞඛ්‍යය ද, ආර්ථිකය මෙන්ම පවුලේ ජීවිතය හා සමාජ ජීවිතය ද වැඩි දියුණු කර ගැනීමට කෙසේ ක්‍රියා කළ යුතුදැයි උන් වහන්සේ දැන සිටියහ. රජකු රටක් කෙසේ පාලනය කළ යුතු ද, මවුපියන් කෙසේ දරුවන් පිළබඳව ක්‍රියා කළ යුතු ද, ගිහියන් හා පැවිදි පක්ෂය, ස්වාමි පුරුෂයන් හා බිරින්දන් මෙන්ම මිතුරන් අරබයා ගිහියකු කෙසේ ක්‍රියා කළ යුතු දැයි උන් වහන්සේ දැන සිටියහ. සැකෙවින් කියතොත් බුදුරජුන්ගේ ඇසූ පිරූ තැන් ඇති බව ප්‍රකට වන ධර්මයෙහි අවධානයට ලක්නොවූ පැතිකඩක් නැති තරම් ය.

දෙව් මිනිසුන්ගේ පමණක් නොව යක්ෂ නාග ආදි බොහෝ දෙනාගේ යහපතට අදාළ ඉගැන්වීම් ද බුද්ධ දේශනා තුළ දක්නට ලැබේ. මේ සියලු කරුණු තුළින් පසක් වන්නේ බුදුරදුන්ගේ බහුශ්‍රැත බවයි. සැබෑ නායකයකු නම් ඔහු සෙසු අනුගාමිකයන්ට සාපේක්ෂ ව ඇසූ පිරූ තැන් ඇති අයකු විය යුතු ය.

බුදුරදුන්ගේ ශ්‍රේෂ්ඨ නායකත්වයට අදාළ ව ඉදිරිපත් වූ මේ කරුණු සැලකිල්ලට ගත් කල මුළු මහත් බුද්ධ චරිතය ම නායකත්ව ලක්ෂණවලින් පිරිපුන් එකක් බව පැහැදිලි ය.

ඔබ මේ වන විට පන්තියේ නායකයා විය හැකි ය. නැතහොත් ශිෂ්‍ය නායකයකු විය හැකි ය. එපමණක් නොව පාසලින් බැහැරව ගමේ හෝ නගරයේ පවත්නා වූ පාඨක සමාජයේ, මුද්දර සමාජයේ, යොවුන් සමාජයේ නායකයකු විය හැකි ය. එසේ නොවූව ද මතු දිනක වැඩිහිටියකු වශයෙන් ගමට, ප්‍රදේශයට, රටට නායකත්වයක් ලබා දෙන අයකු විය හැකි ය. එසේ ලැබෙන නායකත්වය නිවැරැදි ලෙස මෙහෙයවීමට බුදුරදුන්ගේ මෙම ශ්‍රේෂ්ඨ නායකත්ව ලක්ෂණ ඔබට ආදර්ශයට ගත හැකි ය. එවිට ඔබේ නායකත්වය සදා ඇගයීමට ලක්වනු ඇත.

## සාරාංශය

මෙම පාඩමේ දී සාකච්ඡා කරන ලද්දේ බුදුරදුන්ගේ නායකත්ව ලක්ෂණවලින් කිහිපයක් පමණි. මෙවන් නායකත්ව ලක්ෂණ බොහෝමයක් ත්‍රිපිටක ධර්මය අධ්‍යයනය කිරීමේ දී හඳුනාගත හැකි වේ. මෙහි අන්තර්ගත නායකත්ව ලක්ෂණ ඔබගේ නායකත්ව ගුණාංග වර්ධනය කරගැනීමට අතිශයින් ම ඉවහල් වේ. මේවායේ පවත්නා සර්වකාලීන වටිනාකම හැඳිනගෙන තම ජීවිතය සකස් කර ගැනීමට ද බොහෝ සෙයින් උපකාරී කරගත හැකි ය.

## ක්‍රියාකාරකම

1. යථාවාදී තථාකාරී හා යථාකාරී තථාවාදී යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න.
2. සමානාත්මතා ගුණය පිළිබිඹු කෙරෙන අවස්ථා තුනක් බුද්ධ චරිතයෙන් පෙන්වා දෙන්න.
3. පාසල් පිරියත තුළ ප්‍රදර්ශනය කිරීම සඳහා බුදු සිරිතේ නායකත්ව ලක්ෂණ ඇසුරෙන් ආදර්ශ පාඨ පහක් ලියන්න.

## පැවරුම

- මෙම පාඩම ඇසුරෙන් ඔබ සිත්ගත් නායකත්ව ලක්ෂණයක් පිළිබඳව පාසල් රැස්වීමක දී කරන කතාවට අදාළ කරගත හැකි කරුණු සටහන් කරන්න.

03

# අනුත්තර පින් කෙතය සඟ ගණ



බෞද්ධයින් වන අප පූජනීයත්වයෙන් සලකා වැඳුම් පිදුම් කරන උතුම් රත්න තුනක් ඇත. බුද්ධ, ධම්ම, සංඝ යනු එම රත්න තුනයි. මෙම රත්න තුනෙන් සංඝ රත්නය ලොවට දායාද වන්නේ සම්බුද්ධත්වයට පත් ව දෙමාසයකින් එළඹි ඇසළ පොහෝ දින ය. එදා පස්වග මහණුන්ගෙන් ආරම්භ වුණු සඟරුවන මේ වන විට වසර දෙදහස් හයසිය ගණනක ඉතිහාසයකට උරුමකම් කියයි. සංඝ සමාජය යනුවෙන් හැඳින්වෙන්නේ මෙසේ ලොවට

බිහි වූ මහා සංඝ රත්නයයි. මහා සංඝ රත්නය සතු උදාර වූ ගුණ සමුදායත් සිදු කරනු ලබන උතුම් ආගමික, අධ්‍යාපන හා සමාජ මෙහෙවරත් නිසා උන් වහන්සේලා ලෝකවාසී සියලු බෞද්ධයිනට ම මහාර්ඝ වූ සම්පතකි. සඟරුවනේ සුවිශේෂී වූ ගුණ නමයක් දහමෙහි සඳහන් වේ.

## 1. සුපටිපන්න

මහ සඟරුවන මනා පිළිවෙත් ඇති බැවින් සුපටිපන්න වන සේක. එම පිළිවෙත නම් නිර්වාණ මාර්ගයයි. එනම් රාග, ද්වේශ, මෝහ නැති කරන මාර්ගයයි. සංඝ රත්නයට අයත් ඇතැම් උතුමෝ නිවන පසක් කළෝ ය. සෙසු පිරිස එම මාර්ගයේ ගමන් කරති. එබැවින් මේ සියලු මහා සංඝ රත්නය සුපටිපන්න ගුණයෙන් යුක්ත ය.

**මුනිඳු දෙසූ විලසින**
**මහගු පිළිවෙත් සුරකින**
**අරිය අට සඟ ගුණ**
**සුපටිපන්නය කියා පැවසිණ**

## 2. උජුපටිපන්න

අධි ශීල, අධි චිත්ත, අධි ප්‍රඥාවෙන් යුක්ත ව ඍජු ප්‍රතිපත්තියෙහි යෙදෙන බැවින් සංඝ රත්නය උජුපටිපන්න නම් වන සේක. එහි අදහස ඍජු, ඇද නැති ආර්ය ප්‍රතිපදාවට අනුව උන් වහන්සේලා කටයුතු කරන බවයි. ශරීරයට අධික සැප සම්පත් ලබා දෙන කාමසුඛල්ලිකානුයෝගය හා ශරීරයට අධික දුක් දෙන අත්තකිලමථානුයෝගය යන අන්තවලින් මිදී මධ්‍යම ප්‍රතිපදාව අනුව උන් වහන්සේලා කටයුතු කරන සේක. ඒ අනුව ආර්ය අෂ්ටාංගික මාර්ගය නම් වූ එම ඍජු හෙවත් අවංක පිළිවෙත අනුගමනය කරන නිසා උන් වහන්සේලා උජුපටිපන්න ගුණයෙන් යුක්ත ය.

**නොවක් ලෙස සොඳිනා**
**මැදුම් පිළිවෙත පුරනා**
**බැවින් සඟ රුවනා**
**යුතුයි උජුපටිපන්න ගුණෙනා**

## 3. ඤායපටිපන්න

ඤාය යනු නිවන් මගට නමකි. බුදු දහමට අනුව නිවන් අරමුණු කරගත් ශ්‍රාවකයා දුක්ඛ නිරෝධගාමිනි පටිපදා මාර්ගයේ ගමන් කළ යුතු ය. එය ආර්ය අෂ්ටාංගික මාර්ගයයි.

මහ සඟරුවන, එම ආර්ය මාර්ගයෙහි ගමන් කරන උතුමන් පිරිසකි. එසේ නිවන් සාදා දෙන පිළිවෙත් දරන බැවින් උන් වහන්සේලා ඤායපටිපන්න ගුණයෙන් යුක්ත වන සේක.

| | |
|---|---|
| **සඟ මැදට** | **එන්නෝ** |
| **අරි අටඟි මඟ** | **යන්නෝ** |
| **ඤාය පටි** | **පන්නෝ** |
| **කියා එබැවින්** | **හැඳින් වෙන්නෝ** |

## 4. සාමීචිපටිපන්න

සඟරුවන අනුගමනය කරන නිර්වාණගාමී මැදුම් පිළිවෙත ගරු බුහුමනට ලක් විය යුත්තකි. එබඳු ගරු බුහුමන් ලැබීමට සුදුසු ආර්ය ප්‍රතිපදාවක් පුරන හෙයින් මහ සඟරුවන සාමීචිපටිපන්න ගුණයෙන් යුක්ත ය. දුටු විට හුනස්නෙන් නැගිටීම, ආසන පැනවීම, පවන් සැලීම, පා ධෝවනය, මුව දෙවීම හා ස්නානය සඳහා පැන් පහසුකම් සලසා දීම, සිවුරු සෝදා දීම, සේනාසන පවිත්‍ර කර දීම ආදී ඇප උපස්ථාන ලැබීමට උන් වහන්සේලා සුදුසු ය. ඒවා සාමීචි කර්ම යනුවෙන් ද හැඳින්වේ.

| | |
|---|---|
| **පුදමින් සිවු** | **පසය** |
| **උවටැන්වලට** | **සුදුසුය** |
| **එබැවින් සඟ** | **ගණය** |
| **කියති සාමීචි පටි** | **පන්නය** |

## 5. ආහුනෙය්‍ය

සැදැහැවතුන් ඉතා දුර බැහැර සිට වෙහෙස මහන්සි වී ශ්‍රද්ධාවෙන් රැගෙන එන සිවුපසය පිළිගැන්වීමට සුදුසු වන නිසා භික්ෂූන් වහන්සේලා ආහුනෙය්‍ය ගුණයෙන් යුක්ත ය. උන් වහන්සේලා සතු ව පවත්නා සිල්වත්බව ඊට හේතුවයි. එසේ සිවුපසය පිළිගන්වන සැදැහැවතුනට බොහෝ අනුසස් ලැබේ.

| | |
|---|---|
| **දුර සිට රැගෙන** | **එන** |
| **දෙයකින් වුව ද** | **සැදැහෙන** |
| **පිදුමට නිසි** | **බැවින** |
| **ආහුනෙය්‍යයි අරිය සඟ** | **ගණ** |

## 6. පාහුනෙය්‍ය

පාහුනෙය්‍ය යනුවෙන් හැඳින්වෙන්නේ ඥාති හිතමිත්‍රාදීන් සඳහා පිළියෙල වන සංග්‍රහයට ය. එවැනි සංග්‍රහයක් වෙනත් කිසිවකුට සිදු කරනු නොලැබේ. එසේ ආගන්තුක සංග්‍රහයක් වුව ද පිළිගැන්වීමට සුදුසු වන නිසා උන් වහන්සේලා පාහුනෙය්‍ය ගුණයෙන් යුක්ත වන සේක.

| | |
|---|---|
| පළමුව අන් | සැමට |
| නිසි වන බැවින් | පිදුමට |
| මහ සඟරුවන | සෙට |
| පාහුනෙය්‍යයි අනුව | දහමට |

## 7. දක්ඛිණෙය්‍ය

මෙලොව පරලොව සැපත පිණිස පිළිගන්වනු ලබන සියලු දාන පිළිගැනීමට සුදුසු වීම දක්ඛිණෙය්‍ය නම් වේ. දන් දීමෙන් අපේක්ෂා කරන ආනිශංස උපරිම වශයෙන් ලැබීමට නම් සුදුසු පුද්ගලයින්ට ම පිළිගැන්විය යුතු ය. ඒ අනුව දන් පිළිගැන්වීමට වඩාත් ම සුදුසු වන්නේ මහ සඟරුවනයි. එනිසා උන් වහන්සේලා දක්ඛිණෙය්‍ය ගුණයෙන් යුක්ත ය. දායක පක්ෂයට දෙව් මිනිස් සැප ලැබෙන්නේ එවැනි පිරිසකට දන් පිළිගැන්වීමෙනි. ශීල, සමාධි, ප්‍රඥා ආදි පිළිවෙත් සම්පූර්ණ කළ හා එසේ කිරීමට වෙර දරන පිරිසක් වශයෙන් සංඝ රත්නය දක්ෂිණාව පිළිගැන්වීමට හැම අතින් ම සුදුසු උතුමන් වේ.

| | |
|---|---|
| උතුම් සැප ලැබ | දෙන |
| දනක් දීමට නිසි | වන |
| බැවින් මහ සඟ | ගණ |
| දක්ඛිණෙය්‍යයි කියා | පැවසිණ |

## 8. අඤ්ජලිකරණීය

ඇඳිලි බැඳ දොහොත් නඟා වැඳීමට සුදුසු වීම අඤ්ජලිකරණීය නම් වෙයි. ලෝකයා විසින් දොහොත් මුදුන් දී සිදු කරනු ලබන වන්දනාමානවලට සුදුසු බැවින් මහ සඟරුවන අඤ්ජලිකරණීය ගුණයෙන් යුක්ත වන සේක. උන් වහන්සේලා උතුම් ශීලාදි ගුණයන්ගෙන් යුක්ත වීම ඊට හේතුවයි. අප සඟරුවනට වඳිනුයේ බියෙන් හෝ ලාභ අපේක්ෂාවකින් හෝ නොවේ. සැදැහැ සිත පෙරදැරි කොටගෙන ය. අඤ්ජලිකරණීය ගුණයෙන් යුක්ත වන මහ සඟරුවනට දිව්‍ය, බ්‍රහ්මාදීහු පවා වන්දනය කරති.

| | |
|---|---|
| ඇඳිලි බැඳ | මැනැවින් |
| පිදුමට නිසිය | සැබැවින් |
| සඟරුවන | එබැවින් |
| යුතුයි අඤ්ජලිකරණී | ගුණයෙන් |

## 9. අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්ස

ශීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිවිධ ශික්ෂාවෙන් පිරිපුන් මහ සඟරුවනට සිවුපසයෙන් උවටැන් කිරීම මහානිශංසදායී පින්කමකි. සාරවත් වූ කුඹුරකින් ලැබෙන අස්වැන්න මෙන් සැදැහැවතුන්ට පින් නමැති අස්වැන්න නෙළා ගැනීමට භික්ෂූන් වහන්සේලා උතුම් වූ කුඹුරකි. ඒ අනුව මහා සංඝ රත්නය අනුත්තර පුඤ්ඤක්ඛෙත්ත නම් ගුණයෙන් යුක්ත ය.

| | |
|---|---|
| ලොව සැදැහැ ඇති | දන |
| පින නම් බීජ | වපුරන |
| සරු කෙත වන | බැවින |
| අනුත්තර පින් කෙත ය සඟ | ගුණ |

### සාරාංශය

ත්‍රිවිධ රත්නයෙහි තුන්වැනි රත්නය මහ සංඝ රත්නයයි. මහ සඟරුවන සතු ව ශීලාදි ගුණ ධර්ම රැසක් ඇත. එම ගුණාංග සාරාංශ කොට දක්වා ඇති පාඨය සුපටිපන්නෝ යනුවෙන් ආරම්භ වේ. සෝවන් ආදී මාර්ගඵලලාභී ආර්ය මහා සංඝ රත්නයේ ගුණ අසීමිත ය. ඒ සියල්ල ගුණ නවයක් ලෙස සංග්‍රහ කොට තිබේ.

## ක්‍රියාකාරකම

1. සුපටිපන්නෝ පාඨය නිවැරැදි ව සජ්ඣායනා කරන්න.

2. එම පාඨයෙහි ඇති සඟ ගුණ නවය නම් කොට සිංහල තේරුම දක්වන්න.

3. සංඝ රත්නය වෙනුවෙන් ගිහියන් විසින් ඉටු කළ යුතු යුතුකම් පෙන්වා දෙන්න.

## පැවරුම

- ආසන්න රෝහලක රෝගීව වැඩ සිටින භික්ෂූන් වහන්සේලාට උපස්ථාන කිරීමට සුදුසු වැඩපිළිවෙළක් ගුරු දෙගුරුන්ගේ උපදෙස් පරිදි සංවිධානය කරන්න.

## පුහුණුවට

සිරිමත් බඹ සිරසෙහි පා පිසිනා
සැරියුත් මහ මුගලන් පිළිවෙළිනා
පිළිවෙත් සරු මහ සඟගණ සොබනා
මුදුනත් බැඳ නමදිම් බැති පෙමිනා

(ලෝවැඩ සඟරාව)

# 04 වඳිමු සැදැහෙන් උතුම් පුද බිම්

පහත දැක්වෙන්නේ අප බොහෝදෙනා යෙදෙන චාරිකා වර්ග තුනකි. එනම් වන්දනා චාරිකා, අධ්‍යාපන චාරිකා සහ විනෝද චාරිකා ය. මෙම චාරිකා අතර මූලික වෙනස්කම් දැකිය හැකි ය. වන්දනා ගමන් යාමට මුල් වන්නේ ශ්‍රද්ධාවයි. දැනුම ලබා ගැනීම අධ්‍යාපන චාරිකාවල අරමුණයි. විනෝද චාරිකා විනෝදාස්වාදය අරමුණු කොට ඇත. බෞද්ධාගමික සිද්ධස්ථාන වැඳ පුදා ගැනීම හා එම ස්ථාන පිළිබඳ ප්‍රසාදය උපදවා ගැනීම බුදු දහමට අනුව ශ්‍රද්ධාව වැඩි දියුණු වීමට ඉවහල් වන කරුණකි.

ධර්මාශෝක රජුගේ ධර්ම දූත සේවාවෙහි ප්‍රතිඵලයක් ලෙස දඹදිවින් බැහැර ප්‍රදේශවලට ද බුදු දහම ව්‍යාප්ත වී ගියේ ය. ඉන් පසුව එම රටවල වටිනා පූජනීය ස්ථාන ඉදි විය. ශ්‍රී ලංකාව තුළ බෞද්ධ රජදරුවන්ගේ අනුග්‍රහය යටතේ විවිධ පූජනීය ස්ථාන ඉදි වන්නේ මහින්දාගමනයේ දායාදයක් ලෙස ය. සංඝමිත්තාගමනයේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී මහා බෝධි ශාඛාවක් මහමෙව්නාවේ රෝපණය කෙරිණි. එසේ ම සර්වඥ ධාතු නිදන් කොට දිවයින පුරා වෙහෙර විහාර රැසක් ඉදි විය. අනුරාධපුරයේ ඉදි වූ ථූපාරාම දාගැබ, සමාධි බුද්ධ ප්‍රතිමාව ආදිය මුල් යුගයට අයත් වේ. බුදුරජාණන් වහන්සේ ජීවමාන කාලයේ දී ම මෙරට මහියංගණය, නාගදීපය, කැලණිය ඇතුළු ස්ථාන රැසක් සිරිපා පහසින් පාරිශුද්ධත්වයට පත් විය. එසේ පාරිශුද්ධත්වයට පත් දිවයින පුරා පිහිටි ස්ථාන දහසයක් **සොළොස්මස්ථාන** වශයෙන් ද, ඊට අමතර ව අනුරාධපුරයට පමණක් සීමා වූ පූජනීය ස්ථාන අටක් **අටමස්ථාන** වශයෙන් ද හැඳින්වේ.

බෞද්ධයන් මෙම ස්ථානවල වන්දනා චාරිකාවල යෙදෙන්නේ බලවත් ශ්‍රද්ධාවෙනි. සොළොස්මස්ථාන වන්දනාව, අටමස්ථාන වන්දනාව, ශ්‍රී පාද වන්දනාව, කතරගම වන්දනාව, වට වන්දනාව වශයෙන් මෙම වන්දනා ගමන් නම් කොට ඇත. බොදු දරුවන් වශයෙන් අපට මෙම පූජනීය ස්ථාන පිළිබඳ නිවැරදි අවබෝධයක් තිබීම ඉතා වැදගත් ය.

## සොළොස්මස්ථාන පිළිබඳ තොරතුරු

| සිද්ධස්ථානය | පිහිටීම | ආගමික වැදගත්කම |
|---|---|---|
| මහියංගණය | ඌව පළාත<br>බදුල්ල දිස්ත්‍රික්කය | බුදුරදුන් විසින් බුද්ධත්වයෙන් නව වන මස යක්ෂයින් දමනය කිරීම |
| නාගදීපය | උතුරු පළාත<br>යාපනය දිස්ත්‍රික්කය | බුද්ධත්වයෙන් පස්වන වර්ෂයෙහි බක් පොහොය දිනක මැණික් පුටුව වෙනුවෙන් අරගල කළ චූලෝදර මහෝදර නාග ගෝත්‍රිකයන් දමනය |
| කැලණිය | බස්නාහිර පළාත<br>ගම්පහ දිස්ත්‍රික්කය | බුද්ධත්වයෙන් අටවෙනි වසරේ වෙසක් පොහොය දින මණිඅක්ඛික නා රජු සිදු කළ ආරාධනයකට අනුව කැලණියට වැඩම කිරීම |
| ශ්‍රී පාදස්ථානය | සබරගමුව පළාත<br>රත්නපුර දිස්ත්‍රික්කය | වම් සිරිපා ලකුණ පිහිටුවීම |
| දිවාගුහාව | සබරගමුව පළාත<br>රත්නපුර දිස්ත්‍රක්කය | සිරිපා සලකුණ පිහිටුවා බුදුරදුන් දිවා කාලයෙහි විවේක සුවයෙන් ගත කිරීම |
| දීඝවාපිය | නැගෙනහිර පළාත<br>අම්පාර දිස්ත්‍රික්කය | බුදුරජාණන් වහන්සේ තෙවන වර ලක් දිවට වැඩම කළ අවස්ථාවේ සමවත් සුවයෙන් වැඩ සිටීම |
| මුතියංගණය | ඌව පළාත<br>බදුල්ල දිස්ත්‍රික්කය | බුදුරජාණන් වහන්සේ නිරෝධ සමාපත්තියෙන් වැඩ සිටීම |
| තිස්සමහාරාමය | දකුණු පළාත<br>හම්බන්තොට දිස්ත්‍රික්කය | බුදුරදුන්ගේ ලලාට ධාතුව නිදන් කොට තිබීම |
| ශ්‍රී මහා බෝධිය | උතුරුමැද පළාත<br>අනුරාධපුර දිස්ත්‍රික්කය | දඹදිව පිහිටි ශ්‍රී මහා බෝධියේ දකුණු ශාඛාව රෝපණය කොට තිබීම |
| මිරිසවැටිය | උතුරුමැද පළාත<br>අනුරාධපුර දිස්ත්‍රික්කය | සර්වඥ ධාතු නිදන් කොට තිබීම |
| රුවන්මැලිසෑය | උතුරුමැද පළාත<br>අනුරාධපුර දිස්ත්‍රික්කය | සර්වඥ ධාතු වැඩි ප්‍රමාණයක් නිදන් කොට තිබීම |
| ථූපාරාමය | උතුරුමැද පළාත<br>අනුරාධපුර දිස්ත්‍රික්කය | බුදුරදුන්ගේ දකුණු අකු ධාතුව නිදන් කොට තිබීම |
| අභයගිරිය | උතුරුමැද පළාත<br>අනුරාධපුර දිස්ත්‍රික්කය | සර්වඥ ධාතු නිදන් කොට තිබීම |
| ජේතවනය | උතුරුමැද පළාත<br>අනුරාධපුර දිස්ත්‍රික්කය | බුදුරජාණන් වහන්සේ සමවත් සුවයෙන් වැඩ සිටීම |

| | | |
|---|---|---|
| මිහින්තලයේ සේල චෛත්‍යය | උතුරුමැද පළාත අනුරාධපුර දිස්ත්‍රික්කය | බුදුරදුන්ගේ ඌර්ණ රෝම ධාතුව නිදන් කිරීම |
| කතරගම කිරි වෙහෙර | ඌව පළාත මොනරාගල දිස්ත්‍රික්කය | බුදුරදුන් සමවත් සුවයෙන් වැඩ සිටි රන් ආසනය නිදන් කිරීම හා උන් වහන්සේගේ කේශ ධාතු තැන්පත් කිරීම |

## අනුරාධපුර අටමස්ථාන

1. රුවන්මැලි මහාසෑය
2. ශ්‍රී මහා බෝධිය
3. ථූපාරාමය
4. මිරිසවැටිය
5. අභයගිරිය
6. ජේතවනය
7. ලංකාරාමය
8. ලෝවාමහාපාය

මේ අනුව සොළොස්මස්ථානවලට ඇතුළත් ස්ථානවලින් හයක් ම අටමස්ථානවලට ද අයත් වේ. සොළොස්මස්ථානයට ඇතුළත් නොවන ලංකාරාමය හා ලෝවාමහාපාය ද භික්ෂූන් වහන්සේලා වැඩ සිටි අනුරාධපුර පූජා භූමියෙහි පිහිටි ඉපැරණි ස්ථාන දෙකක් වේ. මෙම ස්ථාන පිළිබඳ විමසා බැලීමේ දී පෙනී යන වැදගත් කාරණය වන්නේ බුදුරදුන්ගේ ශාරීරික, පාරිභෝගික, උද්දේසික යන ත්‍රිවිධ චෛත්‍යය ම ඊට ඇතුළත් බවයි. අතීතයේ දී බහුල වශයෙන් මෙම ස්ථාන සියල්ල ම ආවරණය වන පරිදි වන්දනා කිරීමට මෙරට ජනතාව හුරු පුරුදු ව සිටියහ. වැඩි ම දින ගණනක් ගත කරමින් බෞද්ධයින් විසින් සිදු කරන ලද මෙම වන්දනාව **වට වන්දනාව** වශයෙන් සැලකෙයි.

අතීතයේ පටන් මෙරට බෞද්ධ ජනතාව වන්දනා ගමන් යෑම ඉතා සැලසුම් සහගත ව දැඩි ඕනෑකමකින් යුතු ව සිදු කොට ඇත. එහි දී එකිනෙකා අතර ඉතා සුහද එකමුතුකමක් පැවති අතර වන්දනා ගමන් බිමන්වල දී අන්‍යෝන්‍ය සහයෝගය කැපී පෙනෙන ලක්ෂණයක් විය. අතීතයේ වන්දනා චාරිකා සිදුවූයේ පා ගමනිනි. ඉන් පසු ගැල්වලින් ද පසුව ලොරි රථ හා බස්රථවලින් ද වන්දනා ගමන් සිදු විය. අතීතයේ තිබූ දුෂ්කර ම ගමන් දෙක වූයේ ශ්‍රීපාද වන්දනාව හා කතරගම වන්දනාවයි. ගමනාගමන කටයුතු දුෂ්කර වකවානුවල දී වන්දනා කටයුතු සඳහා ගත කිරීමට සිදු වන දින ගණන අවිනිශ්චිත විය. ගමනෙහි දුෂ්කරතාව නිසා ඇති වන ජීවිත අවදානම සලකා සිය දේපොළ ඉඩකඩම් පවා ඇතැම් අවස්ථාවල සමීප ඥාතීන්ට පවරා වන්දනාවෙහි යෙදුණු පිරිස් සිටියහ. පැරැන්නෝ සෑම වර්ෂයක ම පූජනීය ස්ථාන වන්දනය නොවරදවා කළ යුත්තක් ලෙස සැලකූහ. එම ගමන් බිමන්වල දී ගායනය සඳහා තෝරා ගත්තේ ද තෙරුවන් ගුණ කියැවෙන කවි හා සීපද ය. එසේ භාවිත කළ කව්පොතක් වශයෙන් **තුන් සරණය** හැඳින්විය හැකි ය. පහත දැක්වෙන්නේ එයට අයත් කවියකි.

බුද්ධං සරණේ සිරස දරාගෙන
ධම්මං සරණේ සිත පහදාගෙන
සංඝං සරණේ සිවුරු දරාගෙන
ඉන්දැයි තුන් සරණේ අදහාගෙන

මෙවැනි කවි මගින් පාළුව, කාන්සිය, විඩාව දුරු කර ගත හැකි විය. මෙම ගායනාවලින් ශ්‍රද්ධාව ජනනය වන්නේ නිරායාසයෙනි.

## සිද්ධස්ථාන වන්දනාව හා බැඳුණු පුද සිරිත්

වන්දනා ගමන් යෑමේ දී පැරැන්නෝ සාමූහික වශයෙන් එහි නිරත වූහ. එම සමූහය හඳුන්වන ලද්දේ වන්දනා නඩය යනුවෙනි. එහි ප්‍රධානියා නඩේ ගුරා ය. වන්දනා ගමන් යෑමේ දී චාම්, සරල, විනීත අයුරින් සැරසීම සිරිතක් විය. සකසුරුවම සුරැකෙන අයුරු කටයුතු කිරීමත් සංවර ඇඳුමින් සැරසී එම ගමන් යාමත් සිදු කළහ. එසේ ම පැරැන්නෝ ආහාර ගැනීම විනීත ව සිදු කළ අතර පොදු ස්ථාන අපවිත්‍ර නොකළහ. වැසිකිළි කැසිකිළි පරිහරණයෙන් පසු එම ස්ථාන නිසි පරිදි පිරිසිදු කර යෑමට ද ඔවුහු අමතක නොකළහ.

**මෙසේ වන්දනා ගමන් යෑමේ දී පළමු ව ඒ පිළිබඳ නිසි දැනුමක් ලබා ගැනීම ඉතා වැදගත් වේ. තම මූලික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා පමණක් උවමනා දෑ ගමන් මලුවල අඩංගු විය යුතු ය.**

හරසුන් ක්‍රියාවන්ගෙන් මිදී අතීත සිරිත් විරිත් ආදර්ශයට ගනිමින් අර්ථවත් අයුරින් වන්දනා ගමන්වල නිරත විය යුතු ය. වන්දනා ගමන් හා බැඳුණු වත් පිළිවෙත් රැසක් ද ඇත. අපගේ මුතුන් මිත්තන් වන්දනා ගමන්වල දී අනුගමනය කළ සිරිත් විරිත් පිළිබඳ දැනුවත් වීම මෙහිදී ඉතා වැදගත් ය. පහත දැක්වෙන්නේ එවැනි සිරිත් විරිත් කිහිපයකි.

- වන්දනා ගමන පිටත් වීමට පෙර සහභාගි වන සියලු දෙනා ගමේ පන්සලට හෝ ළඟ ම පිහිටි සිද්ධස්ථානයකට හෝ ගොස් තෙරුවන් වැඳපුදා ගැනීම හා බාරහාර වීම
- වන්දනා ගමනෙහි නිරත වන කාලය තුළ නිර්මාංස ජීවිතයක් ගත කිරීම
- සංවර ඇඳුමින් සැරසීම
- වන්දනා කවි පමණක් ගායනා කිරීම
- වන්දනයට පෙර ස්නානය කොට පිරිසිදු වීම
- පූජා භූමිවලට ඇතුළු වීමේ දී සුදු ඇඳුමින් සැරසී සිටීම
- කට වරද්දා ගැනීම යනුවෙන් ද හැඳින්වෙන නොගැළපෙන වදන් පරිහරණය නොකිරීම
- පූජා ද්‍රව්‍ය පඬුරු ආදිය පිරිසිදු කොට රැගෙන යාම
- පැමිණෙන හා පිටත් වන වේලාවන් නොපැවසීම

- සාමූහිකත්වයට මුල් තැන දීම
- වැඩිහිටියන්ට ගරු කිරීම
- ගමනක දී ප්‍රධාන වැඩිහිටියකු පත් කර ගැනීම හා ඔහු 'නඩේ ගුරු' යනුවෙන් හැඳින්වීම
- කල්තබා ගත හැකි දේශීය ආහාර පාන සකස් කර ගෙන යෑම
- වෙහෙස දුරු කර ගැනීමට අම්බලම භාවිතය හා පැන් පහස නිවා ගැනීමට පිංතාලිය භාවිතයට ගැනීම

## ශ්‍රී පාද වන්දනාව

සාම්ප්‍රදායික ව පැවත එන වත්පිළිවෙත් අතුරින් ශ්‍රී පාද වන්දනාව හා බැඳුණු වත් පිළිවෙත් බොහෝ දුරට ආරක්ෂා වී පවතී. ශ්‍රී පාද වන්දනය සඳහා කවර මාර්ගයකින් ගමන් කළ ද ඉතා දුෂ්කර ලෙස දිගු දුරක් පා ගමනින් ම යා යුතු වීම මීට මූලික හේතුවක් බව පෙනී යයි.

මෙරට දහස් සංඛ්‍යාත බැතිමත්හු මහත් ශ්‍රද්ධාවෙන් වැඳ පුදා ගැනීමට උනන්දු වන ස්ථානයක් ලෙස ශ්‍රී පාදස්ථානය සැලකිය හැකි ය. ශ්‍රී පාද ලාංඡනය මත නළල තබා වන්දනාමාන කිරීමට ලැබීම තමන්ගේ භාග්‍යයක් ලෙස බෞද්ධයෝ කල්පනා කරති. දෙසැම්බර් මස සිට මැයි මස දක්වා කාල වකවානුව මේ සඳහා යොදා ගැනේ. ශ්‍රී පාද වන්දනය පැරණි වන්දනාමාන සම්ප්‍රදායයන් රැසක් හෙළිදරව් කරන කැටපතක් වැනි ය.

වර්තමානය වන විට සාම්ප්‍රදායික ව පැවති වන්දනා ගමන්වල බොහෝ වෙනස්කම් දක්නට ලැබේ. ඒ අතර වන්දනා ගමන් හුදු විනෝදය සඳහා ම පමණක් සිදු කරනු දක්නට ඇත. එහෙත් එම ගමන් හුදු විනෝද ගමන් විනා වන්දනා ගමන් නොවේ. මෙසේ කටයුතු කරන පිරිස් රටේ සංස්කෘතියට සිදු කරන්නේ අවමානයකි. සාම්ප්‍රදායික සිරිත් විරිත් හාස්‍යයට ලක් කිරීම හෝ නොසලකා හැරීම හෝ කිසි විටෙක සිදු නොකළ යුතු ය. එය මෙරට ජන සංස්කෘතියට සිදු කරන හානියකි. ඇතැමුන් වන්දනා ගමන් යන මුවාවෙන් සිදු කරන නොමනා කටයුතුවලින් සියලු බෞද්ධයින්ට සිදු වන්නේ මහත් අනර්ථයකි. වර්තමානයේ වන්දනාමාන කිරීමේ දී බොදු දරුවන් සිහි තබා ගත යුතු වැදගත් කරුණු රැසක් ඇත. එයින් කිහිපයක් පහත දැක්වේ.

- පූජනීය හා පෞරාණික වශයෙන් වැදගත් වන ස්ථානවල තම නම් ගම් සටහන් නොකිරීම
- අන් අයට කරදර වන පරිදි කෑකෝ ගැසීමෙන් වැළකීම
- නුසුදුසු ආහාර පාන භාවිත කිරීමෙන් වැළකීම
- නොගැළපෙන වදන් භාවිතයෙන් වැළකීම
- නුසුදුසු ගීත ගායනයෙන් හා වාදනයෙන් වැළකීම
- පූජනීය ස්ථානවල පෞරාණිකත්වයට හා ගෞරවයට හානිවන කිසිවක් නොකිරීම

## අර්ථාන්විත වන්දනයේ ප්‍රයෝජන

අර්ථවත් අයුරින් සැලසුම් සහගතව වන්දනාමානවල යෙදෙන විට සැලසෙන ප්‍රයෝජන රැසකි. මෙම කාලය තුළ පංචශීලය ආරක්ෂා වේ. සහයෝගය, සාමූහිකත්වය වර්ධනය වේ. අන් අයට උදවු කිරීමට අවස්ථාව සැලසේ. සුවපහසු ස්ථානයකට ගොස් විනෝදයෙන් කාලය ගත කිරීමට වඩා ආගමික ස්ථාන දැක පහන් සංවේගය ජනිත කර ගැනීම මෙලොව ජීවිතයට මෙන් ම පරලොව ජීවිතයට ද අතිශය වැදගත් වෙයි. වන්දනා ගමන් යෑම තුළ කණ්ඩායමක් ලෙස වැඩ කිරීමේ කුසලතාව ප්‍රගුණ වනු ඇත. සිද්ධස්ථාන වන්දනයෙන් ශ්‍රද්ධාව වැඩි දියුණු වන්නේ නිරායාසයෙනි. නොදුටු දේවල් සියැසින් දැක ඒ පිළිබඳ මනා දැනුම්වත් භාවයක් ද ඇති කර ගත හැකි ය. පොදුවේ ගත් විට අකුසල සිත් යටපත් වී කුසල සිත් පහළ වේ. පින් සිතුවිලි වැඩි දියුණු වේ.

### සාරාංශය

වන්දනා ගමන්වලට දිගු ඉතිහාසයක් ඇත. බුදු දහම මෙරටට ලැබීමත් සමග දිවයින පුරා වෙහෙර විහාර රැසක් ඉදි විය. ඒවා අතර අටමස්ථාන හා සොළොස්මස්ථාන ප්‍රධාන වේ. පැරැන්නන්ගේ වන්දනාමාන හා බැඳුණු සිරිත් විරිත් රැසක් ඇත. ශ්‍රීපාද වන්දනාව, කතරගම වන්දනය බෞද්ධයින් අතර වඩාත් සිත් ගත් ඒවා ය. වන්දනයේ දී අසංවර චර්යාවන්ගෙන් වැළකී, අර්ථාන්විත ව කටයුතු කිරීම ඉතා වැදගත් ය. අර්ථාන්විත වන්දනා ගමන්වලින් පුද්ගල සංවර්ධනය මෙන් ම සමාජ සංවර්ධනය ද සැලසේ.

## ක්‍රියාකාරකම

1. වන්දනා ගමන්වල දී අනුගමනය කළ යුතු සිරිත් විරිත් ලැයිස්තුවක් පිළියෙල කරන්න.

2. සොළොස්මස්ථාන හා අටමස්ථාන නම් කරන්න.

3. වන්දනාකරුවන් සඳහා යෝග්‍ය උපදෙස් පත්‍රිකාවක් සකස් කරන්න.

## පැවරුම

- ලංකා සිතියමක අටමස්ථාන හා සොළොස්මස්ථාන ලකුණු කරන්න.

## පුහුණුවට

මහියංගණං නාගදීපං කල්‍යාණං පදලාංඡනං
දිවා ගුහං දීඝවාපී චේතියංච මුතියංගණං
තිස්සමහා විහාරංච බෝධිං මරිචවට්ටියං
සොණ්ණමාලී මහා චේතිං ථූපාරාම භයාගිරිං
ජේතවනං සේල චේතිං තථා කාචරගාමකං
ඒතේ සෝළසඨානානි අහං වන්දාමි සබ්බදා

# 05

# සිහිය පිහිටුවා හුස්ම ගනිමු

වප් මඟුල් උළෙල සුදොවුන් රජතුමාට මෙන් ම රජ මාලිගයේ සියලු දෙනාට ද වැදගත් දිනයකි. කුඩා සිදුහත් කුමරු සමග කිරිමවුවරුන් ද මෙම ස්ථානයට පැමිණියේ රජු ඇතුළු රාජකීය පිරිස කුඹුරට බැස සීසාන අයුරු දැක බලා ගැනීමට ය. ප්‍රදේශය පුරා පැවතියේ උත්සවශ්‍රීයකි. වසරකට වරක් එළඹෙන මෙම සිත් ගන්නා සුලු අවස්ථාව දැක ගැනීමට රැස් ව සිටි සියල්ලෝ ම යුහුසුළු වූහ. සිදුහත් කුමරු රැක බලා ගැනීමට නිරන්තරයෙන් වෙහෙසුණු කිරිමවුවරුන්ගේ අවධානය නිමේෂයකට ගිලිහී ගියේ ය. සිදුහත් කුමරු හැරුණු විට සියල්ලන්ගේ සිත් උත්සවශ්‍රීයෙන් කුල්මත් විය. මේ අතර දඹ රුක් සෙවණේ සිසිල් පරිසරය කුමරුගේ සිත කෙමෙන් දැහැන්ගත කරවන්නට සමත් විය. කුමරු දෙස නෙත් යොමු කරන කිරිමවුවරුන්ට දක්නට ලැබුණේ විස්මිත දසුනකි. කුඩා සිදුහත් කුමරු දඹ රුක් සෙවණෙහි පලග බැඳගෙන භාවනානුයෝගී ව සිටියේ ය. නෙත් අදහාගත නොහැකි එම දසුනින් පුදුමයට පත් ඔවුහු රජු ඇතුළු පිරිසට මේ පිළිබඳ දැනුම් දුන්හ. පුතු පිළිබඳ දරු සෙනෙහස අභිබවා ගිය හැඟුමෙන් යුතු සුදොවුන් රජු සිය පුතුට වන්දනා කළේ ය. එය එතුමා සිදුහත් කුමරුට කළ දෙවන වැඳුමයි.

සිදුහත් කුමරු විසින් දඹ රුක් සෙවණේ පලග බැඳගෙන වඩන ලද්දේ ආනාපානසති භාවනාවයි. මෙම භාවනාව පිළිබඳ ඉගෙනුමට පෙර භාවනාවේ ඇති වැදගත්කම පිළිබඳව අප දත යුතු කරුණු රැසකි. ඉන් කිහිපයක් විමසා බලමු.

මිනිස් සිරුර සැකසී තිබෙන්නේ සිත, කය දෙකෙනි. මිනිසාගේ වර්ධනය යනු මෙම දෙ අංශයෙහි ම වර්ධනයයි. මිනිසාගේ පිරිහීම නම් මෙම දෙ අංශයේ ම පිරිහීම ය. දියුණු මිනිසකු බිහි වන්නේ නීරෝගී කයක් හා නීරෝගී මනසක් ඇති විට ය. කායික වර්ධනය සිදු කරන විවිධ ආහාර පාන ද ඖෂධ වර්ග ද ඇත. අප විවිධාරකාරයේ ව්‍යායාම මගින් සිදු කරන්නේ ද කායික වර්ධනයයි. කායික වර්ධනයට අප දක්වන සැලකිල්ල මානසික වර්ධනය කෙරෙහි ද දැක්වීම අතිශය වැදගත් වේ. පරිපූර්ණ මිනිසකු වීමට ද අවසානයේ සාංසාරික විමුක්තිය ලබා ගැනීමට ද මනසෙහි දියුණුව අත්‍යවශ්‍ය වේ. භාවනාව මගින් මානසික දියුණුව ද ශක්තිමත් භාවය ද වර්ධනය කර ගැනීම සියලු කටයුතුවල සාර්ථකත්වයට ඉවහල් වේ. බුදු දහමින් ලබා දෙන මූලික උපදෙස වන්නේ සියලු පව්

බැහැර කොට කුසල් සිත් වඩා සිත පිරිසිදු කිරීම ය. සිත එකඟකර ගැනීම ය. **සොරකු තවත් සොරකුට හෝ වෛරක්කාරයකු තවත් වෛරක්කාරයකුට හෝ කරන නපුරට, වැඩි නපුරක් අයහපතක් නොමගට යොමු කළ සිත නිසා සිදුවෙයි. එසේ ම මාපියන් හෝ අන් ඥාතියකු කරන යහපතට වැඩි යහපතක් සුමගට යෙදූ සිත නිසා සිදු වන්නේ යයි ධම්ම පදයෙහි දැක්වේ.** වැඩි දියුණු නොකිරීමෙන් අවැඩ සිදු කරන දේ අතර සිත ම ප්‍රධාන වේ. 'වැඩිදියුණු කිරීමෙන් හිතසුව සැලසෙන දේ අතර ද කිසිවක් සිතට දෙවෙනි වන්නේ නැත' යනු බුද්ධ වචනයයි. බුදු දහමින් ඒ සඳහා උගන්වා ඇති පිළිවෙත වන්නේ භාවනාවයි. භාවනා අතර ආනාපානසති භාවනාව වඩාත් සුව ගෙනෙයි.

**ආන යනු ආශ්වාසයයි. එනම් හුස්ම ගැනීමයි.**
**අපාන යනු ප්‍රශ්වාසයයි. එනම් හුස්ම පිට කිරීමයි.**
**සති යනු සිහියයි.**

**මේ අනුව,**
**හුස්ම ගැනීම හා පිට කිරීම පිළිබඳ සිහිය පිහිටුවීම ආනාපානසති භාවනාව නමින් හැඳින්වේ.**

ආශ්වාසය හා ප්‍රශ්වාසය නිරායාසයෙන් සිදු වන ක්‍රියාවලියකි. සාමාන්‍ය ජීවිතයේ දී මෙම ක්‍රියාවලිය පිළිබඳ අප තුළ අවධානය පිහිටුවා ගැනීමක් දක්නට නොමැත. හුස්ම ගැනීමත් හුස්ම පිට කිරීමත් පිළිබඳ සිහිනුවණ පිහිටුවීමට මගපෙන්වන භාවනාව ආනාපානසතිය නමින් හැඳින්වේ.

දූහුවිලි ඇවිස්සුණු බිමකට වැසි පොද වැටෙන විට එම දූහුවිලි ක්‍රමයෙන් තැන්පත් වේ. එසේ ම ආනාපානසති භාවනාවෙන් චංචල සිතුවිලි නිශ්චල වේ. එමගින් සිත සමාධි ගත වේ.

සිසුන්ට මෙම භාවනාව ප්‍රගුණ කිරීමෙන් ලබා ගත හැකි ප්‍රයෝජන රැසකි. අපගේ අනාගතය සාර්ථක කර ගැනීම සඳහා බොහෝ දේ දැන උගත යුතු ය. විවිධ ආකාරයේ හැකියාවන් ප්‍රගුණ කර ගත යුතු ය. ඒ සඳහා උත්සාහය අත්‍යවශ්‍ය වේ. උත්සාහයෙන් නිසි ප්‍රයෝජන අත්පත් කර ගැනීමට නම් අප සිදු කරන කවර කටයුත්තක් වුව ද එකඟ වූ පිරිසිදු සිතින් කළ යුතු ය. එකඟ නොවූ අපිරිසිදු සිතින් කරන කිසිදු කටයුත්තකින් නිසි ප්‍රයෝජන ගැනීම අසීරු ය. විභාගවලින් මෙන් ම අනිකුත් කටයුතුවලින් ද ඉහළ ජයග්‍රහණ ලබන අය ඇත. එම සියලු ජයග්‍රහණ තුළ සැඟවුණු රහස නම් මනා සිහිය යි. කිලිටි වූ වස්ත්‍රයකට කෙතරම් සායම් පොවනු ලැබුව ද උරා නොගනී. එහෙත් පිරිසිදු වස්ත්‍රයකට වහා සායම් උරා ගනී. එසේ ම අපිරිසිදු වූ චංචල සිතින් යුතු ව කරන ඉගෙනීමේ කටයුතුවලින් නුවණ,

ධාරණය නොවැඩේ. උගන්වනු ලබන විෂය කරුණු පහසුවෙන් ධාරණය කර ගැනීමට පිරිසිදු එකඟ වූ සිතට ඉහළ හැකියාවක් ඇත. පාඩම මනසට හොඳින් කාවැදේ. තැන්පත් හා සුවපත් වූ මනස ඕනෑ ම පුද්ගලයකු සාර්ථකත්වය කරා රැගෙන යයි.

## භාවනාවට සූදානම් වෙමු

භාවනාවට පෙර ඇඟ පත මුහුණ කට සෝදා පිරිසිදු විය යුතු ය. දෙවනුව අවශ්‍ය පූජා ද්‍රව්‍ය පිළියෙල කොට තබා තෙරුවන් වැඳිය යුතු ය. තෙවනුව පන්සිල් සමාදන් විය යුතු ය. සිව්වනුව භාවනාවට එළඹිය හැකි ය.

ආනාපානසති භාවනාව ප්‍රගුණ කිරීමේ දී ගැහැනු දරුවන් අර්ධ පර්යංකයෙන් ද පිරිමි දරුවන් බද්ධ පර්යංකයෙන් ද සිටීම වඩාත් සුදුසු ක්‍රමය වේ. අසනීප තත්ත්වයක් නිසා බිම වාඩි විය නොහැකි අයකුට මිටි අසුනක් පරිහරණය කිරීමේ හැකියාව පවතී. භාවනා කිරීමේ දී හිස හා කය ඍජු ව තබා ගැනීම අවශ්‍ය ය.



## නිවැරැදි ව භාවනා කිරීම

ඇස් පියාගෙන දොහොත් මුදුන් තබා සාධුකාර දී තෙවරක් නමස්කාරය කියන්න. තිසරණ සහිත පංචශීලය සමාදන් වන්න. ඇස් පියාගෙන හොඳින් හුස්ම ගන්න. සැහැල්ලුවෙන් පිට කරන්න. මෙසේ තෙවරක් කරන්න. අනතුරුව සුපුරුදු ආශ්වාස ප්‍රශ්වාසයට ඉඩ හරින්න. එහෙත් ආයාසයෙන් හුස්ම ඉහළ පහළ නොයවන්න.

**පියවර 1**

ආශ්වාස කරන විට හුස්ම වදින ස්ථානය පිළිබඳ නිවැරැදි අවබෝධයක් ලබා ගන්න. එය නාසයේ අග හෝ උඩු තොල මතුපිට විය හැකි ය. සිහිය පිහිටුවා ගත යුතු වන්නේ එසේ හුස්ම ගැටෙන ස්ථානයේ ය. ආරම්භයේ දී නාසයට ඇතුළු වන වාතය හෝ නාසයෙන් පිට වන වාතය ගැන නොසිතන්න. උඩු තොල මත හෝ නාසය අග ගැටෙන වාතය ගැන පමණක් අවධානය රඳවා ගන්න. ක්‍රමයෙන් භාවනාව ප්‍රගුණ කරන විට ආශ්වාස ප්‍රශ්වාස වාතය එම ස්ථානවල ගැටෙන ආකාරය මැනවින් පසක් වනු ඇත.

**පියවර 2**

මෙහි දී කළ යුත්තේ ආශ්වාස කරන වායුව උඩු තොල මත හෝ නාසය අග වදින විට එකයි යනුවෙන් මෙනෙහි කිරීමයි. දෙවන වර ආශ්වාස කරන විට දෙකයි යනුවෙන් මෙනෙහි කරන්න. මෙසේ ආශ්වාස වායුව පස්වතාව දක්වා ගණනය කරන්න. එමගින් සිත ක්‍රමයෙන් සන්සුන් වේ. ආශ්වාස වායුව නාසය අග හෝ තොල් අතර ගැටෙන අයුරු ඔබට මැනවින් දැනෙනු ඇත. ශිෂ්‍යයකු වශයෙන් ආනාපානසති වැඩීමට අදාළ පියවර කිහිපයකි. භාවනා කරන්නකු විසින් අවසානයේ සිදු කළ යුතු ප්‍රාර්ථනයක් ඇත.

**මාගේ මේ භාවනාමය කුසලය මෙලොව සැනසීම පිණිසත්, පරලොව සැනසීම පිණිසත්, නිවන් සුවයෙන් සැනසීම පිණිසත්, හේතු වේවා. වාසනා වේවා. සාධු! සාධු! සාධු!**

## සාරාංශය

කුසල් සිත් වැඩෙන මානසික අභ්‍යාසය භාවනාවයි. හුස්ම ගැනීම හා පිට කිරීම මෙනෙහි කරමින් සිදු කරන භාවනාව ආනාපානසති භාවනාවයි. එමගින් මෙලොව සැනසීමත් පරලොව සැනසීමත් නිවනත් උදා කර ගත හැකි ය. අපගේ අධ්‍යාපන කටයුතු වඩාත් හොඳින් කිරීමට නම් අපට පිරිසිදු එකඟ සිතක් තිබිය යුතු ය. ආනාපානසති භාවනාව ඒ සඳහා මහඟු පිටිවහලක් සපයයි.

## ක්‍රියාකාරකම

1. ආනාපානසති භාවනාව වඩන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

2. ආනාපානසති භාවනාව වඩන ශිෂ්‍යයකු සඳහා සුදුසු උපදෙස් පත්‍රිකාවක් පිළියෙල කරන්න.

## පැවරුම

- ඔබට ලැබී ඇති උපදෙස් අනුව නිවසේ දී දිනපතා ආනාපානසති භාවනාව වඩන්න. ඒ සඳහා ගත කළ හැකි කාලය පිළිබඳ සටහනක් තබා ගන්න.

# 06

# රජගෙදරින් මෙහෙණවරට

සම්බුද්ධ ශාසනය බැබළවූ අතීත ගිහි පැවිදි ශ්‍රාවක ශ්‍රාවිකාවෝ ආදර්ශවත් බවින් අනූන වූහ. එම චරිත පිළිබඳ ව ලියැවී ඇති ගද්‍ය පද්‍ය නිර්මාණ අධ්‍යයනය කිරීමෙන් ඒ බව පැහැදිලි වේ. පැවිදි ශ්‍රාවිකා චරිත අතර ප්‍රජාපතී ගෝතමී චරිතය හා යසෝදරා චරිතය ප්‍රමුඛ වේ. එයට ප්‍රධානතම හේතුව ඒවා බුද්ධ චරිතය හා බැඳී පැවැතීම පමණක් ම නොවේ. පුද්ගල ජීවිත ආලෝකවත් කර ගැනීමට උපකාරී වන ආදර්ශ සමුදායක් එම චරිත තුළ අන්තර්ගත ව තිබීම ය.  රජ ගෙදර පැවැති අනන්ත සම්පත් හැර දමා පැවිදි ව මෙහෙණවරක වැඩවෙසෙමින් ආධ්‍යාත්මික සුවය ලැබූ එකී මෙහෙණින් වහන්සේලාගේ චරිතාපදාන විමසා බැලීමෙන් අප ජීවිතවලට ද ආදර්ශ ලබාගත හැකි ය.

## මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය

බුද්ධමාතා යන ගරු නාමයෙන් හැඳින්වෙන මහා ප්‍රජාපතී ගෝතමී දේවිය දෙව්දහනුවර අංජන රජුගේ හා යසෝදරා දේවියගේ දෙවන දියණියයි. වැඩිමහල් දියණිය මහාමායා වූවා ය. මේ දෙදෙනා ම සුදොවුන් මහරජතුමාගේ බිසෝවරුන් වූ අතර මහාමායා කුමරිය අගබිසව වූවා ය. ඇය සිදුහත් කුමරු ඉපදී සත් දිනකින් කලුරිය කිරීමෙන් අනතුරුව අගබිසෝ තනතුරට පත් වූයේ මහා ප්‍රජාපතීගෝතමී දේවියයි. ඇය නන්දා නම් වූ දියණියගේ හා නන්ද නම් පුතණුවන්ගේ මවයි. ළදරු වියේ සිටි නන්ද කුමරු හදාවඩා ගැනීම කිරි මවුවරුන්ට බාර කළ ඇය සිදුහත් කුමරු හදාවඩා ගැනීමේ වගකීම බාර ගත්තා ය. තම මවුකුසින් උපන් පුත් කුමරුට මෙන් ම සැලකිලි සත්කාර දක්වමින් සෙනෙහෙබර මවක වශයෙන් තම යුතුකම් නොපිරිහෙලා ඉටු කිරීමට ඇය වගබලා ගත්තා ය. බිළිඳු වයසේ පමණක් නොව ළමා හා තරුණ වයසේ දී ද ඕ තොමෝ කුමරු වෙනුවෙන් ඉටු විය යුතු යුතුකම් මැනවින් ඉටු කළා ය. සිදුහත් කුමරු ගිහිගෙය හැර යාම දැඩි සෝකය දනවන කරුණක් වූ බැවින් ඇය කල් ගෙවූයේ කඳුළු පිරි දෙනෙතිනි. පසුව එම දුක සමනය කරගනු ලැබුවේ තම පුත් නන්ද කුමරුන් ගැන සිතීමෙනි. සුදොවුන් රජතුමා ඒ වන විට නන්ද කුමරුට රජකම ලබා දීමට කටයුතු සංවිධානය කර තිබුණි. එහෙත් නන්ද කුමරුගේ අභිෂේකය (ඔටුනු පැලඳීම) විවාහය හා ගෘහ ප්‍රවේශය යන මංගල්‍ය තුන ම එළඹි දිනයේ බුදුරජාණන් වහන්සේ නන්ද කුමරු ද පැවිදි කරවූ සේක. එය ප්‍රජාපතී ගෝතමී බිසවගේ ශෝකී බව තව තවත් වර්ධනය කරලීමට හේතුවිය. මේ වනවිට සෝවන් ඵලයට පත් ව

සිටි තමන් ද පැවිදි කරවන ලෙසට ප්‍රජාපතී ගෝතමී බිසව කළ ඉල්ලීම ද බුදුරජාණන් වහන්සේ ප්‍රතික්ෂේප කළ සේක.

මේ අතර රෝහිණී නදියේ ජලය බෙදා ගැනීම අරබයා ශාක්‍යයන් හා කෝලියයන් අතර ගැටුමක් ඇති වූ අතර එය නිරාකරණය කිරීම පිණිස බුදුරජාණන් වහන්සේ කළ ධර්ම දේශනාව අසා කුමාරවරු පන්සියයක් දෙනා පැවිදි වූහ. ඉක්බිතිව ඔවුන්ගේ බිසෝවරුන්ට ද පැවිදි වීමේ අවශ්‍යතාව ඇතිවිය. එම පිරිස මුලින් ම තම අදහස දන්වා සිටියේ ප්‍රජාපතී ගෝතමී දේවියටයි. ඇය එම කුමාරිකාවන් පන්සිය දෙනා කැටුව බුදුරදුන් වැඩ සිටි කිඹුල්වත් නුවර නිග්‍රෝධාරාමයට ගියා ය. ඔවුහු බුදුරදුන් දෙපා වැඳ එකත්පස්ව සිට පැවිද්ද ආයාචනා කළහ. බුදුරදුන් එම දෙවන ඉල්ලීම ද ප්‍රතික්ෂේප කළේ කාන්තා පැවිද්දට සුදුසු කාලය නොවන බව සඳහන් කරමිනි. එයට ප්‍රතිචාර දක්වමින් ඔවුන් එතැනින් නික්ම ගියේ සුදුසු කල පැමිණි විට නැවතත් එම ආයාචනය කිරීමේ අරමුණ ඇතිව ය.

දිනක් ප්‍රජාපතී ගෝතමී දේවිය සියතින් ම සළු දෙකක් සකස් කොට බුදුරදුන්ට පිළිගැන්වීමට සූදානම් වූවා ය. බුදුරදුන් එය සංඝයාට පූජා කරන ලෙස අනුදන වදාළහ. ප්‍රජාපතීගෝතමී දේවියගේ ඉල්ලීම වූයේ එය බුදුරදුන් වෙනුවෙන් ම සකස් කළ බැවින් උන් වහන්සේ ම පිළිගත යුතු බවයි. පසුව බුදුරජාණන් වහන්සේ එහි අරුත් පැහැදිලි කර දෙමින් සඟසතු කොට පිදූවිට එය තමන් වහන්සේට ද කළ පූජාවක් වන බව පෙන්වා දුන් සේක.

බුදුරජාණන් වහන්සේගේ සම්බුද්ධත්වයට පත්ව වසර පහක් ඉකුත් වන විට සුදොවුන් පිය මහරජු රහත් ව පිරිනිවන් පා තිබිණ. එකල බුදුරදුන් වැඩ සිටියේ විශාලා මහනුවර කූඨාගාර ශාලාවේ ය. රජ මැදුර තුළ හුදෙකලා ජීවිතයක් ගත කළ ප්‍රජාපතීගෝතමී බිසව නැවත වතාවක් පැවිද්ද අපේක්ෂා කළා ය. මුලින් මේ සඳහා සම්බන්ධ වූ ශාක්‍ය කුමාරිකාවන් පන්සිය දෙනා ද සහභාගි කරගෙන බුදුරදුන් මුණ ගැසීමට යාමට තීරණය කළේ ඒ අනුව ය. ඔවුහු හිස මුඩු කරගෙන කසාවත් හැඳ පා ගමනින් ම දුර බැහැර පිහිටි කූඨාගාර ශාලාවට යෑමට සූදානම් වූහ. ඥාතීන් වූ ශාක්‍ය හා කෝලිය කුමාරවරුන් මේ පිරිස රථවලින් රැගෙන යාමට උත්සාහ කළ ද එම ඉල්ලීම ඇය ප්‍රතික්ෂේප කළේ තම අරමුණ ඉටුකර ගැනීමට එය ද බාධාවක් වේ යැයි සිතූ නිසා ය. ඔවුහු යොදුන් එකසිය පනහක් දුර ගෙවා පා ගමනින් විශාලා මහනුවර කූටාගාර ශාලාව දක්වා ගමන් කළහ.

ගමන් වෙහෙසින් පීඩාවට පත්ව සිටි ප්‍රජාපතී ගෝතමී බිසව ඇතුළු පන්සියයක් දෙනා කූටාගාර ශාලාව දොරටුව අබියස රැඳී සිටියහ. මේ පිරිස දුටු ආනන්ද තෙරණුවෝ එම ස්ථානයට වැඩම කොට එසේ රැඳී සිටීමට හේතු විමසා සිටියහ. ඔවුහු තමන් සියලු දෙනා ම පැවිද්ද අපේක්ෂාවෙන් රැඳී සිටින බව පැවසූහ. ආනන්ද තෙරණුවෝ බුදුරදුන්

වෙත වැඩම කළහ. බුද්ධමාතාව ඇතුළු පිරිස පැවිද්ද අපේක්ෂාවෙන් දොරටුව අභියස රැඳී සිටින බව දැනුම් දී එම පිරිසට පැවිද්ද ලබා දෙන ලෙස ආයාචනා කළහ. එම ඉල්ලීම බුදුරදුන් විසින් තෙවරක් ම ප්‍රතික්ෂේප කරන ලදි. එවිට ආනන්ද තෙරණුවෝ බුදුරදුන්ගෙන් මෙසේ විමසා සිටියහ.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස කිසියම් කාන්තාවක් සසුන් ගත ව විදසුන් වඩයි නම් ඇයට සෝවන් ආදී මාර්ග ඵල ලබා ගත නොහැකි ද?"

"ආනන්දයිනි, යම් ස්ත්‍රියක් පැවිදි ව වීර්ය වඩයි නම්, ඇයට ඇයගේ ස්ත්‍රී භාවය නිවනට බාධාවක් නොවේ."

එවිට ආනන්ද හිමියෝ ප්‍රජාපතීගෝතමී දේවිය සුළු මවක වශයෙන් නොව වැදූ මවක පරිද්දෙන් ගිහිකල බුදුරජාණන් වහන්සේට ලබාදුන් රැකවරණය හා සෙනෙහස ගැන සිහිපත් කරමින් ඇගේ උදාර ගුණ වර්ණනා කොට ඇයට පැවිද්ද ලබා දෙන ලෙස නැවතත් ආයාචනා කළහ. බුදුරජාණන් වහන්සේ එයට ප්‍රතිචාර දක්වමින් මෙසේ වදාළ සේක.

" ආනන්දයිනි, ප්‍රජාපතීගෝතමිය පැවිදි වනු කැමැතිනම් පෙර බුදුවරුන් දවස ශ්‍රාවිකාවන් පිළිගත් පහත සඳහන් අෂ්ට ගරු ධර්ම පිළිගැනීමෙන් ම ඇයට පැවිදි උපසම්පදාව හිමිවන්නේ යැ".

1. භික්ෂුණිය උපසම්පදා වී අවුරුදු සියයක් ගත වුව ද එදින ම උපසම්පදා වූ භික්ෂුවක දුටු විට හුනස්නෙන් නැගිටීම, නමස්කාර කිරීම ආදියෙන් ගරු සැලකිලි දැක්විය යුතු ය.
2. භික්ෂූන් වහන්සේලා නැති ප්‍රදේශවල ආරාමයන්හි භික්ෂුණිය වස් නොවිසිය යුතු ය.
3. අඩ මසකට වරක් වත් භික්ෂුණිය, භික්ෂූන් හමු වී පොහොය විචාරීම ද අවවාද ලබා ගැනීම ද කළ යුතු ය.
4. වස් විසූ භික්ෂුණිය, භික්ෂු - භික්ෂුණී යන දෙපක්ෂයේ (උභතෝ) සංඝයා ඉදිරියේ පවාරණය කළ යුතු ය.
5. භික්ෂුණියක අතින් ගරුක ආපත්තියක් (බලවත් වරදක්) සිදු වූ විට එයින් මිදී නැවත පිරිසිදු වීමට භික්ෂු - භික්ෂුණී යන උභතෝ සංඝයා ඇසුරෙහි වත් මානත්පුරා අබ්භාන නම් විනය කර්මය කළ යුතු ය.
6. භික්ෂුණිය උපසම්පදා වීමට පෙර ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති පුරමින් සික්ඛාමාණාවක වශයෙන් දෑවුරුද්දක් පුහුණු විය යුතු ය.
7. භික්ෂුණියක කිසි ම හේතුවක් නිසා වත් භික්ෂුවකට ආක්‍රෝෂ පරිභව නොකළ යුතු ය.
8. භික්ෂුණිය, භික්ෂූන්ට අවවාද නොකළ යුතු ය. භික්ෂුව භික්ෂුණීන්ට අවවාද කළ යුතු අතර භික්ෂුණිය ඒවා පිළිගත යුතු ය.

අෂ්ට ගරු ධර්ම නම් වූ මේ කරුණු අට ආනන්ද තෙරණුවෝ ප්‍රජාපතී ගෝතමී දේවියට දැනුම් දී ඒවා පිළිගන්නේනම් ඇයට එය ම පැවිද්ද හා උපසම්පදාව වේයැයි දැනුම් දුන්හ. එවිට ප්‍රජාපතී ගෝතමිය බුදුරජාණන් වහන්සේ වැඩ සිටින දිසාවට නමස්කාර කරමින් එම ධර්මයන් ඉහළින් ම පිළිගන්නා බවට තෙවරක් ම ප්‍රතිඥා දුන්නා ය. අෂ්ට ගරු ධර්ම පිළිගැනීමත් සමග ඇයට පැවිද්ද හා උපසම්පදාව හිමි විය. එතුමියත් සමග සිටි සෙසු කුමාරිකාවන්ට ද පැවිද්ද ලබා ගැනීමට අවස්ථාව උදා වුණි. මේ සියලු දෙනා පැවිද්ද ලබා ගැනීම භික්ෂුණී සමාජයේ සමාරම්භය විය. ඒ වන විට බුද්ධ ශාසනය ආරම්භ වී වසර පහක් ඉකුත් වී තිබුණි.

බුදුරජාණන් වහන්සේගෙන් බණ අසා කමටහන් ලබාගෙන වීර්ය වඩා භාවනා කළ ප්‍රජාපතී ගෝතමී තෙරණියෝ නොබෝ දිනකින් රහත් වූහ. එතුමියගේ පිරිවර පන්සියයක් වූ භික්ෂුණීන් වහන්සේලා ද බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද නන්දකෝවාද සූත්‍රය ශ්‍රවණය කොට රහත් බවට පැමිණියෝ ය. මෙසේ භික්ෂුණී සමාජය ආරම්භ වීමත් සමග බමුණු දහමින් පීඩාවට පත් බොහෝ කාන්තාවන්ට විමුක්තියේ දොරගුලු විවර විය. ඒ සඳහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය ගත් උත්සාහය අපමණ ය. විශාලාවේ ලිච්ඡවී රජදරුවන් මෙහෙණවරක් කරවා ප්‍රජාපතී ගෝතමී තෙරණිය ප්‍රමුඛ භික්ෂුණීන්ට පූජා කිරීමත් සමග භික්ෂුණී ආරාම ද ඇතිවිය.

බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයේ වැඩවිසූ එක් අවස්ථාවක දී උන් වහන්සේ විසින් භික්ෂු භික්ෂුණීන් ඉදිරියේ ප්‍රජාපතී ගෝතමී තෙරණිය චිරරාත්‍රඥ (ශාසනයේ දීර්ඝ කාලීන අත්දැකීම් ඇති) භික්ෂුණීන් අතර අග්‍රස්ථානයට පත් කරන ලදි. භික්ෂුණී සමාජයේ ප්‍රධානියා බවට ද පත් කෙරිණි. පසුව යසෝදරා දේවිය හා ජනපද කල්‍යාණී වැනි බිසෝවරු ද භික්ෂුණී සමාජයට ඇතුළත් වූහ. භික්ෂුණීන් වහන්සේලාගේ විනය පවත්වා ගෙන යාමට අදාළ භික්ඛුණී ප්‍රාතිමෝක්ෂය පනවන ලද්දේ ද ප්‍රජාපතී ගෝතමී තෙරණියගේ ඉල්ලීම අනුව ය. එසේ ම භික්ෂුණීන් වෙනුවෙන් පනවන ලද ඇතැම් විනය නීති වෙනස් කිරීමට පවා පෙළඹුණේ ඇයට කරන සැලකිල්ලක් වශයෙනි. විශේෂයෙන් ඇය දැඩිලෙස ගිලන් වූ අවස්ථාවක බුදුරජාණන් වහන්සේ ඇය විසූ මෙහෙණවරට වැඩම කර සුවදුක් විමසා බලා ධර්මය දේශනා කළහ. මේ වනවිට භික්ෂුණීන් වහන්සේලා වැඩවාසය කරන ආරාමයකට භික්ෂූන් වහන්සේලාට වැඩම කිරීම තහනම් විය. නමුත් රෝගී භික්ෂුණියකට සෙත් පැතීම සඳහා වැඩම කරලීම වරදක් නොවී ය. එය සිදු වූයේ මහාප්‍රජාපතී ගෝතමී මෙහෙණින් වහන්සේගේ ඉල්ලීම අනුව ය.

වයස අවුරුදු එකසිය විස්සේ දී ප්‍රජාපතී ගෝතමී තෙරණියට පිරිනිවන් පෑමට කාලය එළඹ ඇති බව වැටහිණ. ඊට පෙරාතුව බුදුරජාණන් වහන්සේ දැක වැඳ පරිනිර්වාණය සඳහා අවසර ගැනීමට අදහස් කළ ඕ තොමෝ උන් වහන්සේ වැඩ සිටි විශාලා මහනුවර කූටාගාර ශාලාවට වැඩම කළහ. එසේ වැඩම කොට ගාථා රැසකින්

බුදුරජාණන් වහන්සේගේ ගුණ වර්ණනා කළහ.

- ස්වාමීනි ඔබ වහන්සේට මා දැක්වූ දරු සෙනෙහසට වඩා ඔබ වහන්සේගේ ශ්‍රාවිකාවක වන මට දැක්වූ සෙනෙහස දහස් වාරයක් උතුම් ය. මම ඔබ වහන්සේට කිරි දී නළවා සැනසුවෙමි. ඔබ වහන්සේ මට දහම් අමා කිරි දී සසර දුකින් මුදවා සැනසූහ. මහා මුනීන්ද්‍රයන් වහන්ස, පුතුන් නැති ස්ත්‍රීහු ඔබ වහන්සේ වැනි පුත්හු ම ලබත්වා. රාජ මාතාව, බිසව යන නම් ස්ත්‍රියකට සුලබ ය. එහෙත් බුද්ධ මාතා යන නම අතිශයින් ම දුර්ලභ ය.”

ඒ අවස්ථාවේ බුද්ධ මාතාවන් පිරිනිවන් පාන බව දිවැසින් දැක අසූ මහා ශ්‍රාවකයන් වහන්සේලා ද මෙම අවස්ථාවට වැඩම කළහ. මහා ප්‍රජාපතීගෝතමී තෙරණින් වහන්සේ මේ සියලු දෙනා වහන්සේගෙන් සමුගෙන බුදුරදුන් ඉදිරියේ ඍද්ධි ප්‍රාතිහාර්ය දක්වා උන් වහන්සේගේ සිරිපතුල් වැඳ අවසර ගෙන ආරාමයෙන් බැහැර වීමට සූදානම් වූහ. එහිදී දුකට පත්ව සිටින භික්ෂුණීන් වහන්සේලා අමතා මෙවන් අවවාදයක් ද ලබාදුන්හ.

“ ඔබ මට ගරු කරන්නේ නම් කළගුණ සලකන්නේ නම් සියලු දෙනා ම සද්ධර්මයේ පැවැත්ම කෙරෙහි මහත්සේ වීර්ය කළ යුතු ය. මගේ ඉල්ලීම නිසා ස්ත්‍රීන්ට ද පැවිද්ද ලැබුණි. එබැවින් ඔබ ද මා අනුව කටයුතු කරන්න. එය මට මහත් සතුටකි.”

මේ ප්‍රකාශයෙන් පසු ආරාමයෙන් පිටතට වැඩම කළ ප්‍රජාපතී ගෝතමී තෙරණියට විශේෂ ගෞරවයක් වශයෙන් බුදුරජාණන් වහන්සේ ද මෙසේ වදාළහ.

“මහණෙනි, මේ බුද්ධ මාතාවෝ සියලු උත්තමයන්ගේ ගෞරවයට හිමිකාරියක් වන්නාහ. එබැවින් සැම දෙනා පසු පසින් ගමන් කරමු” අනතුරුව බුදුරජාණන් වහන්සේ ශ්‍රාවකයින් පිරිවරාගෙන විහාර දොරටුව දක්වා පසු පසින් ගමන් කළහ. එය බුදුරදුන්ගේ පළමු හා අවසාන පසුගමන් කිරීම විය. බුද්ධ මාතාවනට හිමි වූ උත්තම ආචාරය ද එය විය. එසේ බුද්ධ උපහාරය ලැබ පිරිනිවන් පෑ ප්‍රජාපතී ගෝතමී තෙරණියගේ ශ්‍රී දේහය ආනන්ද තෙරුන් වහන්සේගේ උපදෙස් මත ලිච්ඡවී රජ දරුවෝ ගරු බුහුමනින් යුතුව ආදාහනය කළහ. පසුව එතුමියගේ ධාතු තැන්පත් කොට ලිච්ඡවීන් විසින් ස්තූපයක් ද කරවන ලදි.

## ප්‍රජාපතී ගෝතමී තෙරණියගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ

- සැබෑ දාරක ස්නේහයෙන් යුතු ගුණ ගරුක මවක් වීම
- අධිෂ්ඨාන පූර්වක ව කටයුතු කිරීම
- වඩාත් සාමකාමී පිළිවෙතකින් ඉල්ලීම් දිනා ගැනීමට කටයුතු කිරීම
- අනතිමානි ගුණයෙන් යුක්ත වීම
- නිසි නායකත්වය හා කැපවීම
- නිරහංකාර බව

## භද්ද කච්චානා තෙරණිය

භද්දකච්චානා නම් රාහුල මාතාවයි. එනම් යසෝදරාවයි. බිම්බා දේවි නමින් ද එතුමිය ප්‍රකට ය. තම ස්වාමියා කෙරෙහි මහත් බැඳීමෙන්, පති භක්තියෙන් කටයුතු කළ බෞද්ධ කාන්තා චරිත අතර ප්‍රමුඛත්වය හිමිවන්නේ යසෝදරාවන්ට ය. ඒ නිසා ම බෞද්ධ සාහිත්‍යය තුළ වැඩි ඉඩක් යසෝදරා චරිතයට වෙන් වී ඇත. පැරණි සාහිත්‍යයට පමණක් නොව නූතන ගද්‍ය පද්‍ය නිර්මාණවලට ද එම චරිතය වස්තු විෂය වී ඇත. පැරණි ජනකවියා යසෝදරා චරිතය මැනවින් අවබෝධ කරගෙන කාව්‍ය නිර්මාණ කළ බවට එක් නිදසුනකි, යසෝදරාවත. ඇය ගේ සැබෑ පතිභක්තිය විචිත්‍රවත් කිරීමට ජන කවියා ගත් උත්සාහය පහත සඳහන් කවියෙන් මනාව පැහැදිලි වේ.

කැලේ තිබෙන කොයි දේවත් රස වේවා
මලේ බඹරු මෙන් පිරිවර ඇති වේවා
අව්වේ තිබෙන රැස්මාලා අඩු වේවා
ගව්වෙන් ගව්ව දිව මාලිග සැදේවා

යසෝදරාවතෙහි ඇතුළත් පද්‍ය එකසිය තිහ තුළ ම යසෝදරා දේවියගේ පතිභක්තිය මැනවින් ප්‍රකට වේ. එතුමියගේ මව සහ පියා වූයේ දඹදිව දෙව්දහ නුවර වාසය කළ සුප්‍රබුද්ධ රජතුමා සහ අමිතා නම් බිසව ය. දෙව්දත් කුමරු එක ම සොහොයුරා ය. එකල ශාක්‍ය ජනපදයේ විශිෂ්ට රූ සපුවකට හිමිකම් කියූ ජනපද කල්‍යාණි කුමරියටත් භද්දාකාපිලානි නම් වූ බ්‍රාහ්මණ කුමරියටත් වඩා විශිෂ්ට රූප සම්පත්තියෙන් යුතු වූවා ය. දහස් ගණන් ශාක්‍ය කුමාරවරු ඇය සරණ පාවා ගැනීමට අපේක්ෂාවෙන් පසු වූහ. සියලු ශාක්‍ය වංශික රජදරුවන් ඉදිරියේ සිදුහත් කුමරු තමා උගත් ශිල්ප දැක්වීමෙන් පසු සුප්‍රබුද්ධ පිය රජතුමා විසින් තම දියණිය සිදුහත් කුමරුට විවාහ කරදෙනු ලැබී ය. මේ දෙදෙනා එක ම දිනයේ උපන් අය වූහ. විවාහයෙන් පසු කිඹුල්වත් නුවර අගරජු බවට පත් සිදුහත් කුමරුගේ අග බිසව ලෙස ඇයට කිරුළ හිමි විය.

යුග දිවියට පත් යසෝදරා දේවිය සෙනෙහෙබර බිරිඳක වශයෙන් තම යුතුකම් නොපිරිහෙලා ඉටු කළා ය. පින්බර රාහුල පුතු ඉපදීමෙන් ඇය වාසනාවන්ත මවක් වූවා ය. පුතු උපන් දින ම සිදුහත් කුමරු ගිහිගෙය හැරයාම ඇයට ඉවසුම් නොදෙන වේදනාවක් විය. මෙතෙක් කල් ගෙවූ සොඳුරු ජීවිතය සිදුහත් කුමරුගේ අභිනිෂ්ක්‍රමණයත් සමග ඇයට අහිමි විය. මේ කාලයේ ශාක්‍ය කුමාරවරුන්ගෙන් ඇයට විවාහ යෝජනා ගලා ආවේ ය. නමුත් සිහිනෙන්වත් එවන් කුමරුවකුගේ අත ගැනීම ඈ සිත් නොගත්තේ ය. ඕ තොමෝ තම පුත් රාහුල කුමරුන් සමග සුදොවුන් පිය මහ රජුගේ රැකවරණයෙහි විසුවා ය. ගිහිගෙය හැර පැවිදි වූ සිදුහත් බෝසතුන් පිළිබඳව සොයා බලමින් තම ජීවිතය ද බෝසත් චරිතය අනුව ගෙවීමට යොමු වූවා ය. එතුමන් උස් ආසන මහ ආසන පරිහරණය කිරීමෙන්

වැළකී සිටින බව දැන ඇය ද ඒවායින් වැළකී සිටියා ය. ඇය දිනකට එක් වේලක් ආහාර ගැනීමටත් කසාවත් හැඳීමටත් යොමු වූයේ සිදුහත් තවුසාණන් එබඳු ජීවිතයක් ගත කරන බව දැන ගැනීමෙනි. එපමණක් නොව එතුමා කෙස් කලඹ කපා දමා හිස මුඩුකරගෙන සිටින බව දැන ඇය ද ඝන නීල වර්ණයෙන් යුත් දිගු කෙස්වැටිය කපා දැමුවා ය. සිදුහත් තවුසාණෝ නොබෝ දිනකින් බුද්ධත්වය ලබා තමන්ට ද විමුක්ති සුවය ලබාදීමට කටයුතු කරනු ඇතැයි යන ස්ථිර සිතුවිල්ලෙන් ඇය රාහුල පුතු ද රැකගනිමින් කාලය ගත කළා ය. ගිහිගෙය අතැර ගොස් සය අවුරුද්දකට පසුව සිදුහත් බෝසතුන් සම්මා සම්බුද්ධත්වයට පත් වූ බව අසා ඇය බොහෝ සෙයින් සතුටට පත් වූවා ය.

බුද්ධත්වයෙන් පළමු වර්ෂයේ බුදුරදුන්ගේ පළමු කිඹුල්වත් පුර ගමන සිදුවිය. ඒ පිය රජතුමාගේ ආරාධනාවකට අනුව ය. විසිදහසක රහතන් වහන්සේලා පිරිවරාගෙන වඩිනා බුදුරජාණන් වහන්සේ පිළිගැනීමට යසෝදරා දේවිය පෙර ගමන් නොගියා ය. දෙවන දින රහතන් වහන්සේලා පිරිවරාගෙන මහ මග පිඩු සිඟා වඩිනා බුදුරජාණන් වහන්සේ දෙස රාහුල කුමරුන් සමග ඇය බලා සිටියේ කඳුළු පිරි දෙනෙතිනි. දෙතිස් මහා පුරුෂ ලක්ෂණවලින් හා අසූ අනුව්‍යංජනයන්ගෙන් යුතුව සවණක් ඝන බුදුරැස් විහිදුවමින් මහ මග වඩින බුදුරදුන් රාහුල කුමරුගේ පියාණන් ලෙස  හඳුන්වා දුන්නේ උන් වහන්සේගේ ගුණ වර්ණනා කරමිනි. පෙර දවස රජසැප විඳිමින් කල් ගෙවූ නගරයේ ම අද දවසේ බුදුරදුන් පිඬුසිඟා වැඩීම කිසිසේත් විඳදරා ගත නොහැකි විය. සුදොවුන් රජතුමාට ඒ බව දැන්වූයේ ද ඇයයි.

එවිට සුදොවුන් රජතුමා බුදුරදුන් වඩින පෙරමගට ගොස්, "ස්වාමීනී, අපට ලජ්ජා කරමින් පිඩුසිඟා වඩින්නේ කුමකට ද? මේ පිරිසට ආහාර ලබා දීමේ අපොහොසත්කමක් මට තිබේද?" යි බුදුරදුන්ගෙන් විමසා සිටියේ ය.

"මහරජ මේ අපේ වංශයේ සිරිත" යැයි බුදුරජාණන් වහන්සේ සුදොවුන් රජුට වදාළහ.

"ස්වාමීනි, අපේ වංශය මහා සම්මත ක්ෂත්‍රිය වංශයයි. එහි කිසිවකු සිඟමනේ ගොස් නැත," යනුවෙන් සුදොවුන් රජතෙමේ පැවැසුවේ ය.

"මහරජ, ඒ ඔබේ වංශයයයි. අපේ වංශය බුද්ධ වංශයයි. එහි චාරිත්‍රය මෙයයි," බුදුරජාණෝ වදාළහ.

ඒ වෙලාවේ රජතුමාගේ බලවත් ඉල්ලීම මත බුදුරදුන් ප්‍රමුඛ මහරහතන් වහන්සේ මාලිගයට වැඩම කරවා දන් පිළිගන්වනු ලැබිණි. දන් වළඳා අවසන් වූ පසු යසෝදරා දේවිය හැර රජමැදුරෙහි සියලු දෙනා ම පැමිණ එකත්පස්ව උන්හ. සුදොවුන් රජතුමා යසෝදරා දේවියට ද එහි පැමිණෙන ලෙසට දන්වා යැවී ය. එයට ඈ ප්‍රතිචාර දක්වූයේ මේ අයුරිනි.

"සිද්ධාර්ථ කුමාරයෝ ඉතා දැඩි සිත් ඇත්තෝ ය. තපසට යන විට නොකියා ම ගියහ. උන් වහන්සේට මා පක්ෂපාතීව වාසය කර ඇත්නම් උන් වහන්සේ මා දැකීමට වැඩමවනු ඇත. එවිට මා කැමැති පරිදි වඳිමි."

සුද්ධෝදන රජතුමා ඒ බව බුදුරජාණන් වහන්සේට දන්වා සිටියේ ය.

එවිට බුදුරජාණන් වහන්සේ යසෝදරාවන්ගේ ගුණවත්කම සිහිකොට ඇය වෙසෙන මන්දිරයට පිය රජතුමාත් සමග වැඩම කළහ. දුක දරාගත නොහැකි වූ යසෝදරා දේවිය උන් වහන්සේගේ දෙපා මුල වැඳ වැටී හැඬුවේ පියකුගේ පා අල්ලා හඬන දියණියක පරිද්දෙනි. පසුව ඇය ලජ්ජාවෙන් යුතුව තමා කළ දේ සිහි කොට බියෙන් පසෙකට වූවා ය. අනතුරුව සුදොවුන් රජ තෙමේ ඒ මොහොතේ ඇගේ කඳුළෙන් බුදු සිරිපා තෙත් කිරීම වරදක් නම් එයට සමාව දෙන ලෙස ඉල්ලා සිටියේ ය. එසේ ම පසුගිය වසර හත තුළ පතිභක්තිය මඳක් හෝ අඩු නොකොට ඇය ගෙවූ ජීවිතය පිළිබඳව දීර්ඝ විස්තරයක් ද කළේ ය. එය අසා සිටි බුදුරජාණන් වහන්සේ පෙර භවයන්හි දී ද ඇය පතිභක්තියෙන් යුතුව දිවි ගෙවූ බව හැඟවූයේ චන්ද කින්නර ජාතකය දේශනා කරමිනි.

"රජතුමනි මැය රහත්වන ජාතියේ ඔබ වැනි මයිලණු කෙනෙකුගේ ආරක්ෂාව ඇති ව සිටිය දී මට පක්ෂපාතී ව කල් ගෙවීම පුදුමයක් නොවේ. පෙර නුවණ නොමේරූ අවධියෙහි ද සඳකිඳුරුව උපන් කල බරණැස් රජ මැය කෙරෙහි ඇති කරගත් ඇල්මෙන් හීයෙන් විද මා බිම හෙළා තමන්ගේ දොළොස් දහසක් පමණ වූ අන්තඃපුර ස්ත්‍රීන්ට නායක කොට අගබිසෝ තනතුර ලබා දෙන්නෙමි යැයි ඉල්ලූ අවස්ථාවේ ද එයට අවනත නොවී මා කෙරෙහි ප්‍රේමයෙන් ඇයගේ පතිව්‍රතා ධර්මයේ අධිෂ්ඨානයෙන් මාගේ ජීවිතය රැක ගත්තා" යැයි දේශනා කරමින් එතුමියගේ ගුණ වර්ණනා කළහ. එයින් ඉමහත් සතුටට පත් යසෝදරා දේවිය බුද්ධ ශාසනයේ පැවිද්ද ඉල්ලා සිටියා ය. එහෙත් ඇයගේ ඉල්ලීම එම අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ ප්‍රතික්ෂේප කළහ.

කිඹුල්වත්පුර දින කිහිපයක් වැඩ සිටි බුදුරජාණන් වහන්සේ ශාක්‍යයන්ට ධර්මය දේශනා කළහ. හත්වන දිනයේ රජමාලිගයේ දානයට වැඩම කළ විට යසෝදරා දේවිය තම පුත් රාහුල කුමරුට පියාණන් පෙන්වා දායාද ඉල්ලාගෙන එන ලෙස දන්වා යැවුවා ය. පුත් රාහුල කුමරු ද බුදුරදුන් සමීපයට ගොස් දායාද ඉල්ලී ය. එවිට බුදුරජාණන් වහන්සේ රාහුල කුමරුන් විහාරස්ථානයට රැගෙන ගොස් ශාසනික දායාද හිමිකර දෙමින් පැවිදි කරවූ සේක. ඒ පුවත දැන ගැනීමත් සමග ඇය දැඩිසේ කම්පාවට පත් වූවා ය. සිදුහත් කුමරු ගිහිගෙය හැරයාම නිසා හටගත් දුක ඇය විසින් තුනී කරගනු ලැබුවේ රාහුල පුතු නිසා ය. තම පුතුගේ පැවිදි වීමත් සමග ඇය බලවත් ලෙස දුක් වූවා ය. එහෙත් ඇය එය ද සම සිතින් විඳ දරා ගත්තා ය. සුදොවුන් රජුගේ අභාවයත් සමග සසුන්ගත වීමේ අවශ්‍යතාව ඇයට තදින් දැනුණ ද ඒ වන විට භික්ෂුණී පැවිද්ද නොතිබුණි.

භික්ෂුණී පැවිද්ද ආරම්භ වීමෙන් පසු යසෝදරා දේවිය නන්ද කුමරුගේ බිසව වූ ජනපද කල්‍යාණිය ද සමග ගොස් ප්‍රජාපතිගෝතමී තෙරණින් වහන්සේගෙන් පැවිද්ද ලැබුවා ය. එතැන් සිට ඈ ප්‍රසිද්ධ වූයේ භද්දකච්චානා නමිනි. ඉතා කෙටිකලක දී භාවනා කොට රහත් වූ භද්දකච්චානා තෙරණියට එක්වර අසංඛ්‍ය කල්ප ලක්ෂයක් ආත්මභාව සිහි කිරීමට සමත් අභිඥා (විශිෂ්ට ඥානයක්) පහළ විය. එම ඥානය භික්ෂුණීන් අතරින් හිමිකරගත හැකි වූයේ භද්දකච්චානා තෙරණියට පමණි. ඒ තුළින් කාන්තාවනට ද නුවණ දියුණු කර ගැනීමෙන් උසස් ඥානයක් ලබාගත හැකි බව එකල සමාජයට පෙන්නුම් කිරීමට ද හැකිවිය. බුදුරජාණන් වහන්සේ භික්ෂුණීන්ට තනතුරු ප්‍රදානය කරන අවස්ථාවේ භද්දකච්චානා තෙරණියගේ එම සුවිශේෂී හැකියාව හැඳින ඇය අභිඥාලාභීන් අතර අග්‍රස්ථානයට පත් කළහ. පැවිද්ද ලබාගත් දින පටන් භද්දකච්චානා තෙරණිය ශාසන අභිවෘද්ධිය වෙනුවෙන් මහත් කැපවීමකින් ක්‍රියා කළා ය. ඒ අතර ඇයට දරුණු උදරාබාධයක් වැලඳුණි. රාහුල හිමියන් ඇය බැහැදැකීමට භික්ෂුණී ආරාමයට වැඩිය විට එම රෝගී තත්ත්වය දැන ගැනීමට ලැබුණි. ප්‍රතිකාර විමසීමේ දී අඹ පැණි පානයෙන් එය සුවපත් කරගත හැකි බව එතුමියගෙන් දැන ගන්නට ලැබුණි. රාහුල හිමියෝ තම ගුරු හිමියන් වූ සැරියුත් තෙරණුවන්ට ඒ බව දැන්වූහ. උන් වහන්සේ කොසොල් රජමාලිගයට වැඩම කොට අඹ පැණි ලබාගෙන විත් භද්දකච්චානා තෙරණියට පිළිගැන්වූහ. එම පානයෙන් තෙරණිය සුවපත් වූවා ය.

වයස අවුරුදු හැත්තෑ අටේ දී එතුමිය පිරිනිවන් පාන්නට තීරණය කරනු ලැබුවේ බුදුරදුන් ජීවමාන සමයේ ම එය සිදුවිය යුතුයැයි යන අදහස ඇතිව ය. බුදුරජාණන් වහන්සේ වැඩ සිටි විශාලා මහනුවර කූටාගාර ශාලාවට වැඩම කොට තම අදහස දැන්වූවා ය. බුදුරජාණන් වහන්සේගේ අනුදැනුම ඇතිව ප්‍රාතිහාර්ය දැක්වූ භද්දකච්චානා තෙරණියෝ පෙර ආත්ම භවයන්හි තොරතුරු ප්‍රකාශ කොට බුදුරදුන්ගේ සිරිපා නමස්කාර කර අවසර ගෙන පිරිනිවන් පෑ සේක.

## යසෝදරා චරිතයෙන් කාන්තාවන්ට ලබා ගත හැකි ආදර්ශ

- පති භක්තියෙන් කටයුතු කළයුතු බව
- නෑදි මයිලණුවන්ට යටහත් ව, කීකරු ව විසියයුතු බව
- ගුණගරුක මෑණි කෙනකු වියයුතු බව
- නිරහංකාර වියයුතු බව
- චාම් සරල ජීවන රටාවක් පවත්වාගෙන යායුතු බව
- නිකැලැල් චරිතයකින් යුක්ත වියයුතු බව
- විශිෂ්ට ඥානයෙන් යුක්ත වියයුතු බව
- ඕනෑම ගැටලුවක දී ඉවසීමෙන් කටයුතු කළයුතු බව

## සාරාංශය

රජ ගෙදර පැවැති සම්පත් හැර දමා පැවිදි ව මෙහෙණි අසපුවක වැඩ වෙසෙමින් ආධ්‍යාත්මික සුවය ලැබූ රහත් මෙහෙණින් වහන්සේලා අතර මහා ප්‍රජාපතීගෝතමී තෙරණිය හා භද්දකච්චානා තෙරණිය සුවිශේෂ වෙති. එසේ වන්නේ මේ දෙදෙනා ම බුද්ධ චරිතය හා සෘජු සබඳතාවක් පැවැතීම පමණක් ම නොව ආදර්ශවත් චරිතවලින් යුක්ත වීමත් ශාසන අභිවෘද්ධියට කළ උතුම් සේවයත් නිසා ය. විශේෂයෙන් ආධ්‍යාත්මික දියුණුවට ස්ත්‍රීත්වය බාධාවක් නොවන බව මේ චරිත දෙකෙන් දෙන වැදගත් ආදර්ශය වන්නේ ය. අද දවසේ අපේ ජීවන චරිත ගොඩ නගා ගැනීමට ද මේ චරිත බෙහෙවින් වැදගත් වනු ඇත.

## ක්‍රියාකාරකම

1. මහා ප්‍රජාපතීගෝතමී තෙරණිය හා භද්දකච්චානා තෙරණියගේ චරිත තුළ ඔබ සිත්ගත් ගුණාංග දෙක බැගින් ලියන්න.

2. යසෝදරා චරිතය තුළින් පතිභක්තිය ඉස්මතු වන අවස්ථා දෙකක් නම් කරන්න.

3. "ප්‍රජාපතී ගෝතමී මෑණියෝ" යන මාතෘකාවට අදාළ ව ඔබ ලියන රචනයට ඇතුළත් කළ යුතු කරුණු පෙළ ගස්වන්න.

## පැවරුම

- යසෝදරා දේවිය පිළිබඳව ලියැ වී ඇති කවි හා ගීත එකතු කොට කුඩා පොතක් සකස් කරන්න.

# 07 ධම්ම පදයෙන් බිඳක්

මෙලොව පරලොව දියුණුව මෙන් ම නිවන් අරමුණ ද සපුරා ගැනීම සඳහා සදුපදේශ සපයන ධම්ම පදය, බෞද්ධ දර්ශනයේ එන ගැඹුරු ධර්ම කරුණු සරල උපමා භාවිතයෙන් විස්තර කරන වටිනා ධර්ම ග්‍රන්ථයකි. එහි දී උගත් නූගත් ලොකු කුඩා සියලු දෙනාට ගෝචර වන අන්දමට එදිනෙදා ජීවිතයේ නෙත ගැටෙන සංසිද්ධි ද පාදක කොට ගෙන කරුණු විස්තර කරන අයුරු අපූරු ය. ගාථා 423 ක් ද වග්ග හෙවත් පරිච්ඡේද 26ක් ද ධම්ම පදයෙහි දක්නට ලැබේ. සූත්‍ර පිටකයේ පස්වන කොටස වන ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථ 15න් එකක් වන ධම්ම පදය අගනා දහම් කරුණු පාලි පද්‍ය අනුසාරයෙන් ඉදිරිපත් කිරීම විශේෂත්වයක් වේ.

## සුකරානි අසාධූනි

යහපත් දෙයක් කළ හැක්කේ යහපත් සිතිවිලි ඇති අයකුට ම ය. එම ක්‍රියාවෙන් ඔහුගේ යහපත් බව තව තවත් දියුණු වේ. එසේ වුවත් එය එතරම් පහසු කාර්යයක් නොවේ. උඩු ගං බලා පිහිනීමක් වැනි දුෂ්කර කාර්යයකි. එමෙන් ම තමාට අයහපත පිණිස පවතින දේ සිදු කිරීම පහසු ය. ජලය පහළට ම ගලා යන්නාක් මෙනි. මේ බව පැහැදිලි කෙරෙන ගාථාවක් ධම්ම පදයේ ඇතුළත් වේ. එම ගාථා දේශනාවට පසුබිම් වූ කථා පුවතක් ද ඇත.

රජගහ නුවර බිම්බිසාර මහරජතුමා විසින් පුදන ලද වේළුවන නම් ආරාමයේ බුදුරජාණන් වහන්සේ වැඩ සිටින සමයේ පිඬු පිණිස හැසිරෙන අනඳ මාහිමියන් දුටු දේවදත්ත තෙරණුවෝ උන් වහන්සේට මෙසේ පැවසූහ.

“ඇවැත්නි, මම අද පටන් බුදුරදුන් ද මහා සංඝයා ද හැර මට පක්ෂපාතී සංඝයා සමග පොහොය කරමි, අනෙක් විනය කර්ම ද කරමි.”

පිණ්ඩපාතයෙන් පසුව වෙහෙරට වැඩි ආනන්ද තෙරණුවෝ දෙව්දත් තෙරුන් විසින් ප්‍රකාශ කරන ලද සියල්ල බුදුරදුන්ට දන්වා සිටියහ.

එම අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළ සේක.

සුකරානි අසාධූනි
අත්තනෝ අහිතානි ච
යං වේ හිතං ච සාධුංච
තං වේ පරම දුක්කරං

(ධම්ම පදය - අත්ත වග්ගය)

අයහපත් දෑ මෙන් ම තමාට අහිත පිණිස හේතුවන දෑ ද පහසුවෙන් කළ හැකි ය. යහපත් දෑ මෙන් ම තමාට හිතකර වූ දේ කිරීම ඉතා ම දුෂ්කර ය.

## සුද්ධි අසුද්ධි පච්චත්තං

සැවැත් නුවර චුල්ලකාළ නම් උපාසක කෙනෙක් ධාර්මික ව ජීවත් විය. ඔහු සෑම දිනකම රාත්‍රියෙහි වෙහෙරට ගොස් බණ අසා අලුයම් වේලාවෙහි ගෙදර බලා යයි. දිනක් අලුයම් වේලාවේ සොරුන් ගෙයක් බිඳ ධනය පැහැර ගන්නා කල්හි ගෙහිමියෝ අවදි වූහ. පැහැරගත් ධනය රැගෙන සොරු පලා ගියහ. ගෙහිමියෝ සොරුන් පසු පස ලුහුබඳින්නට වූහ. කර කියා ගත හැකි කිසිවක් නැති වූ එක් සොරෙක් බණ අසා ගෙදර යන චුල්ලකාළ උපාසක අසලට සොරබඩු දමා සැඟවී පලා ගියේ ය.



ගෙහිමියෝ චුල්ලකාළ උපාසකත් තම නිවසේ භාණ්ඩත් දැක මෙතෙම සොරා යැයි සිතා පහර දෙන්නට වූහ. උදෑසන ජලය ගෙනයාමට පොකුණට පැමිණි දාස ස්ත්‍රීහු මොහු හොඳ උපාසකයකු බවත් කිසිවකුට වරදක් නොකරන අයකු බවත් විවිධාකාරයෙන් කරුණු කියා ඔහු ගලවා ගත්හ.

චුල්ලකාළ උපාසක තුමා විහාරයට ගොස් තමාට සිදුවූ හදිසි කරදරය භික්ෂූන් වහන්සේලාට හෙළි කළේ ය. භික්ෂූන් වහන්සේ වෙතින් තොරතුරු දැනගත් බුදුරජාණන් වහන්සේ පහත සඳහන් ගාථාව වදාළහ.

**අත්තනාව කතං පාපං**
**අත්තනා සංකිලිස්සති**
**අත්තනා අකතං පාපං**
**අත්තනාව විසුජ්ඣති**
**සුද්ධි අසුද්ධි පච්චත්තං**
**නාඤ්ඤෝ අඤ්ඤං විසෝධයේ**
**(ධම්ම පදය - අත්ත වග්ගය)**

තමා විසින් ම කරන ලද පාපය තමා කිලිටි කරන්නේ ය. තමා විසින් නොකරන ලද පාපය තමා පිරිසිදු කරයි. පිරිසිදු බව හෝ අපිරිසිදු බව තම තමා අත ම පවතින්නකි. කෙනෙක් තව කෙනකු පිරිසිදු නොකරයි.

මෙම දේශනා අනුව බැලීමේ දී පැහැදිලි වන්නේ අපගේ ජීවිත නිවැරැදි මග ම ගමන් කරවීමට යහපත් ක්‍රියා විශාල පිටුබලයක් සපයන බවයි.

පළමු ගාථාවේ එන සාධු යන්නෙන් අදහස් වන්නේ යහපත් චර්යාවන් ය. අසාධු යනු අයහපත් චර්යාවන් ය. ඒ ඒ සංස්කෘතික, ආගමික, සාමාජික පරිසරය අනුව හොඳ නරක පිළිබඳ අර්ථ නිරූපණ විවිධ ස්වරූප ගත හැකි ය. මෙහි දී අර්ථවත් වන්නේ බෞද්ධ ඉගැන්වීම් අනුව යහපත් දේ යන්න ය. බුදු දහම තුළ පෞද්ගලික සුබ සිද්ධිය උදෙසා අදාළ කරගත හැකි ප්‍රායෝගික ඉගැන්වීම් සමුදායක් පවතී.

**පස්පවින් වැළකීම**
**දස අකුසලයෙන් වෙන්වීම**
**පරාභව කරුණුවලින් බැහැර වීම**

වැනි ප්‍රකට කරුණු කිහිපයක් පිළිබඳව වුව ද සලකා බැලීමෙන් ඒ බව තහවුරු වේ. අසාධු ධර්මයන්ගෙන් වෙන්වීම පහසු නොවේ. එම නිසා පළමු ගාථාවෙන් අයහපත් දෑ සිදු කිරීම පහසු බව දේශනා කොට තිබේ. "**කරන කලට පව් මිහිරිය මී සේ**" යැයි වීදාගම මා හිමියන් ලෝවැඩ සඟරාවේ දී ප්‍රකාශ කළ පරිදි පව්කම් කිරීම මී පැණි මෙන් රසවත් ය; පහසු ය; විනෝදය සතුට ගෙන දෙයි. එහෙත් එය තාවකාලික ය. එහි ප්‍රතිඵල අපගේ මෙලොව යහපත වළකාලන අතර භවගාමී දිවිපැවැත්ම ද කටුක එකක් බවට පත්කිරීමට හේතු වේ.

දෙව්දත් තෙරණුවන් උපතින් රාජකීයයෙකි. එහෙත් උන් වහන්සේ තමාගේ හැකියාවන් තමාගේ අයහපත පිණිස ම භාවිත කළ බැවින් තමා උපදවාගත් අභිඥාවලින් ද පිරිහී ගියහ; අපායගාමී වූහ. අපාය යනු පිරිහීම, **සැප නැති තැන** යන අර්ථ දෙන පදයකි. අප ද පහසු වුවත් සුන්දර වුවත් අයහපත් දෑ සිදු කළහොත් අපගේ දිවිය ද සැප අහිමි, දුෂ්කර, කටුක තත්ත්වයකට පත් වීම නිරනුමාන ය. එබැවින් සිසුන් වන අපට ද මතුවන ගැටලු හා දුෂ්කරතා විඳ දරා ගනිමින් ඇප-කැප වී අධ්‍යාපන කටයුතුවල නිරත වුව හොත් උසස් දිවි පැවැත්මක් නිර්මාණය කර ගත හැකි ය. නූතන සමාජයේ ඉහළින් ම වැජඹෙන බොහෝ දෙනා එසේ ඇප-කැප වීම තුළින් තම ජීවිතය උසස් තත්ත්වයකට පත්කර ගත් අය වන බවට බොහෝ තොරතුරු සපයා ගත හැකි ය.

දෙව්දත් තෙරණුවන් අයහපත් දෑ සිදු කිරීමෙන් තමා පමණක් පිරිහීමට පත්වූවා නොවේ. හෙතෙම තම මිත්‍රයා වූ ශ්‍රද්ධාවන්ත අජාසත්ත මහ රජතුමා ද පිතෘඝාතක ආනන්තරිය පාපකර්මයට යොමු කළේ ය. එපමණක් නොව දේවදත්ත තෙරණුවන් අනුගමනය කළ භික්ෂූහු ද අයහපතට යොමු කරවන ලදහ. අසත්පුරුෂයා තමා පමණක් පිරිහෙන්නේ නොවේ. ඔහු ආශ්‍රිත සමාජය ද පරිහානියට යොමුකරවන්නෙකි. මේ තත්ත්වය මනාව වටහා ගෙන අප අසාධු චර්යා දුරු කළ යුතු අතර එවැනි අපචාරී චර්යා සහිත අය ඇසුරු නොකිරීමට ද උත්සාහ කළ යුතු ය; පුරුදු විය යුතු ය. කිරි කළයට ගොම බිඳුවක් වැටීමෙන් එය සම්පූර්ණයෙන් ම නිෂ්ප්‍රයෝජන වේ. එම නිසා අපගේ සාධුසම්මත ජීවිත නමැති කිරි කළයට අසාධු චර්යා නමැති ගොම බිඳුවක් එකතු වීමට ඉඩ නොතබා කටයුතු කරමු. එය එතරම් පහසු කාර්යයක් නොවනු ඇත. නමුත් පියවරෙන් පියවර අපි ඒ සඳහා පුහුණු වෙමු; සාධුචර්යාවන්ට ම යොමුවෙමු. එයින් ජීවිතයට ලැබෙන ආලෝකය විශාල ය.

අප කෙතරම් නිවැරැදි වුවත් නොකළ වරදකට වැරැදිකාරයකු වී ඇණුම්-බැණුම්, දඬුවම් විඳීමට සිදු වන අවස්ථා ඇත. නිවැරැදි අපට යමකු දඬුවම් කළත් අප වැරැදිකාරයන් වන්නේ නැත. මක්නිසා ද යත් අප වරදක් සිදුකොට නොමැති බැවිනි. අල්ලෙහි තුවාලයක් නැතිනම් මොන තරම් විෂක් අතින් ගනු ලැබුවත් ශරීරයට විෂ ඇතුළු නොවෙන බව බුද්ධ දේශනාවයි.

අපි කිසියම් වරදක් කළෙමු නම් එයින් කිලිටි වූ චරිත ඇත්තෝ වෙමු. උපක්‍රමයකින් හෝ නීතියේ රැහැනින් මිදී සිටියත් තම හෘද සාක්ෂ්‍යය අනුව තමා වැරැදිකාරයෙක් ම වන්නේ ය. ඊට උරුම වන දුක් විපාකයෙන් අත මිදීම පහසු නොවේ. අප මෙලොව වශයෙන් කායික මානසික පීඩාවලට යොමු වන්නේ ය. පරලෝක වශයෙන් අපායාදී දුක්වලට භාජනය වන්නේ ය. අප විසින් කළ යුතු වන්නේ පව්කම්වල විපාක දැන හඳුනාගෙන ඒවායින් ඈත් ව සිටීමයි. රෝගයක් ඇති වූවාට පසු එයට පිළියම් කරනවාට වඩා රෝගයෙන් වැළකී සිටීම වඩාත් සුදුසු ය යන්න බෞද්ධ උපදේශයයි.

තමා විසින් කරන ලද අයහපත් ක්‍රියා නිසා තමා අපිරිසිදු වනවා මෙන් ම තමා විසින් කරන ලද යහපත් ක්‍රියා නිසා තමා පිරිසිදු වීම ද සිදු වේ. කෙනකු පිරිසිදු වන්නේ හෝ අපිරිසිදු වන්නේ ඔහුගේ ක්‍රියා කලාපය අනුව ය.

මගධාධිපති අජාසත් රජුගේ පූර්ණ අනුග්‍රහය ලැබුණේ වී නමුත් දෙව්දත් තෙරණුවන්ට කළකම්වලින් ගැළවීමට නොහැකි විය. එසේ ම නොකළ වරදකට තාඩන-පීඩන ලද චුල්ලකාළ උපාසකතුමා ආධ්‍යාත්මික වශයෙන් ජීවිතය උසස් ම තත්ත්වයකට පත් කර ගත්තේ ය. එම නිසා අපි ද කළ වැරැදි විවිධ අයථා ක්‍රම මගින් සඟවා නොගෙන නොකළ වැරැදිවලට හසු නොවී කල්පනාකාරී ව කටයුතු කරමු.

## සාරාංශය

තමාගේ අයහපත පිණිස හේතුවන දෑ පහසුවෙන් කළ හැකි අතර තමාට හිතකර වූ යහපත් දේ කිරීම ඉතා ම දුෂ්කර ය.

තමා විසින් කරන ලද පාපය තමා කිලිටි කරන්නේ ය. තමා විසින් නොකරන ලද පාපය තමා පිරිසිදු කරයි. පිරිසිදු බව හෝ අපිරිසිදු බව හෝ තම තමා අත ම පවතින්නකි. කෙනෙක් තව කෙනකු පිරිසිදු නොකරති.

## ක්‍රියාකාරකම

1. මෙම ගාථා නිවැරැදි උච්චාරණයෙන් යුතු ව තාලයකට ගායනා කරන්න.

2. මෙම ගාථා ඇසුරෙන් අපට ලබාගත හැකි උපදෙස් ඇතුළත් තීරු ලිපියක් රචනා කරන්න.

## පැවරුම

- මෙම පාඩමේ ඇතුළත් ධම්ම පද ගාථාවල අර්ථ ඇතුළත් වන සේ පද්‍ය නිර්මාණය කරන්න.

# 08

# උතුම් පැවැත්මෙන් දිවි මං සරු කරමු

මිනිස් දිවිය උසස් කිරීමට මගපෙන්වන ඉගැන්වීම් රැසක් බුදු දහමෙහි ඇතුළත් ය. එබඳු ගුණාංග අතුරින් සිව් බඹ විහරණවලට හිමි වන්නේ සුවිශේෂ ස්ථානයකි. මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා යනු එම බඹ විහරණ සතරයි. මෙම ගුණාංග බ්‍රහ්ම විහාර, බ්‍රහ්ම විහරණ යනුවෙන් ද හැඳින්වේ. බ්‍රහ්ම යන්නෙහි උතුම්, ශ්‍රේෂ්ඨ යන අරුත් ඇතුළත් ය. විහරණ යන්නෙහි පැවැත්ම, වාසය කිරීම යන අරුත් ඇත. ඒ අනුව බ්‍රහ්ම විහරණ යනු උතුම් පැවැත්ම යන්නයි. මෙම විහරණ සතර **චතු අප්පමඤ්ඤා** යනුවෙන් ද හැඳින්වෙයි. සිව් බඹ විහරණ උසස් මට්ටමින් ප්‍රගුණ කිරීම බ්‍රහ්මයාට සමාන වීමක් ලෙස සැලකෙයි. දෙමාපියන් මහා බ්‍රහ්මයාට උපමා කොට ඇත්තේ ද මෙම උසස් ගුණාංග දෙමාපියන් දරුවන් කෙරෙහි පතුරුවන බැවිනි.

## මෙත්තා

මෙත්තා යනු හිතවත් බවයි; සැබෑ මිත්‍රත්වයයි. නැතහොත් මෛත්‍රියයි. මිතුරකු පිළිබඳ තමා තුළ ඇති හිතවත් භාවයට සමාන හිතවත් භාවයක් සියලු ජීවීන් කෙරෙහි ඇති කර ගැනීම මෛත්‍රී භාවනාවෙන් සිදු වෙයි. මිත්‍රත්වය සියලු ජීවීන් කෙරෙහි ම දැක්වීම උසස් මානුෂික ගුණාංගයකි. සැබෑ මිතුරා සිය මිතුරාට අවැඩක්, විපතක් වෙනවාට අකැමැති වේ. ඔහු මිතුරාගේ දියුණුව ම අපේක්ෂා කරයි. මිතුරා සම්බන්ධයෙන් ඇති කර ගන්නා වූ එම හිතවත්කම තමා අප්‍රිය කරන, අමනාප අය සම්බන්ධයෙන් ද ඇති කර ගැනීම මෛත්‍රියයි. මෙම තත්ත්වය උසස් හැසිරීමක් වන්නේ ආයාසයකින් තොර ව තමාට හමු වන ඕනෑ ම අයකු සම්බන්ධයෙන් හිතවත් බවක් ගොඩනගා ගැනීමට හැකියාවක් පවතී නම් පමණි. කිසිවක් අපේක්ෂාවෙන් යමකු කෙරෙහි ඇති කර ගන්නා බැඳීම මෛත්‍රිය නොවේ. සෑම අයකු කෙරෙහි ම එබඳු ලාභාපේක්ෂාවකින් තොර ව ඇති අව්‍යාජ වූ සැබෑ හිතවත්කම මෛත්‍රියයි. මෛත්‍රී සහගත සිතුවිලි සහිත පුද්ගලයා සියලු ජීවීන් සැපෙන් සිටිනු දැකීමට කැමැති වෙයි. නිරන්තරයෙන් මෙවැනි සිතුවිල්ලක් පවත්වා ගැනීමට නම් එය භාවනාවක් ලෙස ප්‍රගුණ කළ යුතු ය. එසේ සිත ප්‍රගුණ කිරීම මෛත්‍රී භාවනාව යනුවෙන් අපි හඳුන්වමු. මේ ආකාරයෙන් සිත ප්‍රගුණ කිරීම මෙත්තා විහාරය යනුවෙන් ද හැඳින්වේ. කරණීයමෙත්ත සූත්‍රයේ සඳහන් වන ආකාරයට මෛත්‍රිය වැඩීමේ

දී මවක තම එක ම පුතුට දක්වන හිතවත්කමට සමාන හිතවත්කමක් සියලු ජීවීන් කෙරෙහි පැතිරවිය යුතු ය.

## කරුණා

අන් අයට විපතක් කරදරයක් දුකක් ඇති වූ විට ඒ පිළිබඳ ඇති වන අනුකම්පා සහගත සිතින් ක්‍රියා කිරීම කරුණාවයි. බුදුරජාණන් වහන්සේ දිනපතා උදෑසන මහා කරුණා සමාපත්තියෙන් ලෝකය දෙස බලා පිහිට විය යුතු අයට පිහිට වූ සේක. කරදර විපත් පැමිණි විට ඕනෑ ම අයකු අසරණ විය හැකි ය. උස්, පහත්, ධනවත්, දුප්පත් කිසිදු භේදයක් ඊට බලනොපායි.

අසරණයකු දුටු විට ඔහුට පිහිට විය යුතු ය යන හැඟීම නිරායාසයෙන් සිත තුළ ජනිත වන්නේ නම් එය බ්‍රහ්ම විහාරයකි. පෞද්ගලික හිතවත්කම් හෝ නෑ සබඳතා හෝ මත උදවු උපකාර කිරීමට ඉදිරිපත් වන ස්වභාවය සැබෑ කරුණාව නොවේ. කාරුණිකත්වය මැනවින් ප්‍රගුණ කළ තැනැත්තා ජාතිය, කුලය හෝ නෑදෑ හිතවත්කම් හෝ නොසලකා කටයුතු කරයි. දුකකට කරදරයකට පත් වන කවරකුට වුව ද අන් අයගේ උදවු උපකාර අවශ්‍ය වේ. එසේ උදවු උපකාර කිරීමට පෙළඹීමක් ඇති වන්නේ කරුණා සහගත සිතිවිලි ඇති විට පමණි. වර්තමානයේ සහකම්පනය යනුවෙන් හැඳින්වෙන්නේ ද මෙම ගුණයයි. මිනිසුන් කෙරෙහි පමණක් නොව, කරදර විපත්වලට ගොදුරු වන සියල්ලන් කෙරෙහි ම උදවු උපකාර කිරීමට යොමු වීම කරුණාවේ ස්වභාවයයි. තම නිවසේ ඇති දඩි වන සුරතල් සතුන්ට දක්වන ආදර සැලකිල්ල එවැනි ම වූ වෙනත් සත්ත්වයින් කෙරෙහි ද දැක්වීම නිදසුනක් ලෙස පෙන්වා දිය හැකි ය. කිසියම් මනුෂ්‍යයකු හෝ තිරිසන් සතකු හෝ දුකට, අසරණ භාවයට පත් ව ඇති අවස්ථාවක දී උපකාර කිරීමට යොමු වන්නේ කාරුණික අයෙකි. කරුණාවෙන් පිරුණු පුද්ගලයින් වෙසෙන සමාජයක අසරණයින් අඩු වේ. එකිනෙකාට උදවු උපකාර කර ගන්නා සමාජයක් සුඛිත මුදිත වනු ඇත. කරුණා සිතුවිල්ල ප්‍රගුණ කිරීම කරුණා භාවනාව වශයෙන් හැඳින්වේ. කරුණාව මැනවින් ප්‍රගුණ කළ තැනැත්තා අන් අයගේ දුකට පිහිට වෙයි; විවිධ ආකාරයෙන් නොමගට යොමු වූවන් සුමගට ගැනීමට කටයුතු කරයි.

## මුදිතා

අන් අයගේ දියුණුව දැක එම දියුණුව තමාට ඇති වූවක් සේ සලකා සතුටට පත් වන ස්වභාවය මුදිතාවයි. ඕනෑ ම පුද්ගලයකු වඩා කැමැති වන්නේ තම දියුණුව ය. තමාගේ දියුණුව දැක සතුටු වනවා සේ ම අන් අයගේ දියුණුව දැක සතුටු වීම ද උසස් ගුණාංගයකි. සැපතට පත් තැනැත්තා තම හිතවතකු හෝ ඥාතියකු හෝ නම් එවිට ඇති වන සතුට මුදිතා ගුණයක් ලෙස සැලකිය නොහැකි ය. නෑදෑ හිතවත්කම් කිසිත් නොමැති ව ඕනෑ ම

පුද්ගලයකුගේ දියුණුවක දී ආයාසයකින් තොර ව සතුටට පත් වීමට හැකි වීම මුදිතා බ්‍රහ්ම විහාරය ලෙස සැලකිය හැකි ය. මුදිතා ගුණය පුද්ගලයා තුළ නිරායාසයෙන් ජනිත වන සිතිවිල්ලක් නොවේ. එම ගුණය ආයාසයෙන් වර්ධනය කර ගත යුත්තකි. පුහුදුන් මිනිසා තුළ වැඩි වශයෙන් ජනිත වන සිතිවිල්ල ඊර්ෂ්‍යාව ය. මෙම සිතිවිල්ල යටපත් කර ගැනීමට අප මුදිතා ගුණය ප්‍රගුණ කළ යුතු ය; මේ සඳහා වැඩිය යුත්තේ මුදිතා භාවනාව ය.

## උපෙක්ඛා

ලෝකයේ හා ජීවිතයේ ස්වභාවය පිළිබඳ මනා වැටහීමක් සහිත ව කවර තත්ත්වයක් හමුවේ වුව සිතෙහි සමබර බව පවත්වාගෙන යාමට ඇති හැකියාව උපේක්ෂාවයි. එහෙත් කුසීත බව හෝ අනුවණකම හෝ නිසා කිසිවක් ගණන් නොගන්නා ස්වභාවය උපේක්ෂාව නොවේ. දුක සැප දෙකේ දී මනස සමබර ව පවත්වාගෙන යාම උසස් තත්ත්වයකි. එසේ වුව ද පුද්ගලයාගේ සාමාන්‍ය ස්වභාවය දුකේ දී දුක් වීම ය. සැපයේ දී සතුටු වීම ය. දුක සැප දෙකෙහි දී ම සමබර සිත් පවත්වාගෙන යාම බ්‍රහ්මවිහාරයකි. පුද්ගලයින් හා වස්තු කෙරෙහි අසීමිත බැඳීම් ඇති කර ගැනීම ද ගැටුම් ඇති කර ගැනීම ද සිතෙහි සමබර බව බිඳ වැටීමට හේතු වේ. සතුට හෝ නොසතුට හෝ හමුවේ නොසැලෙන මැදහත් බව මෙහි ස්වභාවයයි. උපේක්ෂා සහගත පුද්ගලයා ප්‍රියජනක පුද්ගලයන් හෝ ප්‍රියජනක වස්තු හෝ ප්‍රියජනක සිද්ධි හෝ නිසා අමුතු උද්‍යෝගයක් හෝ උද්දාමයක් හෝ ඇති කර නොගනී. එසේ ම අප්‍රියජනක අත්දැකීම්වලට මුහුණ දීමේ දී ද නොසතුටට හෝ කම්පනයට හෝ පත් නොවී සමබර මනසකින් යුතු ව කටයුතු කරයි.

සිව් බඹ විහරණයෙන් යුතු ව වාසය කිරීමෙන් තම දියුණුව ද අන් අයගේ දියුණුව ද ඇති කර ගත හැකි ය. මිතුරු සිත පතුරුවන විට අන් අයට හිංසා කිරීමට ඔහු නොපෙලඹේ. හිංසාකාරී සිතුවිලිවලින් ඈත් වන විට සිතට මහත් සහනයක් ලැබේ. සියලු අපරාධ සිදු වන්නේ හිංසාකාරී සිතුවිලි ඇති විට ය. මෙත් සිත පතුරුවන්නේ ප්‍රති උපකාර අපේක්ෂාවෙන් නොවන නිසා අකෘතඥ වීම පිළිබඳ අමනාපකම් ඇති නොවේ. සමාජය තුළ සිදු වන විවිධ ආකාරයේ හිංසාකාරී ක්‍රියා අවිහිංසාවාදී සිතුවිලිවලින් යටපත් වේ. සුහදශීලී බව සියලු දෙනා වෙත පතුරුවන විට ප්‍රතිවිරෝධතා යටපත් වේ. එවැනි සමාජයක අසාධාරණකම්, අකටයුතුකම් ඇති වීමට ඇති ඉඩකඩ ඇහිරී යයි.

කරදර විපත් සිදු වන විට කවරකුට වුවද අන් අයගේ උදවු උපකාර අවශ්‍ය වේ. තනි තනිව මෙන් ම සාමූහික ව ද එවැනි කරදර, විපත් වලට මුහුණ දීමට සිදු වන්නේ අනපේක්ෂිත ව ය. කාරුණික මිනිසුන් වෙසෙන සමාජයක විපතට පත් වූවන්ට කඩිනමින් සහන සැලසේ. පසුගිය අවධියේ මෙරට ඇති වූ ගංවතුර, සුනාමි වැනි විපත්තිදායක අවස්ථාවල දී බොහෝ දෙනා කඩිනමින් සුඛිත මුදිත වූයේ අන් අයගේ කරුණාව ඔවුන් කෙරෙහි යොමු වූ නිසා ය.

අන් අයගේ දියුණුව දැක සතුටට පත් වන, මුදිතා ගුණය පවතින සමාජයක දියුණුව වේගවත් වේ. එවැනි සමාජයක් පරිහානියට පත් නොවේ. ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, වෛරය වැනි මානසික දුබලතා මුදිතාවෙන් යටපත් වේ. එනිසා සමාජ ගැටුම් අඩු වේ.

උපේක්ෂා ගුණය දියුණු කර ගත් විට ලාභ, අලාභ, යස, අයස, නින්දා, ප්‍රශංසා, සැප, දුක් ආදි අෂ්ටලෝක ධර්ම හමුවේ නොසැලී වාසය කිරීමට හැකි ය. මානසික සමබරතාව විවිධ ලෙඩරෝග සමනයට මෙන් ම පුද්ගලයාගේ ගුණාත්මක අගය වර්ධනය කර ගැනීමට ද ඉවහල් වේ.

## සාරාංශය

මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා යනු සතර බ්‍රහ්ම විහරණ ය. උසස් වූ හැසිරීම යන්න මෙහි අදහසයි. මෙත්තා යනු හිතවත් බවයි. අන් අයගේ දුකේ දී පිහිට වීමට ඉදිරිපත් වන සිතුවිල්ල කරුණාව වේ. අන්‍යයන්ගේ දියුණුව දැක සතුටු වන ස්වභාවය මුදිතාව වේ. දුක සැප දෙකේ දී මැදහත් සිතුවිලි පවත්වාගෙන යාම උපේක්ෂාව වේ. මෙම ගුණ ධර්මවලින් යුතු පුද්ගලයා ශ්‍රේෂ්ඨ අයෙකි. මෙම ගුණාංග ප්‍රගුණ කිරීමෙන් පුද්ගලයාට මෙන් ම සමාජයට ද සැනසිලිදායක තත්ත්වයක් උදා කර ගත හැකි ය.

## ක්‍රියාකාරකම

1. සතර බ්‍රහ්ම විහරණ නම් කර එම ගුණාංග පැහැදිලි කරන්න.

2. මෙම ගුණාංග ප්‍රගුණ කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන පෙන්වා දෙන්න.

## පැවරුම

- දානපතියන් විසින් සිදු කරනු ලබන සමාජ සත්කාරක වැඩසටහන් පිළිබඳ පළවන පුවත්පත් වාර්තා සොයාගෙන ඒවා වරින්වර පන්තියේ ප්‍රදර්ශනය කරන්න.

# 09

# සීල සුගන්ධය ම උතුම් වන්නේ ය

සීලය යනු කායික හා වාචසික ශික්ෂණයයි. පුද්ගලයාගේ හික්මීමයි; හැදිච්චකමයි. දුශ්චරිතයෙන් වැළකී සිටීම සහ සුචරිතය ආරක්ෂා කිරීම එයින් අදහස් වෙයි. චරිත සංවර්ධනය අරමුණු කොට පවත්නා සීලය නිවන් මගෙහි අත්තිවාරම ය; පදනම ය. එසේ වන්නේ එහි පිහිටා ගෙන ම සෙසු ප්‍රතිපදාවන් අනුගමනය කළ යුතු බැවිනි. "කෙලෙස් තවන වීර්යයෙන් යුත්, සසර බිය දක්නා, නුවණැති තැනැත්තා සීලයෙහි පිහිටා සමාධිය ද ප්‍රඥාව ද වැඩීමෙන් සියලු අවුල් නිරවුල් කරන්නේ ය." යනු බුද්ධ වචනයයි.

මේ සසර දුක් සහිත ය. අසාර වූ සසර ඉක්මවා, දුක දිනා විමුක්තිය උදාකරගනු පිණිස බුදුරදුන් වදාළ මාර්ගය, දුක්ඛ නිරෝධගාමිණී පටිපදාව නම් වේ. එය සීල, සමාධි ප්‍රඥා යන ත්‍රිවිධ ශික්ෂාවකින් යුක්ත ය. එහි මුලින් ම දක්වෙනුයේ ද සීලයයි. සම්මා වාචා, සම්මා කම්මන්ත සහ සම්මා ආජීව යන මාර්ගාංග සීල ශික්ෂාවට ඇතුළත් වේ. කායික වාචසික දුසිරිත්වලින් වෙන්වී, සුසිරිත්වල නිරතවීම මින් අදහස් කෙරේ. පෙළ දහමෙහි සීලය විවිධාකාරයෙන් පැහැදිලි වී තිබේ.

පුද්ගලයකු විසින් රැස්කර ගත යුතු ආධ්‍යාත්මික ධන හතකි. එහි දෙවැන්න සීලයයි. එම ධනය රැස් කර ගත් තැනැත්තා දිළිත්දෙක් නොවේ.

සඳුන් තුවරලාදි සියලු සුගන්ධ, සීල සුගන්ධය විසින් පරදවනු ලැබේ. මල් සුවඳ පරිසරය සුවඳවත් කරයි. එය යටි සුළඟට සීමා වෙයි. උඩුසුළඟට හමා නොයයි. සත්පුරුෂයන්ගේ සීල සුගන්ධය උඩුසුළඟට ද හමා යන්නේ ය. අදත් අපි සම්මා සම්බුදුරජාණන් වහන්සේට වන්දනා කරමු; ගෞරව කරමු; පුද සත්කාර කරමු. සැරියුත්, මුගලන්, සීවලී ආදි මහ රහතන් වහන්සේලා වන්දනා කරමු. උන්වහන්සේලා පිරිනිවනට වැඩ වසර දෙදහස් පන්සියයක් ඉකුත් ව ගොසිනි. එහෙත් අපගේ වන්දනයට පාත්‍ර වන්නේ උන්වහන්සේලා උතුම් සීල සුගන්ධයෙන් ද සුගන්ධවත් වූ බැවිනි.

## චාරිත්‍ර සීලය හා වාරිත්‍ර සීලය

චාරිත්‍රය හා වාරිත්‍රය සීලයේ මූලික ප්‍රභේදයක් වේ. චාරිත්‍රය සමාදානය ලෙස ද හැඳින්වෙයි. එනම් කළයුත්ත කිරීමයි. වාරිත්‍රය යනු විරමණය හෙවත් වැළකීමයි. නොකළයුත්ත නොකිරීමයි. පංච සීල ප්‍රතිපදාවෙන් මෙය වටහා ගත හැකි ය. අප පර පණ නැසීමෙන් වැළකී ක්‍රියා කළ යුතු ය. එය වාරිත්‍රය හෙවත් විරමණයයි. වාරිත්‍රයෙන් පමණක් සීලය අංග සම්පූර්ණ නොවෙයි. චාරිත්‍රය ද එහි ලා අවශ්‍ය ය. එනම් සියලු සත්ත්වයන් කෙරෙහි දයාව හා මෛත්‍රිය දැක්විය යුතු ය. එය චාරිත්‍ර සීලය හෙවත් සමාදානය නම් වෙයි. නොදුන් දෑ ගැනීමෙන් (සොරකමෙන්) වැළකීම විරමණයයි. සමාදානය නම් දුන් දේ පමණක් ගනිමින්, සොර සිතින් තොර ව පිරිසිදු සිතින් වාසය කිරීමයි. කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීම වාරිත්‍ර ශීලයයි. තම ස්වාමිපුරුෂයාට හෝ භාර්යාවට හෝ පමණක් සීමාවෙමින් ශිෂ්ට සම්මත අඹුසැමි ජීවිතයක් ගත කිරීම චාරිත්‍ර ශීලයයි. බොරුකීමෙන් වැළකී සත්‍ය කතා කිරීම, කේළාම් කීමෙන් වැළකී සමගිය ඇති කරවන වචන කතා කිරීම, රළු වදනින් වැළකී මෘදුවදන් කතා කිරීම හා නිෂ්ඵල වචන කතා කිරීමෙන් වැළකී අර්ථවත් වචන කතා කිරීම ආදි වශයෙන් වාරිත්‍රය හා චාරිත්‍රය තුළින් සීලය සම්පූර්ණ වේ. දුරාචාරයෙන් තොර සදාචාර සම්පන්න සමාජයක් නිර්මාණය වේ.

## හිරි ඔත්තප්ප

හිරි ඔත්තප්ප දෙක සීලයෙහි පදනමයි. ඒවා දේව ධර්ම, ලෝක පාලක ධර්ම ලෙස ද හැඳින්වෙයි. මෙහි 'හිරි' යනු පව් කිරීමට ඇති ලජ්ජාව ය. ඔත්තප්ප යනු පව් කිරීමට ඇති බියයි. "දෙවියන් සතු ගුණ ධර්ම" නැතහොත් "කෙනකු දේවත්වයට උසස් කරවන ගුණ ධර්ම" යන අර්ථයෙන් මේවා දේව ධර්ම නම් වේ. යමකු පවට ලජ්ජාවක් හෝ බියක් නැත්නම් සිල්වත් ජීවිතයක් ගොඩනගා ගැනීමට පෙලඹෙන්නේ නැත. ඔහු ඕනෑ ම දුසිරිතකට පහසුවෙන් ම පෙලඹේ. සිල්වත් ජීවිතයකට පෙලඹෙන්නේ හිරි ඔත්තප්ප ඇති තැනැත්තා ය. එම නිසා හිරි ඔත්තප්ප දෙක සීලයේ පදනමයි. සීලයට ඉතා ම ළඟින් සිට උපකාර කරන්නේත් ඒ දෙක ය. මෙහි ලජ්ජාව හා බය යනු සාමාන්‍ය ජීවිතයේ සමහර අවස්ථාවල දී අපට ඇතිවන බය හෝ ලජ්ජාව නොව, පවු කිරීමට ඇති ලජ්ජාවක් හා බියයි. එහෙයින් බුදුරදුන් විසින් මෙම ගුණ ධර්ම දෙක 'ලෝවැස්සාගේ හැසිරීම පාලනය කරන කරුණු' හෙවත් **ලෝක පාලක ධර්ම** ලෙස හඳුන්වා දී ඇත.

'පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි' **මම පරපණ නැසීමෙන් වැළකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි** යැයි කියන විට කරනුයේ තමන් තමන්ට ම පොරොන්දු වීමකි. අප අපට ම දෙන පොරොන්දුවක් කඩ කරන්නේ නම් එය තමන් විසින් තමන් රවටා ගැනීමක් වේ. සිල් සමාදන්වීම යනු බුදුරජාණන් වහන්සේගේ ආඥාවක් පිළිපැදීමට එකඟවීමක් නොවේ. බුදු දහමෙහි ආඥා නැත. එහෙයින් බුදුරදුන්ට හෝ අන් කෙනකුට හෝ බිය වී සිල් රැකීමක් ද සිදුවන්නේ නැත.

## සීලයෙහි ත්‍රිකෝටි පාරිශුද්ධිය

"ත්‍රිකෝටි පාරිශුද්ධිය" යනු අංශ තුනකින් හෙවත් තුන් ආකාරයකින් සීලය ආරක්ෂා කිරීමයි. එනම්,

1. **පව්කම් නොකිරීම**
2. **පව්කම් නොකරවීම**
3. **අන් අය කරන විට අනුමත නොකිරීම**

මේ ආකාරයට සෙසු ශික්ෂාවන් කෙරෙහි ද පැවතිය යුතු බව මෙහි උගන්වා තිබේ.

මෙහි දී ඝාතන, හිංසන මෙන් ම ඒවා සඳහා අනුබල දීම් අනුමත කිරීම් ආදියෙන් වැළකීම අදහස් වෙයි. ඒ අනුව සීලයෙන් පුද්ගලයාගේ දියුණුව සැලසෙයි. එසේ ම කරුණාව දයාව ආදි උසස් මානව ගුණ ධර්ම සමාජයට දායාද කිරීම මගින් සමාජ සදාචාරය ද වර්ධනය වේ.



## අත්තූපනායක ධර්ම පර්යාය

සිල් රැකීමේ දී අත්තූපනායක ධර්ම පර්යාය අනුව ක්‍රියා කිරීම ඉතා වැදගත් ය. ප්‍රාණඝාත ශික්ෂාව ආරක්ෂා කිරීමේ දී අත්තූපනායික ධර්ම පර්යාය මෙසේ භාවිත කළ හැකි ය. තමා ජීවත් වීමට කැමැති ය; මරණයට අකැමැති ය. සෙසු සත්ත්වයෝ ද ජීවත් වීමට කැමැති ය; මරණයට අකැමැති ය; දඬුවමට, දඬුමුගුරුවලට බිය ය. එලෙස තමා උපමා කොට අනුන් නැසීමෙන් වැළකිය යුතු ය. සත්ත්වයින්ගේ ජීවත් වීමේ අයිතිය සුරක්ෂිත කිරීම මෙයින් අදහස් කෙරේ. එසේ ම තමාගේ දේපළ තමා සන්තකයේ පවත්වාගෙන යාමට සෑම පුද්ගලයා ම කැමැති ය. එය අවබෝධ කොට ගෙන අනුන්ගේ දේපළ පැහැර ගැනීමෙන් වැළකී සිටිය යුතු ය. සෙසු ශික්ෂා පද සම්බන්ධයෙන් ද මෙලෙස ක්‍රියා කිරීම අත්තූපනායික ධර්ම පර්යායට අනුව ක්‍රියා කිරීමකි.

කෙනකු ධනවත් හෝ උගත් වුව ද රුවැති හෝ කුලැති වුව ද සීලයෙන් තොර වූයේ නම් ඔහුගේ ජීවිතය නිෂ්ඵල ය. එහෙයින් අපි ද සිල්වත් වෙමු.

### සාරාංශය

බෞද්ධ ආචාර ධර්ම අතර සීලයට හිමිවන්නේ ප්‍රමුඛස්ථානයකි. සීලය යන්න විවිධ තැන විවිධාර්ථවත් වූ පදයකි. සිල්වත්වීම සඳහා අවශ්‍ය වන ලෝක පාලක ධර්ම දෙකකි. එනම් පවට බිය හා ලජ්ජාවයි. සීලයෙහි විරතිය හා සමාදානයත් ත්‍රිකෝටික පාරිශුද්ධියත් අපි මෙම පාඩමෙන් ඉගෙන ගතිමු. පාසල තුළ යහපත් සිසුන් ලෙස ද, සදාචාර සම්පන්න සමාජයක සාමාජිකයන් ලෙස ද ජීවත් වීමට අපි කැමැත්තෙමු. එබඳු සමාජයක් ගොඩනගා ගැනීමේ වගකීමෙන් කොටසක් අප වෙත ද පැවරී ඇත. එහි දී මූලික අවශ්‍යතාව සිල්වත් වීමයි. ඒ සඳහා අප පවින් වැළකිය යුතු ය. පව් කරන අයට කිසිදු අනුබලයක් නොදී හැකි හැම විටෙක ම ඔවුන් පාපයෙන් වළක්වාලීමට පියවර ගත යුතු ය. ඔවුන්ට පවින් වැළකීමේ ආනිශංස අවබෝධ කර දීමට පියවර ගත යුතු ය. මේ සියල්ලට ම පදනම වන්නේ පව පිළිකුල් කිරීම හා පවට බිය වීමයි. එබැවින් හිරි ඔත්තප්ප සම්පන්න ජීවිතයක් ම ගොඩනගා ගැනීමට අධිෂ්ඨානශීලීව කටයුතු කරමු. එවිට අප නිවස, පාසල, පළාත මෙන් ම සමස්ත දේශය ම සොඳුරු තැනක් වන්නේ ම ය.

## ක්‍රියාකාරකම

1. සීල යන්නෙහි අර්ථය ගෙනහැර දක්වන්න.

2. ප්‍රාණඝාත ශික්ෂා පදය ඇසුරු කර ගනිමින් විරතිය හා සමාදානය පැහැදිලි කරන්න.

3. හිරි ඔත්තප්ප හේතු කොට ගෙන අප සිල්වත් වන අයුරු පෙන්වා දෙන්න.

4. සීලයෙහි ත්‍රිකෝටික පාරිශුද්ධිය එක් ශික්ෂා පදයක් ඇසුරෙන් හඳුන්වන්න.

## පැවරුම

- අෂ්ටාංග සීල සමාදානයක දී අනුගමනය කරනු ලබන සිරිත් - විරිත් පැහැදිලි කරමින් පාසල් බිත්ති පුවත් පතට ලිපියක් පිළියෙල කරන්න.

# පුහුණුවට

1. කිසිමැ සතකු නොමරමි මම නො මරවමි
මරණ අයට කිසිසෙත් අනුබල නො දෙමි
කිසිවකු නො වෙහෙසමි හැමට මැ සුව පතමි
මෙලෙස පළමු සිකපද සපුරා රකිමි

2. අනුන් සතු නුදුන් දෙය හොරෙනි නො ගනිමි
නො ගන්වමි හොරුන්හට අනුබල නො දෙමි
තමන් සතු දෙයින් සතුටු ව දවසරිමි
දෙවැන්න ද මෙමෙන් සපුරා මැ සුරකිමි

3. මිසහසිරිනිදු දිවිහිමි කොටැ මැ වළකිමි
දරුැ කලැ කුමර බඹසර නිසිසේ පුරමි
තුරුැණුවැ සරදර සතුටින් සැනසී වෙසෙමි
මෙවිලස තෙවැන්න ද සපුරා රැක ගනිමි

4. බොරුැ නොමැ කියමි අනුනුදු එහි නො මැ යොදමි
කියනුවනට ද කිසිසෙත් අනුබල නොදෙමි
නිසි තැන පමණ දනැ ඇත්තක් මැ පවසමි
සිවු වන සික ද මෙලෙසින් සපුරා රකිමි

5. මත්පැන් නො බොමි නො පොවමි දුමුදු නොමැ බොමි
බොන්නන්හට ද අනු දැනුමක් නොමැ කරමි
මත්වන හැම දෙයින් සිහිනෙනුදු වළකිමි
පස්වන සික ද මෙලෙසින් සපුරා රකිමි

**(පැළෑනේ සිරි වජිරඥාණ මහ නා හිමි - බෞද්ධ ළමයා)**

**පද විවරණය**

1. දවසරිමි - කල් ගෙවමි
2. මෙමෙන් - මේ අයුරින්
3. මිසහසිරිනිදු - වැරැදි හැසිරීමෙන් ද
4. දරුැ කලැ - ළමා කාලයේ
5. තුරුැණුවැ - තරුණ කාලයේ දී
6. සරදර සතුටින් - සිය බිරිඳගෙන් සතුටු වීම
7. දුමුදු නොමැ බොමි - දුම් ද නොබොමි

# 10 ඉටු කරමු යුතුකම්

ඕනෑ ම සමාජයක යහපැවැත්ම උදෙසා සමාජයේ ජීවත්වන සැවොම තම තමන්ගේ යුතුකම් හා වගකීම් ඉටු කිරීම අත්‍යවශ්‍ය වේ. පසුගිය ශ්‍රේණිවල දී අපි මානව යුතුකම් පිළිබඳ තරමක් දුරට උගෙන ඇත්තෙමු. මෙහි දී අවධානය යොමු වන්නේ සිගාලෝවාද සූත්‍රය ඇසුරින් සේව්‍ය-සේවක සබඳතා සහ ගිහි-පැවිදි සබඳතා බෞද්ධ සාරධර්ම අගයමින් ක්‍රියාත්මක කරන්නේ කෙසේ ද යන්න පිළිබඳව ය. සමාජයේ සෑම සාමාජිකයකු ම සුචරිත ක්‍රියාවන්හි යෙදීමෙන් ආධ්‍යාත්මික දියුණුව මෙන් ම සමාජ සංවර්ධනය ද ඇති කර ගැනීමට උත්සාහවත් වීමේ අවශ්‍යතාව බුදු දහම පෙන්වා දෙයි.

## සේව්‍ය - සේවක යුතුකම්

කිසියම් ආයතනයක අයිතිකරුවන්, කළමනාකරුවන්, අධ්‍යක්ෂවරුන් හෝ පාලකයන් සේව්‍ය පක්ෂය ලෙස සැලකිය හැකි ය. ඔවුන් යටතෙහි සේවය කරන්නෝ සේවකයෝ ය. සේව්‍යයාත් සේවකයාත් ආයතනික කාර්යභාරයක් ඉටු කරන බැවින් පොදුවේ ගත් කල්හි සියල්ලෝ ම ඵලදායක වැඩක නිරත වන අය වෙති. සේව්‍ය-සේවක සබඳතාව රිය සකෙහි, චක්‍රය (රෝදය) නාභිය (බොස්ගෙඩිය) සහ අර (ගරාදි) අතර සම්බන්ධය මෙනි. රියසක නොකැඩී නොබිඳී කැරකෙන්නේ එකිනෙකට උපකාරීව බොස්ගෙඩිය හා ගරාදි අතර සම්බන්ධය ඇති කල්හි ය. එබැවින් දෙපක්ෂයට ම ඉහළ ඵලදායිතාවක් සඳහා සුහද සබඳතාවක් අවශ්‍ය ය. ඒ අනුව සේව්‍යයා විසින් සේවකයාත්, සේවකයා විසින් සේව්‍යයාත් ඇගයීමට පොලඹවන ඉගැන්වීමක් සිගාලෝවාද සූත්‍ර දේශනාවෙහි දැක්වෙන්නේ මෙසේ ය.

මානව ප්‍රජාවේ පැවැත්ම වෙනුවෙන් නිෂ්පාදන සහ සේවා අත්‍යවශ්‍ය වේ. එහි දී බුද්ධිමය සහ කායික ශ්‍රම දායකත්වය ප්‍රධාන ය. ඒ මත මානව ප්‍රජාවේ ඉදිරි ගමන රඳා පවතින අතර සේවකයා එහි පදනම ය. සිගාලෝවාද සූත්‍රයෙහි සේව්‍ය සේවක සබඳතාව සඳහන් කිරීමේ දී එය යට දිශාව ලෙස දක්වා තිබේ. එහි දී සේව්‍යයා විසින් අවධානය යොමු කළ යුතු කරුණු පහක් ඇත. ඒවා මෙසේ ය.

1. සේවකයාගේ ශක්ති ප්‍රමාණයට වැඩ කොටස් පැවරීම
2. නිසි පරිදි ආහාර හා වැටුප් ලබා දීම

3. සෞඛ්‍ය පහසුකම් සලසා දීම
4. රසවත් ආහාරපාන බෙදා දීම
5. අවශ්‍ය අවස්ථාවල දී නිවාඩු ලබාදීම සහ නිසි කලට විශ්‍රාම ලබා දීම

නූතන ලෝකයේ මානව අයිතිවාසිකම් සහ කම්කරු අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තීන්ට ද අනුගත අන්තර්ජාතික මට්ටමේ ඉගැන්වීමක් වශයෙන් මෙම කරුණු අගය කළ හැකි ය. සේවකයා ලවා කෙසේ හෝ වැඩ කරවා ගැනීම නොව ඉතා ළෙන්ගතු ව ඔහුගේ ද යහපත උදා කරමින් සේවය ලබා ගැනීම මෙමගින් සිදු වන බව පැහැදිලි ය.

සේවකයාගේ ශක්ති ප්‍රමාණයට වැඩ පැවරීම වඩාත් හොඳ සේවාවක් ලබා ගැනීමට මූලික වශයෙන් උපකාරී වන්නකි. කිසියම් කාර්යයක් සේවකයා ලවා ඉටු කර ගැනීමට ක්‍රියා කිරීමේ දී ඊට අදාළ කායික ශක්තිය මෙන් ම මානසික ශක්තිය ද ඔහු සතු ව ඇත්තේ දැයි සේව්‍යයා විසින් සැලකිය යුතු ය. දැරිය නොහැකි තරම් වැඩ පැවරීමෙන් සේවකයා අතෘප්තියට පත් වන අතර එමඟින් වැඩ මගහැර සිටීමට හෝ මැනවින් නොකිරීමට හෝ ඔහු පෙලඹෙයි. පළපුරුදු විශේෂඥ දැනුම සහ පුහුණුව සහිත අයට ඒ ඒ කාර්යය පැවරීමෙන් එය වඩාත් ඵලදායී ව ඉටුකරවා ගත හැකි ය.

ගිහි ජීවිතයක් ගත කිරීමේ දී සෑම අයකුට ම මුදල් අවශ්‍ය ය. සෑහීමට පත්විය හැකි, ප්‍රමාණවත් ආර්ථික ශක්තියක් උදාකර දෙන සේව්‍යයා කෙරෙහි කැපවීමෙන් සේවය කිරීමට සේවකයා පෙලඹෙනු ඇත. එබැවින් සේවකයාට ජීවත් වීමට ප්‍රමාණවත්, ශ්‍රමයට සරිලන වැටුපක් සහ යැපීමට ප්‍රමාණවත් ආහාර පාන ලබාදීම සේව්‍යයා සතු යුතුකමකි. එවිට වැඩ වර්ජන, වැඩ පැහැර හැරීම, දූෂණ, අල්ලස් වැනි ක්‍රියා අවම වනු ඇත.

සේවක පක්ෂයෙහි මානසික තෘප්තිය, සතුට ඉතා වැදගත් වේ. සේවකයාගේ කායික පෝෂණය පමණක් නොව මානසික පෝෂණය ද කෙරෙහි සේව්‍යයා උනන්දු විය යුත්තේ එබැවිනි. සේවකයාට ලෙඩක් දුකක් ඇති වූ කල්හි ඊට අවශ්‍ය වෛද්‍ය පහසුකම් ලබාදීම මගින් ලබාගත හැකි ප්‍රයෝජන කිහිපයකි. නීරෝගී සේවකයා මැනවින් කාර්යයෙහි නිරතවීම ඉන් එකකි. දෙවැන්න නම් තමා රෝගී වූ විට අත් නොහැර තමාට පිහිට වූ සේව්‍යයා හෝ ආයතනය හෝ කෙරෙහි කෘතවේදී ව, ළබැඳියාවෙන්, කැපවීමෙන් සේවකයා තම සේවයේ නිරත වීම ය. එසේ අවශ්‍ය සෞඛ්‍ය පහසුකම් ලබාදීම මනා සේව්‍ය-සේවක සම්බන්ධතාවකට බලපාන වැදගත් කරුණකි.

සේවකයාගේ ශ්‍රමය මත තම සමෘද්ධිය රඳා පවතින බව සේව්‍යයා නිතර සිහි කළ යුතු ය. එබැවින් රසවත් ආහාරපාන ආදිය සේවක - සේවිකාවන්ට ද බෙදා හදා දී අනුභව කළ යුතු ය. එවැනි සංග්‍රහ ලබන සේවකයා, ස්වාමියා හෝ ආයතනය හෝ කෙරෙහි මනා බැඳීමක් ඇතිකර ගනී.

ජාත්‍යන්තර කම්කරු ප්‍රඥප්තීන්ට අනුව පැය අටක වැඩමුරය සේවකයාගේ අයිතිවාසිකමකි. බුදුරදුන් විසින් ඈත අතීතයේ දී පවා එය අවධාරණය කොට තිබේ. උන් වහන්සේ වැඩ සිටියේ අධික ලෙස ශ්‍රමිකයන් පීඩාවට පත් වූ යුගයක ය. ශ්‍රමිකයන්ගෙන් මනා සේවාවක් ලබා ගැනීම සඳහා සුදුසු පරිදි විවේකය ලබා දිය යුතු බව බුදුදහමේ දැක්වේ.

මෙසේ ස්වාමියාගෙන් සංග්‍රහ ලබන සේවකයා ද අවංකව සහ කැපවීමෙන් තම වගකීම් ඉටුකළ යුතු ය. එහි දී ඔහු හෝ ඇය හෝ විසින් ස්වාමියා කෙරෙහි ක්‍රියා කළ යුතු ආකාරය ද බුදුරදුන් දේශනා කොට ඇත. ඒ මෙසේ ය.

1. ස්වාමියාට පළමුව අවදිවීම
2. ස්වාමියාට පසුව නිදාගැනීම
3. ස්වාමියා දුන් දෙය පමණක් ගැනීම
4. වැඩකටයුතු ඉතා මැනවින් ඉටු කිරීම
5. ස්වාමියාගේ ගුණ වර්ණනා කිරීම

ගෘහ සේවයේ නිරත සේවක සේවිකාවන් විසින් ස්වාමියාට පළමුව අවදි වී දෛනික කටයුතු ආරම්භ කිරීම ස්වාමි පක්ෂයේ සිත් දිනා ගැනීමට ඉවහල් වන්නේ ය. ස්වාමියාට පසුව නිඳන සේවකයා දොර ජනෙල් මැනවින් වසා තබා, අනවශ්‍ය විදුලි පහන් නිවා තබා, නිම කළ යුතු දෛනික කටයුතු නිමවා නින්දට යාම එම ස්වාමියාට මහත් අස්වැසිල්ලකි.

නූතන ලෝකයට අදාළ ව මෙම කරුණ පැහැදිලි කර ගැනීමේ දී නියමිත වේලාවට පෙර සේවා ස්ථානයට පැමිණීමත් නියමිත කාර්යය මනාව ඉටුකර ආයතනික ආරක්ෂාව පිළිබඳ අවශ්‍ය විධිවිධාන නිමවා ආයතනයෙන් බැහැරවීමත් වශයෙන් විග්‍රහ කරගත හැකි ය. එය ස්වාමියාගේ සිත් දිනා ගැනීමටත් ආයතනයේ දියුණුව හා ක්‍රමවත් බව ඇති කර ගැනීමටත් උපකාරී වේ.

සේවකයා වෙනුවෙන් සේව්‍යයාගේ යුතුකම් මැනවින් ඉටුවන ආයතනයක සේවකයා තමාට දුන් දෙය පමණක් ගැනීමට පුරුදු විය යුතු ය. තමාට නිසි පරිදි බත් වැටුප් ලබා දෙන ලෙඩට, දුකට පිහිට වෙන සෙනෙහසින් රැකබලා ගන්නා ආයතනයට අප එරෙහි නොවිය යුතු ය. එය රැක බලාගෙන දියුණු කිරීමට ඇප-කැප විය යුතු ය. එය ආයතනයේ මෙන් ම පුද්ගලයාගේ ද යහ පැවැත්ම තහවුරු කරනු නියත ය.

තමාට පැවරී ඇති වැඩ කොටස මැනවින්, අවංක ව, කැපවීමෙන්, නිසි කලට වේලාවට ඉටු කිරීමට සේවකයා නිතර උත්සාහවත් විය යුතු ය. එය ඔහුගේ පරම වගකීමකි. එය ඉටු නොවන කල ස්වාමි - සේවක සබඳතාව ආරක්ෂා වන්නේ නැත.

එමෙන් ම සේවකයා විසින් ද තම ස්වාමියා, ආයතනය හා ආයතන ප්‍රධානියා අගය කිරීම ද ඉතා හොඳ ස්වාමි සේවක සබඳතාවක් පවත්වා ගැනීම කෙරෙහි උපකාරී වේ. "නිදොස් කෙනෙක් මෙදියත උපදිනේ නැත" යන කියමන අනුව මෙලොව ඕනෑ ම කෙනකු තුළ කුඩා හෝ වරදක් තිබිය හැකි ය. ඒවා මහත් කොට නොදක්වා හෝ ඒ පිළිබඳව පමණක් ම නොසිතා හෝ ස්වාමියා සතු කුඩා හෝ ගුණයක් ඇත්නම් එය අගය කිරීම සේවකයාගේ යුතුකමයි.

මෙලෙස සේව්‍ය-සේවක අන්‍යෝන්‍ය යුතුකම් ඉටුවන කල්හි අයිතිවාසිකම් වෙනුවෙන් කරන වැඩවර්ජන, උද්ඝෝෂණ, අරගල අවම වනු ඇත. එවන් ආයතනයක්, නිවසක් ඉතා ප්‍රසන්න හා සාමකාමී වනු නොඅනුමාන ය.

අපගේ ජීවිතයේ විවිධ කාලවල දී අප විසින් සේව්‍ය-සේවක යන භූමිකා දෙක ම නියෝජනය කරනු ලැබෙයි. එබැවින් එම භූමිකා දෙකට ම අදාළ යුතුකම් මැනවින් ඉටු කිරීමට පුහුණු වෙමු.

## ගිහි පැවිදි යුතුකම්

ගිහි-පැවිදි යනුවෙන් සමාජයක දෙඅංශයක් පවතී. බෞද්ධ සමාජය භික්ෂු-භික්ෂුණී, උපාසක-උපාසිකා යන සිව්වණක් පිරිසෙන් යුක්ත ය. එහි උපාසක - උපාසිකා යනු ගිහි සමාජය වන අතර භික්ෂු - භික්ෂුණී යනු පැවිදි සමාජයයි. ඕනෑ ම සමාජයක ගිහි පැවිදි දෙපිරිස අතර අන්‍යෝන්‍ය සම්බන්ධයට සහ අභිවෘද්ධියට අදාළ කරගත හැකි උපදෙස් මාලාවක් සිගාලෝවාද සූත්‍රයෙහි ඇතුළත් ය.

ශ්‍රී ලාංකේය ඉතිහාසය දෙස අවධානය යොමු කරන කල්හි පෙනී යන වැදගත් කරුණක් නම් සමාජය ලෞකික, ලෝකෝත්තර අභිවෘද්ධිය උදෙසා ඉතා සුවිශේෂ මගපෙන්වීම ලැබුවේ භික්ෂූන් වහන්සේලාගෙන් බවයි. රජුගේ සිට සාමාන්‍ය පුරවැසියා දක්වා සියල්ලෝ ම ඉතා ඉහළ ආධ්‍යාත්මික සහ සදාචාරාත්මක දියුණුවක් ඇති පිරිසක් බවට පත් වීමෙහිලා ද, අහස උසට දිවෙන මහා දාගැබ්, මහා සාගරය වැනි විශාල වැව් අමුණු නිර්මාණය වීමට ද බුදු දහමින් සුපෝෂිත ශ්‍රේෂ්ඨ කලා නිර්මාණ බිහි වීමට ද භික්ෂූන් වහන්සේලාගෙන් ලද මග පෙන්වීම ප්‍රමුඛ වී තිබේ. ශ්‍රී ලාංකේය ජනතාව විසින් ඉතා දුර්දශාසම්පන්න කාලවාකවානුවල දී පවා ජීවිත පරිත්‍යාගයෙන් උන් වහන්සේලා ආරක්ෂා කළේ එබැවිනි. සිගාලෝවාද සූත්‍රයට අනුව ගිහියා විසින් පැවිදි උතුමන් කෙරෙහි ඉටු කළ යුතු යුතුකම් පහකි. ඒවා මෙසේ ය.

1. පැවිදි උතුමන් පිළිබඳ මෛත්‍රියෙන් ක්‍රියා කිරීම
2. මෛත්‍රී සහගත ව කථා කිරීම
3. මෛත්‍රියෙන් සිතීම

4. ශාසනික අවශ්‍යතා සඳහා තම නිවසට වැඩම කිරීමට ඉඩ සැලසීම
5. සිව්පසයෙන් උවටැන් කිරීම

පැවිදි සංස්ථාවේ පැවැත්ම වෙනුවෙන් ගිහියා විසින් කරනු ලබන සියලු කාර්යයන් මෛත්‍රී සහගත ව ඉටු කිරීම මෙහි අවධාරණය කෙරෙන කරුණකි. බස් රථයේ දී ආසනයක් ලබාදීම, මහ මග දී පවා ගරු කිරීම, විහාරස්ථානයේ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කිරීම ආදි සියලු කටයුතු කිසිවකුගේ මෙහෙයවීම නිසා නොව ශාසනික හැඟීමෙන්, මෛත්‍රී සහගතව ම කළ යුතු ය. මෛත්‍රී සහගත කාය කර්ම පැවැත්වීම යනු එයයි.

'අපේ හාමුදුරුවෝ' යනුවෙන් කටපුරා හිතපුරා ගෞරව සම්ප්‍රයුක්ත ව භික්ෂූන් වහන්සේට ආමන්ත්‍රණය කිරීම බෞද්ධ අපගේ ඉපැරණි සම්ප්‍රදායයි. ඒ වදන මෛත්‍රී සහගත ය. ජීවිතයේ පළමු වරට දුටු ස්වාමීන් වහන්සේ නමකට වුවත් එසේ ආමන්ත්‍රණය කිරීමට බෞද්ධයන් පුරුදු ව සිටීමෙන් ඒ බව තහවුරු වේ. උන් වහන්සේගේ අනුශාසනා සාධුකාර පවත්වමින් ශ්‍රවණය කිරීම ද මීට අදාළ ය. භික්ෂූන් වහන්සේ සමග කතා කරන සෑම වචනයක් ම මෛත්‍රී සහගත විය යුතු බව මෙයින් ඉගැන්වෙයි.

උන් වහන්සේ පිළිබඳ සිතන සෑම සිතුවිල්ලක් ම මෛත්‍රී සහගත විය යුතු බව ද උගන්වා ඇත. ගිහියන්ගේ මෛත්‍රී සහගත සිතුවිලි පදනම් කරගත් කටයුතු නිසා ම භික්ෂුවගේ පැවැත්ම පහසු වන අතර එය ගිහියාට ද මහත් පිනකි.

භික්ෂූන් වහන්සේ නමක් නිවසට වඩින කල්හි ගෞරවයෙන් යුතු ව ආසන පනවා පිළිගැනීම හා ශාසනික අවශ්‍යතා ඉටු කරගැනීමට හැකි උපරිමයෙන් දායකවීම ගිහි බෞද්ධයාගේ සිව්වැනි යුතුකම වේ.

භික්ෂූන් වහන්සේලා පෝෂණය කිරීම ගිහි බෞද්ධයාගේ වගකීමකි. එබැවින් උන් වහන්සේලාගේ දන් පැන්, සිවුරු පිරිකර, වාසස්ථාන, බේත් ආදී අවශ්‍යතා සොයා බලා ඒවා සම්පූර්ණ කිරීම පිළිබඳ ව ගිහි පින්වතුන් උද්‍යෝගවත් ව ක්‍රියා කළ යුතු ය.

මෙලෙස ආමිස දානයෙන් උපකාර ලබන ස්වාමීන් වහන්සේ විසින් ගිහියා කෙරෙහි ධර්ම දානයෙන් ප්‍රතිඋපකාර කළ යුතු යැයි බුද්ධ දේශනාවේ දක්වා තිබේ. එය මූලික වශයෙන් සය වැදෑරුම් වේ යැයි සිගාලෝවාද සූත්‍රය සඳහන් කරයි.

1. වැරැදි ක්‍රියාවලින් වළක්වා ගැනීම
2. යහපත් ක්‍රියාවල යෙදවීම
3. යහපත් සිතින් ආශීර්වාද කිරීම
4. නොඇසූ දහම් ඇසීමට සැලැස්වීම

5. ඇසූ දහම් පිළිබඳ සැක ඇතොත් එම සැක දුරු කිරීම

6. සුගතියට මග කියාදීම

සත්පුරුෂ ආශ්‍රය සමස්ත සමාජයේ ම යහපත පිණිස උපකාරී වේ. සුවඳ මල් නිසා පරිසරය ද සුවඳවත් වන්නාක් මෙනි. එබැවින් සමාජය නැමැති මඩගොහොරුවේ පිපුණ පියුමක් බඳු ස්වාමීන් වහන්සේගේ ඇසුර සමස්ත සමාජය නැමැති පොකුණ සුගන්ධවත් කරනු නොඅනුමාන ය.

ස්වාමීන් වහන්සේ උපායශීලී ව හෝ ගිහියා පාපයෙන් වළක්වා ගත යුතු ය. උන් වහන්සේ තරම් දහමින් ශික්ෂණය නොලද ගිහියා පව්කම් මිහිරි යැයි සිතනවා විය හැකි ය. එහෙත් ස්වාමීන් වහන්සේ ධර්මානුශාසනා කොට ගිහියා පවින් වළක්වා ගත යුතු ය. මුගලන් හිමියන් මෙන් ඍද්ධි ප්‍රාතිහාර්ය නොපෑහැකි වුව ද කෝසිය සිටාණන් වැනි මසුරු ලෝභීන් පිංකම්හි නිරත කරවීමට තරම් උන් වහන්සේ උපාය කුසලතා සම්පන්න විය යුතු ය.

තමන් වහන්සේ සිවුපසයෙන් පෝෂණය කරන ගිහියාගේ ශාසනික සහ ආධ්‍යාත්මික අභිවෘද්ධිය දක ඉතසිතින් ආශීර්වාද කිරීම ස්වාමීන් වහන්සේගෙන් විය යුක්තකි. ඒ මගින් ගිහියාට මානසික සුවයක් ද සතුටක් ද උපදනා බැවිනි.

බුදු දහම පිළිබඳ මනා අවබෝධයක් ඇති භික්ෂූන් වහන්සේ ගිහියා කෙරෙහි අනුකම්පාවෙන්, නොඇසූ  දහම් දේශනා කරමින්, ඔහු බණ දහමින් පෝෂණය කිරීමත් ඇසූ දහම්හි සැක තැන් ඇතොත් ඒවා පහදා දීමත් කරුණා පෙරදැරිව කළ යුතු ය. එය භික්ෂූන් වහන්සේගේ පරම යුතුකම බව බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත.

මෙලොව භෞතික සහ ආධ්‍යාත්මික දියුණුව ඇති කර ගැනීමට මෙන් ම පරලොව සුගතිගාමී වීමට ද බුදු දහම අදාළ කරගත හැකි බව සහේතුක ව ගිහියාට අවබෝධ කරවීම ස්වාමීන් වහන්සේ නමකගෙන් ඉටු විය යුතු කාර්යයකි. නැතහොත් අපායගාමී වීමට මෙන් ම සසර විවිධ දුක්පීඩා විඳීමට ද සිදු වන බව අවබෝධ කරවීම සමස්ත සමාජයට ම මහත් ශාන්තියකි.

## සාරාංශය

සේව්‍ය-සේවක යුතුකම් අන්‍යෝන්‍ය වශයෙන් මැනවින් ඉටුවීම සමාජයක යහපැවැත්මට අවශ්‍ය බව බුදු දහම අවධාරණය කරයි. සිගාලෝවාද සූත්‍රය ඒ සඳහා මූලික මග පෙන්වීමක් කර ඇත. එහි සදුපදේශයන් වර්තමානයේ අන්තර්ජාතිකව පිළිගත් මානව හිමිකම් සහ කම්කරු අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තීන් සමග ඉතා සමීප ය. සේව්‍ය-සේවක යුතුකම් මැනවින් ඉටු කිරීමෙන් වැඩවර්ජන, උද්ඝෝෂණ, සේවයෙන් නෙරපීම වැනි විෂම චර්යාවලින් තොර අන්‍යෝන්‍ය, ගැටුම් විරහිත, සුහද, කාර්යක්ෂම සබඳතාවක් නිර්මාණය කරගත හැකි ය. එය ස්වාමි-සේවක දෙපක්ෂයේ ම අභිවෘද්ධිය පිණිස හේතු වේ.

සංවර්ධිත සමාජයක කැඩපත ආධ්‍යාත්මික ප්‍රගතියයි. එහිලා ගිහි පැවිදි දෙපක්ෂය ම තම යුතුකම් මැනවින් ඉටු කළ යුතු ය. ගිහියන් තම ආගමික උතුමන් මැනවින් රැකබලා ගත යුතු අතර ආගමික උතුමන් ද ගිහියන්ගේ අභිවෘද්ධියට අවශ්‍ය කටයුතු කළ යුතු ය. දෙපක්ෂයේ ම යහපැවැත්ම සාධනය වනුයේ එවිට ය.

## ක්‍රියාකාරකම

1. ඔබ ඔබගේ පාසලේ අනධ්‍යයන සේවකයකු යැයි සිතා පාසලේ යහපත් පැවැත්ම වෙනුවෙන් ඔබ අනුගමනය කරන ක්‍රියාකාරකම් ලැයිස්තුවක් පිළියෙල කරන්න.

2. ඔබගේ නිවසට වැඩම කළ ස්වාමීන් වහන්සේ නමකට ගරු බුහුමන් පෙරදැරි ව කටයුතු කරන ආකාරය පිළිබඳ උදෑසන රැස්වීමේ දී කරන කතාවක් ලියා දක්වන්න.

## පැවරුම

- කර්මාන්ත ශාලාවක සේව්‍ය-සේවක අර්බුදයක් විසඳා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් අදාළ කරගත හැකි ආකාරය පිළිබඳ ව හිත මිතුරන් සමග සාකච්ඡාවක නිරත වන්න.

# 11

# බුදුබව පැතූ බලංගොඩ මහානායක හාමුදුරුවෝ

මිය පරලොව ගිය පුද්ගලයන් පිළිබඳ විස්තර සොයන්නේ කුමට ද? ඔවුන් පිළිබඳ දැනගෙන ඇති ඵලය කුමක් දැයි ඇතැමුන් කල්පනා කරනවා විය හැකි ය. ශිෂ්ට සම්පන්න ලෝකයේ මිනිස්සු මිය ගිය පුද්ගලයන් පිළිබඳ තොරතුරු සොයති. එම තොරතුරු දැනගෙන රට දැය සමය වෙනුවෙන් සේවයක් සිදු කළ පුද්ගලයන්ට ගරු කරති; උපහාර කරති; කෘතගුණ දක්වති; එසේ ම ඒ උත්තමයන් සතු ගුණාංග තම ජීවිතවලට සම්බන්ධ කර ගනිති; අන් අයට ද එම ගුණ නුවණ හා මෙහෙවර පැහැදිලි කර දෙමින් තමන් ද ඒ අනුව එම අඩිපාරේ ගමන් කිරීමට පෙළඹෙති; එම චරිත ආදර්ශයට ගනිති.

අප අද ඉගෙනගන්නේ අප රටේ වැඩසිටි සුපේශල ශික්ෂාකාමී, වියත්, දේශ දේශාන්තරයන්හි බහුමානයට පත් වූ, බුදු සසුනට මහ මෙහෙවරක් සිදුකොට වදාළ මහානායක හිමිපාණන් වහන්සේ නමක් පිළිබඳවයි. උන් වහන්සේ නමින් අතිපූජ්‍ය බලංගොඩ ආනන්ද මෛත්‍රේය මහානායක මාහිමිපාණන් වහන්සේයි.

බලංගොඩ, කිරිඳිගල උස්වත්තගේවත්තේ නාරංගොඩ ආරච්චිගේ මෙතියස්හාමි නොහොත් මද්දුමහාමි උස්වත්තගේ උන් වහන්සේගේ පියා විය; මව හීන් මැණිකේ වූවා ය. 1896 අගෝස්තු මස 23 දින ඒ වාසනාවන්ත දරුවා මෙලොව එළිය දුටුවේ ය. ඔහුට විලියම් යන නම තැබුවේ එදා සමාජයේ බොහෝ දෙනා අනුව යාමෙනි. බෝසත් උතුමකු බඳු දරුවකු බිහිකළ හීන්මැණිකේ සති දෙකක් ගතවෙන තැන කලුරිය කළා ය. ඇය මිය යන්නට පෙර තම දරුවා සිය ස්වාමිපුරුෂයාගේ අයියාගේ බිරිඳ වූ යශෝහාමි අක්කාට භාර කළා ය. ඒ, දරුවා ලැබෙන්නටත් පෙර වූ පොරොන්දුවක් ඉටු කරමිනි. යශෝහාමි අක්කාට හා ඩිංගිරිහාමි අයියාට දරුවන් සිටියේ නැත. ඒ නිසා මල්ලිගේ භාර්යාවට හෙවත් හීන්මැණිකේට දරුවකු ලැබෙන්න සිටින බව දැනගෙන ඒ දරුවා තමන්ට හදාගන්නට දෙන ලෙස දවසක් පන්සලේ දී ඉල්ලීමක් කර තිබිණ. සිය ස්වාමි පුරුෂයාගේ අයියාට දරුවන් නැති නිසා කළ ඒ අහිංසක ඉල්ලීම ඉවත දමන්නට අපහසු වූ හීන්මැණිකේ පොරොන්දුවක් පිට දරුවා දෙන්නට කැමැති වූවා ය. එම පොරොන්දුව වූයේ පිරිමි දරුවකු ඉපදුණොත් ඒ දරුවා මහණ කරන ලෙසයි. යශෝහාමි ඒ කොන්දේසියට එකඟ වී සිටියා ය.

මව මියගිය පසු දරුවා අම්මා තාත්තා කීවේ යශෝහාමි ලොකු අම්මාට සහ ඩිංගිරිහාමි ලොකු තාත්තාටයි. කිරිඅම්මා වී මේ දරුවාට කිරි පෙව්වේ තලහපිටිරාළලාගේ මොහොට්ටිහාමිගේ බිරිය වූ පුංචිමැණිකේ මාතාව ය. රන්මැණිකේගේ අකල් මරණය නිසා සිත් වේදනාවට පත්ව සිටි මද්දුමහාමි ගම හැර ගියේ ය. ලොකු තාත්තා කඩේ වැඩ කරමින් කාලය ගත කරන අතර වැඩිපුර මේ දරුවා වැඩුණේ සීයාගේ ඇසුරේ ය. සීයා මේ දරුවාට පුංචි මහත්තයා යැයි ඇමතුවේ ය.

පුංචි මහත්තයා හෙවත් මේ විලියම් දරුවා බලංගොඩ කිරිඳිගල කතෝලික විදුහලෙන් ද බලංගොඩ රජයේ කුමාර විදුහලෙන් ද මූලික අධ්‍යාපනය ලැබී ය. සීයා හවසට ජාතක කතා සහ ජාතික වීරවරයන් පිළිබඳ කතා ද ඔහුට ඉගැන්වී ය. මේ කාලයේ වලිසිංහ හරිස්චන්ද්‍ර තුමා බලංගොඩට පැමිණියේ ය. එතුමා විසින් කරන ලද දේශනයක් සීයා සමග ගොස් ඇසූ මේ දරුවාට ජාතිකත්වය පිළිබඳ අමුතු හැඟීමක් උපන්නේ ය.

වසර දහහතරේ දී සිය ඥාතීන්ගේ ආශීර්වාද මැද මේ පින්වත් දරුවා දෙණිහේනේ ශ්‍රී සීලානන්ද මහ තෙරුන් වහන්සේගේ ආචාර්යත්වයෙන් පැවිදි බිමට ඇතුළත් වූ බව සඳහන් වෙයි. ඒ 1911 මාර්තු මස 02 දා ය. මේ දරුවාට පැවිදිවීමේ දී බලංගොඩ සරණගවේසී යැයි නම් තබන ලදි. සරණගවේසී සාමණේර හාමුදුරුවන් සිය ගුරු හිමිපාණන් වහන්සේ කියා දුන් බණ දහම් ඉතා ඕනෑකමින් හා ඉක්මනින් ප්‍රගුණ කළේ සසර පුරුද්දට මෙනි. පිරිවෙන් අධ්‍යාපනයක් නොලැබුව ද උන් වහන්සේ ත්‍රිපිටක ධර්මය ද තවත් බොහෝ දේ ද මැනවින් හැදෑරූහ. විසි වයස් සපිරීමට ආසන්න ව සිටි සාමණේර හිමියෝ නිසි බණදහම් ඉගෙන 1916 ජූලි මස 14 වෙනි දින බලංගොඩ ඕලු ගඟ උදකුක්ඛේප සීමා මාලකයේ දී අධිසීල සංඛ්‍යාත උපසම්පදාව ලැබූහ. ඒ දෙණිහේනේ සීලානන්ද මහා ස්වාමීන් වහන්සේගේ ආචාර්යත්වයෙන් හා දාමහන ධම්මානන්ද මහා ස්වාමීන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙනි.

සිය ගුරු හිමිපාණන් වහන්සේගේ නියමය පරිදි අප හිමිපාණෝ උපසම්පදාවෙන් දෙවසරකට පසු බලංගොඩ සරණගවේසී යන නම ඉවත් කොට බලංගොඩ ආනන්ද මෛත්‍රේය යන නම භාවිතයට ගත්හ. කිසි ම පිරිවෙණකට හෝ පාසලකට හෝ නොගිය උන් වහන්සේ සිය ගුරුදේවයන් වහන්සේ වෙතින් පාලි, සංස්කෘත, සිංහල මෙන් ම ඉංග්‍රීසි භාෂාව ද ඉගෙන ගත්හ. වර්ෂ 1919 දී කොළඹ ආනන්ද විද්‍යාලයේ භික්ෂූන් වහන්සේලා සඳහා පැවැත්වෙන ඉංග්‍රීසි භාෂා පංතියක් පිළිබඳ දැනගත් ආනන්ද මෛත්‍රේය හිමියෝ ඉංග්‍රීසි භාෂා දැනුම වැඩි දියුණු කරගැනීම සඳහා ආනන්ද විද්‍යාලයට වැඩම කළහ. එහි අධ්‍යාපනය ලබන අතර වර්ෂ 1922 වන විට ආනන්දයේ පාලි, සංස්කෘත, සිංහල හා බුද්ධ ධර්මය යන විෂයයන් උගන්වන ගුරුවරයා බවට ද උන් වහන්සේ පත්වූහ.

අනතුරුව උන් වහන්සේ නාලන්දා විද්‍යාලයේ ආචාර්යවරයකු ලෙස වසර දෙකක් සේවය කළහ. නාලන්දා විද්‍යාලය යන නමත් එම විද්‍යාලයේ "අපදාන සෝභිනී පඤ්ඤා" යන ආදර්ශ පාඨයත් උන් වහන්සේගේ උපදෙස් අනුව නිර්මාණය වූ බව ප්‍රකට ය.

දේශීය ධර්ම දූත සේවයේ මෙන් ම විදේශීය ධර්ම දූත සේවයේ ද නිරත වූ ආනන්ද මෛත්‍රේය මාහිමියෝ 1926 දී ඉන්දියාවේ කේරලයේ කැලිකට් නගරයට වැඩම කළහ. උන් වහන්සේ භාරතයට පමණක් තිස්හය වතාවක් වැඩම කොට ඇත. පෙර අපර දෙදිග බොහෝ රටවලට වැඩම කළ උන් වහන්සේ විදේශයන්හි පවා ධර්මඥානය බෙදා දුන්හ. උන් වහන්සේ සිංහල, පාලි, සංස්කෘත යන පෙරදිග භාෂා මෙන් ම ඉංග්‍රීසි, ප්‍රංශ, ලතින් වැනි අපරදිග භාෂා ද දැන සිටියහ. අනගාරික ධර්මපාල තුමාගේ අඩිපාරේ යමින්, එතුමන්ට සහාය වෙමින් ජාතික මෙහෙවරට ද දායකත්වය දැක්වූ ආනන්ද මෛත්‍රේය හිමිපාණන් ධර්මපාලතුමාත් සමග විදේශීය ධර්ම ප්‍රචාරයට යෑමට සූදානම් වූ නමුත් එයට බාන්ස් රත්වත්තේ රටේ මහත්මයා අකැමැති විය. "අපේ හාමුදුරුවෝ ලෝකෙට වැඩ කරන්න ඉස්සෙල්ලා ගමේ දුප්පත්, අසරණ, නූගත්, ගිහි පැවිදි පිරිසට සේවයක් කළොත් හොඳ නැද්ද?" යි ඔහු විමසුවේ ය. එතුමාගේ මේ ඉල්ලීම පිළිබඳ සලකා බැලූ උන් වහන්සේ 1935 වර්ෂයේ දී ආනන්ද විද්‍යාලයෙන් ඉවත් වී බලංගොඩ ධම්මානන්ද පිරිවෙණට වැඩම කළහ.

ගමේ දුප්පත් දරුවන්ට හා ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සඳහා උන් වහන්සේ ධම්මානන්ද පිරිවෙණේ ඉංග්‍රීසි පන්තියක් ආරම්භ කළහ. එය කොතරම් දියුණු වූවා ද කියතොත්, 1943 ජූලි මස 05 වන දින ශ්‍රී ධම්මානන්ද විද්‍යාලය නමින් වෙන ම ගොඩනැගිල්ලක ආරම්භ කොට පවත්වාගෙන යාමට ද සිදුවිය. පසු කාලයේ දී රජයට පවරාගත් මේ විද්‍යාලය අද බලංගොඩ මධ්‍ය මහා විද්‍යාලය නමින් හැඳින්වේ.

ගුරුවරයකු වශයෙන් මහත් දස්කම් පෑ ආනන්ද මෛත්‍රේය හිමිපාණන් වහන්සේ දේශනයෙහි මෙන් ම ලේඛනයෙහි ද සමත්කම් දැක්වූහ. එදා බෞද්ධ විරෝධී අන්‍යාගමික ප්‍රජාව විසින් පුවත්පතක් ආරම්භකොට බෞද්ධයන් විවේචනය කරන ලදි. මෙම විවේචනවලට පිළිතුරු දීම සඳහා "ශ්‍රී බුද්ධරශ්මි" නමින් පුවත්පතක් ආරම්භ කෙරුණු අතර එහි ආරම්භක සංස්කාරකවරයා ලෙස ආනන්ද මෛත්‍රේය නාහිමියෝ ආරූඪ නමකින් පෙනී සිටිමින් කටයුතු කළහ. ඒ බලංගොඩ මෛත්‍රීපාල යන නමිනි. බොහෝ අන්වර්ථ නාම යොදමින් එදා බෞද්ධ විරෝධීන්ට පිළිතුරු දීමට නාහිමියෝ ඉදිරිපත් වූහ. මෙම කාලයේ දී බෞද්ධ විරෝධීන් විසින් මොරටුව ප්‍රදේශයේ මාස තුනක් තිස්සේ ගෙන ගිය වාදයට උන් වහන්සේ වැඩම කළහ. අප නාහිමිපාණන් වහන්සේ බෞද්ධ පිල ජයග්‍රහණය කරා රැගෙන ගියා පමණක් නොව මෙම වාදය අවසානයේ අන්‍යාගමික පවුල් 63ක් බුදු දහමට හරවා ගැනීමට ද සමත් වූහ.

එදා 1928 දී දහම් පාසල් දරුවන් සඳහා උන් වහන්සේ අතින් ලියැවුණු **බුද්ධ චරිතය** නොකියවූ බෞද්ධ දරුවකු නැති තරම් ය. එසේ ම **ශ්‍රී ශාක්‍යමුනීන්ද්‍රාවදානය හෙවත් සිද්ධාර්ථ ගෞතම බුද්ධ චරිතය** නැමැති ග්‍රන්ථයේ පිටපත් ලක්ෂයකට වඩා මේ වන විට මුද්‍රණය කොට ඇත්තේ එහි ඇති වටිනාකම නිසා ය. අප නාහිමිපාණන් වහන්සේ සිංහල, පාලි, සංස්කෘත, ඉංග්‍රීසි යන භාෂාවලින් රචනා කළ කෘති හා පරිවර්තනය කළ කෘති සංඛ්‍යාව 80කට ආසන්න වේ. පුවත්පත් සඟරා ආදියට ලියූ ලිපි සංඛ්‍යාව ගණනින් කිව නොහැකි තරම් ය.

අප කතානායකයාණන් වහන්සේගේ වටිනා සේවය අගය කරමින් 1954 වර්ෂයේ දී උන් වහන්සේට සබරගමු සද්ධම්මවංස නිකාය මගින් සංඝනායක පදවියක් පිරිනමන ලදි. උන් වහන්සේ පසුව එම නිකායෙහි අතිගරු මහානායක ධුරයට ද පත්වූහ. 1954 වර්ෂයේ දී බුරුමයේ ඡට්ඨ සංගායනාව පැවැත්වූ අවස්ථාවේ එහි ප්‍රධාන උත්තරීතර අවසාන ශෝධන මණ්ඩලයට තෝරා ගැනීමත් අට්ඨකථා සංගායනාවේ දී ප්‍රධාන සභාපති හැටියට තෝරාගැනීමත් උන් වහන්සේට පමණක් නොව අප රටට ද ගෞරවයක් ගෙන දීමට සමත් විය. 1956 රාජ්‍ය පෙරළියෙන් පසු ආරම්භ කරන ලද විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ බෞද්ධ අධ්‍යයන අංශයේ මහාචාර්ය ධුරයක් උන් වහන්සේට හිමි වූයේ ද බුද්ධ ධර්මය පිළිබඳ පැවැති විශාරදත්වය හේතුවෙනි. උන් වහන්සේ පසුව එම විශ්වවිද්‍යාලයේ උපකුලපති ධුරයට ද පත්වූහ. එහෙත් උන් වහන්සේ දිගින් දිගට ම එහි සේවය කිරීමට අකැමැති වූහ. එසේ ම උන් වහන්සේට ලැබුණු තනතුරු ගෞරව නාම ප්‍රමාණය බොහෝ වේ. **සාහිත්‍ය සූරි, අග්ගමහා පණ්ඩිත, සාහිත්‍ය චක්‍රවර්ති, අභිධජ මහා රට්ඨගුරු** වැනි තනතුරු මීට නිදසුන් වේ. ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාවේ සභාපති පදවිය දසවසරක් දරූ උන් වහන්සේට **උත්තරීතර මහානායක** පදවිය පිරිනැමූ අවස්ථාවේ, **මට දැන් වයස අවුරුදු අසූවක්. ඔය පදවිය වැඩ කරන්න පුළුවන් කෙනකුට දෙන්න** කියා අනතිමානී ව ප්‍රතික්ෂේප කළ ආකාරය ද බොහෝ දෙනා අගය කළ කරුණකි.

ශාසනයේ පැවැත්ම උදෙසා ධර්ම දේශනා පවත්වමින්, පොත්පත් ලියමින් කටයුතු කළා සේ ම ගිහි දරුවන් රැසක් පැවිදි කර ශාසනය රැක ගැනීමට ද උන් වහන්සේ ක්‍රියා කළහ. ඒ අනුව පැවිදි කළ ගෝල පිරිස හතළිස් නමකට ආසන්න වේ.

"මතු බුදු වන ආනන්ද මෛත්‍රේය නාහිමි" යනුවෙන් ප්‍රකට ව සිටි අප කතානායකයාණන් වහන්සේ පුරා ශතවර්ෂයකුත් වසර දෙකක් අප අතර වැඩ සිටියහ. අප රටට. ජාතියට, ආගමට, බොහෝ සේවයක් කළ උන් වහන්සේ 1998 අගෝස්තු මස 23 දින 102 වන ජන්ම දිනය සමරන්නට ආසන්නව තිබිය දී සියලු සංස්කාර ධර්මයන්ගේ අනිත්‍ය බව පසක් කරමින් අපවත් වූහ.

ඉතා දුෂ්කර ගම් ප්‍රදේශයක ඉපිද භාෂා කිහිපයක් ම ඉගෙනගෙන බොහෝ පොත්පත් ලියමින්, දේශන පවත්වමින්, සුපේශල ශික්ෂාකාමී දිවිපෙවෙතක් ගෙවූ උන්

වහන්සේගේ චරිතය අපට ඉමහත් ආදර්ශයකි. අපගේ දියුණුව පවතින්නේ අප සතු සම්පත් ප්‍රමාණය මත නොව උත්සාහය මත බව උන් වහන්සේ අපට පෙන්වා දුන් සේක. පාසල් දරුවන් හැටියට අපට ද උන් වහන්සේගේ චරිතය ආදර්ශයට ගෙන කටයුතු කිරීමෙන් අනාගත ජීවිතයෙන් උතුම් ඵල නෙළාගත හැකි ය.

## සාරාංශය

බලංගොඩ වැනි දුෂ්කර ගම්මානයක උපත ලබා කුඩා කල ම දෙමාපියන්ගේ සෙනෙහස පවා අහිමි වුවත් ලෝක පූජිත තත්ත්වයට පත්වන්නට ආනන්ද මෛත්‍රේය හිමිපාණන් වහන්සේ සමත් වූහ. කොතරම් කම්කටොලු හා දුෂ්කරතා තිබුණත් ඒවා ජයගෙන ඉදිරියට යෑම අපටත් ආදර්ශයකි. සිල්වත් ගුණවත් මහතෙර නමක ලෙස පෙර අපර දෙදිග භාෂා කිහිපයක් ඉගෙනීමත් ධර්මධරයකු වීමත් එයට හේතු වන්නට ඇත. ශත වර්ෂාධික කාලයක් ලෝක සත්ත්වයා වෙත කරුණාවෙන් උතුම් මෙහෙවරක් කළ අතිගරු ආනන්ද මෛත්‍රේය මහානායක මාහිමියෝ බුද්ධ පුත්‍රයකු ලෙස ඉමහත් සේවයක් කළහ.

## ක්‍රියාකාරකම

1. ආනන්ද මෛත්‍රේය මහ නාහිමිපාණන් වහන්සේට හිමි වූ ගෞරව නාම 03ක් ලියන්න.

2. බලංගොඩ ආනන්ද මෛත්‍රේය මහ නාහිමිපාණන් වහන්සේ පිළිබඳ බිත්ති පුවත්පතකට කෙටි ලිපියක් සකස් කරන්න.

## පැවරුම

- බලංගොඩ ආනන්ද මෛත්‍රේය මහ නාහිමිපාණන් වහන්සේ විසින් රචිත කෘති 05ක නම් සොයා ලියන්න.

# 12

# අටලෝ දහම

මෙලොව උපන් සෑම සත්ත්වයෙක් ම සතුටින් ජීවත් වීමට කැමැති ය. දුකින් විසීමට අකැමැති ය. කීර්ති ප්‍රශංසා ලැබීමට කැමැති ය; සැප විඳීමට කැමැති ය; නින්දා අපහාස ලැබීමට හෝ දුක් විඳීමට අකැමැති ය. එහෙත් අපට ජීවිතයේ කැමැති දේ පමණක් නොව අකැමැති දේටත් මුහුණ දීමට සිදුවෙයි. බොහෝ දෙනා තමා කැමැති දේ ලැබීම නිසා අප්‍රමාණ සතුටට පත්වෙති; එසේ ම අකැමැති දෙයක් ලැබුණ විට බොහෝ සේ දුකට පත්වෙති. කරත්තයක රෝදයක් කැරකෙනවා සේ අපේ ජීවිතත් අටලෝ දහමට යටත් ව ගමන් කරයි.

අලාබය මෙන් ම ලාබය ඇති වෙනවා
අයස මෙන් ම යස සැමහට පොදු වෙනවා
නින්දා විඳින අයටත් පැසසුම් එනවා
සැප දුක සමග අට ලෝ දම් කැරකෙනවා

මහා මංගල සූත්‍රයේ දී අටලෝ දහමින් කම්පා නොවී කටයුතු කිරීම මංගල කරුණක් ලෙස දක්වා තිබේ. මංගල යනු දියුණුවයි. මංගල කරුණක් යනු දියුණුව ඇතිකරන කරුණකි; යහපත උදාකරන්නකි.

**ඵුට්ඨස්ස ලෝකධම්මෙහි**
**චිත්තං යස්ස න කම්පති**
**අසෝකං විරජං ඛේමං**
**ඒතං මංගල මුත්තමං**

## 1. ලාභ - අලාභ

ලාභය නම් ලැබීමයි. අලාභය නම් නොලැබීම හෝ අහිමිවීමයි. අපට ජීවිතයේ සෑම දා ම එකසේ ලාභ සිදුවන්නේ නැත. එසේ ම සෑම දා ම අලාභ ම සිදුවන්නේ ද නැත. ධන ලාභ, පුත්‍ර පරිවාර ආදී සම්පත් ලාභ වැනි බොහෝ ලාභ අපට ජීවිතයේ දී

හිමිවෙයි. එසේ ම බලාපොරොත්තු වන ලාභ නොලැබීම නිසා අලාභයන්ට ද ගොදුරු වීමට සිදුවෙයි.

සමාජයේ බොහෝ දෙනා ලාභයක් ලැබීමේ දී ඉතාමත් උද්දාමයට පත්වීමත්, අලාභයක් වූ විට බොහෝ දුකට පත්වීමත් දැකිය හැකි ය. එහෙත් බුදු දහමට අනුව මනස පුරුදු කරගත යුත්තේ ලාභයේ දී අපමණ සතුටු වීමටත් අලාභයේ දී බොහෝ දුකට පත්වීමටත් නොව දෙක ම එක සේ මධ්‍යස්ථ ව විඳ දරාගැනීමටයි. අප බුදුපියාණන් වහන්සේට අනාථපිණ්ඩික සිටුතුමා, බිම්බිසාර රජතුමා, කොසොල් රජතුමා, විසාකා උපාසිකාව වැනි බොහෝ දායක දායිකාවෝ සිවුපසයෙන් උපස්ථාන කළහ. එසේ ම වේරංජාවේ වැඩසිටි කාලයේ උන් වහන්සේට දානය පවා නොමැති ව වැඩවසන්නට සිදුවිය. ඒ දෙක ම එක සේ විඳ දරාගැනීමට බුදුරජාණන් වහන්සේට හැකිවිය. රජකම් කළ බිම්බිසාර රජුට අවසන් කාලයේ සිරගෙයි සිට මිය යෑමට සිදුවිය. පසේනදි කොසොල් රජු මියගියේ අම්බලමක ය. අනේපිඬු සිටුතුමා වැනි මහා ධනවත් සිටුවරයෙක් දුප්පත් විය. සීතාවක රාජසිංහ වැනි මහා රණ ශූරයකුට ඔරු කබලක් මත අසරණ ව අවසන් හුස්ම හෙළන්නට සිදුවිය. මෙවැනි නිදසුන් දෙස බැලීමේ දී අපට පෙනී යන්නේ සැම දා ම ලාභ අලාභ එකසේ හිමි නොවන බවයි. අප ඒ දෙක ම විඳ දරාගැනීමට පුරුදු පුහුණු විය යුතු ය.

## 2. යස - අයස

යස යනු කීර්තිය සම්පත යන අරුත් ඇති පදයකි. අයස යනු අපකීර්තියයි. කීර්තිය මෙන් ම අපකීර්තිය ද ලොව කාටත් පොදුවේ විඳීමට සිදුවේ. ලොව කිසිවකු සැම දා කීර්ති ප්‍රශංසා ලබා නැත. කිසිවකු අපකීර්තිය ද ලබා නොමැත. මිනිසාට මේ දෙක ම මාරුවෙන් මාරුවට හෝ අඩු වැඩි වශයෙන් ලැබේ. ඔබ සිල්වතෙකි, ගුණවතෙකි, යහපත් කෙනෙකි, හොඳ ළමයෙකි, කීකරු කෙනෙකි, දක්ෂයෙකි වැනි ඇගයීම් අපට හැම දා ම අසන්නට නොලැබෙයි. ඔබ නපුරු කෙනෙකි, ලෝභයෙකි, වංචාකාරයෙකි, නරක ළමයෙකි, දඟ ළමයෙකි, කපටියෙකි, ගුණමකුවෙකි, අහංකාර කෙනෙකි වැනි අපකීර්තිමත් වචන ද අසන්නට ලැබෙන්නට පිළිවන. අප මේ දෙක ම එක සේ විඳ දරාගැනීමට පුරුදු පුහුණු විය යුතු ය.

බුදුරජාණන් වහන්සේගේ කීර්තිය මිනිස්ලොව පමණක් නොව දෙව්ලොව බඹලොව පවා පැතිරිණි. එසේ ම උන් වහන්සේට අපහාස කිරීමට ද සමහරු ක්‍රියා කළහ. චිංචාමාණවිකා, සුන්දරී පරිබ්‍රාජිකා, මාගන්ධියා වැනි අයගේ අපහාස ද උන් වහන්සේට විඳින්ට සිදුවිය. එසේ අස්ථාන චෝදනා එල්ලවුව ද බුදුරජාණන් වහන්සේ කිසිවිට කම්පා වූයේ නැත. ජීවිතයේ අපටත් නොයෙක් අපවාද අවලාද ඇසීමට සිදුවන්නට බැරි නැත. එහෙත් අප ඒ හැම දෙයක් ම ඉවසීමට පුරුදුවිය යුතු ය.

## 3. නින්දා - ප්‍රශංසා

අන් අයගේ ඇනුම් බැණුම් ගැරහීම්වලට ලක්වීම නින්දාවයි. අන් අය විසින් තමන් වර්ණනා කිරීම, ගුණ කීම ප්‍රශංසාවයි. අපට ජීවිතයේ හැමවිට ම පැසසුම් අසන්නට නොලැබේ. සමහර අවස්ථාවල නින්දා බස් ද අසන්ට ලැබේ. වැරැද්දක් සිදුකර බැණුම් අසන්නට ලැබෙන්නේ නම් තමාගේ වරද නිසා එසේ දොසක් ඇසීමට සිදුවූවා යැයි හිත හදාගත හැකි ය. එහෙත් වරදක් නොකොට පවා බැණුම් ඇසීමට සිදුවන අවස්ථා තිබිය හැකි ය. එය ලෝක ස්වභාවයයි. අප එම අවස්ථාවල දී කලබල නොවිය යුතු ය. ඉවසා දරා සිටීමට පුරුදු පුහුණු විය යුතු ය. කිසි ම වරදක් නොකළ අප බුදුපියාණන් වහන්සේ මෙන් ම බොහෝ රහතන් වහන්සේලා පවා නිරපරාදේ නින්දා අපහාස විඳ ඇත. එහෙත් උන් වහන්සේලා කම්පා වී නැත. අපට ද ජීවිතයේ බොහෝ ප්‍රශංසා මෙන් ම අපහාසවලට ද ගොදුරු වන්නට සිදුවිය හැකි ය. අප ඒ දෙක ම එකසේ විඳ දරාගැනීමට පුහුණු විය යුතු ය. එසේ ම බුද්ධා දී උතුමෝ නිබඳව ම දෙවියන්ගේ පවා ප්‍රශංසා ලැබූහ; ඇගයීම් ගුණ වැනුම් ලදහ. එහෙත් උන් වහන්සේලා එයින් උද්දාමයට පත් වූයේ ද නැත.

## 4. සැප - දුක

සුඛ යනු සැපයි. දුක්ඛ යනු දුකයි. සැපය ආකාර දෙකකට බෙදිය හැකි ය. කායික සැප හා මානසික සැප යනු ඒ දෙකයි. දුක ද කායික හා මානසික වශයෙන් දෙයාකාර ය. බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලාට මානසික දුක් නොමැත. එහෙත් කායික දුක් ඇත. රහත් නොවූ අපට කායික දුක් මෙන් ම මානසික දුක් ද විඳීමට සිදු වේ.

අතිඋතුම් නිවන් සුවයෙන් සැනසුණේ වුව ද, උසස් ලෙස සිවුපසය ලැබුණ ද බුදුරජාණන් වහන්සේට පවා දෙව්දත් හිමියන් ගලක් පෙරලීම නිසා ශ්‍රීපාදයේ මාපට ඇඟිල්ලේ තුවාලයක් ඇතිවී වේදනා විඳීමට සිදුවිය. එසේ ම උන් වහන්සේට නිතර නිතර හිසේ රුදාවක් ද වැළඳිණ. සමහර අවස්ථාවල පිටකොන්දේ වේදනාවක් ඇතිවිය. ලෝහිත පක්ඛන්දිකා නම් රෝගය වැළඳී වේදනා විඳීමට සිදුවිය. උන් වහන්සේ මේ සියලු කායික වේදනාවන් ඉවසා දරාගෙන වැඩසිටියහ. අපටත් අසනීප වීම නිසා හෝ තුවාල සිදුවීම් ආදිය නිසා කායික වේදනා විඳීමට සිදු වේ. ඒවාට කලබල නොවී ඉවසීමට අප හුරුපුරුදු විය යුතු ය. මානසික පීඩාවලට අපට මුහුණ දෙන්නට සිදු වේ. අප ඒවා විඳ දරාගැනීමට හුරුවීම ද අවශ්‍ය ය.

ඉහත සඳහන් කළ අටලෝ දහම පිළිබඳ හොඳ අවබෝධයක් ලබා තිබීම බෞද්ධ ජීවිතයකට ඉතා ප්‍රයෝජනවත් ය. ඉගෙන ගන්නා සිසුන් ලෙස අපට ද බොහෝ ගැටලුවලට මුහුණ දීමට සිදුවේ. විභාගවලට මුහුණ දී ඉතා විශිෂ්ට ලෙස සමත් වන සිසුන් මෙන් ම අසමත් වන සිසුන් ද ඇත. සමත් වුණත් අසමත් වුණත් එය විඳ දරාගැනීමේ හැකියාව අපට තිබිය යුතු ය. දෙමාපියන්, වැඩිහිටියන්, ගුරුවරුන් සමහර අවස්ථාවල දී කරන

ප්‍රශංසා ඇගයීම් මෙන් ම ලබාදෙන අවවාද, දඬුවම් ආදිය ද සමව දරා ගැනීමට පුරුදු පුහුණු විය යුතු ය. ඒවා උපේක්ෂාවෙන් යුතුව ඉවසීම හොඳ ගුණයකි. අප ජීවත් වන පරිසරය අනුව සුනාමි, ගංවතුර, නාය යෑම්, සුළං, අවු වැසි ආදි ස්වාභාවික විපත් ආදිය නිසා අපට කරදර ඇතිවිය හැකි ය. ඒවාත් උපේක්ෂාවෙන් විඳ දරාගැනීමට අප පුරුදු පුහුණු විය යුතු ය.

**සේලෝ යථා ඒකඝනෝ**
**වාතේන න සමීරති**
**ඒවං නින්දාපසංසාසු**
**න සමිඤ්ජන්ති පණ්ඩිතා**

යන බුදු වදනට අනුව **මහා ගල් පර්වතයක් වාතයෙන් නොසෙල්වෙන්නාක් මෙන් නුවණැත්තා නින්දා ප්‍රශංසා දෙකෙහි ම නොසෙල් වී කටයුතු කරයි.** අප ජීවත් වන සමාජයේ නොයෙක් අඩුපාඩුකම් තිබිය හැකි ය. සමහරවිට ආර්ථික අපහසුකම්, පවුල් ආරවුල්, දෙමාපියන්ගේ ගැටලු ආදිය නිසා මානසික පීඩාවට පත්වන දරුවන් ද නැතිවා නොවේ. අප ඒ දේවල් ඉවසා සිටීමට පුරුදු විය යුතු ය. සමාජයේ බොහෝ ලාභවලට වඩා අලාභ විඳීමට සිදුවේ. යසසට වඩා අයස විඳීමට සිදුවේ. කීර්ති ප්‍රශංසාවලට වඩා නින්දා විඳීමට සිදුවේ. සැපට වඩා දුක් විඳීමට සිදුවේ. මෙකී අෂ්ටලෝක ධර්මතාවලින් කම්පා නොවී කටයුතු කිරීමට හුරුවීම හොඳ බෞද්ධ දරුවකුගේ ලක්ෂණයකි. තමාගේ සිත ශක්තිමත් කරගෙන ධර්මයෙහි හැසිරීමේ වගකීම තම තමා සතු වේ.

**සාරාංශය**

ලාභ - අලාභ, යස - අයස, නින්දා - පසංසා, සුඛ - දුක්ඛ යනු අටලෝ දහමයි. අංග අටකින් යුත් නිසා අෂ්ට යනුවෙන් පැවසේ. ලෝකයාට බලපාන නිසා ලෝක යැයි කියනු ලැබේ. ධර්ම යනු ස්වභාවයයි. මෙය සැමදෙනාට එකසේ බලපායි. පාසල් දරුවන් වන අපට ද මේ ධර්මතාවලට මුහුණ දීමට සිදුවේ. ඒවාට අකම්පිත ව, ඉවසීමෙන් හා අවබෝධයෙන් යුතු ව මුහුණ දීමට අප පුරුදු විය යුතු ය.

## ක්‍රියාකාරකම

1. ලාභෝ අලාභෝ අයසෝ යසෝ ච................ යන ගාථාව කටපාඩමින් කියන්න.

2. බුදුරජාණන් වහන්සේ ලාභ අලාභ ඉදිරියේ මුහුණ දුන් ආකාරය පැහැදිලි කරමින් පන්තිය ඉදිරියේ ඔබ කථාවක් කරන්නේ යැයි සිතා එහි සාරාංශය ලියන්න.

## පැවරුම

- අටලෝ දහමට අකම්පිත ව මුහුණ දීමට බැරිව අනුවණ තීරණ ගත් අය ගැන වාර්තා කීපයක් ඇසුරු කරමින් ඔවුන් බුද්ධිමත් ව ගතයුතු ව තිබුණු පියවර පහැදිලි කරමින් උපදෙස් පත්‍රිකාවක් පිළියෙල කරන්න.

## පුහුණුවට

**ලාභෝ අලාභෝ අයසෝ යසෝ ච**
**නින්දා පසංසා ච සුඛං ච දුක්ඛං**
**ඒතේ අනිච්චා මනුජේසු ධම්මා**
**අසස්සතා විපරිනාම ධම්මාති.**

"ලාභය ද, අලාභය ද, අයස ද, යසස ද, නින්දාව ද, ප්‍රශංසාව ද, සැප ද, දුක ද යන මිනිසුන් කෙරෙහි පවත්නා ලෝක ධර්ම අට අනිත්‍ය වේ; සදාකාලික නොවේ; වෙනස්වන ස්වභාවයෙන් යුක්ත වේ."

# 13

# වැවයි දාගැබයි ගමයි පන්සලයි

අප ශ්‍රී ලංකාද්වීපය තුළ ජාතික, ආගමික, සංස්කෘතික හා සාමාජික නවෝදයක් ඇති වූයේ මහින්දාගමනයේ ප්‍රතිඵලයක් ලෙසිණි. මිහිඳු මාහිමි ඉදිරිපත් කළ ජීවන දැක්ම ලක්වැසියන්ගේ හදවත තුළ තදින් ම මුල් බැසගත්තේ ය. ඒ ඔස්සේ වැඩීගිය සමාජ ආර්ථික ක්‍රමයත් එහි බෞද්ධ මුහුණුවරත් ප්‍රකට කෙරෙන ජනප්‍රිය ව්‍යවහාරය **වැවයි-දාගැබයි, ගමයි-පන්සලයි** යන්නයි.



බෞද්ධ ඉගැන්වීම් ආලෝකය කොටගත් විශිෂ්ට සංස්කෘතිය සංකේතවත් කරන අසිරිමත් වූ ද විධිමත් වූ ද වාස්තුවිද්‍යාත්මක වශයෙන් ඉහළ අගයක් ගන්නා වූ ද වැව හා දාගැබ අපගේ අනන්‍යතාව කුමක් දැයි ලොවට හෙළිකිරීමෙහි ලා පෙරමුණ ගෙන තිබේ. අතීතයේදී රුහුණු, මායා, පිහිටි යන සමස්ත තුන් සිංහලය ම ආවරණය වූයේ වී ගොවිතැන මුල්කොට ගත් කෘෂිකාර්මික ජීවන ක්‍රමයකිනි. එහිලා විධිමත් සැලසුම්ගත හා ස්ථිරසාර වාරි පද්ධතියක අවශ්‍යතාව අපේ මුතුන් මිත්තෝ මනාව තේරුම් ගත්හ. ඒ අනුව මහා සාගර වැනි වැව් ඉදිවූයේ ය.

බෞද්ධ සංස්කෘතිය හා වාපි සංස්කෘතිය අතර ඇත්තේ සමීප සබඳතාවකි. ඒ දෙක එකිනෙකින් පෝෂණය වී තිබේ. බොහෝ විට වැව් ඉදිකරවීමෙහිලා පුරෝගාමී වූවෝ සිංහල රජදරුවෝ ය. නොඑසේ නම් අමාත්‍යවරුන් හෝ එබඳු ජන ප්‍රධානීහු ය. සාගරය පරයන වැව් අමුණු ඉදිකරවීමෙන් ඔවුන් අපේක්ෂා කළේ ප්‍රජා සංවර්ධනයෙහි පදනම වන ආර්ථික සංවර්ධනයයි. ආර්ථික වශයෙන් ප්‍රමාණවත් සංවර්ධනයක් නොමැතිවීම දිළිඳුකමයි. එය පුද්ගලයාට මහත් දුකකි. මූලික ලෞකික අවශ්‍යතා සම්පූර්ණ නොවූ තැනැත්තකුට සදාචාරාත්මක හා ආධ්‍යාත්මික වශයෙන් සංවර්ධනය වීමට ද පරලොව සුගතිය උදාකර ගැනීමට ද නිවන් මඟ යාමට ද නොහැකි ය. එවන් තැනැත්තා දුසිරිතට යොමු වෙයි; අපායගාමී වෙයි. එබැවින් තම යැපීමට ප්‍රමාණවත් වූ සම්පත් ඇතිකම සැපතකැයි, බුදු දහම උගන්වයි. වැව කේන්ද්‍ර කොටගත් ජීවිතය තුළ ගැමියෝ දැහැමි දිවිපැවැත්මෙන් දැනේ වීර්යයෙන් අවශ්‍යතා සපුරා ගත්හ.

ශ්‍රී ලාංකේය සිංහල බෞද්ධ සමාජයේ ප්‍රධාන ජීවනෝපාය වූ කෘෂිකර්මාන්තය රඳා පවත්නේ වැව් දියවර මත ය. ඒ අනුව එදා පැවති ස්වයංපෝෂිත කෘෂි ආර්ථික රටාවේ පදනම වූයේ වැවයි. වැව යනු රටවැසියන් කිසිවකුත් සන්තක පෞද්ගලික දේපොළක් නොවේ. එහෙත් එය සියලු දෙනාගේ ම ජීවිත රැක දෙයි; ආරක්ෂා කරයි. පරාර්ථ චර්යාව පිළිබඳ බුදු දහමේ එන ඉගැන්වීම් හකුළා දක්වන සංකේතයක් ලෙස වැව හැඳින්විය හැකි ය. වැව හෑරීමේ දී එහි කැපුණු පසින් තැනූ ගඩොළු උපයෝගී කරගෙන වැව් ඉස්මත්තේ ඉදි කළ අහස්කුස සිපගන්නා තේජාන්විත සුදෝ සුදු දාගැබ ආධ්‍යාත්මික සමෘද්ධියේ හෙවත් නිර්වාණ මාර්ගයේ සංකේතය වේ. දාගැබ බෞද්ධ සංස්කෘතිය තුළ වැඩීගිය විශිෂ්ටතම වාස්තු විද්‍යාත්මක හැකියාව ප්‍රකට කරන නිමැවුමකි; එසේ ම බෞද්ධ කලා ශිල්පියාගේ නිර්මාණශීලී නිපුණත්වය විදහාපාන්නකි. පිළිපැදිය යුතු ධර්මයත්, පසක් කළ යුතු නිවනත්, දාගැබ මගින් සංකේතවත් වේ. සැදැහැවතුන් දාගැබ ප්‍රදක්ෂිණා කරමින් මල් පහන් පූජා කරනුයේ බුදුරදුන්ට කරන උතුම් ගෞරවයක් ලෙස ය.

සාම්ප්‍රදායික ග්‍රාමීය ප්‍රජාවගේ භෞතික, ආර්ථික අභිවෘද්ධිය උදෙසා වැව දායක වූ අතර ඔවුන්ගේ ආධ්‍යාත්මික සාරධර්ම වර්ධනය පිණිස දාගැබ උපකාරී විය. පුද්ගලයා හා සමාජය හුදෙක් භෞතික ආර්ථික සුවපත් භාවයෙන් පමණක් සෑහීමට පත් නොවිය

යුතු ය. එකී අභිවෘද්ධිය තිරසාර වන්නේ ද ඵලදායී වන්නේ ද සැබෑ මානව අභිවෘද්ධියක් ලෙස සැලකිය හැකි වන්නේ ද ඊට සමගාමී ව ආධ්‍යාත්මික, සදාචාරාත්මක අභිවෘද්ධිය ද අත්වැල් බැඳගත් විට ය. ආර්ථික අභිවෘද්ධිය හා ආධ්‍යාත්මික, සදාචාරාත්මක අභිවෘද්ධිය ද එකිනෙකට උපකාරී වෙයි. එකී දෙපැත්ත ම නොදකින්නා දෑස ම නොපෙනෙන අන්ධයෙකි. ආර්ථික දියුණුව පමණක් දකින්නා එක් ඇසක් පමණක් ඇත්තකු වැනි යැයි බුදු දහම උගන්වයි. මේ අනුව වැව අර්ථවත් කළ මෙලොව සැපත (ආර්ථික අභිවෘද්ධිය) මෙන් ම දාගැබ අර්ථවත් කළ පරලොව සැපත (ආධ්‍යාත්මික අභිවෘද්ධිය) යන උභයාර්ථය සලසා ගැනීම බෞද්ධ සංස්කෘතිය තුළ හික්මීම ලද හෙළ ගැමියාගේ ජීවන දැක්ම වූයේ ය. වැවයි, දාගැබයි එම උභයාර්ථ සංවර්ධනයේ සංකේතය වූයේ ය.

වැවේත් දාගැබේත් රැකවරණය හා ආශීර්වාදය මත පැවැති ජනපදය ගමයි. ගමේ මුදුන්මල්කඩ විහාරස්ථානයයි. ගම්වාසීන් එදිනෙදා ජීවන රටාව ගෙන යන්නේ භික්ෂූන් වහන්සේලාගේ නිසි අවවාද අනුශාසනාවත් ආශීර්වාදයත් ඇතිවයි. පන්සල ආගමික ආයතනයක් මෙන් ම අධ්‍යාපන මධ්‍යස්ථානයක් ද විය. පන්සලත් ගමත් ගසට පොත්තත් පොත්තට ගසත් සේ මනා සබැඳියාවකින් යුක්ත ව පැවැතියේ ය. අද දක්වා මත් එම සබැඳියාව ශක්තිමත් ව පවතී. විහාරස්ථානය ත්‍රිවිධ චෛත්‍යයකින් සමන්විත විය. එයින් ප්‍රමුඛ තැන හිමි වූයේ දාගැබට ය. අනුරාධපුරයේ රුවන්මැලි මහා දාගැබ ථූපාරාම දාගැබ ආදි බුදුරදුන්ගේ ශාරීරික ධාතු තැන්පත් කළ උතුම් දාගැබ් ඒ අනුව ඉදිවූයේ ය. දහස් ගණනක් දාගැබ් ගමක් ගානේ ඇති විය. එසේ ම අනුරාධපුරයේ තිසාවැව, නුවරවැව ආදි වැව් ද පුරාණ රජ දරුවන් විසින් කරවන ලදි. එදා ගමක් ගමක් පාසා කරවන ලද වැව් අදත් දේශය පෝෂණය කරයි.

රටේ ආර්ථිකය ශක්තිමත් කරවීමත් ජනතාවගේ දිවිමඟ සදාචාර සම්පන්න ලෙස පෝෂණය කරවීමත් රාජරාජමහාමාත්‍යාදීන්ගේ අභිප්‍රාය විය. වැව් ඉදිකරවීම හා දාගැබ් ඉදිකරවීමෙහිලා රජවරුන් නිරතවූයේ රටේ ජනතාවගේ ද සාමූහික සහභාගිත්වය ලබාගනිමිනි. ජනතාව ද මහත් බැති සිතින් ඒ ඒ කාර්යයන්හි නිරත වූයේ ලක්වැසියන් වූ ඔවුනට උපතින් ම උරුම වූ උතුම් වගකීමක් බව තේරුම් ගනිමිනි.

භික්ෂූන් වහන්සේලාගෙන් නිසි අවවාද අනුශාසනා ලබමින් රාජ අනුග්‍රහයත් ඇතිව ජීවත් වූ ලක්වැසියෝ වැව් අමුණු හරහා කෙත්වතු ආදිය ඵලබරින් පෝෂණය කරවා කෘෂි ආර්ථිකය නංවා රට ස්වයංපෝෂිත කළහ. මෙම ක්‍රියාකාරකම් මගින් සාමය හා සමගිය තහවුරු කෙරිණ. කෘෂිකාර්මික කටයුතුවල ලක්වැසියා සැම විට ම නිරත වූයේ සාමූහික ව ය. එක් ගොවියකුගේ කුඹුරෙහි ගොයම් කැපීම ආදි කටයුතුවලට ගමේ ගැහැනු පිරිමි සියලු දෙනා ම වාගේ පැමිණියහ. කෙත් යායෙහි ම ගොයම් කැපී අවසන් වන තුරු ගමේ ජනතාව සාමූහික ව එකාවන් ව වැඩ කළහ. ගොයම් කැපීම් ආදිය සිදුකරන කුඹුරු කොටස හිමි ගොවියා සහායට පැමිණි සියලු දෙනාට ම අවශ්‍ය ආහාරපානාදියෙන්

සංග්‍රහ කළේ ය. මෙසේ ඒ ඒ කෘෂිකාර්මික කාර්යයන් සිදු වූයේ සාමූහික ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙසයි. ඒ තුළින් ගමේ සියලු දෙනාගේ ම සුහදත්වය වර්ධනය වූවා සේ ම ඔවුනොවුන්ගේ ආර්ථික ශක්තිය ද වර්ධනය විය. මෙම වාපි සංස්කෘතියෙන් පෝෂණය ලැබූ අප රටේ ජනතාව අවි ආයුධ වෙළෙඳාම, වස විස වෙළෙඳාම, සත්ත්ව වෙළෙඳාම වැනි අධාර්මික රැකියාවල නිරතවෙමින් තමාගේ මෙන් ම අන්‍යයන්ගේ ද දිවිමඟ අඳුරු කරගැනීමට පෙළඹී නැති බව ද පෙනේ. ඔවුන් වෙතින් මැනවින් මූර්තිමත් වූයේ දැහැමි දිවි පැවැත්මයි; සමගිය හා සහජීවනයයි.

වැවත් දාගැබත් ඔස්සේ ලාංකික ජනතාවගේ සාරධර්ම මැනවින් ආරක්ෂා විය. මෙරට වැසියෝ සොරකම, බොරුකීම කිසිසේත් ම ප්‍රිය නොකළ අවංක සාධාරණ පිරිසක් ලෙස සමස්ත ලෝකයාගේ ම ගෞරවාදරයට පත් පිරිසක් වූහ. සියලු ම දෙනා එක මවකගේ දරුවන් මෙන් අන්‍යෝන්‍ය සුහදත්වය ප්‍රකට කරමින් සහජීවනයෙන් දිවිපැවැත්ම ගෙන ගියහ. ඔවුහු සැබෑ ම අවිහිංසාවාදියෝ වූ හ. සැපතේ දී මෙන් ම විපතේ දී ද සැවොම අන්‍යෝන්‍ය උපකාරය ඇතිව එකාවන් ව ක්‍රියා කළහ. ආත්මාර්ථය ඉක්මවා ගිය පරාර්ථ හැඟීමෙන් යුතුව මෙරට ජනයා ක්‍රියා කළ අයුරු මෙමගින් පැහැදිලි ය. සමාජ ජීවිතයේ දී අන්‍යෝන්‍ය වශයෙන් ඔවුනොවුන් තුළ පැවැති මෙම අත්‍යන්ත සබැඳියාව එකට කැටි වී ඒ තුළින් සහජීවනය මනාව මූර්තිමත් විය. මානව දයාව හා කරුණාව තුළින් ගොඩනගාගත් මෙම සහජීවනයට වැව මෙන් ම දාගැබ ද බෙහෙවින් ම උපකාරී වූයේ ය.

තමාට මෙන් ම සමාජයට ද බරක් නොවන ලෙස ජීවත්වීම බෞද්ධයකුගේ පරම යුතුකම සේ ම වගකීම ද වන්නේ ය. නිවැරැදිව ජීවත් වීමට නම් අපි නීතිගරුක ව හා සාධාරණ ව මෙන් ම අන්‍යෝන්‍ය සහජීවනයෙන් ද ක්‍රියා කළ යුතු වෙමු. නිවැරැදි දිවිපෙවෙත සුවයකි. එසේ ජීවත්වීමට නම් ධාර්මික වීම අත්‍යවශ්‍ය ය.

ලොව අන් එක ද ජාතියකටවත් නොමැති, ශ්‍රී ලාංකිකයන්ට ම ආවේණික වූ මෙම වැවත් දාගැබත් වත්මන් සමාජයට ලබා දෙන ආදර්ශය ඉතා වැදගත් ය. මිනිසුන් අතර සහජීවනය වර්ධනය කර ගැනීමට නම් පළමුව අප එකිනෙකා හොඳින් හඳුනාගත යුතු ය. සැපතේ දී මෙන් ම විපතේ දී ද සැවොම එකා වන් ව ක්‍රියා කිරීමට පෙලඹිය යුතු ය. සාමකාමී ජන සමාජයක් ගොඩනගාගත හැකි වන්නේ එසේ සුහදශීලී ව ක්‍රියා කිරීමෙනි.

## සාරාංශය

ලක්දිව ආගමික, සංස්කෘතික, සාමාජික හා ජාතික නවෝදයේ ප්‍රබලතම සාධකය මහින්දාගමනයයි. ඒ ඔස්සේ සංවර්ධනය වූ වැවයි-දාගැබයි, ගමයි-පන්සලයි යන සංස්කෘතික සංකල්පය රටේ සදාචාරාත්මක සංවර්ධනයේ කැඩපතයි. ලාංකේය ජනසමාජයේ සාමය හා සහජීවනය ඇතිවූයේ ද ඒ නිසා ම ය. අනාදිමත් කාලයක පටන් පැවැති එම සංස්කෘතිය මේ දක්වා ම අඛණ්ඩව ආරක්ෂා වී පවතින්නේ මෙහි වෙසෙන ජනතාවගේ බුද්ධිමය ශ්‍රේෂ්ඨත්වය මතයි.

## ක්‍රියාකාරකම

1. වැවයි, දාගැබයි, ගමයි, පන්සලයි යන මාතෘකාව ඔස්සේ ශිෂ්‍ය සමිතියේ කතාවක් පැවැත්වීමට අවශ්‍ය තොරතුරු රැස්කරන්න.

2. සාමූහික ව ගොවිතැන්හි යෙදෙන ගම්වාසීන් පිරිසක් චිත්‍රයට නඟන්න.

## පැවරුම

- අපේ සංස්කෘතික උරුමයන් ගැන කියවෙන පුවත්පත් ලිපි රැස්කොට පොතක් සකස් කරන්න.

# 14

# නිබ්බාන පරමං සුඛං

එක්තරා පොකුණක මිතුරෝ දෙදෙනෙක් වාසය කළහ. ඉන් එකෙක් ඉදිබුවෙකි. ඔහුට ගොඩ දිය දෙක ම හුරු ය. හෙතෙම එම පරිසර පද්ධති දෙකෙහි ම වාසය කිරීමට සමත් වෙයි. ඉදිබුවාගේ මිතුරා මාළුවෙකි. ඔහුට ගොඩබිම නුහුරු ය. දියෙහි ම ඉපිද එහි ම වසන හෙතෙම ගොඩබිම පරිසරය නොදකියි. දිනක් ඉදිබුවා පොකුණෙන් ගොඩබිමට පැමිණ දීර්ඝ සංචාරයක යෙදුණේ ය. ඔහුට බොහෝ දේ දකින්නට ලැබුණි. සවස් යාමයෙහි නැවත පොකුණට පැමිණි හෙතෙම තම මිතුරු මාළුවාට කතා කළේ ය. තමා ගොඩබිම ඇවිද ආ බවත්, බොහෝ දේ දුටු බවත් පැවසුවේ ය. ඉදිබුවා සිය ගොඩබිම අත්දැකීම් එසේ ඉතා සතුටින් හා උද්‍යෝගයෙන් සිහිපත් කළ ද මාළුවාට කිසිවක් නොතේරුණි. "ඒ කියන්නේ ඔබ පිහිනා ගිය බව නොවේද?"යි මාළුවා අවසානයේ දී විමසී ය. ගොඩබිම ඝන බවත්, එහි පිහිනිය නොහැකි බවත්, ඇවිද යා යුතු බවත් මාළුවාට කියා දෙන්නට හේ බෙහෙවින් උත්සාහ කළේ ය. එහෙත් මාළුවාට කිසිවක් නොතේරුණි. ගොඩබිම යනු පොකුණ මෙන් ජලය ඇති රළ සහිත කිමිද පිහිනා යා හැකි තැනක් විය යුතු බව මාළුවා තදින් ම කියා සිටියේ ය. මෙය උපමා කතාවකි.

සසර වසන කෙලෙස් සහිත පුහුදුන් තැනැත්තකුට සසරින් එතෙර කෙලෙස් රහිත වූ දුක්ඛ නිරෝධය හෙවත් නිවන යනු කුමක් දැයි, කියා දීම පහසු කටයුත්තක් නොවේ. එය ඉදිබුවා මාළුවාට පොකුණෙන් එතෙර ඇති ගොඩබිම ගැන කියා දීමට සමාන කළ හැකි ය. නිවන යනු බුද්ධාදී මහ රහතන් වහන්සේගේ අත්දැකීමයි. උන් වහන්සේලා සසර දුක් ඇති කරන කාම තණ්හාව හෙවත් පස්කම් සැපතෙහි කැමැත්ත ඇති, ඉඳුරන් පිනවීමේ රුචිය ද, භව තණ්හාව හෙවත් මගේ ය, මම වෙමි, මගේ ආත්මය වේ යැයි සලකා ගන්නා ශාස්වත දෘෂ්ටිය අනුව භවයෙහි හැකිතාක් සැප විඳීමට ඇති ආශාව ද, විභව තණ්හාව හෙවත් සියල්ල මරණයෙන් කෙළවර වේ, මතු පැවැත්මක් පුනර්භවයක් නැත යන උච්ඡේද දෘෂ්ටිය මුල් කොට ගත් මෙලොව හැකිතාක් සැප විඳීමට ඇති ආශාව ද දුරු කළ උතුමෝ වෙති. එසේ තුන් වැදෑරුම් යැයි පළමු දම් දෙසුමේ දී බුදුරදුන් වදාළ තෘෂ්ණාව මුළුමනින් ම දුරු කළ බුද්ධාදී ආර්ය උතුමන්ගේ අත්දැකීම නිවනයි. එය දැන දැකගත්, එහි ඇති සුවය හඳුනාගත් එම නිදහස ශාන්තිය උදා කරගත් උන් වහන්සේලාගේ එම අත්දැකීම සසර වසන තෘෂ්ණාව ඇති කෙලෙස් සහිත අපට විඳගත නොහැකි ය;

තේරුම් ගත නොහැකි ය. එනිසා ම අප ලියන, කතා කරන භාෂාව පවා දුක්ඛ නිරෝධයේ හෙවත් නිවනෙහි ස්වභාවය පැවසීමට සපුරා ප්‍රමාණවත් නොවේ. භාෂාවෙහි ඇත්තේ අප දන්නා දේ අපේ අදහස්වල අත්දැකීම් පැවසීමට යොදන වචනයි. නිවන අපගේ අත්දැකීමක්, වින්දනයක් නොවන බැවින් ඒ ගැන විස්තර කිරීමට භාෂාව ප්‍රමාණවත් නොවේ. එහෙත් අපට භාෂාව නැති ව බැරි ය. භාෂාව නොමැතිව සසර හෝ නිවන විස්තර කිරීමට අපි අසමත් වෙමු. මේ අනුව බුදුරජාණන් වහන්සේ ද පරමාර්ථ සත්‍යය වූ නිවන තේරුම් කර දීමට සම්මුතියක් වන භාෂාව භාවිත කළහ. භාෂාවේ හමුවන "ඇත" යන අර්ථය ඇති වචන පසෙකින් තබා "නැත" යන අර්ථය ඇති වචන බුද්ධ දේශනාව තුළ නිරෝධ සත්‍යය විස්තර කිරීමට යොදාගෙන තිබේ. එසේ ම නිරෝධය හා එහි ස්වභාවය විස්තර කිරීමේ දී සමාන හා සමීප අර්ථ ඇති වචන රැසක් එකවර යොදා ගැනීම ද සූත්‍ර දේශනාවල දැකගත හැකි ය. බුදුරජාණන් වහන්සේගේ මංගල ධර්ම දේශනාවෙහි තෙවැනි ආර්ය සත්‍යය වූ දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය මෙසේ විස්තර වේ.

**දුකට මුල් වන්නා වූ තෘෂ්ණාව මුලුමණින් නැසීමක් වේද, අත් හැරීමක් වේද, දුරලීමක් වේද, මිදීමක් වේද, එහි නොඇලීමක් වේද එය දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යයයි.**

මේ අනුව සත්ත්ව සන්තානයෙහි මුල්බැස ඇති, කා වැදී ඇති **තෘෂ්ණාව සපුරා නැති කිරීම, මුලිනුපුටා දැමීම නිවනයි, නිරෝධයයි. තෘෂ්ණාව ක්ෂය කිරීම නිවන** වේ යැයි තවත් බුද්ධ දේශනාවක දක්වා තිබේ. තෘෂ්ණාව ඇතිතාක් සසර දුක ඇත. එනම් ඉපදීම, ලෙඩවීම, මහලු වීම, මරණය ආදි කටුක අප්‍රසන්න අත්දැකීම්වලට මුහුණදීමට අපට සිදු වේ. තෘෂ්ණාව සපුරා නැති කළ විට සසර දුක ද සපුරා නැති වේ යැයි, මෙසේ තෘෂ්ණාව ද ඉන් උපදනා සියලු දුක් දොම්නස් ද නැවත නූපදනා පරිදි නැතිවීම සැපතකි. එය පරම සැපතයි; උතුම් සැපතයි; බුදු දහමෙහි ඉගැන්වෙන පරම නිෂ්ටාවයි; අවසාන විමුක්තියයි; නිවනයි.

භව යනු පැවැත්ම ය. ස්කන්ධ ධාතු ආයතනාදී වශයෙන් දහමෙහි හැඳින්වෙන සත්ත්වයාගේ ජීවිතයට හා පැවැත්මට තුඩුදෙන භෞතික මානසික ශක්තීන්ගේ නොසිඳී පැවැත්ම ය. එයට ම සසර යැයි කියනු ලැබේ. එබැවින් බුද්ධ වචනයෙහි භව නිරෝධය නිවන නම් වේ යැයි ද දක්වා තිබේ. එසේ භවය අවසන් වන්නේ තණ්හාව සපුරා නතර වීමෙනි; සියලු කෙලෙස් නැති වීමෙනි. සසර දුකට හා දුක් සහිත පැවැත්මට එක ම හේතුව තණ්හාව නොවේ. එය මූලික හේතුවයි. රාග, ද්වේශ, මෝහාදී තණ්හාව පෙරටු කොටගත් සියලු කෙලෙස් සසර දුක් උපදවයි. ඒ අනුව මිනිස් සන්තානයෙහි කාවැදී ඇති රාගාදිය මුළුමනින් ක්ෂය වීම නිවන යැයි ද බුදුරජාණන් වහන්සේ වදාළහ.

තණ්හාව ඇතුළු රාග, ද්වේශ, මෝහාදී සියලු කෙලෙස් මුල් කොටගෙන දුක් ඇතිවන බව අපි දනිමු. ඉපදීම හෙවත් සත්ත්වයාගේ හට ගැනීම, ජරාව හෙවත් දිරා යාම එනම් මහලු වීම, ව්‍යාධිය හෙවත් ලෙඩ දුක්, රෝග පීඩා ඇති වීම, මරණය හෙවත් ජීවිතයේ අවසානය ආදී වශයෙන් දුක්ඛ ආර්ය සත්‍ය දේශනාවෙහි පෙන්වා දුන්, සසර වසන සත්ත්වයාට විඳීමට සිදු වී ඇති එකී දුක් දොම්නස් සියල්ල අවසන් වීම නිවන ය. එබැවින් නිවන යනු සසර දුකෙහි අන්තය යැයි දක්වා තිබේ.

**සියලු සංස්කාරයන් සංසිඳීම, සියලු බැඳුම් අත් හැරීම, තෘෂ්ණාව සපුරා නැති කිරීම, විරාගය, නිරෝධය, නිර්වාණයයි.** හේතු ප්‍රත්‍ය ඇති කල ඇතිවන නැති කල නැතිවන අනිත්‍ය වූ, දුක් සහිත වූ, අනාත්ම වූ සියල්ල මෙහි සංස්කාර යනුවෙන් දක්වන ලදි. එකී සසර පැවැත්ම ඇති කරන ස්කන්ධ ආදි සංස්කාර ධර්මයන්ගේ සංසිඳීම නිවන ය. සසර වසන අපි සචේතනික-අචේතනික, සජීවී-අජීවී බොහෝ දෙයට සිතින් බැඳී සිටිමු; ඇලී සිටිමු. එම බැඳීම්, ඇලීම් අත්හැරීම, නැතිවීම නිවනයි. එබැවින් තෘෂ්ණාව සපුරා අවසන් වීම විරාගය හෙවත් නොඇලීම, නිරෝධ නිවන යැයි උගන්වන ලදි.

නිවන ගැන තවත් බුද්ධ දේශනයක මෙසේ පැහැදිලි කෙරේ.

**මහණෙනි, හටගත් හෝ නොහටගත් හෝ යම්තාක් (ස්කන්ධ ආදි) ධර්මයෝ වෙත් ද ඔවුන් අතර විරාගය ම උතුම් යැයි කියනු ලැබේ. එනම් මදය සංසිඳවන, තෘෂ්ණා පිපාසය නැති කරවන, ඇලීම මුලින් උපුටා දමන, පැවැත්ම සිඳ දමන, තෘෂ්ණාව වනසන, විරාගයයි, නිරෝධයයි, නිර්වාණයයි.**

දුක්ඛ නිරෝධය හෙවත් නිවන සැපතක් වන්නේ කෙසේ දැයි, අනුමාන වශයෙන් හෝ තේරුම් ගැනීම මෙහි දී ඉතා වැදගත් වේ. දුක සිරගෙයක් හා සමාන ය. සසර නමැති සිරගෙයි වසන සත්ත්වයෝ නොයෙක් ආකාරයේ දුක් පීඩාවලට ගොදුරු වෙති. මිනිස් සිත් තුළ තෘෂ්ණාව නොමැති නම් එතැන දුක නමැති සිරගෙය ද නැත. එය පරම සැපතකි. අප සමාජය තුළ ජීවත් වීමේ දී යම් යම් කරුණු මුල් කරගෙන අධික ලෙස කෝපයට පත්වන අවස්ථා තිබේ. එවිට පිටස්තරව අප දෙස බලන කෙනකුට අපගේ මුහුණ අතපය යනාදී ශරීරාංගවල පවා යම් වෙනසක් දැකිය හැකි ය. ඒ කෝපය ඇතිවීමෙන් උපන් මානසික විකෘතිය නිසා ය. කෝපය තාවකාලික ය. එය තුරන් වී ගිය පසු අප සිතට කෙතරම් සුවයක් හා සැනසිල්ලක් ලැබේ ද යන්න සිතා බැලිය යුතු ය. අප සාංසාරිකව සොයන, විඳින සැප සම්පත් හැඳින්වෙන්නේ වේදයිත සැප යනුවෙනි. ලෞකික වශයෙන් විඳින සැපයි. නිවන අවේදයිත සැපතකි. එනම් නිවන සැපතකැයි කියන්නේ අප සිතන පතන සැප එහි ඇති නිසා නොවේ; දුකක් නැති නිසා ය.

මහිච්ඡතාව යනු අසීමිත ආශාවන් ඇති බවයි; බොහෝ දෑ කැමැති වීමයි. මහ බලාපොරොත්තු ඇති බවයි. එයින් ජීවිතයේ සැනසිල්ල, සතුට නැති වේ; සිත්හි සහනය අහිමි වේ; මිනිසුන් අතර ගැටුම් ඇති වේ; තරගය වැඩි වේ. බුදු දහම අනුව අප අල්පේච්ඡ ජීවිතයක් ගත කිරීමට හුරු විය යුතු ය. එවිට සැනසිල්ලෙන් ජීවත් විය හැකි ය. මිල-මුදල්, ඉඩ-කඩම්, යාන-වාහන, ගෙවල්-දොරවල්, ආහාර-පාන යනාදිය පිළිබඳ ඇතැමුන්ට ඇත්තේ අසීමිත ආශාවකි. මෙකී ලෞකික දේ රැස් කිරීමටත්, ඒවායෙහි ප්‍රයෝජන භුක්ති විඳීමටත් ඔවුහු වැඩි කාලයක් ගත කරති. කිසිදු විවේකයක්, මානසික නිදහසක් නොමැති ව ලෞකික දේ පසුපස ම හඹා යන සමහරෙක් එයින්ම වෙහෙසට දුකට පත්වෙති; විවිධ පීඩා විඳිති.

බුදුරජාණන් වහන්සේ ප්‍රශංසා කරන්නේ, අගය කරන්නේ අඩු බලාපොරොත්තු ඇති සීමිත ආශාවන් ඇති ජීවිතයි. බලාපොරොත්තු අඩු තැනැත්තා ලද දෙයින් සතුටු වෙයි. (සන්තුස්සකො); පෝෂණය කිරීම පහසු ය. (සුභරෝ) එසේ ම අසීමිත අපේක්ෂා නැති අල්පේච්ඡ තැනැත්තා විවේකයෙන් ජීවත් වෙයි. ඔහුට වැඩ අඩු ය. (අප්පකිච්චො) ඔහුගේ පැවැත්ම සැහැල්ලු ය. (සල්ලවුකවුත්ති) තව ද ඔහුගේ ඉන්ද්‍රිය සංවර ය. (සන්තින්ද්‍රියො) ඔහු නුවණැත්තෙකි. (නිපකො) අල්පේච්ඡ මිනිසුන් වසන ලෝකයේ ස්වාභාවික සම්පත ද සුරකෙයි. ඔවුහු එම සම්පත් නිසි පාලනයකින් යුතු ව භුක්ති විඳිති. ආශාව අඩු කරගෙන ජීවත් වූ තරමට ම අපි කෙමෙන් කෙමෙන් නිවනට ළං වෙමු. අසීමිත ආශාවන් පොදි බැඳගෙන ජීවත් වීම නිවන් මග අවහිර කොට සසර ගමන ද දීර්ඝ කරවීමට හේතු වෙයි. එබැවින් අල්පේච්ඡ ජීවිතයක් පවත්වාගෙන යාමට අප කුඩා කල පටන් ම හුරු පුරුදු විය යුතු ය. දුක්ඛ නිරෝධය වෙත ළඟා විය හැක්කේ එසේ අපිස් පැවැත්ම පෙරටු කොටගත් ශික්ෂණය ඔස්සේ ය.

## සාරාංශය

නිවන් සුවය ඉක්මවා යන පරම සුවයක් ලෝකයේ නොමැත. දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය මගින් උගන්වන්නේ සියලු දුක් නැති කිරීමෙන් ලබන එම සුවයයි. එනම් දුකට මුල් වන තෘෂ්ණාව මුළුමනින් නැති කිරීමයි; සියලු කෙලෙස් මුලිනුපුටා දැමීමයි; භව නිරෝධයයි. එය දුකෙහි අන්තය වෙයි. අල්පේච්ඡ, සරල ජීවිතයක් ගත කිරීම නිවනට ක්‍රමයෙන් ළඟා වීමකි.

## ක්‍රියාකාරකම

1. "නිබ්බාන පරමං සුඛං" යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

2. තෘෂ්ණාවෙහි ස්වභාවය කියැවෙන කෙටි ඡේදයක් ලියන්න.

3. අල්පේච්ඡ, සරල ජීවිතයකට හුරුපුරුදු වීමේ ප්‍රයෝජන දැක්වෙන වාක්‍ය 03ක් ලියන්න.

## පැවරුම

- ධම්මචක්කප්පවත්තන සූත්‍රයෙහි දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය විස්තර කෙරෙන පාලිපාඨය ලියා දක්වන්න.

## පුහුණුවට

යථාපි මූලේ අනුපද්දවේ දළ්හෙ
ඡින්නොපි රුක්ඛෝ පුනරේව රූහති
ඒවම්පි තණ්හානුසයේ අනූහතේ
නිබ්බත්තති දුක්ඛමිදං පුනප්පුනං.

මුල හොඳට ඇති කල
කැපූ ගස් ලියලන සේ
දුරු නොකළ කල තණ්හා
පුන පුනා දුක උපදී.

# 15 දුකින් මිදෙන මග උගනිමු

අප මහ බෝසතාණන් වහන්සේ සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් දස පාරමිතා ධර්ම සම්පූර්ණ කරමින් සසර සැරිසැරුවේ සත්ත්වයා දුකින් එතෙර කිරීමේ අරමුණ ඇතිවයි. අවසන බුද්ධත්වයට පත් වී පළමු ධර්ම දේශනාවෙන් ම පස්වග මහණුන්ට චතුරාර්ය සත්‍යය දේශනා කළ බව අපි දනිමු. දුක්ඛ ආර්ය සත්‍යය, දුක්ඛ සමුදය ආර්ය සත්‍යය, දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය, දුක්ඛ නිරෝධගාමිණී පටිපදා ආර්ය සත්‍යය යනු ඒ ආර්ය සත්‍ය සතරයි. මීට පෙර පළමු සත්‍ය තුන පිළිබඳ ව ඉගෙනගත් අප අද ඉගෙන ගන්නේ දුක්ඛ නිරෝධගාමිණී පටිපදා ආර්ය සත්‍යය පිළිබඳවයි.

සත්ත්වයා සසර දුක් විඳින බවත්, එම දුක් විඳීමට හේතුවක් ඇති බවත්, එය නැති කළ හැකි බවත් අපි දනිමු. එය නැති කිරීමේ මාර්ගය ද අප උගත යුතු ය. දුක් නැති කිරීමේ මාර්ගයේ අංග අටක් ඇති බව බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන් සේක. භාරතීය ආගමික සමාජය අන්තගාමී පිළිවෙත් අනුගමනය කළේ මෙම අංග අටකින් යුත් මාර්ගය නොදන්නාකම නිසයි. කාමසුඛල්ලිකානුයෝගයට හෙවත් අපමණ ව සැප විඳීමට පුහුදුන් පුද්ගලයා රුචි කරයි. එය අන්තවාදී පිළිවෙතකි. බුදුවදන අනුව **කාමසුඛල්ලිකානුයෝගය පහත් පිළිවෙතකි (හීනෝ), එය නොදියුණු ය (ගම්මෝ), පුහුදුන් ස්වභාවය ඇත්තේ ය (පොථුජ්ජනිකෝ), ආර්ය පැවැත්මක් නොවේ (අනරියෝ), අවැඩදායක ය (අනත්ථ සංහිතෝ).** එම පිළිවෙත සේවනය නොකළ යුතු යැයි වදාරන ලද්දේ ය. එයින් විමුක්තියක් ලැබිය නොහැකි ය. **අත්තකිලමථානුයෝගය හෙවත් සිරුරට අපමණ දුක්දීම තුළින් විමුක්තිය සෙවීම ද අන්තවාදී පිළිවෙතකි. එය දුක් සහිත ය, අනාර්ය ය, අවැඩදායක ය.** එයින් ද විමුක්තිය ලැබිය නොහැකි ය. එම අන්ත දෙකේ ගමන් කිරීමෙන් අපට සසර දුකින් එතෙර විය නොහැකි බැවින් මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කළ යුතු ය. එය ආර්ය අෂ්ටාංගික මාර්ගය ලෙසින් හැඳින්වේ. මෙම අංග අටකින් යුත් ප්‍රතිපදාව සීල, සමාධි, පඤ්ඤා යන ත්‍රිශික්ෂාවට අයත් වේ. එය ම නිර්වාණ මාර්ගයයි; සසර සියලු දුකින් එතෙර වීමේ මගයි.

| | | |
|---|---|---|
| 01 | සම්මා දිට්ඨි (නිවැරැදි දැකීම) | පඤ්ඤා |
| 02 | සම්මා සංකප්ප (නිවැරැදි කල්පනාව) | |
| 03 | සම්මා වාචා (නිවැරැදි වචනය) | සීල |
| 04 | සම්මා කම්මන්ත (නිවැරැදි කටයුතු) | |
| 05 | සම්මා ආජීව (නිවැරැදි දිවි පැවැත්ම) | |
| 06 | සම්මා වායාම (නිවැරැදි උත්සාහය) | සමාධි |
| 07 | සම්මා සති (නිවැරැදි සිහිය) | |
| 08 | සම්මා සමාධි (නිවැරැදි සිත එකඟ කිරීම) | |

## 1. සම්මා දිට්ඨි (නිවැරැදි දැකීම)

ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සෑම අංගයක් සඳහා ම "සම්මා" යන වචනය මුලින් යෙදී තිබේ. එයින් "යහපත්, නිවැරැදි" යන අර්ථ ගම්‍ය වේ. එයින් පෙනී යන්නේ මෙම අංග අටට ප්‍රතිවිරුද්ධ වූ අයහපත් හා වැරැදි පිළිවෙත් ද ඇති බවයි. දිට්ඨි යනු දැකීමයි. සම්මා දිට්ඨි යනු නිවැරැදි දැකීමයි. මිච්ඡා දිට්ඨි යනු වැරැදි දැකීමයි.

සම්මා දිට්ඨිය ද දෙයාකාර ය. පළමුවැන්න දුන් දෙයෙහි විපාක ඇත, කළ හොඳ නරකවල විපාක ඇත, මෙලොවක් පරලොවක් ඇත යනාදි වශයෙන් විස්තර වන දසවස්තුක සම්මා දිට්ඨියයි. දෙවැන්න චතුසච්ච සම්මා දිට්ඨියයි. දුක පිළිබඳ ඥානය, දුක ඇතිවීමේ හේතුව පිළිබඳ ඥානය, දුක නැතිකිරීම පිළිබඳ ඥානය, දුක නැතිකිරීමේ මාර්ගය පිළිබඳ ඥානය යන චතුරාර්ය සත්‍ය ඥානය මෙහි දී චතුසච්ච සම්මා දිට්ඨිය ලෙස හැඳින්වේ. එය ආර්ය අෂ්ටාංගික මාර්ගයේ පළමු අංගයයි. සම්මා දිට්ඨිය ආර්ය මාර්ගයේ ඇතුළත් අංග අටට ම මූලික පදනම සපයයි. මෙයට ප්‍රතිවිරුද්ධ වූ දුන් දෙයෙහි විපාක නැත, කළ හොඳ නරකවල විපාක නැත, මෙලොවක් පරලොවක් නැත යනාදි වශයෙන් වන දසවස්තුක මිච්ඡා දිට්ඨියක් ද ඇත.

## 2. සම්මා සංකප්ප (නිවැරැදි කල්පනාව)

අරිඅටඟිමඟෙහි දෙවන අංගය සම්මා සංකප්පයයි. සම්මා සංකප්ප යනු නිවැරැදි කල්පනාවයි. අපට ඇතිවන වැරැදි කල්පනාවන් මිච්ඡා සංකප්ප ලෙසින් හැඳින්වේ. කාම සංකප්ප, ව්‍යාපාද සංකප්ප හා විහිංසා සංකප්ප යනු ඒ මිච්ඡා සංකප්ප තුනයි. එම මිච්ඡා සංකප්පවලින් වෙන් වූ සම්මා සංකප්පය නොහොත් නිවැරැදි කල්පනාව ද තුන් ආකාර ය.

1. නෙක්ඛම්ම සංකප්ප (කාම වස්තූන්ගෙන් වෙන්වීමේ සංකල්පනාව)
2. අව්‍යාපාද සංකප්ප (ව්‍යාපාදයෙන් වෙන්වීමේ සංකල්පනාව)
3. අවිහිංසා සංකප්ප (හිංසාවෙන් වෙන්වීමේ සංකල්පනාව) යනු ඒ තුනයි.

## 3. සම්මා වාචා (නිවැරැදි වචනය)

සම්මා වාචා යනු නිවැරැදි වචනයයි. වචනය සංවර කරගැනීම මෙයින් අදහස් වේ. වචනයෙන් වැරැදි සතරක් සිදු වේ. ඒවා මුසාවාද, පිසුණාවාච, ඵරුෂාවාච, සම්ඵප්පලාප යනුවෙන් හැඳින්වේ. යම් කෙනෙක් එසේ වචනයෙන් සිදුවන වැරැදි සතරින් වෙන් ව යහපත් වචන භාවිත කරයි නම් එය සම්මා වාචා නම් වේ. වචනයෙන් සිදුවන වැරැදි කරන්නා මිච්ඡා වාචා අනුගමනය කරන්නෙකි.

1. මුසාවාදා වේරමණී
   අනුන් රවටන බොරු කීමෙන් වැළකී ඇත්ත කතා කිරීම
2. පිසුණාවාචා වේරමණී
   අනුන් බිඳුවන කේලාම් කීමෙන් වැළකී අනුන් සමගි කරන වචන භාවිත කිරීම.
3. ඵරුසාවාචා වේරමණී
   අනුන් සිත් පාරන, රළු, පරුෂ වචන කීමෙන් වැළකී මිහිරි, කනට සුවදෙන වචන කතා කිරීම
4. සම්ඵප්පලාපා වේරමණී
   නිෂ්ඵල වූ, අරුත් සුන්, හිස් වචන ප්‍රකාශ කිරීමෙන් වැළකී අර්ථවත්, ප්‍රයෝජනවත් සේ කතා කිරීම නිවැරැදි වචන යනු මේවා ය.

## 4. සම්මා කම්මන්ත (නිවැරැදි කටයුතු)

සම්මා කම්මන්ත යනු නිවැරැදි ව ක්‍රියා කිරීමයි. මෙහි අවධානය යොමුකර ඇත්තේ කයින් සිදු කරන ක්‍රියා පිළිබඳ ව ය. සතුන් මැරීම, සොරකම් කිරීම, කාමයෙහි වරදවා හැසිරීම යන අකුසල් කයින් සිදුවෙයි. එම වැරැදි ක්‍රියාවලින් ඈත්ව, යහපත් ක්‍රියාවල නිරතවීම සම්මා කම්මන්ත නම් වේ. එය තුන් ආකාර ය.

1. පාණාතිපාතා වේරමණී
   සතුන් මැරීමෙන් හා සත්ත්ව හිංසාවෙන් වැළකීම
2. අදින්නාදානා වේරමණී
   සොරකම් කිරීමෙන් වැළකීම
3. කාමේසු මිච්ඡාචාරා වේරමණී
   කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීම

ප්‍රාණඝාතය ආදී අකුසල ක්‍රියාවන්ගෙන් වැළකී සත්ත්ව ජීවිත ආරක්ෂා කිරීම, අන්සතු දේ ආරක්ෂා කිරීම, ශිෂ්ට සම්මත අඹුසැමි සම්බන්ධතාව යන නිවැරැදි ක්‍රියාවල යෙදීම සම්මා කම්මන්ත ලෙස හැඳින්වේ.

## 5. සම්මා ආජීව (නිවැරැදි දිවි පැවැත්ම)

දිවි පැවැත්ම සඳහා අයහපත් වෘත්තීන්හි නිරත වීම මිච්ඡා ආජීවයයි. ඒවායින් වෙන්වී යහපත් රැකියා මාර්ගවල යෙදීම සම්මා ආජීවයයි. යම් කෙනකු ජීවිකා වෘත්තිය සඳහා සතුන් මරන්නේ නම්, සොරකම් කරන්නේ නම්, දුරාචාරයෙහි යෙදෙන්නේ නම්, වෙනත් පාපතර වෘත්තියක නිරත වේ නම් එය මිච්ඡා ආජීවයයි. කුහකකම්, කපටිකම්, සැහැසිකම් ආදිය දිවි පැවැත්ම උදෙසා නොකළ යුතු ය. පංචවිධ වෙළෙඳාම් කිරීම ආදියෙන් වැළකිය යුතු ය. එසේ නොකළයුතු වෙළෙඳාම් පහ නම්,

1. අවිආයුධ වෙළෙඳාම
2. සත්ත්ව වෙළෙඳාම
3. මස්මාංස වෙළෙඳාම
4. මත්ද්‍රව්‍ය වෙළෙඳාම
5. වසවිෂ වෙළෙඳාම යනුයි. මෙහි සඳහන් වන්නේ වෙළෙන්දකු විසින් පාපී, අකුසල සහගත, නොකළ යුතු වෙළෙඳම් ය. මෙබඳු වෙළෙඳම් අතහැර දැහැමි වෙළෙඳම් කිරීමට බෞද්ධයකු යොමු විය යුතු ය. නිදසුන් වශයෙන් දක්වන ලද එබඳු අදැහැමි වෙළෙඳම් ඇතුළු සියලු ආකාරයේ පාපී ජීවිකා වෘත්තීන්ගෙන් වැළකී තම දිවිපෙවෙත දැහැමි ව ගෙවීමට අප වගබලාගත යුතු ය. එය සම්මා ආජීවයයි.

## 6. සම්මා වායාම (නිවැරැදි උත්සාහය)

වායාම යනු කුමක් ද? එය උත්සාහය, වීර්යය, වෑයම යන අර්ථ ගෙන එයි. ඕනෑ ම කාර්යයක් සඳහා ගන්නා උත්සාහය සම්මා වායාම නොවේ. යහපත් උත්සාහය සම්මා වායාම නමින් හැඳින්වේ. එනම් දුකින් මිදීම සඳහා වන සිව් වැදෑරුම් උත්සාහයයි.

1. නූපන් අකුසල් නොඉපදවීමට දරන වෑයම
   (මෙතෙක් නොකළ අකුසල් මතුවටත් නොකිරීමට දරන උත්සාහය)
2. උපන් අකුසල් දුරු කිරීමට දරන වෑයම
   (තමා තුළ ඇති අකුසල් දුරු කිරීමට දරන වෑයම)
3. නූපන් කුසල් උපදවා ගැනීමට දරන වෑයම
   (නූපන් කුසල් ඉපිදවීම සඳහා දරන වෑයම)
4. උපන් කුසල් රැක ගැනීමට හා වැඩි දියුණුකර ගැනීමට උත්සාහ කිරීම
   (තමා තුළ ඇති කුසල් තවදුරටත් දියුණු කර ගැනීමට උත්සාහ කිරීම)

## 7. සම්මා සති (නිවැරැදි සිහිය)

සතිය යනු සිහියයි. සම්මා සතිය නිවැරැදි සිහිය, හොඳ සිහිය, මනා සිහිය, යහපත් සිහිය යනාදි වශයෙන් හැඳින්විය හැකි ය. මෙහි දී අදහස් කෙරෙනුයේ සතර සතිපට්ඨානයෙන් යුක්ත වූ පැවැත්මයි. සතර සතිපට්ඨානය මෙසේ ය.

1. කායානුපස්සනාව
   (ශරීරයේ ක්‍රියාකාරිත්වය හා ස්වභාවය පිළිබඳ සිහිය)
2. වේදනානුපස්සනාව
   (කයට දැනෙන සැප දුක් ආදී වේදනා පිළිබඳ සිහියෙන් කටයුතු කිරීම)
3. චිත්තානුපස්සනාව
   (පහළවන සිත්වල ස්වභාවය පිළිබඳ අවධානයෙන් සිටීම)
4. ධම්මානුපස්සනාව
   (පංච නීවරණ ආදී ධර්ම අනුව සිහිය යෙදවීම)

## 8. සම්මා සමාධි (නිවැරැදි මානසික එකඟ බව)

සමාධිය යනු චිත්ත ඒකග්‍රතාව හෙවත් සිතේ එකඟකමයි. සම්මා සමාධිය යනු කුසල් අරමුණක සිත එකඟ වීම ය. අයහපත් අරමුණක ද සිත එකඟ කළ හැකි ය. ඒ මිච්ඡා සමාධියයි. සම්මා සමාධිය යනු විවිධ අකුසලයන්ගෙන් හා විවිධ කාමයන්ගෙන් වෙන් ව භාවනා කිරීම තුළින් ලබන සමාධියයි. එනම් ප්‍රථමධ්‍යාන, ද්විතීයධ්‍යාන, තෘතීයධ්‍යාන, චතුත්ථධ්‍යානාදිය තුළින් ලබන සමාධිය වේ. අකුසල ධර්මයන්ගෙන් වෙන්වීම යන්නෙන් පංචනීවරණ ධර්ම යටපත් කිරීම අර්ථවත් වේ. එනම් කාමච්ඡන්ද, ව්‍යාපාද, ථිනමිද්ධ, උද්ධච්ච කුක්කුච්ච හා විචිකිච්ඡා යන පහයි. කාමයන්ගෙන් වෙන්වීම යන්නෙන් අර්ථවත් වන්නේ රූපාදී කාම වස්තු කෙරෙහි ඇලීමට ඇති කැමැත්තෙන් ඈත්වීමයි.

ඉහත දක්වන ලද අංග අටකින් යුත් මාර්ගය නිවන් මාර්ගයේ ගමන් කරන බෞද්ධයකුට පමණක් නොව මෙලොව සතුටින් සිටීමට කැමැති හා ධාර්මික ව දියුණුව පතන කාහට වුව ද ප්‍රයෝජනවත් වේ. අධ්‍යාපනය ලබන ළමයින් හැටියට අපට සීල, සමාධි, ප්‍රඥා යන මෙම ශික්ෂා මාර්ගය අනුගමනය කළ හැකි ය. එසේ කිරීම අප ජීවිතයට මහත් අස්වැසිල්ලක් වේ. අපට ඇතිවන තණ්හාව, ආශාව, රාගය, ද්වේශය, මෝහය වැනි දේ දුරුකර ගැනීම, උත්සාහයෙන් කටයුතු කිරීම, සිහියෙන් කටයුතු කිරීම ආදිය තුළින් අධ්‍යාපන කටයුතු පවා ඉතා පහසුවෙන් කළ හැකි වේ. මෙම මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කිරීමට පුරුදු පුහුණුවීම මෙලොව පරලොව දෙලොවට ම වැඩදායක වේ.

## සාරාංශය

සත්ත්වයා දුකින් මුදවන ප්‍රතිපදාව චතුරාර්ය සත්‍යයෙහි දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය තුළින් විස්තර කර තිබේ. එය ආර්ය අෂ්ටාංගික මාර්ගය ලෙස හැඳින්වේ. කාමසුඛල්ලිකානුයෝගය සහ අත්තකිලමථානුයෝගය යන අන්ත දෙකට නොවැටුණු මැදුම් පිළිවෙත එයයි. එය අප නිවනට පමුණුවන මාර්ගයයි.

## ක්‍රියාකාරකම

1. ආර්ය අෂ්ටාංගික මාර්ගය ත්‍රිශික්ෂාවට ඇතුළත් වන අයුරු පෙන්වා දෙන්න.

2. "මැදුම් පිළිවෙත බෞද්ධයන්ට පමණක් නොවේ, ලොව සැමට එය ඵලදායක ය." මේ පිළිබඳ වාක්‍ය රචනයක් ලියන්න.

## පැවරුම

සම්මා වායාම (නිවැරදි උත්සාහය) තුළින් කියවෙන අකුසල් සහ කුසල් පිළිබඳ බෞද්ධයකු ක්‍රියා කළ යුත්තේ කෙසේදැයි ඔබේ පන්තියේ සෙසු අය සමග ධර්ම සාකච්ඡාවක් කරන්න.

# 16

# නොකර පව්කම් කරමු පින්කම්

ජීවක අඹ වනයට රාත්‍රිය උදා වූයේ ය. එහෙත් සඳපහන් රැයක් වූ හෙයින් වනාන්තරය ආලෝකවත් ව තිබිණි. පරිසරය නිහඬ ය; නිස්කලංක ය. අඹ තුරු සෙවණෙහි මහ රහතුන් වහන්සේලා සමාධි සුවයෙන් වැඩ සිටින දර්ශනය අතිශය මනස්කාන්ත වූයේ ය. බුදුරජාණන් වහන්සේ ගඳකිළියෙහි වැඩ සිටියේ සමාධි සුවයෙනි. මෙකල මගධයෙහි පාලකයා වූයේ අජාසත්ත නිරිඳු ය. හෙතෙම තමා කරන ලද පිතෘ ඝාතනයෙන් බලවත් පසුතැවීමට හා ශෝකයට පත් ව සිටියේ ය. එම දුක තුනී කර ගැනීම සඳහා දිනක් රාත්‍රියෙහි හෙතෙම බුදුරදුන් සොයා පැමිණියේ ජීවක වෙදැදුරු සමග ය. මෙහි දී ඇති වූ සාකච්ඡාවෙන් අනතුරුව, රජගහ නුවර වාසය කරන ශාස්තෘන් හයදෙනකු පිළිබඳ ව තොරතුරු හෙළිවිය. එනම් **පූරණ කස්සප, මක්ඛලිගෝසාල, පකුධ කච්චායන, අජිතකේසකම්බලි, සංජයබෙල්ලට්ඨිපුත්ත** සහ **නිගණ්ඨනාථපුත්ත** යනුවෙනි. මෙම ශාස්තෘන් අතරින් පූර්ණ කස්සප ශාස්තෘවරයා කර්මය හෙවත් ක්‍රියාව ප්‍රතික්ෂේප කරන්නෙකි. අජිතකේසකම්බලි විපාකය ප්‍රතික්ෂේප කළ අතර මක්ඛලිගෝසාල කර්මය සහ විපාකය යන දෙක ම ප්‍රතික්ෂේප කළේ ය. පකුධ කච්ඡායන විසින් සියල්ල මූලික වන පදාර්ථ හතක් ඉගැන්වූ අතර ඔහු ද කර්ම විපාක නොපිළිගත්තේ ය. කර්මය, විපාකය හෝ පරලොව යනාදි කවරක් පිළිබඳ ව කවරකු විසින් හෝ විචාළ කල්හි ඍජුව පිළිතුරු නොදී මගහැර යාම සංජය බෙල්ලට්ඨිපුත්ත ශාස්තෘවරයාගේ පිළිවෙතයි. ජෛන මහාවීර තුමා කර්මවාදියෙකි. හෙතෙම සියල්ල පෙර කරන ලද කර්මයට අනුව සිදුවේ යන පුබ්බේකත හේතුවාදයක් ඉගැන්වී ය. එසේ ම යම් ක්‍රියාවක් සිදු කිරීමේ දී කය ප්‍රධාන වන බවත් මනස ද්විතීයික වන බවත් එතුමා ඉගැන්වී ය. මේ ආකාරයට ඈත අතීතයේ සිට ම සියල්ල කර්මයෙන් සිදු නොවේ යැයි පිළිගත් පිරිසක් මෙන් ම සියල්ල කර්මයෙන් සිදු වේ යැයි පිළිගත් පිරිසක් ද වාසය කළ බව පැහැදිලි ය. බුදු දහම හේතුඵලවාදී ය. බුදුරදුන් කර්ම විපාක ඉගැන්වූයේ ද ඒ අනුවයි. කර්මය මිනිසාට දුක් හෝ සැප හෝ උපදවන සාධක අතර එකක් වන බව බුදුදහම පිළිගනියි.

බුද්ධ දේශනාව අනුව කර්මය යනු චේතනාවයි. එය මුල් කොටගත් ක්‍රියාවයි. **"චේතනාහං භික්ඛවේ කම්මං වදාමි. චේතයිත්වා කම්මං කරෝති, කායේන වාචාය මනසා." "මහණෙනි මම චේතනාව කර්මය යැයි කියමි. සිතින් සිතා කයින්, වචනයෙන් හා**

**මනසින් කර්ම රැස් කරයි."** මේ අනුව පුද්ගලයාගෙන් සිදු වන සියලු ක්‍රියා කර්ම යනුවෙන් හඳුන්වන්නේ නැත. සිතාමතා කරන ක්‍රියාවක් ම කර්මය වේ. චේතනාව අනුව කර්මය **යහපත් හෝ අයහපත්** හෝ විය හැකි ය. **ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා, දස කුසල ධර්ම, පන්සිල්, දස පාරමී ධර්ම,** ආදිය යහපත් පුණ්‍ය කර්ම හෝ කුසල කර්ම ගණයට ද, **පස් පව්, දස අකුසල්,** ආදිය පාපකර්ම හෝ අකුසල කර්ම ගණයට ද අයත් ය. අපගේ ජීවිතය සකස් වන්නේ අප විසින් කරනු ලබන ක්‍රියාකාරකම් හෙවත් කර්මවලට අනුව ය. යහපත් කර්ම කිරීමෙන් අප ජීවිතය යහපත් ආකාරයෙන් ද, අයහපත් කර්ම කිරීමෙන් අයහපත් ආකාරයෙන් ද සකස් වේ. නැවත උපත ලැබීම සඳහා හේතු වන්නේ අප සිදු කරන කුසලාකුසල කර්මයි. කුසල කර්ම නිසා සැප ලැබේ. අකුසල කර්ම නිසා දුක් ලැබේ.

බෞද්ධ ඉගැන්වීමට අනුව කුසලාකුසල කර්ම විනිශ්චය කිරීමේ හැකියාව පුද්ගලයාට ඇත. කර්ම නිශ්චය කිරීමට අදාළ මිණුම් දඬු විවිධාකාර ය. බුදුදහම අනුව **චේතනාව හා විපාකය** ඒ අතරින් ප්‍රධාන ය. පුද්ගලයා විසින් සිදු කරනු ලබන ක්‍රියා ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි. එනම් **කුසල** ක්‍රියා සහ **අකුසල ක්‍රියා** වශයෙනි. ලෝභ, දෝස සහ මෝහ යන අකුසල මූලයන් මුල්ව සිදුකරන ක්‍රියා අකුසල් ය. අලෝභ, අදෝස සහ අමෝහ යන කුසල මූලයන් මුල්ව සිදුකරන ක්‍රියා කුසල් ය. අකුසල චේතනා මුල් කොට සිදු කරන්නේ අකුසල ක්‍රියා ය. අකුසල ක්‍රියා අයහපත් ය; තමාට ද අනුන්ට ද අවැඩදායක ය. ඒවායින් අයහපත් ප්‍රතිඵල ලැබේ. ගවයා පසු පස යන ගැලෙහි රෝදය මෙන් අප පසු පස ම එයි. යම් ක්‍රියාවක් සිදුකොට නැවත එම ක්‍රියාව මෙනෙහි කරන කල්හි නෙතට කඳුළ, දුක මෙන් ම ශෝකය ළඟා වන්නේ නම් එවැනි ක්‍රියා නොකළ යුතු ය; ඒවා පව් ය; අකුසල් ය; ඒවායින් දුක් විපාක ලැබෙන්නේ ය. කුසල චේතනා මුල්කොට සිදුකරන්නේ කුසල ක්‍රියා ය. කුසල ක්‍රියා යහපත් ය; තමාට හා අනුන්ට හිතකර ය. ඒවායින් යහපත් ප්‍රතිඵල ලැබේ. අප අත් නොහැර යන සෙවණැල්ල මෙනි. එසේ ම යම් ක්‍රියාවක් සිදුකොට නැවත එම ක්‍රියාව මෙනෙහි කරන කල්හි හදවතට සතුට, සොම්නස දැනෙන්නේ නම් එවැනි ක්‍රියා කළ යුතු ය; ඒවා පිං ය; කුසල් ය; ඒවායින් සැප විපාක ලැබෙන්නේ ය. එහෙයින් ඒවා කළ යුතු ය.

## කර්මය හා විපාකය

දිනක් බුදුරජාණන් වහන්සේ තෝදෙය්‍යපුත්‍ර සුභ මානවකයා අමතා මෙසේ වදාළහ. **"මානවකය, සත්ත්වයා කර්මය ස්වකීය කොට ඇත, දායාද කොට ඇත, කර්මය අනුව උපත ලබා ඇත, එය නෑයා කොට ඇත, පිළිසරණ කොට ඇත. කර්මය විසින් සත්ත්වයා උස් පහත් වශයෙන් බෙදනු ලැබේ."** මෙයින් හෙළි වන්නේ කර්මය හා සාංසාරික සත්ත්වයා අතර පවතින බැඳීමයි.

ඒ ඒ පුද්ගලයා විසින් කරන ලද කුසල අකුසල කර්මවල විපාක සසර පුරාවට ම ලැබේ. කිසියම් භවයක උපත ලැබීමේ දී අපගේ අතීත කර්ම ද ඉවහල් වේ. නිරයෙහි, තිරිසන් ලෝකයෙහි, ප්‍රේත ලෝකයෙහි, මනුෂ්‍ය ලෝකයෙහි හෝ දිව්‍ය ලෝකයෙහි හෝ අප උපත ලබන්නේත් එම එක් එක් ලෝකයට අදාළ දුක් හෝ සැප හෝ විඳීමට මූලික වන්නේත් අප විසින් කරන ලද කුසලාකුසල කර්මයන් ය.

අප්‍රසන්න, අකුසල චේතනාවලින් යුක්ත ව කරන ක්‍රියා අකුසල වේ. අකුසල ක්‍රියා අයහපත් ය; තමාට හා අනුන්ට අහිතකර ය. ඒවායින් අයහපත් ප්‍රතිඵල ලැබේ. ගවයා පසු පස යන ගැල් රෝදයක් මෙන් අකුසල ක්‍රියා දුක් ගෙන දෙමින් අප සමග එයි. පහත දැක්වෙන්නේ ඒ පිළිබඳ බුදු වදනයි.

**මනෝ පුබ්බංගමා ධම්මා**
**මනෝ සෙට්ඨා මනෝමයා**
**මනසා චේ පදුට්ඨේන**
**භාසති වා කරෝති වා**
**තතෝ නං දුක්ඛ මන්වේති**
**චක්කංව වහතෝ පදං** (ධම්මපදය, 1 ගාථා)

ප්‍රසන්න කුසල චේතනාවලින් යුක්ත ව කරන ක්‍රියා කුසල වේ. කුසල ක්‍රියා යහපත් ය; තමාට හා අනුන්ට හිතකර ය. ඒවායින් යහපත් ප්‍රතිඵල ලැබේ. අප සමග යන සෙවණැල්ල මෙන් කුසල ක්‍රියා සැප ගෙන දෙමින් අප සමග එයි.

**මනෝ පුබ්බංගමා ධම්මා**
**මනෝ සෙට්ඨා මනෝමයා**
**මනසා චේ පසන්නේන**
**භාසති වා කරෝති වා**
**තතෝ නං සුඛ මන්වේති**
**ඡායාව අනපායිනි** (ධම්මපදය, 2 ගාථා)

ඒ අනුව කුසලාකුසල සියලු ක්‍රියා අප සමග එයි. ප්‍රධාන වශයෙන් තිදොරින් සිදු කරන අකුසල ක්‍රියා දහයක් ද, කුසල ක්‍රියා දහයක් ද වේ.

**අකුසල ක්‍රියා**

1. පරපණ නැසීම
2. සොරකම් කිරීම
3. කාමයෙහි වරදවා හැසිරීම
4. බොරු කීම
5. කේලාම් කීම
6. පරුෂ වචන කීම
7. හිස් වචන කීම
8. දැඩි ලෝභය (අභිජ්ඣා)
9. තරහව (ව්‍යාපාද)
10. වැරැදි විශ්වාසය (මිථ්‍යා දෘෂ්ටි)

### කුසල ක්‍රියා

1. පරපණ නැසීමෙන් වැළකීම
2. සොරකම් කිරීමෙන් වැළකීම
3. කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීම
4. බොරු කීමෙන් වැළකීම
5. කේලාම් කීමෙන් වැළකීම
6. රළු වචන කීමෙන් වැළකීම
7. හිස් වචන කීමෙන් වැළකීම
8. දැඩි ලෝභයෙන් වැළකීම
9. ද්වේශයෙන් වැළකීම
10. වැරැදි දෘෂ්ටිවලින් වැළකීම

අකුසල කර්ම සිදු කිරීමට අප පොලඹවන්නේ ලෝභ, ද්වේශ, මෝහ යන සන්තානගත අකුසල මූලයන් ය. කුසල කර්ම කිරීමට අලෝභ, අද්වේශ, අමෝහ යන කුසල් මුල් අප පොලඹවයි. ඉහත කී අකුසල් සහ පව්කම් අතර වෙනසක් නැත. එහෙත් බුදු දහමෙහි ඉගැන්වෙන කුසල ක්‍රියා සහ පුණ්‍ය ක්‍රියා අතර මූලික වෙනස්කම් දක්නට ලැබේ.

## බුදුරදුන්ට හා මහ රහතුන්ට විපාක දුන් අකුසල කර්ම

බෝසතාණන් වහන්සේ සම්මා සම්බුද්ධත්වය සඳහා නියත විවරණ ලැබීමට පෙර ආත්ම භවයන්හි දී සුරාපානය ආදි යම්යම් පාප කර්මයන්හි නියැලුණු බව සඳහන් වේ. එසේ පෙර කරන ලද පාප කර්ම දොළහක් තමන් වහන්සේට මෙලොව දී විපාක දුන් බව හිමාලයේ අනෝතත්ත විල අසල දී පන්සියයක් භික්ෂූන් හමුවේ උන් වහන්සේ වදාළ සේක. බුද්ධ දේශනාව අනුව ඒවායින් සමහරක් මෙසේ ය.

1. සුන්දරී පරිබ්‍රාජිකාව මුල් කොටගත් සිදු වීමේ දී බුදුරදුන් අපවාදයට ලක් වූයේ පෙර මුනලී නම් ධූර්තයකු ව ඉපිද සිටිය දී සරභූ නම් පසේ බුදුරදුන්ට කළ අපහාසය නිසයි.

2. චිංචාමාණවිකාව පිළිබඳ සිදු වීමේ දී ද උන් වහන්සේ අපවාදයට ලක් වූයේ පෙර සබ්බාභිභූ නම් බුදු රදුන්ගේ නන්ද නම් ශ්‍රාවකයන් වහන්සේට 'කාමභෝගියා' යැයි දොස් නැඟීම හේතුවෙනි.

3. බුදුරජාණන් වහන්සේට විටෙන් විට වැළඳුණු හිසේ රුදාවක් තිබිණ. එයට හේතු වූයේ, පෙර මසුන් මරන පවුලක ඉපිද සිටිය දී තම ඥාතීන් මසුන් ගොඩදා තිබෙනු දැක සතුටු සිනා පහළ කළ පාප කර්මයයි.

4. උන් වහන්සේ පෙර භවයක වෛද්‍යවරයකුව සිටිය දී තමාගෙන් බෙහෙත් ලබා ගත් සිටුවරයකු නියමිත මුදල් නොගෙවූ බැවින්, ඒ පිළිබඳ ද්වේෂයෙන් එම රෝගී සිටුවරයාට විරේක බෙහෙතක් දී මුදල් ලබා ගැනීමේ පාපයෙන් ලෝහිතපක්ඛන්දිකා (ලේ අතීසාරය) නමැති දරුණු රෝගය වැළඳුණි. මේ ආකාරයෙන් ම බෝධිසත්වයන් වහන්සේ විසින්

කරන ලද පුණ්‍ය කර්මවල ආනිශංස පිළිබඳව ද බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන් වේ. පූජාවලිය ඒ සඳහා නිදසුන් වේ.

## මුගලන් හිමි සොරුන්ගෙන් පහර කෑමට හේතුව

මුගලන් මහ රහතන් වහන්සේ අප බුදු සසුනෙහි ඍද්ධිලාභීන් අතර අග්‍ර වූ සේක. එසේ වුව ද තීර්ථකයන්ගෙන් අල්ලස් ගෙන සොරුන් විසින් පහර දෙනු ලැබීම නිසා කාලසිලා පර්වතයේ දී පිරිනිවන් පෑමට සිදුවිය. ඊට හේතු වූයේ පෙර ජාතියක දී සිය දෙමව්පියන් කැලයට ගෙනගොස් පහර දී මරා දැමූ පාප ක්‍රියාවයි. ඉහත කී නිදසුන්වලින් පැහැදිලි වන්නේ රහතුන්ට පවා පාප කර්ම කළවිට සසර දුක් ලැබෙන බව ය. එමෙන් ම පුණ්‍ය කර්ම කළ විට සසර සැප ලැබේ. සීවලී මහරහතන් වහන්සේ ප්‍රත්‍යලාභීන් අතර අග්‍රස්ථානයට පත් වූයේ, පෙර භවයක දී තාපසයකු ව සිටිය දී තමන් වැළඳූ ආහාරය වමාරා පැටවුන් සහිත කුසගින්නේ සිටි බැල්ලියකට ලබාදුන් පුණ්‍ය කර්මය හේතුවෙනි.

උසස් මනසක් ඇති මිනිසුන් වශයෙන් අප ද යෝනිසෝමනසිකාරයෙන් හෙවත් සිහි නුවණින් සිතා, විමසා බලා ක්‍රියා කළ යුතු ය. බුදුරජාණන් වහන්සේට මහත් වූ නුවණක් ඇත්තේ ය, යසස් ඇත්තේ ය, මහත් වූ පිරිවර සම්පත්තියක් ඇත්තේ ය, මහත් වූ ගුණ සම්පත්තියක් ඇත්තේ ය, මහත් වූ ඍද්ධිබලයක් ද ඇත්තේ ය. එහෙත් තථාගත සම්මා සම්බුදු රජාණන් වහන්සේට ද කර්ම විපාකවලින් බේරී සිටීමට නොහැකි වූයේ නම්, එතරම් පාරමී ශක්තියක්, ගුණ ශක්තියක්, පිරිවර බලයක්, ඍද්ධිබලයක් නැති අප වැන්නවුන් කෙසේනම් කළ පව්කම්වලින් ගැලවෙන්නේ ද? එබැවින් අප නැවත පසුතැවිල්ලට සිදු වන දෑ නොකළ යුතු ය. කිසි දිනක කවරකුට හෝ දුකක්, පීඩාවක්, කරදරයක්, විපතක් කිරීමෙන් වැළකී සිටිය යුතු ය. අප විසින් කළ යුත්තේ නැවත නැවතත් සිතමින් සැප විපාක විඳිමින් සතුටු විය හැකි කුසල් ය; පින්කම් ය. තමන්ට මෙන් ම අනුන්ට ද අවැඩක්, අයහපතක් සිදුවන දෑ මගහරිමින් වැඩක්, යහපතක් සිදුවන දෑ කළ යුතු ය. කෙටියෙන් කියතොත් අප නොකළ යුත්තේ පව්කම් ය. අකුසල් ය; කළ යුත්තේ සැප විපාක දෙන පින්කම් ය; කුසල් ය.

## සාරාංශය

කර්මය බුදුදහමේ මූලික ඉගැන්වීමකි. එම ඉගැන්වීමේ අරමුණ අපගේ ක්‍රියා පිළිබඳ අපට ඇති වගකීම පෙන්වා දීමයි. අපගේ ක්‍රියා අපට ද අප අවට සිටින අයට මෙන් ම මුළු ලෝකයට ද බලපාන බව පෙන්වා දීමයි. එසේ පෙන්වා දෙන අතර කර්මය පිළිබඳ සමකාලීන මිථ්‍යා මත බැහැර කෙරේ. බුදුදහමට අනුව චේතනාව මුල් වී කයින්, වචනයෙන් හා මනසින් කර්ම රැස් කරනු ලැබේ. ඒවා කුසලාකුසල වශයෙන් වර්ග කෙරේ. කර්ම මැන බැලිය හැකි නිර්ණායක හෙවත් මිණුම් දඬු අතර **චේතනාව හා විපාකය** ප්‍රධාන ය. බුදුරජාණන් වහන්සේට මෙන් ම කෙලෙස් නැසූ මහ රහතුන්ට ද කුසලාකුසල කර්ම විපාක දුන් අවස්ථා ඇත. කර්මයත් විපාකයත් පිළිගැනීම සැබෑ බෞද්ධ ජීවිතයක ලක්ෂණය වෙයි. කුඩා කල සිට ම අපි ද පවින් හා අකුසලයෙන් වැළකී පින්කම් හා කුසල් කරමින් ජීවිතය සාර්ථක කර ගැනීමට අධිෂ්ඨාන කර ගනිමු.

## ක්‍රියාකාරකම

1. බුදුදහමේ ඉගැන්වෙන කර්ම සංකල්පය කෙටියෙන් හඳුන්වන්න.

2. බුදුරදුන් බැහැර කළ කර්මවාද පිළිබඳ ඉගැන්වීම් මොනවා දැයි පෙන්වා දෙන්න.

3. කුසලාකුසල කර්ම මැන බැලිය හැකි ප්‍රධාන නිර්ණායක පිළිබඳව ගුරුතුමා සමග සාකච්ඡා කරන්න.

## පැවරුම

- පුස්තකාලය භාවිතයෙන් පහත සඳහන් ධර්ම කරුණු රැස්කොට වගුවක් පිළියෙල කරන්න.

1. පස් පව්
2. දස පුණ්‍ය ක්‍රියා
3. දස කුසල්
4. දස අකුසල්

## පුහුණුවට

ඇතත් නැතත් පරලොව සුදනෙනි මහත
හලොත් යෙහෙකි පව්කම් නොතබා ම සිත
නැතත් එ පරලොව ඉන් වන අවැඩ නැත
ඇතොත් නැතැයි පව් කළ හට වෙයි විපත

**(සුභාෂිතය)**

න තං කම්මං කතං සාධු - යං කත්වා අනුතප්පති
යස්ස අස්සුමුඛෝ රෝදං - විපාකං පටිසේවති.

තං ච කම්මං කතං සාධු - යං කත්වා නානුතප්පති
යස්ස පතීතෝ සුමනෝ - විපාකං පටිසේවති.

**(ධම්ම පදය)**

# 17

# හේතුව ඵලය වෙයි ඵලය හේතුව වෙයි

පාසල් නිවාඩුව සමග අපගේ වර්ෂාවසාන විභාගයේ ප්‍රතිඵල ලබා දුන් අද මට ඉතා ම ප්‍රීතිමත් දිනයකි. පන්තියේ අනෙක් සිසුනට වඩා මා බෙහෙවින් ම සතුටු වන්නේ මා පන්තියේ පළමුවෙනියා වීම නිසා ය. පසුගිය වර්ෂයේ පන්තියේ අටවෙනියා වී සිටි මා මෙවර පන්තියේ පළමුවෙනියා වීම පිළිබඳ පන්තිභාර ගුරුතුමිය මට බොහෝ සේ ප්‍රශංසා කළා ය. එතුමිය මා පන්තිය ඉදිරියට කැඳවා පසුගිය වතාවේ අටවෙනියා වූ මා මෙවර පළමුවෙනියා වූයේ කවර හේතු නිසා දැයි ප්‍රකාශ කරන ලෙස දන්වා සිටියා ය. මා වෙනදාට වඩා මහන්සියෙන් හා උත්සාහයෙන් කටයුතු කළ අයුරු, විස්තර කර ගුරුවරුන්ට කීකරුව සිටි නිසා හොඳ ප්‍රතිඵල ලබන්නට හැකි වූ බව පන්තිය ඉදිරියේ ප්‍රකාශ කළේ මහා වීරයකු ලෙසිණි.

එසේ පන්තිය ඉදිරියේ ගුරුතුමිය කරුණු දක්වන විට මට අපේ දහම් පාසලේ ලොකු හාමුදුරුවන් වහන්සේ කියා දුන් **කිසිවක් අහේතුකව ඉබේ සිදුවන්නේ නැත. හැම දෙයකට ම හේතුඵල ධර්මය අදාළ වේ** යන පාඩම සිහිපත් විය. මම එම කරුණු ද පදනම් කරගෙන අදහස් දැක්වූයෙමි. මම හොඳින් පාඩම් කළ නිසා විභාගය හොඳින් සමත් වූයෙමි. පාඩම් වැඩ නිසි අයුරින් නොකළා නම් අසමත් වෙන්නට හෝ ලකුණු අඩු වෙන්නට ඉඩ තිබුණි. එමගින් කියවෙන්නේ හැම දෙයකට ම බලපාන හේතුවක් තිබෙන බවයි. හේතුව හොඳ නම් ප්‍රතිඵලය හොඳ වේ. හේතුව අයහපත් නම් ප්‍රතිඵලය ද අයහපත් වේ. මෙය ලෝකයේ සෑම දෙයකට ම පොදු ධර්මතාවකි. බුදුරජාණන් වහන්සේ දේශනා කළ පටිච්ච සමුප්පාද ධර්මයෙන් දැක්වෙන්නේ ද එබඳු හේතුඵල සබඳතාවකි. සත්ත්වයා සසර ඇවිදින්නේ ද මෙම හේතුඵල ධර්මය හරි හැටි තේරුම් නොගැනීම නිසා ය. හේතුඵල ධර්මය හෙවත් පටිච්ච සමුප්පාද ධර්මය ඇතුළත් කෙටි සූත්‍ර දේශනාවක් ද ඇතැයි එදා උගත් දේ මම මෙහි සටහන් කරමි.

| | |
|---|---|
| **ඉමස්මිං සති ඉදං හෝති** | මෙය ඇති කල්හි මෙය වේ. |
| **ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති** | මෙය හට ගැනීමෙන් මෙය හට ගනී. |
| **ඉමස්මිං අසති ඉදං න හෝති** | මෙය නැති කල්හි මෙය නොවේ. |
| **ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති** | මෙය නැතිව යාමෙන් මෙය නැති ව යයි. |

මෙම පටිච්ච සමුප්පාද සූත්‍රය ඉතා කෙටි වුව ද මෙමගින් ගම්‍ය වන අර්ථය ඉතා පුළුල් වූවකි. "මෙය ඇති කල්හි මෙය වේ" යන්න සරල නිදසුනකින් මෙසේ දැක්විය හැකි ය. වලාකුළු ඇති කල වැස්ස ඇති වේ. වැස්ස ඇති කල තෙතමනය ඇති වේ. තෙතමනය ඇති කල තුරුලතා ඇති වේ. තුරුලතා ඇති කල වලාකුළු ඇති වේ. ස්වභාව ධර්මය ආශ්‍රිත මෙම ක්‍රියාවලිය තුළින් කියවෙන්නේ මෙය ඇති කල මෙය ඇති වේ. මෙය හටගැනීමෙන් මෙය හටගනී යන්නයි. නොඑසේ නම් මේ හේතුවෙන් මේ ඵලය වේ යන විද්‍යාත්මක සත්‍යයයි.

එසේ ම වලාකුළු නැති කල වැස්ස නැත. වැස්ස නැති කල තෙතමනය නැත. තෙතමනය නැති කල තුරුලතා නැත. තුරුලතා නැති කල වලාකුළු නැත යන්න ද සොබාදහම පිළිබඳ විද්‍යාත්මක සත්‍යයකි. එයට මුල් වී ඇත්තේ මෙය නැති කල්හි මෙය නැත. මෙය හට නො ගැනීමෙන් මෙය හට නොගනී යන්නයි. නොඑසේ නම් හේතුව නැති කල ඵලය නැත යන්නයි.

සංජය පිරිවැජියාගෙන් වෙන්ව සත්‍යය සොයා ගිය කෝලිත උපතිස්ස දෙදෙනාගෙන් දෙවැන්නාට පිණ්ඩපාතයේ වඩින පස්වග භික්ෂූන් වහන්සේලා අතුරින් අස්සජි හිමියන් හමුවිය. ඒ අවස්ථාවේ දී ඔබගේ ගුරුවරයා කවුද? ඔබ පිළිගන්නා දහම කුමක් දැයි උපතිස්ස විමසූ විට අස්සජි හිමියන් දුන් පිළිතුර මෙසේ ය.



යේ ධම්මා හේතුප්පභවා
තේසං හේතුං තථාගතෝ ආහ
තේසං ච යෝ නිරෝධෝ
ඒවං වාදී මහා සමණෝ

හේතු නිසා හට ගන්නා යම් ධර්මතා වෙත් ද ඒවායේ හේතුව බුදුරජාණන් වහන්සේ වදාළහ. එසේ ම එම ධර්මතාවන්ගේ සපුරා නැතිවීමක් වෙත්නම් එය ද ශාස්තෘවරයාණන් වහන්සේ දේශනා කරන බව අස්සජි හිමියෝ උපතිස්ස පිරිවැජියාට පැවසූහ. එයින් ප්‍රකාශ වූයේ ද පටිච්ච සමුප්පාද ධර්මය ම වේ. එහි අර්ථය වටහා ගත් උපතිස්ස පරිබ්‍රාජකයා මාර්ගඵල අවබෝධ කිරීමට පවා සමත් විය. පසු කාලයේ දී සැරියුත් මහරහතන් වහන්සේ නමින් ප්‍රකට වූයේ ද උන් වහන්සේයි.

බුද්ධත්වයෙන් පළමු සතියේ  බෝමැඩ වැඩ සිටි බුදුරජාණන් වහන්සේ හේතු ප්‍රත්‍ය නිසා සසර දුක් ඇති වන ආකාරයත් හේතු ප්‍රත්‍ය නැති වීමෙන් සසර දුක් නැති වන ආකාරයත් අනුලෝම පටිලෝම වශයෙන් මෙනෙහි කළහ. එයින් පැහැදිලි වන්නේ බුදුරදුන් පසක් කළ ධර්මයෙහි හරය එසේ මෙනෙහි කළ බව ය. තමන් අවබෝධ කර ගත් මෙම ගැඹුරු දහම අවිද්‍යාවෙන් අන්ධ ව තෘෂ්ණාවෙන් මුසපත් ව සිටින මිනිසුන්ට අවබෝධ නොවනු ඇතැයි විමතියක් ද උන් වහන්සේට ඇති විය. එතැන ද දහම ලෙස දක්වෙන්නේ පටිච්ච සමුප්පාදයයි. බුදුවරුන් ලොව උපන්න ද නූපන්න ද පවත්නා පරම සත්‍යය නම් මෙකී හේතුඵල ධර්මයයි. බුදුවරු පහළ වී එම සත්‍ය හෙළිකරති. යමෙක් මෙම පටිච්ච සමුප්පාද ධර්මය අවබෝධ කරන්නේ ද හෙතෙම බුද්ධ ධර්මය අවබෝධ කරන්නේ ය. යමෙක් බුද්ධ ධර්මය අවබෝධ කරන්නේ ද හෙතෙම පටිච්ච සමුප්පාද ධර්මය අවබෝධ කරන්නේ ය.

මෙම පටිච්ච සමුප්පාද ධර්මය හෙවත් හේතුඵල දහම බුදුරජාණන් වහන්සේ සත්ත්වයාගේ සසර දුක ඇතිවීම හා නැතිවීම පිළිබඳව දේශනා කළ දහමක් වුව ද එය ලෝකයේ සියල්ල හා බැඳේ. කායික මානසික, බාහිර අභ්‍යන්තර, සචේතනික අචේතනික, සජීවී අජීවී සියල්ල ම හේතු ප්‍රත්‍ය ඇති කල ඇති වේ. නැති කල නැති වේ. සෑම කරුණක් පිළිබඳව ම විමසා බැලීමේ දී මෙම හේතුඵල සම්බන්ධතාව දැක ගත හැකි වේ. ගැටලු ඇති වන්නේ හේතු ප්‍රත්‍ය ඇතිව ය. එම ගැටලු විසඳෙන්නේ ද එම හේතු ප්‍රත්‍ය නැති වූ විට ය. සමාජයේ දැක ගත හැකි ප්‍රාණඝාත, අදත්තාදාන, මුසාවාද ආදි ඕනෑ ම අපචාර ක්‍රියාවකට හේතු ප්‍රත්‍ය ඇත. ඒ කිසිවක් ඉබේ හට ගන්නේ නැත. කිසියම් අද්භූත බලයකින් ඇති වන්නේ ද නැත. එසේ ම හේතු ප්‍රත්‍ය නැති වීමෙන් එම දුසිරිත් ද නැති වී යයි.

මෙය ඇති කල්හි
මෙය වේ. (ඉමස්මිං සති ඉදං හෝති)

මෙය හට ගැනීමෙන් මෙය හට ගනී → අවිජ්ජා පච්චයා සංඛාරා..... → අනුලෝම දේශනාව → සසර දුක් ඇති වන සැටි

(ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති)

මෙය නැති කල්හි
මෙය නැත. (ඉමස්මිං අසති ඉදං න හෝති)

මෙය නැතිව යාමෙන් මෙය නැතිව යයි. → අවිජ්ජාය නිරෝධා සංඛාරා නිරෝධා → පටිලෝම දේශනාව → සසර දුක් නැතිවන සැටි

(ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති)

මිනිසුන් සමාජයේ දී දුරාචාරකම්, වැරැදි වැඩ, සොරකම් ආදිය සිදු කරන්නේ ඇයි ද යන්න පිළිබඳ විමසා බැලීමේ දී මෙම ගැටලුවලට විසඳුම් සොයා ගත හැකි වේ. දුප්පත්කම නිසා, නූගත්කම නිසා, මිනිස්සු බොහෝ විට වැරැදි වැඩ කිරීමට පෙළඹෙති.

බුද්ධ දේශනාව අනුව දිළින්දන්ට ආර්ථික පහසුකම් නොසලසන විට දිළිඳුකම වැඩි වේ. දිළිඳුකම නිසා මිනිස්සු සොරකම් කරති. සොරකම් නිසා ආයුධ ගනිති. මුසාබස් කියති. රජුන් විසින් සොරුන් මැඩලීම පිණිස නීති ක්‍රියාත්මක කරනු ලබන විට පරපණ නැසීමට සිදුවේ. මෙසේ දිළිඳුකම ඇති කල සොරකම ඇත. සොරකම ඇති කල අවි ආයුධ ගැනීම් ඇත. ඒ ආකාරයෙන් සමාජයේ නොයෙක් අකුසල ධර්ම පැතිර යන්නේ එකිනෙකට බලපාන හේතු ප්‍රත්‍ය නිසා ය. මේ අයුරින් තණ්හාව නිසා සෙවීම ඇති වේ. සෙවීම නිසා ලැබීම වේ. ලැබීම නිසා ඇගයීම වේ. ඇගයීම නිසා බැඳීම වේ. බැඳීම නිසා මගේ යැයි සිතේ. එයින් ආරක්ෂාව තර කෙරේ. එහි දී අවි අයුධ භාවිත කරනු ලැබේ. එවිට කල කෝලාහල ඇති වේ. මෙසේ ලෝකයේ හේතුඵල දහම අනුව කරුණු කාරණා සිදු වන ආකාරය පිළිබඳ තොරතුරු චක්කවත්ති සීහනාද සූත්‍රය, මහා නිදාන සූත්‍රය ආදී සූත්‍ර කිහිපයක ම සඳහන් වේ.

මෙම පටිච්ච සමුප්පාද ධර්මය මනාව අවබෝධ කරගෙන කටයුතු කිරීමෙන් සමාජයේ ඇති ගැටලු බොහොමයකට විසඳුම් සොයා ගත හැකි වේ. පාසල් යන දරුවන් ලෙස අපට ද හේතුඵල දහම අපේ අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගැනීමට ආධාර කර ගත හැකි ය. පාඩම් නොකරන දරුවෝ විභාගයෙන් අසමත් වෙති. පාඩම් කරන අය විභාගය හොඳින් සමත් වෙති. හොඳ වැඩ කරන දරුවෝ සමාජයේ ගෞරවාදරයට ලක් වෙති. වැරැදි වැඩ කරන දරුවෝ සමාජයේ අපවාදයට ලක් වෙති. මේ ආකාරයට ලෝකයේ සියල්ල හේතුඵල සම්බන්ධතාව අනුව සිදුවන බව මනාව පැහැදිලි වේ.

## සාරාංශය

'යමෙක් පටිච්ච සමුප්පාද ධර්මය දකී නම් හෙතෙම ධර්මය දකී. යමෙක් ධර්මය දකී නම් හෙතෙම පටිච්ච සමුප්පාද ධර්මය දකී' යනුවෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක. එයින් පැහැදිලි වන්නේ පටිච්ච සමුප්පාදය හෝවත් හේතුඵල දහම බුදුසමයේ මූලික ඉගැන්වීමක් බවයි. හේතුඵල ධර්මය අපගේ එදිනෙදා ජීවිතයට ද සම්බන්ධ කර ගත හැකි ය. අපගේ ප්‍රශ්න ඇති වීමට හේතුව කුමක් ද යන්න සොයාගෙන එය විසඳා ගැනීමට මෙන් ම සමාජයේ සියලු ගැටලු සඳහා ද මේ න්‍යාය උපයෝගී කරගෙන විසඳුම් සොයා ගත හැකි වේ. මෙසේ පටිච්ච සමුප්පාදය ප්‍රායෝගික දහමක් ලෙස අප ජීවිතයට සම්බන්ධ කර ගත හැකි වේ.

## ක්‍රියාකාරකම

1. පටිච්ච සමුප්පාද කෙටි සූත්‍රය හා එහි තේරුම මතකයෙන් කියන්න.

2. ඔබගේ ජීවිතය හා බැඳුණු කරුණක් පදනම් කරගෙන එය පටිච්ච සමුප්පාද ධර්මය හෙවත් හේතුඵල දහම අනුව විග්‍රහ කර පෙන්වන්න.

## පැවරුම

- "පටිච්චසමුප්පාදය උගන්වන හේතුඵල සම්බන්ධය සෑම දෙයක් හා බැඳී පවතී." මෙය පැහැදිලි කරමින් කතාවක් කරන්න.

# 18 සාමකාමී ජීවිතයක් ගත කරමු

"සැවැත් නුවරට නුදුරු පෙදෙසෙක එක් ගොවියෙක් දිනක් කුඹුරු වැඩ කළේ ය. එදිනට පෙරදින රාත්‍රි හොරු රංචුවක් සැවැත් නුවර පොහොසත් ගෙයකට ඇතුළු වී රන්රුවන් ආභරණ හා දහසින් බැඳි පියල්ලක් ද ගෙන පැන ගොස් ඒ කුඹුරට ඇතුළු ව, ඒවා බෙදා ගන්නා විට හදිසියේ භයක් ඇති වී දහසින් බැඳි පියල්ල අමතක ව, අනෙක් බෙදාගත් වස්තුවත් රැගෙන පැන ගියහ. එදින අලුයම බුදුරජාණන් වහන්සේ ලොව බලන කල මේ අහිංසක ගොවියා කරදරයකට මුහුණ දෙන බව දැක, ඔහු කෙරෙහි කරුණාව උපදවා, අනඳ මහතෙරුන් ද කැඳවා ගෙන එම කුඹුරට වැඩියහ. ගොවියා බුදුරදුන් දැක ළඟට අවුත් වැඳ නැවත සී සෑමෙහි යෙදුණේ ය. බුදුරජාණන් වහන්සේ කුඹුරේ පසෙක තිබුණු, එතෙක් ගොවියා නුදුටු දහසින් බැඳි පියල්ල දැක අනඳ තෙරුන් අමතා ඒ දෙසට අත දිගු කොට, " ආනන්දය, සර්පයා දුටුවෙහිද?"යි ඇසූහ. "එසේ ය දුටුවෙමි"යි අනඳ තෙරහු පිළිතුරු දුන්හ. මෙය අසා සිටි ගොවියා බුදුරදුන් හා අනඳ තෙරුන් කුඹුර පසු කොට වැඩිය කල්හි සර්පයා මරා දමමියි කෙවිටක් ගෙන ළඟට ගිය විට සර්පයකු නො ව රන් පියල්ල දැක, එය රැගෙන වේල්ල මත තබා සී සාන්නට පටන් ගත්තේ ය.



පෙර දින රාත්‍රී කළ හොරකම ගැන පසු දින නගරය පුරා ආරංචි විය. රාජ පුරුෂයන් මේ සොරකම ගැන සොයන විට කුඹුරේ වේල්ල මත තුබුණු රන් පියල්ල හමු විය. ඔවුහු ගොවියා අල්ලාගෙන රජු වෙත ගෙන ගියහ. රජු නඩුව නොඅසා ම ඔහුට වද දී මරන්ට නියම කළේ ය. රාජපුරුෂයන් ඔහුට වද දිදී ගෙන යන විට "ආනන්දයෙනි, සර්පයා දුටුවෙහි ද? ආනන්දයෙනි, සර්පයා දුටුවෙහි ද? 'එසේ ය දුටුවෙමි, එසේ ය දුටුවෙමි"යි කියමින් ගොවියා හඬන්ට විය. ඒ ඇසූ රාජ පුරුෂයෝ එසේ කීමට හේතු විමසා දැන සියලු පුවත් රජුට දැන්වූහ. රජු ගොවියා ආපසු ගෙන්වා ගෙන, බුදුරදුන් ළඟට කැඳවා ගෙන ගොස් ඔහු කී තොරතුරු සැළකර සිටියේ ය. බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේ අනඳ තෙරුන් සමග මේ ගොවියා සීසාන කුඹුර ළඟට වැඩම කළ බවත්, දහසින් බැඳි පියල්ල දැක එය සර්පයෙකැයි වදාළ බවත්, එසේ නොවැඩියේ නම් ඔහු තමන් වහන්සේ වෙතට කැඳවා ගෙන එනු වෙනුවට, මරා දමන බවත් පවසමින් ඔහුගේ නිර්දෝෂී බව තහවුරු කළහ.

බෞද්ධ ගිහියකු විසින් නිති රැකිය යුතු ශීලය, නිත්‍ය ශීලය, ගේහසික ශීලය හෙවත් පඤ්ච ශීලයයි. එහි පළමු ශික්ෂාව 'පණ ඇති සතුන් මැරීමෙන් වැළකීම' ය. මෙයින් පෙනෙන්නේ බෞද්ධයකු තුළ මූලික වශයෙන් තිබිය යුතු ගුණය අවිහිංසාවාදීත්වය බව ය. බුදුරජාණන් වහන්සේ හැම ආකාරයක ම හිංසාව හෙළා දැක්කාහ. මිනිසුන්ට පමණක් නොව සියලු සතුන්ට ම මෛත්‍රිය දක්වන ලෙස දේශනා කළහ. පරපණ නැසීමෙන් තොරව දඬු මුගුරු අවි ආයුධ පසෙකින් තබා සියලු ප්‍රාණීන්ට හිතවත් ව සානුකම්පිත ව ක්‍රියා කිරීමට උපදෙස් දුන්හ.

**සබ්බේ තසන්ති දණ්ඩස්ස - සබ්බේ භායන්ති මච්චුනෝ**
**අත්තානං උපමං කත්වා - න හනෙය්‍ය න ඝාතයේ.**

සියල්ලෝ දඬුවමට භය වෙත්. සියල්ලෝ මරණයට බිය වෙත්. තමාත් දඬුවමට හා මරණයට බිය බැවින් තමා ම උපමා කොට සිතා අනුන් නො නැසිය යුතු ය. නො මැරවිය යුතු ය.

ප්‍රාණ ඝාතනය මෙන් ම හිංසනය නිසා ද පුද්ගලයාට විඳීමට සිදුවන දුක් විපාක බුදු දහම අපට පැහැදිලි කර දෙයි. එම නිසා පාසල් අවධියෙහි දී ම හිංසනයෙන්, ඝාතනයෙන් වැළකී සියලු සත්ත්වයින්ට මෛත්‍රී කරුණා දැක්වීමට අපි අදිටන් කොට ගනිමු. එම අධිෂ්ඨානය අප ම උපමා කොට ගෙන පුරුදු පුහුණු කරමු.

සබ්බේ තසන්ති දණ්ඩස්ස - සබ්බේසං ජීවිතං පියං
අත්තානං උපමං කත්වා - න හනෙය්‍ය න ඝාතයෙ

'සියලු දෙන ම දඬුවමට තැති ගනිත්. සියල්ලන්ට ම ජීවිතය ප්‍රිය ය. ඒ නිසා තමා උපමා කොට සිතා අනුන් නො නැසිය යුතු ය. නොනැස්සවිය යනුවෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කළහ.

"යමකු පරපණ නසන්නේ නම් එය හේතු කොට ගෙන මේ ජීවිතයේ දී භය හා වෛරය ඇති කර ගනියි. චෛතසික වශයෙන් දුක් දොම්නස් වින්දනය කරයි. ප්‍රාණඝාතයෙන් වෙන්වුණ පුද්ගලයාට ඒ භය, වෛරය සංසිඳුණේ වෙයි." යනුවෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කළහ.

කවර කරුණක් මුල් කොට ගෙන වුව ද සිදුවන සත්ත්ව ඝාතනය, හිංසනය බුදු දහම අනුමත නොකරයි. එදා බ්‍රාහ්මණයන් විසින් සිය දහස් ගණන් තිරිසන් සතුන් මෙන් ම මිනිසුන් ද අමානුෂික ව ඝාතනය කරමින් බිලි පූජා පවත්වන ලදි. එහි දී සත්ත්ව ඝාතනය, හිංසනය පමණක් නොව වන විනාශය ද සිදුවිය. යාග භූමිය සකස් කිරීමේ දී විශාල වශයෙන් වෘක්ෂලතාවෝ විනාශයට පත් වෙති. මේ නිසා යාගය වනාහි හිංසාවාදී ය; පීඩාකාරී ය. උත්තරීතර වූ මානව ගුණ ධර්ම හා වටිනා සම්පත් ද විනාශ කරන දුර්දාන්ත වූ නිෂ්ඵල ක්‍රියාවක් ලෙස යාගය බුදු දහමෙහි හඳුන්වා දී තිබේ.

සූත්‍ර දේශනාවල බ්‍රාහ්මණ යාගය ප්‍රතික්ෂේප කොට තිබේ. යාගය වෙනුවට බුදු දහම ආදේශ කරන්නේ, දානයයි. එමගින් ජීව අජීව පරිසරයට හානි වන්නේ නැත. ප්‍රචණ්ඩත්වය නොමැත. හිංසනය, පීඩනය වෙනුවට එහි ඇත්තේ, දයාව, කරුණාව, අනුකම්පාව වැනි මානව ගුණ ධර්ම ය. දන් දෙන්නාට මෙන් ම ලබන්නාට ද සිදුවන්නේ සෙතකි.

බුදුරජාණන් වහන්සේගේ අනුශාසනය ලෝකයේ ඕනෑ ම රටක ඕනෑ ම වැසියකුට පිළිපැදිය හැක්කකි. උන් වහන්සේ සතුරු-මිතුරු, ලොකු-කුඩා, අඳුනන-නාඳුනන, දුටු-නුදුටු හැම සතකුගේ ම ජීවිතය, ප්‍රාණය ඒ සතාට ප්‍රිය බව ඉගැන්වූහ. මෛත්‍රී කිරීමේ දී හැම තරාතිරමක ම, හැම සතකු ම, අඩංගු වනු සඳහා, '**මාගේ මෛත්‍රිය පා නැති, නයි පිඹුරු - පොළොං ආදී දීර්ඝ ජාතීන්හට ය. මාගේ මෛත්‍රිය දෙපා ඇත්තන්හට ය. මා ගේ මෛත්‍රිය සිවුපා ඇත්තන්හට ය. මා ගේ මෛත්‍රිය පත්තෑ, ආදී බොහෝ පා ඇත්තන්හට ය." 'හැම සත්ත්වයෝ ද, හැම ප්‍රාණීහු ද, හැම භූතයෝ ද යන මේ හැම දෙන ම යහපතක් ම දකිත්වා! මොවුන් කෙරෙන් කිසිවකු කරාත් දුකක් නො පැමිණෙත්වා!"** මෙසේ සියලු සතුන්ගේ ම ජීවත්වීමේ අයිතිය පිළි ගනිමින් හිතමිතුරු ආකල්පයකින් ක්‍රියා කිරීම මෛත්‍රී පිළිවෙතයි.

"මහණෙනි, ඉදින් දරුණු හොරුන් අවුත් දෙපැත්තේ දඬු ඇති මහ කියතකින් ශරීරයේ කොටස් කැලි කැලිවලට කපද්දී යමෙක් ඒ හොරුන් කෙරෙහි හිත අමනාප කර ගත්තොත්, දූෂිත හිතක්, තරහ හිතක් ඇති කර ගත්තොත් හෙතෙමේ මගේ අනුශාසනය පිළිපදින්නෙක් නොවේ. මහණෙනි, එබඳු අවස්ථාවක දී වුවත් තොප විසින් මෙසේ සිතිය යුතුයි. අපේ හිත වෙනස් වන්නේ නැත. මොවුන්ට තද වචන නො කියන්නෙමු. හිතානුකම්පී ව තරහ නොවී මෛත්‍රිය පතුරුවමු. ඒ මෙත් සිතට අරමුණු වූ සියලු ලෝකයා කෙරෙහි මහත් වූ, අප්‍රමාණ වූ, වෛර නැති මෛත්‍රිය පතුරුවා වසන්නෙමු. මහණෙනි, හතුරකු කෙරෙහි වුවත් මෙසේ සිතන්නට පුරුදු විය යුතු" ය යනු බුදු වදනයි.

ඒ අනුව මොන ම කරුණක් නිසා වත්, මොන ම කෙනකුට වත් හිංසාවක්, පීඩාවක් කිරීමට බුද්ධ ධර්මයෙන් ඉඩක් නැත. සැබෑ බෞද්ධයන් අතර හිංසාවක්, පීඩාවක්, ප්‍රාණඝාතයක්, කලහයක්, ආරවුලක්, අමනාපයක්, ගහ බැණ ගැනීමක්, ලේ හැලීමක් ඇති වන්නට මොන ම ඉඩක් වත් නැත. යම් පිරිසක් අතර මේවා සිදුවෙතොත් එහි තේරුම ඔවුන් සැබෑ බෞද්ධයන් නොවන බවයි.

මෛත්‍රිය හා කරුණාව වර්ධනය කර ගත යුත්තේ සීමා රහිත ව වැඩෙන **(අපරිමාණං = අප්පමඤ්ඤා)** ගුණ ධර්ම ලෙසිනි. මවක් ස්වකීය දරුවාට දක්වන ආදරය සෙනෙහස මෙන් සියලු සත්ත්වයින් කෙරෙහි හිතානුකම්පීව, දයාහරිත ව වාසය කරන ලෙස බුදුරජාණන් වහන්සේ දේශනා කළහ. මුල් අවදිවල දීර්ඝායුෂ්ක වූ මානව වර්ගයාගේ ආයු ප්‍රමාණය අඩු වීමට හේතු වූයේ ප්‍රාණ ඝාතයයි. සමාජයක ස්ථාවරභාවය, ආරක්ෂා වීමට සාමකාමී වාතාවරණයක් පැවතිය යුතු ය. ජීවිත ආරක්ෂාව තහවුරු වී නොමැති සමාජය තුළ කිසිවකුට සතුටින් නොබියව වාසය කළ නොහැකි ය. එම සමාජයේ ඉදිරි ගමන ද නවතින්නේ ය. මේ නිසා අනෙකුත් සියල්ලට ම පළමු මිනිසුන් වශයෙන් අප අන් අයට හිංසා පීඩා කිරීමෙන්, ප්‍රචණ්ඩත්වයෙන් වැළකී සිටිය යුතු ය. ඒ සඳහා අනුබල දීමෙන් වැළකී සිටිය යුතු ය. එමෙන් ම අන්‍යයන්ට හිංසා පීඩා කරනු දැක නිහඬව බලා සිටීම ද නොකළ යුතු වන්නේ ය. දැක මුනිවත රැකීම හිංසනයට අනුබල දීමක් වන බැවිනි.

"නසන්නා නැසීමට, දිනන්නා පැරදවීමට තවත් කෙනකු පිටුපසින් පැමිණෙයි. හිංසනය, භීෂණය නිසා වර්ධනය වන්නේ ක්‍රෝධයය; වෛරයයි. වෛරයෙන් වෛරය නොසන්සිඳෙන බවත් අවෛරයෙන් ම වෛරය සන්සිඳෙන බවත් බුදු දහම පෙන්වා දෙයි. දැහැමි බෞද්ධ රාජ්‍ය පාලනයකට අදාළ දස සක්විතිවත්වල සිව්පාවුන්ට, පක්ෂීන්ට රැකවරණය සැලසීම ද උගන්වා තිබේ. එතැන දී එය ගුණ ධර්මයක් මෙන් ම ව්‍යවස්ථාගත නීතියක් ද වේ.

සමාජයක පුද්ගලයෝ විවිධාකාර වෙති. ඇතැමුන්ගේ චර්යා රටා මිනිස්කමට නිගා කරන්නේ ය. ඔවුන්ගේ ජීවිකා ගොඩ නැගී ඇත්තේ සමාජ විරෝධී ක්‍රියාකාරකම් ඇසුරු කොට ගෙන ය. සත්ත්ව ඝාතනය, හිංසනය ඔවුන්ට සාමාන්‍ය ය. එහෙත් බුදුරජාණන් වහන්සේ දේශනා කොට ඇත්තේ, ප්‍රාණීන්ට හිංසා කරන්නා ද, ප්‍රාණීන් කෙරෙහි දයාවක් නොමැති පුද්ගලයා ද, වසලයකු බවයි. තව ද ගම් නියම්ගම් විනාශ කරනු ලබන්නා ද, වටලා පහර දෙනු ලබන්නා ද, එබඳු කැළඹිලිකාර පුද්ගලයකු යැයි ජනතාව අතර ප්‍රසිද්ධියට පත් පුද්ගලයා ද, වසලයෙක් වේ. මෙවැනි ක්‍රියා මගින් සමාජයට ප්‍රචණ්ඩත්වය, භීෂණය ආදේශ වන අතර එවැනි ප්‍රදේශ මිනිස් වාසයට නුසුදුසු යැයි සැලකෙයි.

ඇතැම් රටවල ජාතීන් අතර මෙන් ම ආගම් අතර ද සිදු වන්නා වූ ගැටුම් සම්පූර්ණයෙන් ම බුදුදහමින් බැහැර කෙරේ. වියට්නාම ජාතික ටිච් නට් හාන් හිමියන්ගේ ප්‍රකාශයක් මෙසේ ය. "ඔබ අත තුවක්කුවක් ඇත්තේ නම් ඉන් එක් අයකුට, දෙදෙනකුට, තුන් දෙනකුට හතර දෙනකුට හෝ පස් දෙනකුට වුවත් වෙඩි තබා මරා දැමිය හැකියි. එය විනාශයකි; අපරාධයකි. එහෙත් ඔබ යම් අන්තවාදී දෘෂ්ටියක පිහිටා එය බොහෝ දෙනා අතර පතුරුවමින් යයි ද එයින් ඔබ සිදු කරන්නේ සිය දහස් ගණනින් පුද්ගලයින් විනාශ කර දැමීමකි. එය මහා ම අපරාධය වන්නේ ය." මෙබඳු ප්‍රකාශ තුළින් ප්‍රකට වන්නේ තමන්ගේ වර්ගය, ආගම, කුලය පමණක් ශ්‍රේෂ්ඨ ය. අනෙක් ජන වර්ග ආගම් පහත් ය, ඔවුන් මිසදිටුවන් ය, එනිසා ඔවුන් විනාශ කර දැමිය යුතු ය, ඔවුන්ගෙන් රට ජාතිය ආරක්ෂා කර ගත යුතු ය වැනි දෘෂ්ටියක් මත පිහිටා මානව වර්ගයා විනාශ කර දැමීම බුදු දහමට එකඟ නොවන බව ය.

මිනිසත් බව දුර්ලභ යැයි බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන්හ. (දුල්ලභංච මනුස්සත්තං) උන් වහන්සේගේ දර්ශනයේ පදනම වන්නේ කරුණාව හා ප්‍රඥාවයි. බුදුරජාණන් වහන්සේගේ කරුණාව අප හඳුන්වන්නේ මහා කරුණාව (මහාකාරුණිකෝ නාථෝ) වශයෙනි. එම උතුම් ගුණය සමස්ත ජීවී අජීවී පරිසරයට ම පොදු වූවකි. එහි ජාති ආගම් කුලමල වශයෙන් ප්‍රභේදයක් නොවී ය. මෙනිසා දඬුවමට, මරණයට තමන් බිය වන්නාක් මෙන් ම සෙසු සියලු සතුන් ද එයට බිය වන බව නිතර නිතර මෙනෙහි කළ යුතු බව බුද්ධ දේශනයයි. එය අත්තූපනායික ධර්ම පර්යාය ලෙස පෙන්වා දී තිබේ. මෙලෙස සිතා ක්‍රියා කරන්නේ නම්, බෞද්ධයාට සත්ත්ව ඝාතනයට, හිංසනයට මෙන් ම ඒ සඳහා අනුබල දීමට කෙසේවත් අවසර නොමැත්තේ ය.

විටෙක විවිධ හේතු මත වියරු වැටුණු මිනිසා නොමිනිසකු සේ කළයුත්ත නොකළයුත්ත වටහා ගත නොහැකි ව අසරණ ව, මුලා ව ක්‍රියා කරනු දක්නට ලැබේ. මානව ජීවිතවල වටිනාකම, අගය කෙමෙන් කෙමෙන් වියැකී යමින් පවතී. මුදල ප්‍රධාන සාධකය බවට පත් වී වටිනා මිනිස් ජීවිත අකාලයේ මිලින ව යනු දක්නට ලැබේ. බලය, ධනය, නිලය වෙනුවෙන් ඕනෑ ම පහත් ක්‍රියාවක් සිදු කිරීමට ඇතැම් නොමිනිස්සු සැදී

පැහැදී සිටිති. එවිට රජවන්නේ කරුණාව දයාව නොව ඊර්ෂ්‍යාවයි, ක්‍රෝධයයි, වෛරයයි. එය විනාශයේ සෙවණැල්ල මිස දියුණුවේ ආලෝකය නොවේ. බුදු දහමින් දෙන ධර්මෝපදේශය වන්නේ, **වෛරයෙන් වෛරය නොසන්සිඳේ, අවෛරයෙන් ම වෛරය සන්සිඳේ.** යන්න ය. එවැනි උතුම් දහමක පිහිටා ක්‍රියා කිරීම සමස්ත ජීව අජීව පරිසරයට ම ළෙන්ගතු වීමක් වන්නේ ය. අජීවී පරිසරය, එහි අගය හා සොඳුරු බව ද දැක ඒ සමග හිතමිතුරු ආකල්පයක් වර්ධනය කර ගෙන තිබීම මිනිසාගේ යහ පැවත්මට හේතුවෙයි.

පුද්ගල මට්ටමෙන් පමණක් නොව රාජ්‍ය මට්ටමෙන් ද සදාචාර සම්පන්න පරිසර ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට බුදු දහම නිර්දේශ කරයි. කූටදන්ත බමුණාට බුදුරදුන් වදාළ පරිදි දැහැමි ව පැවැත් වූ යාගයේ දී යාග කණු ආදිය සඳහා ගස් නො කපන ලදි. බිම ඇතිරීමට තණ කොළ විනාශ නොකරන ලදි. ගව එළු බැටළු කුකුළු ආදි සතුන් නොමරන ලදි. අකැමැත්තෙන්, බල කිරීමෙන් මිනිසුන්ගෙන් වැඩ නො ගන්නා ලදි.

මෙසේ බෞද්ධ ඉගැන්වීම් අනුව මිනිසුන් විසින් සෙසු මිනිසුන්ට, තිරිසන් සතුන්ට මෙන් ම ගහ කොළ ආදිය ඇතුළත් පරිසරයට ද හානිකර නොවන පිළිවෙතක පිහිටා කටයුතු කිරීම බුදු දහම අපේක්ෂා කරයි. එහි ඝාතනය, හිංසනය නැත. අධික තෘෂ්ණාව, කෑදරකම හා සූරාකෑම නැත. හිත මිතුරු හැඟීම් හා කාරුණික බව පිරී තිබේ. අවබෝධයෙන් හා ඉවසීමෙන් කටයුතු කෙරේ.

අප විසින් අජීවී පරිසරය මානව යහපත සඳහා යොදවා ගත යුත්තේ සැහැසි මානසිකත්වයෙන් තොරව ය. ස්වකීය අවශ්‍යතා සපුරා ගත යුත්තේ මලෙන් රොන් ගන්නා බඹරකු මෙන් ස්වභාව ධර්මය සමග හිත මිතුරු ආකල්පයක් ගොඩ නංවා ගෙන බව බෞද්ධ ගිහියන්ට මෙන් ම පැවිද්දන්ට ද උගන්වා ඇත. රොන් ගන්නා මී මැස්සා මලේ පෙතිවලට ද, වර්ණයට ද, සුවඳට ද කිසිදු හානියක් නො කරයි. ඒ වෙනුවට පරාග පෝෂණය කරමින් ශාකයේ පැවැත්මට දායක වෙයි. රොන් ගෙන මී වදයක් බැඳ ස්වකීය සන්තතියේ පැවැත්ම තිර කර ගනියි. අගනා ඖෂධයක් ලෝකයාට ද ප්‍රදානය කරයි. මේ උපමාව මගින් දෙන අගනා පණිවුඩය මිනිසා වටහා ගන්නේ නම් තිරසර සංවර්ධනය සඳහා ස්වභාව ධර්මය වනසා දැමීමට මිනිසා පෙලඹෙන්නේ නැත. තිරසර සංවර්ධන සංකල්පයේ සියලු මූලික ලක්ෂණ ඒ උපමාව තුළ ගැබ්වෙයි. මිනිසා පරිසරයෙන් (ස්වභාව ධර්මයෙන්) ප්‍රයෝජන ගත යුත්තේ පරිසරය හිත මිතුරකු ලෙස සලකා ගනිමිනි. පරිසරයෙන් ගත යුතු උපරිම ප්‍රයෝජන ගැනීම සුදුසු ය. ඒ සමග ම පරිසරය දූෂණය කිරීම හෝ වනසා දැමීම වෙනුවට සංවර්ධනය කළ යුතු ය. දැඩි ගිජුකමින් වහා දියුණු වීමට කෲර ප්‍රතිපත්ති අනුගමනය කරනු වෙනුවට ක්‍රමානුකූල දියුණුවක් සඳහා මෛත්‍රිය හා කරුණාව වැඩෙන මෘදු ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සුදුසු ය. සංවර්ධනය ස්ථිර සාර වන්නේ ඒ අයුරින් ක්‍රියා කළ හොත් පමණකි.

## සාරාංශය

ලොව ජීවත්වීමේ අයිතිය සෑම සත්ත්වයකුට ම පොදු වූ බව බුදු දහමින් පිළිගනියි. එහෙත් බොහෝ ආගම්වල ජීවත්වීමේ අයිතිය ලබා දී ඇත්තේ මිනිසාට පමණි. දේවවාදී ආගම් මෙහි දී විශේෂ ය. එහෙත් බුදු දහම කුමන ආකාරයක හෝ සත්ත්ව ඝාතනය හිංසනය පිටු දකියි. සියලු සතුන්ගේ ජීවත්වීමේ අයිතිය සුරැකීම මිනිසාගේ වගකීම බව බුදු දහමින් පිළිගනියි. එය පුද්ගල පමණක් නොව රාජ්‍යතාන්ත්‍රික ක්‍රියාවලියක් බව බොහෝ අවස්ථාවල අවධාරණය කොට තිබේ. එමගින් සාමකාමී ජීවිතයක් ගත කළ හැකි බව පෙන්වා දෙයි. එහි ඝාතනය, හිංසනය, ප්‍රචණ්ඩත්වය නැත. අධික තෘෂ්ණාව, කෑදරකම හා සූරා කෑම නැත. හිත මිතුරු හැඟීම් හා කාරුණික බව පිරී තිබේ. අවබෝධයෙන් හා ඉවසීමෙන් කටයුතු කෙරේ. හදිසි දියුණුව නොව ක්‍රමානුකූල තිරසර වර්ධනයක් සිදුවේ.

## ක්‍රියාකාරකම

1. ජීවී පරිසරය කෙරෙහි අප දැක්විය යුතු ආකල්පය සාකච්ඡා කරන්න.

2. පරිසරයට අදාළ බුද්ධ දේශනා දෙකක් ඇසුරින් උන් වහන්සේගේ මහා කරුණිකත්වය පැහැදිලි කරන්න.

## පැවරුම

- බුද්ධ ධර්මය විෂයභාර ගුරු භවතාගේ උපදෙස් ඇතිව කුරුල්ලන්ට ආහාර-පාන දීම සඳහා ස්ථානයක් පාසල් පිරියත තුළ සකස් කරන්න.

## පුහුණුවට

අපාදකේහි මේ මෙත්තං - මෙත්තං ද්පාදකේහි මේ
චතුප්පදේහි මේ මෙත්තං - මෙත්තං බහුප්පදේහි මේ
සබ්බේ සත්තා සබ්බේ පාණා - සබ්බේ හූතා ච කේවලා
සබ්බේ හද්‍රානි පස්සන්තු - මා කඤ්චි පාපමාගමා

19

# ආරෝග්‍ය පරමාලාභා

එදා පුෂ්පිකා ගුරුතුමිය ද සමග පන්තියේ අපි සියලු දෙනා ම පිළිකා රෝගීන්ට ප්‍රතිකාර කරන මහරගම අපේක්ෂා රෝහල වෙත ගියේ රෝගීන්ට අහාරපානාදියෙන් සංග්‍රහ කිරීමේ පිංකමකට සහභාගි වීමට ය. එහි නේවාසික ව ප්‍රතිකාර ලැබූ රෝගීන් දැකීමෙන් නීරෝගීකම ජීවිතයට කෙතරම් වාසනාවක් දැයි අපට හැඟුණි. ඒ පිළිබඳ පසුව පන්තියේ අප කළ කතා බහට එක් වූ පුෂ්පිකා ගුරුතුමිය නීරෝගී සම්පත ගැන බුදුරදුන් වදාළ ධර්ම කරුණු රැසක් ද ඇතුළත් කොට ඉගැන්වූ පාඩම අප සිත් තුළ තදින් ම කාවැදුණේ ය. එම පාඩමේ ආරම්භයේ සිට අවසානය දක්වා කරුණු ගොනු කොට දක්වන ලෙස ගුරුතුමිය අපට පැවරුමක් දුන්නා ය. පහත දැක්වෙන්නේ මවිසින් කළ ගොනු කිරීමයි.

ජීවිතය සාර්ථක ව පවත්වාගෙන යාමට මානසික මෙන් ම කායික නීරෝගීතාව අත්‍යවශ්‍ය ය. නොයෙකුත් ලෙඩරෝගවලින් පීඩිත වූ පුද්ගලයකුට ස්වකීය දියුණුව සඳහා නිසිලෙස වෙහෙස මහන්සි වී ක්‍රියා කිරීමට හැකියාවක් නොලැබෙයි. මිනිස් ජීවිතයක අන් සියලු දුෂ්කරතාවලට වඩා බලවත් වන්නේ රෝග පීඩාවන් ය. නීරෝගී දිවිපෙවෙතක් ගත කරන්නේ නම් කායික ශක්තිය අපගේ දියුණුව වෙනුවෙන් උපරිම ලෙස කැප කළ හැකි ය. "ආරෝග්‍ය පරමාලාභා" යනුවෙන් නීරෝගී බව උසස් ම ලාභය යැයි බුදුරජාණන් වහන්සේ දේශනා කළේ එබැවිනි.

නීරෝගී දිවිපෙවෙතක් උරුමකර ගැනීමට නම් මනා සෞඛ්‍ය පිළිවෙත් ආරක්ෂා කළ යුතු ය. ඒ වෙනුවෙන් අපට ඉගැන්වූ කරුණු රැසක් ධර්මය තුළ සඳහන් ව ඇත. ගිහි ජීවිතයේ දී නිත්‍ය වශයෙන් ආරක්ෂා කළ යුතු යැයි උගන්වා ඇති පංච ශීලය පවා නීරෝගී ජීවිතයකට මග පෙන්වයි. එහි තුන් වැනි සිල්පදය කාම මිථ්‍යාචාරයෙන් හෙවත් කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීමයි. එය ම පරදාර සේවනයෙන් වැළකීම ලෙස ද හැඳින්වෙයි. එනම් ශිෂ්ට සම්මත සීමාවන් ඉක්මවා අසම්මත ලෙස, අශිෂ්ට ලෙස ස්ත්‍රී පුරුෂ සබඳතා පැවැත්වීමයි. එය ඉතා භයානක, මාරාන්තික රෝගවලට ද හේතු විය හැකි ය. වර්තමාන ලෝකයේ විශාල පිරිසක් එබඳු රෝග පීඩාවන්ට ගොදුරු වී සිටිති. ඔවුහු සිතින් ද කයින් ද අපමණ දුක් විඳිති; ජීවිතයේ සියලු අපේක්ෂා බිඳ වැටී සතුට සැපත අහිමි වී ජීවත් වෙති.

බුදුරජාණන් වහන්සේ උගන්වා වදාළ කාම මිථ්‍යාචාරයෙන් වැළකීම නීරෝගී මිනිසුන් සහිත සමාජයක් ගොඩනගා ගැනීමට විශේෂයෙන් ම උපකාරී වන බව මින් පැහැදිලි වේ.

පංච ශීලයෙහි පස්වෙනි ශික්ෂා පදය මනාව ආරක්ෂා කිරීම ද නීරෝගීකම උදෙසා ඉතා වැදගත් වෙයි. එමගින් කියැවෙනුයේ මදයට හා ප්‍රමාදයට හේතුවන මද්‍යසාර භාවිතයෙන් වැළකී සිටීම ය. බුදුරදුන් සිගාලක නම් ගෘහපති පුත්‍රයාට උපයන ධනය විනාශ වන කරුණු සයක් ඇතැයි උගන්වා තිබේ. ඉන් පළමුවැන්න මද්‍යසාර භාවිතයයි. මද්‍යසාර භාවිතයෙහි විපාක සයක් ද එම සූත්‍රයේ ම දක්වෙයි. එහි තෙවැන්න වනුයේ, නොයෙක් රෝගාබාධ හටගැනීමයි.

මත්ද්‍රව්‍ය, මත්වතුර භාවිත කිරීමෙන් මාරාන්තික රෝග පීඩාවන්ට ගොදුරු වී සිටින ජන සංඛ්‍යාව ද ලෝකයේ ඉතා විශාල ය. එබැවින් අද වන විට මද්‍යසාර භාවිතය නොයෙක් අයුරින් බලවත් ව්‍යසනයක් වී තිබේ. ශරීරයට ඉතාමත් අහිතකර මෙම නුසුදුසු පුරුදු නිසා අනන්ත රෝගාබාධවලට ගොදුරු වූවන් සමාජයේ කොතෙකුත් දැකිය හැකි ය. සමහරු දවසේ වැඩ නිමකොට අධික වෙහෙස මහන්සිය දුරු කර ගැනීමේ පහසු මගක් ලෙස ද මානසික පීඩා අවම කර ගැනීමට ද ඇතැම් වේදනා තාවකාලික ව යටපත් කර ගැනීමට ද විකෘති සතුටක් ලබා ගැනීමට ද මෙම දුසිරිතෙහි පිහිට සොයති. මත්ද්‍රව්‍ය හා මත් වතුර ඉතා ඉක්මනින් රුධිරය හා මිශ්‍ර වෙයි. එබැවින් මුළු සිරුරට ම උත්තේජනයක් ලබා දෙයි. එහෙත් එය අහිතකර ය. මෙම උත්තේජනයට හුරුවූවෝ නැවත නැවතත් එහි ම ඇලී එහි ඇති තාවකාලික සුවය ම සොයා යති. අවසානයේ සිදුවන්නේ උපතින් ම අපට උරුම වූ මහාර්ඝ සම්පතක් වන මොළයේ සෛල විශාල ප්‍රමාණයක් අකාලයේ විනාශ වී යාම ය. මෙම තත්ත්වය නුවණින් වටහා නොගැනීම නිසා මේ වන විට විනාශ වී ඇති ජීවිත සංඛ්‍යාව ද ඉතා විශාල ය. හෘදයාබාධ, පිළිකා, අක්මාවේ රෝග සහ වකුගඩු රෝගවලට ද ප්‍රධාන හේතුවක් වන්නේ මද්‍යසාර භාවිතයයි.

ශාරීරික සෞඛ්‍යයට බෙහෙවින් අහිතකර තවත් ප්‍රබල කරුණක් නම් දුම් පානයට ඇබ්බැහිවීමයි. මෙය ද මත්ද්‍රව්‍ය හා මත් වතුර භාවිතය මෙන් ම හෘද රෝග, මුඛ පිළිකා ආදියටත් ශ්වසන පද්ධතියේ විවිධ රෝග ඇතිවීමටත් ශරීරයේ අභ්‍යන්තර ඉන්ද්‍රියයන්ගේ ශක්තිය අඩපණ කිරීමටත් ප්‍රබල හේතු සාධකයක් වන්නේ ය.

මිනිසුන්ගේ කායික නීරෝගීතාව අඩපණ කරන තවත් සාධකයක් වන්නේ ආහාර පිළිබඳ අනිසි හුරු පුරුදුකම් ය. ආහාර ද කායික රෝගී බවට මෙන් ම නීරෝගී බවට ද බලපෑමක් ඇති කරයි. බුදු දහම අනුව කුසගින්න ලොව බලවත් ම රෝගයයි. සියලු සත්ත්වයන් ජීවත් වන්නේ ආහාරයෙනි. ආහාර ගැනීමෙන් අප බලාපොරොත්තු විය යුතු ප්‍රධාන කරුණු කිහිපයකි.

- ශරීරයේ යහපැවැත්ම, යැපීම
- උපන් කුසගිනි වේදනා දුරුකර ගැනීම
- නූපන් කුසගිනි වේදනා වැළැක්වීම
- ආයුෂ, වර්ණය, සැපය, බලය මෙන් ම නුවණ ද වැඩිදියුණු වීම

මේ අනුව කායික සෞඛ්‍යය සුරැකීමේ අත්‍යවශ්‍ය පියවරක් ලෙස සුදුසු ආහාර සුදුසු පරිදි අනුභව කිරීම සඳහන් කළ හැකි ය. ප්‍රමාණයට වඩා ආහාර අනුභව කිරීම කායික සෞඛ්‍යයට කිසිසේත් ම හිතකර නොවේ. බුදුරජාණන් වහන්සේ පමණ ඉක්මවා ආහාර ගත් කොසොල් මහ රජුට වදාළ පරිදි සිහි බුද්ධියෙන් ක්‍රියා කරන මිනිසුන්, පමණ දැන ආහාර ගත යුතු ය. එවිට කුසගින්න මෙන් ම තවත් කායික වේදනාවෝ ද නැති වෙති. ගන්නා ආහාර සැණෙකින් දිරවයි. ආයු සම්පත් වැඩි දියුණු වෙයි. අධිපෝෂණය සිරුරට අහිතකර ය. මේදය අධිකවීම හේතුවෙන් වැලඳෙන රෝගී තත්ත්වයන් සමාජය තුළ බහුලව දැකිය හැකි ය. ආහාර වැඩියෙන් අනුභව කිරීමත් ඊට සරිලන පරිදි කායික වෙහෙසීමක් සිදු නොවීමත් මෙම රෝගවලට ප්‍රධාන හේතුවකි. එය පාලනය කරගත නොහැකි වුවහොත් මුළු ජීවිත කාලය ම ඒ නිසා ම පීඩා විඳීමට සිදුවෙයි.

මනා කායික සෞඛ්‍යයක් උරුම කර ගැනීමට නම් කිසිදු ලෙසකින් හෝ අපි මත්ද්‍රව්‍ය, මත් වතුර භාවිතය හෝ දුම්බීම සිදු නොකළ යුතු වෙමු. ඇතැම්විට සමහරුන් ඒවාට හුරුවී ඇත්තේ විවිධ විෂම පුද්ගලයින්ගේ ඇසුර ලැබීම නිසයි. එබැවින් ඇසුරට සුදුසු ගුණයහපත් පුද්ගලයන් තෝරා ගැනීම ඉතා වැදගත් ය. මෙම අහිතකර ක්‍රියාවලට හුරුවීම අප සංසාර ජීවිතයේ අපමණ කුසල් කොට ලබාගත් වටිනා ජීවිතය අඳුරු අගාධයකට ඇද දමන විෂම බලවේගයක් බව මනාව තේරුම් ගත යුතු ය. ආහාර අනුභවයේ දී ද අප සැලකිලිමත් විය යුතු කරුණු කිහිපයකි.

- ශරීරයට හිතකර වූ ආහාර වේලක් තෝරා ගැනීම
- එළවළු හා පලාවර්ග ආහාරයට ගැනීම
- පළතුරු වර්ග හැකිතාක් ආහාර වේලට එක්කර ගැනීම
- පිළිකා කාරක කෘත්‍රිම රසායනික වර්ග අඩංගු නොවන ස්වාභාවික ආහාර පාන භාවිතය
- රසායනික ද්‍රව්‍ය යොදා ගනිමින් කෘත්‍රිම ලෙස වර්ණ ගැන්වූ ආහාර පාන භාවිතයට නොගැනීම

සිය ශ්‍රාවක භික්ෂූන් වහන්සේලා මානසික මෙන් ම කායික වශයෙන් ද නීරෝගී ව, ප්‍රබෝධවත් ව කටයුතු කිරීම බුදුරජාණන් වහන්සේ නිරතුරුව ම අපේක්ෂා කළහ. භික්ෂූන් වහන්සේලාගේ සෞඛ්‍ය සම්පන්න බව ආරක්ෂා කිරීම පිණිස විනය නීති රැසක් ද පණවා ඇත. ඉතා ප්‍රායෝගික වූ උපදෙස් ද ලබා දී තිබේ. පානීය හා පරිභෝජනීය ජලය පවිත්‍ර ව නිසි කළමනාකරණයෙන් භාවිත කිරීම, පරිසරය ප්‍රිය මනාප ලෙස මෙන් ම පිරිසිදු ව

පවත්වාගෙන යාම, පැන් පෙරා පානය කිරීම, සිවුරු ආදිය නිසි ලෙස සෝදා පරිහරණය කිරීම, භික්ෂූන් වහන්සේලා වැඩ සිටින ආවාස පිරිසිදු ව, ක්‍රමවත් ව තබා ගැනීම, එලෙසින් ම ඇඳ පුටු ආදිය පිරිසිදු ව හා ක්‍රමවත් ව භාවිත කිරීම විනයෙහි නීරෝගී භික්ෂු සමාජයක් ඇති කර ගැනීම පිණිස අනුදැන වදාළ කරුණු සමහරකි.

ඉහත කී සියලු කරුණු සැලකිල්ලට ගත් විට නීරෝගීකම උතුම් ම ලාභයක් බව නොයෙක් අයුරින් පැහැදිලි වේ. එසේ ම බුදු දහම අනුව නිවනින් මෙපිට පුද්ගලයකුට ලබා ගත හැකි උත්තරීතර සැපතක් නම් නීරෝගීකම ය. නිවැරැදි සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරීමෙන් යහපත් සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීමට හැකියාව ලැබේ. උසස් අධ්‍යාපනයක් ලබා දීප්තිමත් අනාගතයකට උරුමකම් කීමට ඒ තුළින් මනා පිටිවහලක් ලැබේ.

## සාරාංශය

කායික නීරෝගීතාව යනු ජීවිතයක සාර්ථකත්වය කෙරෙහි බෙහෙවින් ම බලපාන අංගයකි. ඒ වෙනුවෙන් නිවැරැදි සෞඛ්‍ය පිළිවෙත් ආරක්ෂා කළ යුතු ය. මත්ද්‍රව්‍ය හා මත් වතුර භාවිතය, දුම්පානය වැනි ශරීරයට ඉතා අහිතකර වූ නුසුදුසු පැවැත්ම ලෙඩරෝග රැසක් හටගැනීමට මංපෙත් විවර කරයි. හෘදයාබාධ, පිළිකා, අක්මාවේ රෝග හා වකුගඩු ආබාධ ඒ අතර ප්‍රධාන ය. පිළිකාකාරක කෘත්‍රිම ආහාර පාන භාවිතය ද ලෙඩරෝගවලට හේතුවකි. සුදුසු ආහාර පාන වර්ග පමණක් අවශ්‍ය ප්‍රමාණයට ගැනීම මෙහි දී ඉතා වැදගත් ය. නිදුක් නීරෝගී දිවි පැවැත්මකට උරුමකම් කිව හැක්කේ එසේ ක්‍රියා කිරීම මගිනුයි.

## ක්‍රියාකාරකම

1. මත්ද්‍රව්‍ය, මත් වතුර භාවිතය හා දුම්බීම වැනි විෂම චර්යාවලින් ජීවිතයට සිදුවන හානිය පිළිබඳ කරුණු සාරාංශ කොට දක්වන්න.

2. 'නීරෝගීකම උතුම් ම ලාභයයි', මෙම ප්‍රකාශයෙහි සත්‍යතාව අනාවරණය කරන්න.

3. එදිනෙදා ආහාරපාන වර්ග තෝරා ගැනීමේ දී අප අනුගමනය කළ යුතු පිළිවෙත කුමක් ද?

## පැවරුම

- "අපි කයින් සුවපත් වෙමු" මැයෙන් පාසල් සිසුන් අතට පත් කිරීමට සුදුසු අත් පත්‍රිකාවක් පිළියෙල කරන්න.

# 20 ගැටලු විසඳන සසුන් පිළිවෙත


"චුන්ද, මා විසින් අවබෝධ කරගෙන යම් ධර්මයක් දේශනා කරන ලද්දේ ද එම ධර්මය අර්ථයෙන් අර්ථය, වචනයෙන් වචනය සංසන්දනය කරමින් සංගායනා කළ යුතු ය. විවාද නොකළ යුතු ය. එය සියල්ලන්ගේ යහපත පිණිස හේතු වෙයි."

බුදුරජාණන් වහන්සේ ශාක්‍ය ජනපදයෙහි වේධඤ්ඤ නම් වූ ශාක්‍ය රජදරුවන්ගේ උයනෙහි වැඩවසන සමයෙහි මෙම ප්‍රකාශය කර ඇත්තේ චුන්ද හිමියන් අමතමිනි. එයට හේතු වූයේ නිගණ්ඨනාතපුත්ත ශාස්තෘවරයාගේ අභාවයෙන් පසුව එම ශාසනයට අත්වූ ඉරණම චුන්ද හිමියන් විසින් බුදුරජාණන් වහන්සේට දැනුම් දීමයි. ඉහත ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේ ශාසනික ගැටලු විසඳීම සඳහා සංගායනා පැවැත්වීම අනුදැන වදාළ බවයි. ඒ අනුව සංගායනා පැවැත්වීමේ මූලික අර්ථය සාකච්ඡා මාර්ගයෙන් ධර්ම විනය නිරවුල් කර ගැනීම හා ගැටලු විසඳා ගැනීමයි. ශාසන ඉතිහාසය තුළ එසේ ගැටලු ඇති වූ අවස්ථාවන්හි දී ශාසන භාරධාරී මහතෙරවරුන් මුල් වී සංගායනා පවත්වා ඇත. එසේ පැවැත් වූ පළමු ධර්ම සංගායනාව පිළිබඳ ව අටවෙනි ශ්‍රේණියේ දී අපි උගතිමු. මෙහි දී දෙවන හා තෙවන සංගායනා පිළිබඳව විමසා බලමු.

## දෙවන ධර්ම සංගායනාව

බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගිය තැන පැවැත් වූ පළමු ධර්ම සංගායනාව විවිධාකාරයෙන් ශාසන චිරස්ථිතියට හේතුවිය. එහෙත් එයින් සියවසක් ඇවෑමෙන් නැවත සසුන තුළ ගැටලු මතුවිය. විශේෂයෙන් බුදුරදුන් විසින් නොපැනවූ නීති නොපැනවීමටත් පනවන ලද නීති කඩ නොකොට ආරක්ෂා කිරීමටත් ප්‍රථම සංගායනාවේ ගෙන තිබූ තීරණය ඇතැම් භික්ෂූන් වහන්සේලා විසින් මේ වන විට නොසලකා හරින තත්ත්වයට පත් ව තිබුණු බව පෙනේ. වජ්ජිපුත්තක භික්ෂූන්ගේ ක්‍රියාකලාපය මෙයට නිදසුනකි. වජ්ජි රාජ්‍යයේ විසූ එම භික්ෂු පිරිස සාමාන්‍ය ජනතාවගේ පමණක් නොව එකල පාලකයා වශයෙන් කටයුතු කළ කාලාශෝක රජුගේ පවා අනුග්‍රහය ලැබීමට තරම් ශක්ති සම්පන්න වූහ.

කාකණ්ඩ පුත්‍ර යස හිමියන් විශාලාවෙහි චාරිකාවක නිරත වූයේ මේ කාලයේ ය. එදින පොහෝ දිනයකි. වජ්ජි පුත්තක භික්ෂූහු විහාරස්ථානයට පැමිණෙන උපාසක පිරිසෙන් පිරිකර ලබා ගැනීමට යැයි කියමින් ලෝහමය පැන් භාජනයකට කහවනු දමන ලෙස ඉල්ලා සිටියහ. යස හිමියෝ මෙම ක්‍රියාවලිය දැක එය අකැප බව දායකයනට පෙන්වා දුන්හ. එහෙත් උපාසකවරු පෙර පරිදි ම බඳුනට කහවනු දැමූහ. පසුව වජ්ජිපුත්තක භික්ෂූහු සම්මාදම් කළ කහවනුවලින් කොටසක් යස හිමියන්ට ද ලබා දීමට උත්සාහ කළහ. එහෙත් යස හිමියෝ එය ප්‍රතික්ෂේප කළහ. කහවනු සම්මාදම් කිරීමේ සිද්ධිය ද ඇතුළත් ව විනය විරෝධී ක්‍රියාකාරකම් දහයක් වජ්ජිපුත්තක භික්ෂූන් විසින් අනුගමනය කරන ලද බව යස හිමියන්ට දැනගන්නට ලැබුණි. චුල්ල වග්ග පාලියේ දැක්වෙන පරිදි එම අකැප දස වස්තුව මෙසේ ය.



1. කප්පති සිංගිලෝණ කප්පෝ - අඟක ලුණු තබාගෙන භාවිත කිරීම කැප ය.

2. කප්පති ද්වංගුල කප්පෝ - හිරු අවරට ගොස් සෙවණැල්ල දැඟුලක් වනතුරු ආහාර අනුභවය කැප ය.

| | | |
|---|---|---|
| 3. කප්පති ගාමන්තර කප්පෝ | - | වරක් වළඳා අවසන් කොට වෙනත් ගමකට යන්නෙමැයි නැවත වැළඳීම කැප ය. |
| 4. කප්පති ආවාස කප්පෝ | - | මහා සීමාව තුළ පිහිටි කුඩා ආවාසයන්හි වෙන වෙන ම පොහොය කර්ම කිරීම කැප ය. |
| 5. කප්පති අනුමති කප්පෝ | - | විනය කර්මවලට නොපැමිණි භික්ෂූන්ගේ අනුමතය පසුව ලබා ගන්නා රිසියෙන් සංඝ කර්ම කිරීම කැප ය. |
| 6. කප්පති ආචිණ්ණ කප්පෝ | - | ආචාර්යයන් වහන්සේලා විසින් පුරුදු කරන ලද කැප හෝ අකැප දෑ සියල්ල ඒ ලෙසට ම පිළිගැනීම කැප ය. |
| 7. කප්පති අමථිත කප්පෝ | - | කිරිත් නොවූ දීකිරිත් නොවූ කිරි වැළඳීම කැප ය. |
| 8. කප්පති ජලෝගි පාතුං | - | නොපැසුණු සුරාපානය කැප ය. |
| 9. කප්පති අදසකං නිසීදනං | - | වාටි නොමැසූ ඇතිරිලි පරිහරණය කිරීම කැප ය. |
| 10. කප්පති ජාතරූපරජතං | - | රන් රිදී කහවනු පිළිගැනීම කැප ය. |

"ඔබ වහන්සේ මෙම කරුණුවලට විරුද්ධත්වය ප්‍රකාශ කිරීමෙන් උපාසක උපාසිකා පිරිස් අප කෙරෙහි කලකිරවතැ"යි චෝදනා කොට වජ්ජි පුත්තක භික්ෂූහු යස හිමියනට **පටිසාරණීය කර්මය** කළහ. (ගිහියන්ගෙන් සමාව ගැනීමට නිර්දේශ කරන දඬුවම පටිසාරණීය කර්ම නම් වේ.) තව දුරටත් මෙම දස වස්තුවට එරෙහි ව අදහස් දැක්වීම හේතු කොට ගෙන උන් වහන්සේට **උක්ඛේපනීය කර්මය** කිරීමට ද වජ්ජිපුත්තක භික්ෂූහු සැලසුම් කළහ. (වැරැදි හෙවත් ඇවැත් නොදන්නා, නොපිළිගන්නා භික්ෂූන්ට වරප්‍රසාද තහනම් කිරීම උක්ඛේපනීය කර්මයයි.) මේ ක්‍රියාවලිය දැනගත් යස තෙරණුවෝ ඊට පෙර ආපසු කොසැඹෑ නුවරට වැඩම කළහ. අනතුරුව පාවා හා අවන්ති ප්‍රදේශවල වාසය කරන භික්ෂූන් වහන්සේලා ද දැනුවත් කොට වජ්ජි පුත්තක භික්ෂූන් වහන්සේලාගේ දස වස්තුවට එරෙහි ව ධර්ම විනය ආරක්ෂා කර ගැනීමේ අරමුණින් ක්‍රියා කළහ. ඒ අනුව පළමුව පාවා ප්‍රදේශයෙන් භික්ෂූන් වහන්සේලා හැට නමක් ද අවන්ති ප්‍රදේශයෙන් භික්ෂූන් වහන්සේලා අසූඅට නමක් ද සම්බන්ධ කර ගන්නා ලදහ. එහි දී එවකට විසූ ජ්‍යෙෂ්ඨ භික්ෂූන් වහන්සේලා වෙතින් උපදෙස් ලබා ගැනීමට ද **සබ්බකාමී** සහ **යස** යන හිමිවරුන් විසින් ක්‍රියා කළහ. වනවාසී **සම්භූත**, සෝරෙය්‍ය නුවර වැසි **රේවත** යන මහ තෙරුන් වහන්සේලාගේ උපදෙස් ලබා ගන්නා ලද්දේ ඒ අනුව ය.

වජ්ජිපුත්තක භික්ෂූහු තමනට එරෙහිව මතුවන විරෝධයන් මර්දනය කරලීමට අවශ්‍ය බොහෝ ක්‍රියාකාරකම්වලට යොමු වූහ. ඉන් එක් පියවරක් වූයේ රේවත හිමියන් වෙත විශාල වශයෙන් පිරිකර පූජා කොට උන් වහන්සේගේ සහාය තම පාර්ශ්වයට ලබා ගැනීමට උත්සාහ ගැනීම ය. එහෙත් රේවත හිමියන් ඒවා ප්‍රතික්ෂේප කිරීම නිසා එම උපක්‍රමය අසාර්ථක විය. අනතුරුව යොමු වූයේ මේ වන විට බුදු දහම පිළිබඳ ව අනවබෝධයෙන් සිටි කාලාශෝක රජතුමා තම වචනයට අවනත කර ගැනීමට ය. එම උත්සාහය තරමක් සාර්ථක විය. යස හිමියන් ඇතුළු පිරිස විසාලාවට පැමිණීම වැළැක්වීමේ නියෝග නිකුත් කිරීමට රජතුමා යොමු වූයේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. එහෙත් රජතුමාගේ නැගණියක වූ නන්දා රහත් මෙහෙණින් වහන්සේගේ කරුණු පැහැදිලි කිරීමෙන් අනතුරුව රජතුමාට යථාර්ථය තේරුම් ගැනීමට හැකි විය. ඉන් සිදු වූයේ ධර්මවාදී භික්ෂූන් වහන්සේලාට සහාය දීමට රජතුමා යොමු වීමයි. අනතුරුව විසාලා මහනුවර මහවනයෙහි කූටාගාර ශාලාවට ධර්මවාදී විශාල භික්ෂු පිරිසක් එක් රැස් වූහ. එහිදී භික්ෂූන් අතර විවිධ මතවාද වූයෙන් දසවස්තුව පිළිබඳ ව සම්මතයකට පැමිණීමට නොහැකි විය. අනතුරුව රැස් වූ භික්ෂු පිරිසගෙන් කාරක සභාවක් (උබ්බාහිකාවක්) පත් කරගෙන මෙම ගැටලුව විසඳීමට ක්‍රියාකිරීම සුදුසු බවට රේවත හිමියන් ගෙනා යෝජනාව සභා සම්මත වූයේ ය. ඒ අනුව එතැන රැස්ව සිටි පාචීන හෙවත් පෙරදිග ප්‍රදේශය නියෝජනය කරන භික්ෂූන් වහන්සේලාගෙන් හතර නමක් එම උබ්බාහිකාවට (කමිටුවට) පත්කර ගන්නා ලදහ. උන් වහන්සේලා නම් **සබ්බකාමී, සාළ්හ, ඛුජ්ජසෝභිත, වාසභගාමී** යන ස්වාමීන් වහන්සේලා ය. පාවෙය්‍යක හෙවත් බටහිර ප්‍රදේශය නියෝජනය කරමින් පත් වූයේ **රේවත, සම්භූත, යස, සුමන** යන ස්වාමීන් වහන්සේලා සිව් නම ය. එම කාරක සභාව විසින් පුළුල් අධ්‍යයනයකින් පසුව තීරණය කළේ දස වස්තුව විනය විරෝධී බවයි. කාරක සභාවේ සභාපතිත්වය දරන ලද්දේ සබ්බකාමී තෙරණුවන් විසිනි. මේ අවස්ථාවේ ශාසනයේ චිර පැවැත්ම උදෙසා සංශෝධනයක් ඇතිකරලීමටත් දසවස්තුව විනය විරෝධී බව තහවුරු කිරීමටත් අවශ්‍ය සංඝ සම්මුතිය ලබා ගැනීම උදෙසා දෙවන ධර්ම සංගායනාව පවත්වන ලදි.

**සංගායනාව පිළිබඳ තොරතුරු සම්පිණ්ඩණය**

**1. හේතුව**

වජ්ජි පුත්තක භික්ෂූන් විසින් ක්‍රියාත්මක කරගෙන එනු ලැබූ විනය විරෝධී දසවස්තුව.

**2. මූලිකත්වය**

කාකණ්ඩ පුත්ත යස හිමියන් වජ්ජි පුත්තක භික්ෂූන් පිළිගත් අකැප දස වස්තුවට එරෙහිව සුවිශාල කාර්යභාරයක් ඉටු කළ ද ජ්‍යෙෂ්ඨත්වය අනුව සංගායනාවේ මූලිකත්වය හෙබවූයේ සබ්බකාමී මහරහතන් වහන්සේ ය.

**3. අනුග්‍රාහකත්වය**

කාලාශෝක රජතුමා.

**4. සහභාගී වූ පිරිස**

ත්‍රිපිටකය පිළිබඳ ව පුළුල් දැනුමක් ඇති මහ රහතන් වහන්සේලා හත්සිය නමකි. එබැවින් මෙම දෙවැනි ධර්ම සංගීතිය සත්තසතික සංගීතිය ලෙස හැඳින්වේ.

**5. ස්ථානය**

විශාලා මහනුවර වාලුකාරාමය

**6. වකවානුව**

බුද්ධ පරිනිර්වාණයෙන් වසර සියයකට පසු

**7. ගත වූ කාලය**

මාස අටකි

**8. ප්‍රතිඵල**

1. වජ්ජිපුත්තක භික්ෂූන් විසින් පිළිගන්නා ලද දස වස්තුව විනය විරෝධී යැයි සංඝ සම්මුතියෙන් ප්‍රතික්ෂේප කිරීම
2. විනය නීති ලිහිල් නොකිරීමට පළමු ධර්ම සංගායනාවේ දී ගන්නා ලද තීරණය ඒ අයුරින් ම ක්‍රියාත්මක කරලීමට එකඟ වීම
3. බුද්ධ කාලයේ පටන් වැඩුණු ශාසනික පැවැත්මට එරෙහි උපද්‍රව ඉවත් කර ශාසනික සම්ප්‍රදායට සංශෝධනයක් ඇති වීම
4. දස වස්තුව පිළිගත් විශාල භික්ෂු පිරිසක් වූ අතර උන් වහන්සේලා විසින් මහාසාංඝික නමින් වෙන ම නිකායක් පිහිටුවා ගැනීම හා එතැන් පටන් සංගීතියට මූලික වූ හා එකඟ වූ ශික්ෂාකාමී වූ පැරණි භික්ෂු සම්ප්‍රදාය ථෙරීය නමින් පෙනී සිටීම.

## තෙවන ධර්ම සංගායනාව

අශෝක සමය ශාසන ඉතිහාසයේ නව සන්ධිස්ථානයක් සනිටුහන් කළ යුගයකි. කාලාශෝක රාජ්‍ය සමයෙන් පසුව භාරතයේ බුදු සසුන නැවත ප්‍රබෝධයට පත්වූයේ අශෝක රාජ්‍ය සමයෙහි දී ය. එයට හේතු වූයේ බොහෝ පාලකයන් ශාසන උන්නතිය පසෙක ලා රාජ්‍ය උන්නතිය පමණක් සලකා කටයුතු කිරීමයි. රාජ්‍ය අනුග්‍රහය නොමැති සෑම අවස්ථාවක ම සිදුවනුයේ ශාසනික පරිහානියකි. කාලාශෝක රජුගෙන් පසුව බලයට පත් ඔහුගේ දරුවන්ගෙන් ද අනතුරුව බලයට පත් නන්ද රාජ පෙළපතට අයත් පාලකයන්ගෙන් ද ශාසන අභිවෘද්ධියට අදාළ ප්‍රමාණවත් මෙහෙවරක් ඉටු නොවුණු තරම් ය.

අශෝක සමයේ දී බුදු සසුනට රජු විසින් දක්වන ලද ඇල්මත්, පුද සත්කාරත් නිසා අන්‍යාගමිකයින්ට ලැබුණ වරප්‍රසාද හීන විය. බෞද්ධ බලය ක්‍රමයෙන් වර්ධනය වන්නට විය. මෙයින් නොසතුටු වූ අන්‍යාගමිකයෝ විවිධ ලාභ ප්‍රයෝජන අපේක්ෂාවෙනුත් බුදු සසුන කෙලෙසීමේ අපේක්ෂාවෙනුත් තමන් විසින් ම සිවුරු පොරවාගෙන ව්‍යාජ ලෙස භික්ෂු වෙස් ගත්හ. වැඩි වශයෙන් මෙබඳු පිරිස් සසුනට එක් වීම නිසා ඔවුන්ගේ බලය ද වැඩි විය. ඔවුන් තමන්ගේ මතය උපක්‍රමශීලී ව සමාජගත කිරීමට යොමුවීම හේතුවෙන් සිල්වත් භික්ෂූන්ට විවිධ අපහසුතාවලට මුහුණ දීමට සිදුවිය. උපසම්පදා භික්ෂූන්ට අදාළ ප්‍රධාන විනය කර්මයක් වන පොහොය කර්ම පවා සත්වසක් මුළුල්ලෙහි සිදු නොවිණි.

ධර්මාශෝක අධිරාජයාට මෙම වාතාවරණය සැලවිය. ඒ පිළිබඳව සොයා බැලීමට හෙතෙම පැලලුප් නුවර අශෝකාරාමයට ඇමැතියකු පිටත් කර හැරියේ ය. ඔහු එහි වැඩසිටි උපසපන් භික්ෂූන් වහන්සේලාට පොහොය කර්ම කිරීමට නියෝග කළ නමුත් සිල්වත් භික්ෂූහු එය ප්‍රතික්ෂේප කළහ. මෙයින් කිපුණු ඇමැතිවරයා විසින් භික්ෂූන් වහන්සේලා කිහිප නමක් ඝාතනය කරන ලදි. ඒ අතර රජතුමාගේ සහෝදරයකු වූ තිස්ස තෙරුන්ගේ මැදිහත්වීම නිසා භික්ෂු ඝාතන නැවතිණි. රජුට මේ ගැන දැන ගැනීමට ලැබීමෙන් පසු නැවතත් එතුමා දැඩි චිත්ත පීඩාවට පත්විය. තමනුත් මෙම පාපකාරී ක්‍රියාවේ කොටස්කරුවකු වී ඇත් දැයි දැන ගැනීමට රජුට අවශ්‍ය විය. දිගින් දිගට ම මේ පිළිබඳ ව භික්ෂූන් වහන්සේලාගෙන් විමසූ කල ලැබුණ පිළිතුරුවල පොදු එකඟතාවක් නොවුණි. මේ සඳහා නිශ්චිත පිළිතුරක් ලබාගත හැකි රහතන් වහන්සේ නමක වශයෙන් මොග්ගලීපුත්තතිස්ස හිමියන් පිළිබඳව රජතුමන්ට සැල විය. රජතුමා විසින් මොග්ගලීපුත්තතිස්ස හිමියන්ට තම ගැටලුව ඉදිරිපත් කරන ලදි. එයට ලැබුණ පිළිතුර වූයේ රජතුමාගේ දැනුම්වත්භාවයකින් තොරව භික්ෂු ඝාතනය සිදුවීම නිසා එම පාපකාරී ක්‍රියාවේ ඔහු කොටස්කරුවකු නොවන බවයි. අනතුරුව බුදු සසුනට මේ වනවිට අත් වී ඇති ඉරණම පිළිබඳ ව දෙදෙනා අතර දීර්ඝ පිළිසඳරක් ඇතිවිය. ධර්මාශෝක රජතුමාට ශාසනයෙහි පැවති අර්බුදකාරී තත්ත්වය පිළිබඳව නිවැරැදි අවබෝධයක් ඇතිවූයේ එවිට ය. මේ තත්ත්වයෙන් ශාසනය මුදවා ගැනීමට කළ යුතු කාර්යය ලෙස තීරණය වූයේ ශාසන සංශෝධනයක් කිරීමයි. මොග්ගලීපුත්තතිස්ස මාහිමියන්ගේ උපදෙස් පරිදි පළමුවෙන් සිදුකළ කාර්යය වූයේ මේ වනවිට සසුනට ඇතුළත් වී සිටි දුර්මතධාරී භික්ෂූන් වහන්සේලා ඉවත් කිරීමයි. නිසි ක්‍රමවේදයක් තුළින් එම ඉවත් කිරීම සිදුකෙරුණි. ඉවත් කරන ලද අන්‍ය ලබ්ධික භික්ෂු පිරිස හැටදහසකි. ඉන් අනතුරුව මොග්ගලීපුත්තතිස්ස හිමියෝ තවදුරටත් සසුනේ පාරිශුද්ධත්වය හා චිර පැවැත්ම සහතික කරලීම උදෙසා සංගායනාවක් කිරීමේ අවශ්‍යතාව ද රජුට පෙන්වා දුන්හ. තෙවන ධර්ම සංගායනාවට පසුබිම සකස් වූයේ ඒ අයුරිනි.

**සංගායනාව පිළිබඳ තොරතුරු සම්පිණ්ඩනය**

**1. හේතුව**

ලාභ ප්‍රයෝජන අපේක්ෂාවෙන් මිථ්‍යා ලබ්ධික පිරිස් භික්ෂු වෙස් ගැනීමෙන් උපන් ගැටලු.

**2. මූලිකත්වය**

මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ

**3. අනුග්‍රාහකත්වය**

ධර්මාශෝක මහ රජතුමා

**4. සහභාගි වූ පිරිස**

ධර්මධර විනයධර බහුශ්‍රැත භික්ෂූන් වහන්සේලා දහසක් මේ සඳහා සහභාගි වූ නිසා මෙම සංගායනාව සාහස්සිකා සංගීතිය නමින් හැඳින්වේ.

**5. ස්ථානය**

පැලලුප්නුවර අශෝකාරාමය

**6. වකවානුව**

බුද්ධ පරිනිර්වාණයෙන් වසර දෙසිය තිස් හයක් ගිය පසු

**7. ගත වූ කාලය**

මාස නවයකි

**8. ප්‍රතිඵල**

1. දුර්මතධාරී භික්ෂූන් වහන්සේලා හැටදහසක් සසුනෙන් නෙරපා හැරීම
2. පොහොය කර්ම ආදිය සාමූහික ව සිදු කිරීමට භික්ෂූන්ට හැකියාව ලැබීම
3. සසුනට ඇතුළු ව තිබූ දුර්මත පන්සීයක් හඳුනාගෙන ඒවාට පිළිතුරු වශයෙන් දක්වන ලද ධර්ම කරුණු පන්සියයක් ඇතුළත් කර කථාවත්ථුප්පකරණය නම් ග්‍රන්ථය රචනා කර අභිධර්ම පිටකයට ඇතුළත් කිරීම. ඒ අනුව ථෙරවාද අභිධර්ම පිටකය ප්‍රකරණ සතක් බවට පත් වීම.
4. බුදු දහම දේශාන්තර වශයෙන් ව්‍යාප්ත කිරීම - ඒ යටතේ රටවල් නවයකට පහත සඳහන් පරිදි ධර්ම දූතයන් වහන්සේලා පිටත් කර හරින ලදි.

| රට | නායකත්වය |
|---|---|
| කාශ්මීර ගන්ධාර | මජ්ඣන්තික හිමි ඇතුළු පිරිස |
| මහිස මණ්ඩලය | මහාදේව හිමි ඇතුළු පිරිස |
| වනවාසී දේශය | රක්ඛිත හිමි ඇතුළු පිරිස |
| අපරන්ත දේශය | යෝනක ධම්ම රක්ඛිත හිමි ඇතළු පිරිස |
| මහා රට්ඨ | මහා ධම්ම රක්ඛිත හිමි ඇතුළු පිරිස |
| යෝනක දේශය | මහා රක්ඛිත හිමි ඇතුළු පිරිස |
| හිමවත් පෙදෙස | මජ්ඣිම හිමි ඇතුළු පිරිස |
| ස්වර්ණ භූමිය | සෝණ උත්තර හිමි ඇතුළු පිරිස |
| තම්බපණ්ණිය | මිහිඳු හිමි ඇතුළු පිරිස |

මේ ආකාරයට ශාසනයේ චිරස්ථිතියට හා ව්‍යාප්තියට අදාළ ව තෙවන ධර්ම සංගායනාවෙන් ප්‍රතිඵල රැසක් උදා වූ බව පැහැදිලි ය. ඉහත සටහන අනුව තම්බපණ්ණිය යනුවෙන් එවකට හඳුන්වා ඇත්තේ ශ්‍රී ලංකාවයි. මිහිඳු මහ රහතන් වහන්සේ ප්‍රධාන ධර්ම දූත පිරිස එදා මෙරටට පැමිණීම අතිවිශිෂ්ට ඓතිහාසික සිදු වීමකි. එයින් ථෙරවාද බුදු දහමෙහි කේන්ද්‍රස්ථානයක් බවට මෙරට පත් වීම ද, නොයෙක් අයුරින් ශ්‍රී ලාංකේය සංස්කෘතිය බුදු දහම මුල්කොට සංවර්ධනයට පත් වීම ද සිදු විය.

ශාසනික වශයෙන් ඇති වූ ගැටලු නිරාකරණයට උපකාරී වූ පළමු, දෙවන, තෙවන ධර්ම සංගායනා වත්මන් සමාජයේ ගැටලු නිරාකරණයට අගනා ආදර්ශයකි. කාරක සභාවක් තුළින් දස වස්තුව විනිශ්චය කිරීමට යොදා ගත් ක්‍රියාමාර්ගය වර්තමානයේ සාමාජික, දේශපාලනික හා ආර්ථික ආදි විවිධ අංශයන්ට අදාළ ව පැන නගින ගැටලු නිරාකරණයට භාවිත කළ හැකි ය. එමෙන් ම මේ කුමන හෝ අංශ සම්බන්ධ ව ඇතිවන අර්බුද විසඳා ගැනීමට රාජ්‍ය මැදිහත් වීම වැදගත් ය. එසේ නොවුණහොත් එම ගැටලුව තව දුරටත් වර්ධනය වනු ඇත. ගැටලු ඇති වූ විට තනි තනිව විසඳුම් සෙවීමට නොගොස් බුද්ධිමතුන්ගේ හා විශේෂඥයන්ගේ උපදෙස් ලබා ගැනීමට යොමුවීම ඉතා වැදගත් ය. සාකච්ඡාවෙන් ද සම්මුතියෙන් ද එළැඹෙන විසඳුම් බොහෝ සෙයින් සාර්ථක වේ. මෙම කරුණු තේරුම් ගෙන අපි ජීවත් වන සමාජයේ විවිධ ක්ෂේත්‍රයන්ට අදාළ ව පැන නගින ගැටලුවලට විසඳුම් සෙවීමට යොමු වෙමු.

## සාරාංශය

බුද්ධ පරිනිර්වාණයෙන් වසර සියයක් ගිය තැන වජ්ජිපුත්තක භික්ෂූන් වහන්සේලාගේ දස වස්තුව මුල්කරගෙන විශාලා මහනුවර වාලුකාරාමයේ දී සබ්බකාමී හිමියන්ගේ මූලිකත්වයෙන් හා කාලාශෝක රජුගේ අනුග්‍රාහකත්වයෙන් දෙවන ධර්ම සංගායනාව පවත්වන ලදි. මාස අටක් මුළුල්ලේ පැවැති මෙම සංගායනාවට රහතන් වහන්සේලා හත්සීයක් දෙනා සහභාගි වූහ. එබැවින් මෙය සත්තසතික සංගීතිය නම් වේ. තෙවන ධර්ම සංගායනාව පවත්වා ඇත්තේ බුද්ධ පරිනිර්වාණයෙන් වසර දෙසිය තිස්හයක් ගිය තැන පැළලුප්නුවර අශෝකාරාමයේ දී ය. ඒ සඳහා හේතු වී ඇත්තේ මිථ්‍යා ලබ්ධිකයින් ලාභ ප්‍රයෝජන අපේක්ෂාවෙන් සසුන් ගත වී ශාසන විරෝධී ක්‍රියාකාරකම්වල නිරතවීම ය. මෙහි මූලිකත්වය මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ ඉසුලූ අතර අනුග්‍රාහකත්වය ලබා දී ඇත්තේ අශෝක රජතුමා විසිනි. මාස නවයක් මුළුල්ලේ පැවැති මෙම සංගායනාවට සහභාගි වූ රහතන් වහන්සේලාගේ සංඛ්‍යාව දහසකි. එබැවින් මෙම සංගීතිය සාහස්සිකා නම් විය.

## ක්‍රියාකාරකම

1. ශාසනයේ චිර පැවැත්මට හා ව්‍යාප්තියට අදාළ ව තෙවන ධර්ම සංගායනාවෙන් සිදු වූ සේවාවන් දෙකක් නම් කරන්න.

2. "අ " කොටසට ගැළපෙන පිළිතුර "ආ " කොටසින් තෝරාගෙන එයට හිමි අංකය වරහන තුළ යොදන්න.

| අ කොටස | | ආ කොටස |
|---|---|---|
| 1. අභිධර්ම පිටකය | ( ) | 1. දෙවන ධර්ම සංගායනාව |
| 2. හිමවත් ප්‍රදේශය | ( ) | 2. විශාලා මහනුවර |
| 3. දස අකැප වස්තුව | ( ) | 3. මිහිඳු මාහිමි |
| 4. තම්බපණ්ණිය | ( ) | 4. කථාවත්ථුප්පකරණය |
| 5. වාලුකාරාමය | ( ) | 5. මජ්ඣිම තෙරුන් වහන්සේ |

## පැවරුම

- සංගායනාත්‍රයට අදාළ මූලික කරුණු වගුගත කොට දක්වන්න.

21

# සුරකිමු හෙළ කලා කෙත

මිහිඳු මහ රහතන් වහන්සේගේ වැඩමවීම ශ්‍රී ලාංකේය සංස්කෘතියත් ඒ හා බැඳුණු සියල්ලත් පෝෂණය කරලීමට, සංවර්ධනය කරලීමට නන් අයුරින් මුල් වූ බව ප්‍රකට කරුණකි. උන් වහන්සේගේ ලංකාගමනය දේශීය සංස්කෘතියේ ආරම්භය ලෙස ද සැලකෙයි. එමගින් මෙරට අධ්‍යාපනය, සිරිත් විරිත්, දේශපාලනය, ආර්ථිකය, ජන ඇදහිලි, භාෂාව හා සාහිත්‍යය, කලා ශිල්පාදී සෑම සමාජ සංස්කෘතික ක්ෂේත්‍රයන්ට බුදුසමයෙන් ආභාසය ද ඇති ව සංවර්ධනය වූයේ ය. අප මෙහි දී සාකච්ඡා කරන්නේ දේශීය කලා ශිල්ප හා සාහිත්‍යය බෞද්ධ ආභාසයෙන් පෝෂණය වී වැඩී ගිය ආකාරයයි.

## බෞද්ධ කලාව

හෙළ කලා කෙත සරුසාර වූයේ බුදු සමයේ ආභාසයෙනි. එය අපේ ඉතිහාසය පරීක්ෂා කිරීමේ දී පසක් වේ. මිහිඳු හිමියන් ලක්දිවට වැඩම කිරීමට පෙර දේශීය කලාව වැඩි දියුණු වී නොතිබිණ. පශ්චාත් මහින්ද යුගයේ දී නිර්මාණය කෙරුණු

- **බෝධිඝර**
- **චෛත්‍යඝර සහ දාගැබ්**
- **ප්‍රතිමාඝර සහ බුදු පිළිම**
- **චිත්‍ර ශිල්පය**
- **කැටයම් නිර්මාණ**

ආදි සියලු කලා ශිල්ප පෝෂණය වී ඇත්තේ බුදු සමයේ ආභාසයෙනි. ශ්‍රී මහා බෝධි රෝපණයෙන් පසුකාලීන ව ඇති වූ බෝධිඝරය බුදු දහමේ හරවත් පණිවිඩ පදනම් කරගෙන නිර්මාණය වූවකි.

බුද්ධ කාලීනව ඉතා සරල නිර්මාණයක් වශයෙන් ඇරඹි බෞද්ධ ස්තූපය අංග වශයෙන් මෙන් ම සංකේතාර්ථ වශයෙන් ද විචිත්‍රත්වයට පත් වූයේ හෙළ බොදු සංස්කෘතිය තුළිනි. ඒ හා බැඳුණු වාහල්කඩ පවා ගැඹුරු සංකේතාර්ථ සහිත ඉතා සියුම් නිර්මාණවලින් සුසැදි බව විද්වත් පිළිගැනීමයි. ස්තූපයේ ආකෘතිය අනුව බුබ්බුලාකාර, ඝටාකාර ආදි විවිධ ආකෘති දක්නට ලැබේ. එපමණක් නොව ස්තූපයේ ඒ ඒ අංග මගින් ගැඹුරු බෞද්ධ සංකල්ප සෞන්දර්යාත්මක ව නිරූපණය කරන බව මහාචාර්ය සෙනරත් පරණවිතාන සූරීන්ගේ පිළිගැනීමයි.

බුද්ධ ප්‍රතිමාව නිර්මාණය වූයේ දීර්ඝ කාලයක් ඒ වෙනුවට සංකේත භාවිතයෙන් අනතුරුව ය. ක්‍රි.ව. 1 වැනි සියවසේ දී පමණ ඇරඹී බුද්ධ ප්‍රතිමාව අප්‍රාණික කළුගලකට කරුණාවේ හදවත ඇතුළු කිරීමට හෙළ කලාකරුවා දැරූ උත්සාහයකි. මහමෙව්නාවේ වැඩ සිටින සමාධි ප්‍රතිමා වහන්සේ මෙයට සාක්ෂි දරයි. තොළුවිල, රැස්වෙහෙර, අවුකන ආදි ස්ථානයන්හි පිහිටි බුද්ධ ප්‍රතිමා හෙළ කලාකරුවාගේ බොඳු බැතියත් කලාකාමී නිර්මාණශීලී හැකියාවත් ප්‍රකට කෙරෙන ප්‍රධාන නිදසුන් කිහිපයකි.

මූලික වශයෙන් මෙම ත්‍රිවිධ චෛත්‍යය අරමුණු කරගෙන සැකසුණු සඳකඩ පහණ, මුරගල, කොරවක්ගල පමණක් නොව ගල් කුලුනක කොටන ලද කැටයම පවා බෞද්ධ තේමාවක් රැගත් නිර්මාණයක් කිරීමට තරම් හෙළ කලාකරුවා බුදු දහමින් පුබුදුවාලූ නිවුණු මනසක් ඇති අයෙක් විය. බෞද්ධ සිද්ධස්ථානයකට පිවිසීම සඳහා ඇති පියගැට පෙළෙහි පාමුල පිහිටි සඳකඩ පහණ යනු අර්ධ කවාකාර ගල් පඩියකි. එහි එකිනෙක අර්ධ වෘත්තාකාර තීරු තුළ නිරූපිත මූර්ති හුදෙක් අලංකාරය පිණිස ම නොවේ. මහාචාර්ය සෙනරත් පරණවිතාන සූරීන්ට අනුව එයින් සසර ගමන පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් නිරූපණය කෙරේ.

සඳකඩ පහණට දෙපසින් පිහිටුවා ඇති සෘජුකෝණාශ්‍රාකාර ගල් පුවරු දෙක මුරගල් ලෙස හැඳින්වේ. අභයගිරි විහාර රත්න ප්‍රාසාදයේ දැකිය හැකි මුරගල සිංහල කලාකරුවාගේ ශිල්පීය නිපුණතාව ලොවට කියාපාන ප්‍රසිද්ධ නිර්මාණයකි. එමෙන් ම විහාර බිත්තියේ ද ඇතැම් විට දාගැබ් ගර්භයේ ඇතුළත අඳින ලද බිතුසිතුවම්වල ද බුදු සමයේ ආභාසය දැකිය හැකි ය. ඒවාට මූලාශ්‍රය වී ඇත්තේ

**ජාතක කථා**

**බුද්ධ චරිතය**

**ශාසන ඉතිහාසය** යනාදියයි.

අනුරාධපුර යුගයට අයත් බෞද්ධ චිත්‍ර හිඳගල, අම්බලන්තොට, කරඹගල, ගල්ඔය, ගොනාගොල්ල ආදි ස්ථානවලත් පොළොන්නරු යුගයට අයත් චිත්‍ර මහියංගණ චෛත්‍යය, තිවංක පිළිමගෙය, ලංකාතිලක විහාරය, උත්තරාරාමය, දිඹුලාගල යනාදි ස්ථානවල දීත් දැකගත හැකි ය. මහනුවර ශ්‍රී දළදා මාළිගය මහනුවර යුගයේ චිත්‍ර සම්ප්‍රදාය අධ්‍යයනය කිරීමට හොඳ තෝතැන්නකි. කැලණි විහාරයේ බිතුසිතුවම් නූතන බෞද්ධ චිත්‍ර සම්ප්‍රදායයේ පිළිබිඹුවකි.

ලෙන් විහාර, පබ්බත විහාර, පධානඝර, උපෝසථඝර, පටිමාඝර, චේතියඝර, වටදාගෙය ආදිය බෞද්ධ වාස්තු විද්‍යාත්මක නිර්මාණ වශයෙන් හැඳින්විය හැකි ය. සිතුල්පව්ව, වෙස්සගිරිය, මිහින්තලේ, දඹුල්ල, හිඳගල, කරඹගල, මුල්ගිරිගල ආදි ස්ථාන පරීක්ෂා කිරීමෙන් බෞද්ධ වාස්තු විද්‍යාවේ ඉපැරැණි දියුණුව පැහැදිලි කර ගත හැකි වේ.

වටදාගෙය චෛතියඝරයේ විකාශනයක් ලෙස සැලකේ. පොළොන්නරුව, තිරියාය සහ අත්තනගල්ල යන ස්ථානයන්හි පිහිටි වටදාගෙවල් උසස් කලාත්මක ලක්ෂණ ප්‍රකට කරන අතර මණ්ඩලගිරි වටදාගෙය ශ්‍රී ලංකාවේ පිහිටි සුවිශේෂ වූ බෞද්ධ කලා නිර්මාණයක් ලෙස සැලකේ.

## බෞද්ධ සාහිත්‍යය

මිහිඳු හිමියන් ලංකාවට වැඩමවීමෙන් පසු මෙහි ප්‍රචලිත වූ බ්‍රාහ්මී අක්ෂර මාලාව එවකට අශෝක සෙල්ලිපිවල භාවිත වූ බ්‍රාහ්මී අක්ෂර මාලාව ම බව පුරාවිද්‍යාඥයෝ විශ්වාස කරති. මිහින්තලයෙහි අටසැටලෙන්වල කටාරම් කොටා සටහන් කර ඇති කෙටි වැකි දනට හමු වී ඇති මුල් ම ලේඛන වශයෙන් සැලකේ. පසු කාලීන ව මිහින්තලා පුවරු ලිපිය වැනි විශාල ප්‍රමාණයේ අභිලේඛන ලියැවී ඇත.

## හෙළඅටුවා

මිහිඳු හිමියන් ප්‍රමුඛ පිරිස හෙළබසින් පෙළ දහම විස්තර කළ බවට හා මුලින් පැවති පාලි අට්ඨකථා ද හෙළබසට නැගූ බවට ද සාධක ඇත. ඒ අනුව ක්‍රි.පූ. 3 වැනි ශතවර්ෂයේ දී පමණ සිංහල සාහිත්‍ය පරිවර්තන ස්වරූපයෙන් ඇරඹී බව පෙනේ. එම හෙළඅටුවා අද විද්‍යමාන නොවීම මෙරටට සිදු වූ මහත් පාඩුවකි. ක්‍රි.පූ. 3 වැනි සියවසේ සිට ක්‍රි.ව. 7 වැනි සියවස දක්වා කාලය අතර රචනා වූයේ යැයි සැලකෙන ග්‍රන්ථාවලිය ඉතා විශාල ය. නමුත් අවාසනාව වනුයේ ඒවා අදට විද්‍යමාන නොවීම ය. ඊට පසු යුගයේ දී එනම් අනුරාධපුර අවසාන සමයේ දී රචනා වූ ග්‍රන්ථ තුනක් පමණක් අදට ශේෂව පවති. ඒවා මෙසේ ය.

1. **ධම්පියා අටුවා ගැටපදය**
2. **සිඛවලඳ හා සිඛවළඳ විනිස**
3. **සියබස්ලකර**

## සියබස්ලකර

අනුරාධපුර යුගයේ රචනා වූ ග්‍රන්ථ අතරින් ශේෂ ව පවතින පැරණි ම කෘතිය වන්නේ කාව්‍ය නිර්මාණයට උපදෙස් සපයන සියබස්ලකරයි. එය දණ්ඩීන්ගේ කාව්‍යාදර්ශය නමැති සංස්කෘත ග්‍රන්ථය ඇසුරෙන් නිර්මාණය කෙරුණු නමුත් දේශීය සාහිත්‍යයට මග පෙන්වන බොහෝ කරුණු ඇතුළත් බැවින් ස්වාධීන කෘතියක් ලෙස ද අගය කළ හැකි ය.

"පෙදෙන් බුදු සිරිතැ - බසින් වත් සිරිත් ඇ
පද යුතු බසින් නළු ඇ - අනතුරු ලකුණු දක්වම්"

මෙම උපදේශය අනුව, සිංහල සාහිත්‍යකරුවන්ගේ වස්තු විෂය විය යුත්තේ බෞද්ධ තේමාවක් ම යැයි පිළිගන්නා ලදි. එමෙන් ම මෙරට සාහිත්‍යකරණයෙහි නිරතවූවන් වැඩිපුර ම බෞද්ධ භික්ෂූන් වහන්සේලා වීමත් ගිහි පඬිවරුන් පවා බුදු දහමින් ශික්ෂණයක් ලැබීමත් පදනම් කරගෙන සිංහල සාහිත්‍යය බෞද්ධ සාහිත්‍යයක් වූ බව එහි ඉතිහාසය විමසා බැලීමෙන් සනාථ වේ.

## ධම්පියා අටුවා ගැටපදය

මෙය, **V** වැනි කස්සප රජතුමා විසින් පාලි ධම්මපදට්ඨ කථාවේ එන දුරවබෝධ පද සඳහා කරන ලද අර්ථ විවරණයකි.

## සිඛවළඳ හා සිඛවළඳ විනිස

මෙහි කතුවරයාගේ නම සඳහන් නොවේ. භාෂා ලක්ෂණ අනුව අනුරාධපුර යුගයට අයත් යැයි සැලකේ. භික්ෂූන් වහන්සේලාට අදාළ විනය නීති මෙහි විස්තර කෙරේ. මෙම කෘතිය අතීත පිරිවෙන් අධ්‍යාපනයෙහිලා භාවිත වන්නට ඇතැයි උපකල්පනය කෙරේ.

මීට අමතර ව එවකට රචනා වූයේ යැයි සැලකෙන එළු බෝධිවංශය, දළදා වංශය, එළු ථූපවංශය, එළු කේසධාතුවංශය, අසක්දාකව, කුසදාකව, මියුරු සඳෙස වැනි බොහෝ සාහිත්‍ය නිර්මාණවල සුරැකී ඇත්තේ නාමය පමණි.

එහෙත් එලෙස විනාශ නොවූ පොදුජන විඥානයේ කැඩපතක් බඳු ක්‍රි.ව. 5 - ක්‍රි.ව. 10 වැනි සියවස දක්වා අතර කාලයේ රචනා වූයේ යැයි සැලකෙන සීගිරි ගීවලින් සිංහල සාහිත්‍යයේ ආදිතම යුගය පිළිබඳ වැටහීමක් ලබාගත හැකි ය. ඒ අතර ද බුදු දහමින් පෝෂණය වූ කාව්‍ය සංකල්පනා දක්නට ලැබේ.

පොළොන්නරු යුගයේ සිට මහනුවර යුගය දක්වා ලියැවුණු බොහෝ සාහිත්‍ය කලා නිර්මාණයන්හි බෞද්ධ ආභාසය දක්නට ලැබේ. ඒ පිළිබඳ ව ඒ ඒ යුගවල පළ වී ඇති ප්‍රධානතම බෞද්ධ සාහිත්‍ය කෘති පිළිබඳ මෙහි ඇති තොරතුරු වගුව ඇසුරෙන් සාකච්ඡා කළ හැකි ය.

| යුගය | සාහිත්‍ය නිර්මාණය | කර්තෘවරයා | අරමුණ |
| --- | --- | --- | --- |
| අනුරාධපුර | සියබස්ලකර | අබාසලමෙවන් (I වැනි සේන) | කාව්‍යාලංකාර පිළිබඳ උපදෙස් සැපයීම |
| | සිඛවළඳ හා සිඛවළඳ විනිස | කතුවරයා අප්‍රකටය | භික්ෂු විනය නීති පැහැදිලි කිරීම |
| පොළොන්නරුව | මුවදෙව්දාවත | කතුවරයා අප්‍රකටය | මඛාදේව ජාතකය ඇසුරෙන් බුදු ගුණ කාව්‍යයක් කිරීම |
| | ධර්ම ප්‍රදීපිකාව හෙවත් මහා බෝධිවංශ පරිකථාව | ගුරුළුගෝමී පඬිතුමා | පාලි බෝධි වංශයෙහි එන පද 205කට අර්ථ විවරණ සැපයීම |
| | අමාවතුර | ගුරුළුගෝමී පඬිතුමා | බුදුරදුන්ගේ පුරිසදම්මසාරථී ගුණය විස්තර කිරීම |
| | සසදාවත | කතුවරයා අප්‍රකටය | සස ජාතකය ඇසුරෙන් බුදු ගුණ වර්ණනා කිරීම |
| දඹදෙණිය | සද්ධර්ම රත්නාවලිය | ධර්මසේන හිමි | ධම්මපදට්ඨ කථාවේ එන කථා පරිවර්තනය කරමින් පොදු ජනයාට උචිත පරිදි ඉදිරිපත් කිරීම |
| | පූජාවලිය | මයුරපාද පරිවේණාධිපති බුද්ධපුත්‍ර හිමි | තුන්ලෝකවාසීන්ගේ පූජා ලැබීමට බුදුරදුන් සුදුසු වන බව විස්තර කිරීම |
| | කව් සිළුමිණ | දෙවැනි පැරකුම්බා රජු | කුස ජාතක කථාව ඇසුරින් බෝධි සත්ත්ව චරිතය වර්ණනා කිරීම |
| කුරුණෑගල | ථූපවංශය | සකල විද්‍යා චක්‍රවර්තී පරාක්‍රම පණ්ඩිත | රුවන්මැලි මහාසෑයේ ඉතිහාස කථාව කියාපෑම |
| | සිංහල ජාතක පොත | සිවුවැනි පැරකුම්බා රජුගේ ආරාධනාවෙන් කර්තෘ මණ්ඩලයක් | බෝසතුන්ගේ අතීත භවයන් පිළිබඳ කතා ඉදිරිපත් කිරීම |
| | දළදා සිරිත | දෙව්රඳ දම් පසඟිනාවන් | දළදා වහන්සේගේ ඉතිහාස කතාව සහ ඊට සම්බන්ධ පූජා විධි විස්තර කිරීම |

| | | | |
|---|---|---|---|
| කුරුණෑගල | සිංහල බෝධි වංශය | විල්ගම්මුල මහ තෙර | ජයසිරිමහ බෝ සමිඳුන්ගේ ඉතිහාස කථා ගෙනහැර පෑම |
| | දළදා පූජාවලිය | කතුවරයා අප්‍රකටය | පාලි දාඨාවංශය සිංහලට පරිවර්තනය කරමින් බුද්ධ චරිතයත්, දළදා ඉතිහාසයත් ප්‍රකාශ කිරීම |
| ගම්පොළ | එළුඅත්තනගලු වංශය | කතුවරයා අප්‍රකටය | පාලි අත්තනගලු වංශය සිංහලයට නැගීම |
| | නිකාය සංග්‍රහය හෙවත් ශාසනාවතාරය | දේවරක්ෂිත ජයබාහු හෙවත් දෙවැනි ධර්මකීර්ති මාහිමි | ලක්දිව ඉතිහාසයත්, බුද්ධ ශාසනයේ ඉතිහාසයත් විස්තර කිරීම |
| | සද්ධර්මාලංකාරය | දේවරක්ෂිත ජයබාහු හෙවත් දෙවැනි ධර්මකීර්ති මාහිමි | රසවාහිනිය ඇතුළු පාලි මූලාශ්‍ර වල එන කතා සිංහලෙන් දක්වා ජනතාව තුළ ශ්‍රද්ධා බුද්ධි වර්ධනය කිරීම |
| කෝට්ටේ | සද්ධර්මරත්නාකරය | විමලකීර්ති ධම්මදින්න හිමි | මෙතෙක් ලියවී තිබුණ පාලි - සිංහල බණ පොත්වල එන කරුණු සංග්‍රහ කරමින් බණ කතා සංග්‍රහයක් කිරීම |
| | ලෝවැඩ සඟරාව | වීදාගම මහ තෙරුන් | සරල බසින් ධර්ම කරුණු විස්තර කිරීම |
| | බුදු ගුණ අලංකාරය | වීදාගම මහ තෙරුන් | බුදු ගුණ කවියෙන් විස්තර කිරීම |
| | කාව්‍යශේඛරය | ෂඩ්භාෂා පරමේශ්වර තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමි | සත්තුභත්ත ජාතකය ඇසුරින් බෝධිසත්ව චරිතය වර්ණනා කිරීම |
| | ගුත්තිල කාව්‍ය | වෑත්තෑවේ තෙරුන් | ගුත්තිල ජාතකය ඇසුරින් පොදු සිංහල ජනයාට කාව්‍යයක් නිර්මාණය කිරීම |

මීට පසු යුගවල දී ද බෞද්ධ තේමා රැගත් නිර්මාණ සිංහල සාහිත්‍යය තුළ බිහි වී තිබේ. පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි විදේශීය ආක්‍රමණ නිසා ශ්‍රී ලංකාව බොහෝ දුෂ්කරතාවලට මුහුණ පෑව ද සිංහල ගත් කතුවරු බෞද්ධ තේමා පදනම් කරගනිමින් නිර්මාණකරණයේ

යෙදීම අත් නොහැරියහ. අලගියවන්න මුකවෙටිතුමා විසින් දහම්සොඬකව, කුසදාකව වැනි ජාතක කාව්‍ය සහ සුභාෂිතය වැනි උපදේශ කාව්‍ය රචනා කිරීමෙන් ඒ බව තහවුරු වේ.

සෙංකඩගල රාජධානි සමයේ දී ද විල්ගම්මුල නම් මහ තෙර නමක විසින් සඳකිඳුරුදාකව, කයිවැල්ලේ පණ්ඩිත සහ පේරාදෙණියේ විජයකෝන් ද එතුමාගේ මුනුබුරා ද විසින් රචිත විධුර ජාතක කාව්‍යය, කතුවරයා සඳහන් නොවන තුන්සරණේ කවි පොත, ගොඩගම්දෙණියේ ගණිත ඇදුරුතුමා විසින් කරන ලද සම්බුලා ජාතක කාව්‍යය, කර්තෘ අඥාත ආලවක දමන කාව්‍යය, බහුකර්තෘක කෘතියක් වන මහබිනික්මන් කව ද, දේවදත්ත වරුණ ද, දළදා වරුණේ වැනි ග්‍රන්ථ ද බෞද්ධ සාහිත්‍ය කෘතීහු වෙති.

මහනුවර රාජධානි සමයේ දී වැලිවිට අසරණ සරණ සරණංකර මහාහිමිපාණන් විසින් සාරාර්ථ සංග්‍රහය, සාරාර්ථදීපනී නම් සතර බණවර සන්නය වැනි ග්‍රන්ථ ද කුලසේකර අප්පුහාමි විසින් කළ මනිචෝර ජාතක කාව්‍යය, මහාසේන නම් හිමි නමක විසින් සුමගුදාකව, වැලිවිට හිමියන්ගේ ශිෂ්‍ය ගිනිගත්පිටියේ හෙරණ නම නිර්මාණයක් වන තෙරුවන්මාලා නම් තෙරුවන් ගුණ කියවෙන කාව්‍යය ද වික්‍රමසිංහ පණ්ඩිත මුදලි විසින් රචිත දේවධර්ම ජාතක කාව්‍යය ද සාහිත්‍යයට එක් වී තිබේ.

මෙරට මහජනයා පිං පව් පිළිබඳව විශ්වාසයෙන් යුතුව ලජ්ජා භය දෙකින් අනූනව හැඩගැසුණේ මෙවැනි ධර්ම සාහිත්‍යයක් මඟින් හික්මවනු ලැබූ නිසාවෙනි. බෞද්ධ සාහිත්‍යය මිනිසාට වින්දනය පමණක් නොව දහම් රසය ද ලබා දෙයි. එබැවින් විශිෂ්ට ලක්ෂණ ප්‍රකට කරන මෙකී සම්භාව්‍ය සිංහල බෞද්ධ සාහිත්‍ය කෘති පරිශීලනය කිරීමත් ආරක්ෂා කර ගැනීමත් අප කාගේත් වගකීමක් වේ.

මෙම සියලු කරුණු සලකා බැලීමෙන් පැහැදිලි වන්නේ ශ්‍රී ලාංකේය කලාකෙත මෙන් ම සාහිත්‍යය ද බුදු සමයේ අභාසයෙන් පෝෂණය වූ බව ය. ඒ පිළිබඳව වැඩිදුරටත් අධ්‍යයනය කොට අපගේ ජාතික වටිනාකම් හැඳින ගැනීමත් ඒවා මතු පරපුරට සංරක්ෂණය කොට දායාද කිරීමත් අප සතු වගකීමකි.

## සාරාංශය

අනුබුදු මිහිඳු හිමියන් විසින් අපට දායාද කරන ලද බුදු සමය යුගයෙන් යුගය සිංහල සාහිත්‍යය නොයෙක් අයුරින් පෝෂණය කළේ ය. ගිහි පැවිදි පඬිවරුන් බෞද්ධ තේමා ඇසුරින් ගද්‍ය පද්‍ය කෘති රාශියක් බිහි කරමින් සිංහල සාහිත්‍යය බෞද්ධ සාහිත්‍යයක් බවට පත් කර තිබීමෙන් එය මනාව පැහැදිලි වේ.

අපේ කලා ශිල්පීහු ද ඉතිහාසය පුරා ඒ ඒ යුගවල සුවිසල් දෑකුම්කලු දාගැබ්, බෝධිඝර, චෛතියඝර, ප්‍රතිමාඝර මෙන් ම චිත්‍ර, මූර්ති, කැටයම් ආදි නිර්මාණ ද බිහි කළහ. මෙම සාහිත්‍ය නිර්මාණ හා කලා නිර්මාණ ඇසුරින් අප වින්දනයක් සහ ශික්ෂණයක් ලබන අතර ඒවා රැකගැනීමට ද අදිටන් කරගත යුතු ය.

## ක්‍රියාකාරකම

1. ජාතක කතා පදනම් කරගෙන මහනුවර යුගයේ ලියවුණු කෘති 2ක් හා ඒවායේ කතුවරුන් නම් කරන්න.

2. ඔබ කැමැති ඓතිහාසික බෞද්ධ කලා නිර්මාණයක් චිත්‍රයට නඟන්න.

## පැවරුම

- නිර්මාණාත්මක බෞද්ධ චිත්‍ර රැස්කොට පොත් පිංචක් නිර්මාණය කරන්න.

# 22

# ණය නොවී සතොසින ගෙවමු දිවිමග දැහැමින

අපා විදුහල ඉදිරිපිට මහ මග අසල හොඳින් අතු පතර විහිද ගිය විශාල සියඹලා ගසක් ඇත. බස් නැවතුමට ද සෙවණ දෙන එම ගස යට මෑතක් වන තුරු ම කුඩා වෙළෙඳ සලක් තිබිණ. දැන් එතැන දක්නට ලැබෙන්නේ කෙමෙන් දිරාපත් වන ගොඩනැගිල්ලක් පමණකි. එකල එම වෙළෙඳසලෙහි හිමිකරු අපි දැන සිටියේ නැත. බොහෝ විට අපේ පාසලේ ගුරුතුමන්ලා මෙන් ම අප ද එම වෙළෙඳසලින් පෑන්, පැන්සල්, අභ්‍යාස පොත් ආදිය මිල දී ගත් සැටි මට මතක ය. මුදලාලි මාමා පසු කලෙක දුප්පත්ව සිටියේ ය. වෙළෙඳසලේ ද මුල දී මෙන් බඩුමුට්ටු නොතිබිණි. පසුව ඔහු විසින් එය වසා දමන ලදි. පසුගිය සඳුදා උදෑසන පළමුවැනි කාලපරිච්ඡේදයේ අප පන්තියට වැඩම කළ, අපට බුදු දහම උගන්වන ස්වාමීන් වහන්සේ සමග, 'මුදලාලි මාමාට සිදු වූයේ කුමක් ද? ඔහුගේ වෙළෙඳාම අසාර්ථක වූයේ ඇයිදැ?'යි අපි සාකච්ඡා කළෙමු. එම කථාබහේ දී අපේ ගුරු හාමුදුරුවෝ මෙසේ පැවසූහ.

"දරුවනේ ලෝකෙ ඕනෑ ම කෙනෙක් සැපසේ ජීවත් වෙන්න කැමැතියි. කවුද දුක් විඳින්න කැමැති? කවුරුත් නැහැ නේද? මුදලාලි මාමාත් එහෙමයි. අපිත් එහෙමයි. ඒ මනුස්සයට මොකද වුණේ. කඩේ ආදායමට වඩා වියදම වැඩි කර ගත්තා. අය වැය සමානව තියාගත්තේ නැහැ. සුඛෝපභෝගී ජීවිතයක් පතාගෙන අත්‍යවශ්‍ය නොවන දේටත් දරන්නටත් බැරි විදියට වියදම් කළා. අන්තිමේ දී දිගට හරහට අඳුනන අයගෙන් ණයට ගන්න සිදු වුණා. ණය ගෙවාගන්න බැරි වුණා. ණය බර නිසා මහ සිත් වේදනා විඳින්නත් ණය දුන්නු අයගේ නින්දා අපහාසවලට මුහුණ දෙන්නත් සිදු වුණා. සමහරු ණය ඉල්ලා නඩු මගට ගියා. අන්තිමේ දී ගෙදර දොර ඉඩකඩම් විකුණමින් ණය ගෙවන්නත් කඩේ වසා දමන්නත් මුදලාලි මාමට සිද්ධ වෙලා. දරුවනේ ණය වීම මහ දුකක්. ණය නොවීම සැපයක්. ඒකට බුදු බණේ කියන්නේ අනණ සැපය කියලයි. අනුන්ට ණය නැති කෙනා සමාජය ඉදිරියට නොබියව යනවා. කවුරු කවුරුත් බොහොම සුහදව ආශ්‍රය කරනවා. කොයි ගෙදරටත් යනවා එනවා. කවුරුත් එයාට ආදරෙයි. එයා සැපෙන් ඉන්නවා, සතුටින් ඉන්නවා. එහෙම ණය නොවී ජීවත් වෙන්න නම් හොඳ කළමනාකරණයකින් මිල මුදල් වගේ ම අනෙක් දේත් පරිහරණය කරන්න ඕනෑ. අරපරිස්සමින්, හොඳ සැලැස්මක් ඇතුව, අයට ඔරොත්තු දෙන වැය රටාවක් ඇතුව ක්‍රමවත් ව අය ගැනත් වැය ගැනත් හොඳ අවධානයකින් හරියට

තරාදියෙන් බඩු කිරා බලනවා වගේ කටයුතු කරන්න ඕනෑ. ඒකට බුදු බණේ කියන්නේ සමජීවිකතාව කියලා. ඒ වගේ ම ණය නොවී ඉන්න නම්, ණය නොවීමේ සැපය විඳ ගන්න නම් කෑම් බීම් ඇතුළු එදිනෙදා වියදම් සීමාව දැන ගෙන කරන්න ඕනෑ. මිල මුදල් තිබුණට සරල, චාම් ජීවිතයක් ගත කරන්න පුරුදු ඕනෑ. මේ හැම දේකට ම අදාළ ක්‍රියාත්මක කළ හැකි ප්‍රායෝගික උපදෙස් බුදු දහමේ තියෙනවා.

මහිච්ඡතාව කියන්නේ මහත් බලාපොරොත්තු ඇතිකම, අසීමිත ආශාවල් ඇතිකම. එසේ වූ විට හරි හම්බකරන සම්පත් සීමාවක් නැතිව වැය කරන්න මිනිස්සු පෙලඹෙනවා. මොකද්ද වෙන්නෙ? අයට වඩා වැය වැඩිවෙනවා. එවිට ණය වෙනවා. බුදු දහමේ උගන්වන්නේ අල්පේච්ඡතාව. අවම බලාපොරොත්තු අසාවල් ඇතිකම. ලද පමණින් සතුටු වීමට හැකි, පහසුවෙන් පෝෂණය කළ හැකි සැහැල්ලු චාම් ජීවිත ගත කරන්න යැයි බුදුරජාණන් වහන්සේ අපට අනුශාසනා කරන්නේ. එහෙම වුණාම සම්පත් මිල මුදල් වුණත් අනවශ්‍ය විදියට වැය වෙන්නේ නැහැ. ණය වෙන්න සිදුවන්නෙත් නැහැ. මම කාටවත් ණය වෙලා නැහැ කියලා සතුටු වෙන්න, සැපෙන් ඉන්න අවස්ථාව උදා වෙනවා. ණය වෙලා ණය හිමියන්ගෙන් චෝදනා අසමින් ඔවුන්ගේ වහලෙක් වගේ ජීවත් වෙන එක, ණය හිමියන්ට බයේ හැංගිලා ඉන්න එක මහ දුකක්. ණය නොවී දැහැමිව උපයාගෙන කා බී ජීවත් වෙන එක සැපයක්."

ස්වාමීන් වහන්සේගේ මේ කෙටි දේශනයෙන් පස්සේ උන් වහන්සේ අවසර දුන්නා අපට ප්‍රශ්න තියෙනවා නම් අහන්න කියලා. ඒ වෙලාවේ විචක්ෂණ ප්‍රශ්නයක් ඇහුවා. "හාමුදුරුවනේ, ණය නොවී සිටීම වගේ ම දුසිරිත් නොකර සිටීමත් සැපයක් නේද?"

"ඔව්, ඒ සැපයට කියන්නෙ අනවජ්ජ සැපය කියලා. බුද්ධ දේශනාවේ ඒ සැපය විස්තර කරලා තියෙන්නේ මෙහෙමයි. '**මෙලොව ආර්ය ශ්‍රාවක තෙමේ නිවැරැදි කාය කර්මයෙන් යුක්ත වෙයි. නිවැරැදි වාක් කර්මයෙන් යුක්ත වෙයි. නිවැරැදි මනෝ කර්මයෙන් යුක්ත වෙයි. හෙතෙම "මම එසේ කායික වාචසික හා මානසික වූ නිවැරැදි චර්යාවෙන් යුක්ත වෙමි" යැයි සුව විඳින්නේ ය. සොම්නසට පත් වන්නේ ය.**" නිවැරැදි කාය කර්මය කියන්නේ ප්‍රාණඝාතය, හිංසනය ඒ සඳහා අවි ආයුධ දඬු මුගුරු දුරීමාදියෙන් තොර ව සියලු සත්ත්ව ප්‍රජාව කෙරෙහි කරුණා, මෛත්‍රී පෙරදැරිව ක්‍රියා කිරීම. නිවැරැදි වාක් කර්මය කියන්නෙ බොරුවෙන් වංචාවෙන් අනුන් රැවටීමෙන් තොරව සත්‍යවාදී වීම, කේලාම් කියා අනුන් භේද කිරීමෙන් තොරව අන් අයගේ සමගිය කැමැති ව සමගි බව ඇතිවන වචන කීම, හිස් වචන කතා කිරීමෙන් තොරව අර්ථවත් වචන කතා කිරීම හා රළු පරුෂ වචන කතා කිරීමෙන් තොරව කනට මිහිරි හෘදයංගම හිතවත් බව වඩන වචන කතා කිරීම. නිවැරැදි මනෝ කර්මය කියන්නේ විසම වූ දැඩි ලෝභයෙන් තොරව පරිත්‍යාගශීලි වීම, ව්‍යාපාදයෙන් ක්‍රෝධයෙන් තොරව කරුණා, මෛත්‍රී සහගත වීම, මිථ්‍යා දෘෂ්ටියෙන් වැරැදි දැකීමෙන් තොරව ඇත්ත ඇති සැටියෙන් දැක්ම. මේ හැටියට කායික, වාචසික, මානසික

වැරැදි ක්‍රියාවන්ගෙන් ඒ කියන්නේ අකුසල කර්මවලින් වැළකිලා ඒ තිදොරින් කුසල කර්මවල, හරි ක්‍රියාවල යෙදීමයි අනවජ්ජ සැපය. මේ පැවැත්මටමයි සම්මා කම්මන්ත කියන්නේ."

"ස්වාමීන් වහන්ස, ධාර්මික දිවි පැවැත්මත් මේ එක්ක බැඳිලා තියනවා නේද?" එහෙම ඇහුවේ සුදර්ශනී.

"ඔව්, දැහැමි දිවි පැවැත්මට කියන්නෙ සම්මා ආජීව කියල. නීති විරෝධී ධර්ම විරෝධී විදිහට පාපකාරී කටයුතු කර්මාන්ත, වෙළෙඳාම් ආදියෙන් ධනය උපයා දිවි පැවැත්වීමට කියන්නේ මිච්ඡා ආජීව කියලා. ඒ අධාර්මික ජීවිකාවන්ගෙන් මිදිලා ධර්මානුකූලව, නීත්‍යානුකූලව, සාධාරණව ධනය උපයා දිවි පැවැත්වීම සම්මා ආජීව ය. ඔය ඉස්සරහ කඩේ කරපු මුදලාලි මාමටත් චෝදනාවක් තියෙනවා අධාර්මික වෙළෙඳාම් කරපු බවට. එයා දෙතුන් වතාවක් ම නීතියේ රැහැනට අහු වුණා. මත් පැන්, මත් ද්‍රව්‍ය වෙළෙඳාම් කරලා. ඒ වගේ ම වැඩි මිලට බඩු විකුණලත් අහු වුණා. එක සැරයක් එයා මැදිවුණේ බාල බඩු හොඳ බඩු කියලා විකුණලා. ඒ විදිහෙ වෙළෙඳාම් නොකළ යුතුයි කියලා බුදු බණේ උගන්වලා තියෙනවා. මොන විදිහකින් හරි පව්, අකුසල් සිද්ධ වෙන, තමාටත් අනුන්ටත් අවැඩදායක නීති විරෝධී රැකියාවකින් ජීවත් වීම වරදක්. ඒ විදිහෙ මිථ්‍යා ජීවිකාවක් අත් හැර ධාර්මිකව සම්මා ආජීවයෙන් දිවි පවත්වන්නයි බුදු දහම උගන්වන්නෙ. විශේෂයෙන් ම තුලා කූට (හොර කිරුම් උපකරණ භාවිතය) මාන කූට (හොර මිනුම් ක්‍රම භාවිතය) කංස කූට (ව්‍යාජ භාණ්ඩ අලෙවිය) සතුන් වෙළෙඳාම, මස් වෙළෙඳාම, අවි ආයුධ වෙළෙඳාම, වස විස වෙළෙඳාම, මද්‍යසාර වෙළෙඳාම බුදු දහමට පටහැනියි. ඒවා ආධාර්මිකයි. තමන්ටත් අනුන්ටත් හානිදායකයි.

මල නොතලා රොන් ගන්න බඹරකු වගේ සමාජයට හානි නොකර, පීඩාවක් නොකර උපයා දිවි පැවැත්වීමට බුදුරජාණන් වහන්සේ උපදෙස් දෙනවා. අධර්මයෙන් ජීවත්වීමය, ධර්මයෙන් මිය යාමය යන මේ දෙකෙන් දෙවෙනි ක්‍රියා මාර්ගය පළමු වැනි එකට වැඩිය උතුම් බවයි දහමෙහි සඳහන් වන්නේ. ධර්ම ගරුකව කටයුතු කරන්නාට ධර්මයෙන් ම රැකවරණ ලැබෙනවා. ධනයත් එයින් ලබන දියුණුවත් ධාර්මිකව ම ප්‍රාර්ථනා කළ යුතු බවත් ඒ කිසිවක් අධාර්මික ව නොපතන තැනැත්තා සිල්වතෙක් හා නුවණැත්තෙක් හැටියටත් බුදුරජාණන් වහන්සේ හඳුන්වනවා. උත්සාහයෙන්, වීර්යයෙන්, දැතේ ශක්තියෙන්, මනා පුහුණුවකින් ධනය ඉපයිය යුතු බව උගන්වන බුදු දහම ධාර්මික ක්‍රමෝපායයන්ගෙන් උපයා සපයා ගත් භෝග සම්පත් ඇත්තකු වීමටයි ගිහියාට මග පෙන්වන්නෙ."

"ස්වාමීන් වහන්ස, ගොවිතැන ඒ විදිහෙ ධාර්මික ධනෝපායන මාර්ගයක් නේද?" එහෙම ප්‍රශ්න කළේ බුද්ධිකයි.

"ඔව්. ගොවිතැන ඉතා ම හොඳ ධාර්මික ධනෝපායන මාර්ගයක්. බුද්ධ චරිතයත්, බුද්ධ ධර්මයත්, බෞද්ධ සංස්කෘතියත් ගොවිතැන එක්ක බැඳිලයි තියෙන්නෙ."

මෙම සාකච්ඡාව අවසන් වූයේ ස්වාමීන් වහන්සේ විසින් ලබා දුන් පැවරුමකින්. ඒ අනුව ධාර්මික ධනෝපායන මාර්ග ලැයිස්තුවක් පිළියෙල කිරීමට සිසුන්ට පවරන ලදි. අප සියලු දෙනා සකස් කළ එම ලැයිස්තු අතුරින් වැඩි ම ලකුණු ප්‍රමාණයක් හිමි වූයේ ප්‍රසාදිනි විසින් ඉදිරිපත් කළ පත්‍රිකාවට ය. එහි ධනෝපායන මාර්ග දොළහක් දක්වා තිබුණි.

1. ගොවිතැන
2. ධාර්මික වෙළෙඳාම
3. ගුරු සේවය
4. නීතිඥ වෘත්තිය
5. වෛද්‍ය වෘත්තිය
6. විදුලි කාර්මික කටයුතු
7. වඩු කර්මාන්තය
8. පෙදරේරු කර්මාන්තය
9. ඉංජිනේරු වෘත්තිය
10. රියදුරු වෘත්තිය
11. ලිපිකරු සේවය
12. රාජ්‍ය සේවය

පාසල් දරුවන් වන අප ද, කවර ලෙසකින්වත් අනුන්ට ණය නොවන්නකු වීමටත්, සම්මා ආජීවයෙන් ජීවිතය පවත්වාගෙන යාමටත්, ධාර්මික ධනෝපායන මාර්ගයක් තෝරා ගැනීමටත් අදිටන් කරගත යුතු බව පැහැදිලි කළ ස්වාමීන් වහන්සේ සාකච්ඡාව එතෙකින් නිම කළහ. දහම නොදැනීමෙන් හා එයට පිටුපෑමෙන් මුදලාලි මාමා විශාල කරදර රැසකට මුහුණ දී තිබෙන බව අපි උන් වහන්සේ සමග කළ සාකච්ඡාවෙන් අවබෝධ කරගත්තෙමු.

## සාරාංශය

අය වැය සමව පවත්වා නොගැනීම, විවිධ දුසිරිත්වලට යොමුවීම, මහිච්ඡතාව ආදි විවිධ හේතු නිසා ඇතිවන ආර්ථික ගැටලු බොහෝ අය විසඳගන්නේ අනුන්ට ණය වීමෙනි. ණය වීම දුකකි. ණය හිමියාට අවනතව ජීවත් වීමට එයින් සිදු වේ. ආත්ම අභිමානය, ආත්ම ගෞරවය නැති වී යයි. මා අන්කිසිවකුටත් ණය නැත යන සතුට සැපය ගිහියකු විසින් භුක්ති විඳිය යුතු යැයි බුදු දහම උගන්වයි. එසේම අනවජ්ජ සැපය නම් වූ තිදොරින් සිදුවන අකුසල කර්මයන්ගෙන් වෙන් වී සම්මා කම්මන්තය ප්‍රගුණ කිරීම ද සැපයෙකි. ධාර්මික ධනෝපායනය බුදු දහම තුළ නොයෙක් අයුරින් අගය කොට තිබේ. දැහැමි ධනෝපායන මාර්ගයක් අනුගමනය කිරීමට අප ද අදිටන් කරගත යුතු ය.

## ක්‍රියාකාරකම

1. ණයකාරයකු වීමෙන් කෙනකුට මුහුණ දීමට සිදුවන ගැටලු පහක් නම් කරන්න.
2. සම්මා කම්මන්ත යන්න ධර්මානුකූලව පැහැදිලි කරන්න.
3. වර්තමාන සමාජයේ දක්නට ලැබෙන අධාර්මික ධනෝපායන මාර්ග නිසා සිදුවන විපත් පිළිබඳ පුවත් පතකට යැවෙන තීරු ලිපියක් ලියන්න.

## පැවරුම

- නිවසේ අවශ්‍යතා අනුන්ට ණය නොවී පිරිමසා ගත හැකි අයුරු දැක්වෙන වැඩ පිළිවෙළක් සකස් කරන්න.

## පුහුණුවට

අදමින් ජීවත් වෙනවා විතර ට
දැහැමින් මියයනු සොඳමයි දන හට
මෙලෙසින් වදහළ මුනි බණ සිහි කොට
සැබවින් පින් කොට පැමිණෙව් නිවනට

# 23

# රාජා භවතු ධම්මිකෝ

පාසලේ ප්‍රධාන ශාලාවේ වේදිකාවට ඉහළින් උස බිත්තියේ සවිකර තිබූ ලොකු මුහුණතක් ඇති බිත්ති ඔරලෝසුව දහවල් 1.30 සලකුණු කළේ ය. ඒ සමග ම නාද වූයේ පාසල් කාලය නිමවීමේ සීනුවයි. ඒ අවස්ථාවේ දී පන්ති භාර ගුරුතුමිය පාසල නිමා කරන මොහොතේ කියන කවිය ළමුන් සමග ම ගායනා කළා ය.

**කල් වැසි වසීවා - කෙත්වතු සාර වේවා**
**සත් සිත් නිවේවා - රජය දැහැමිව සෙත සැදේවා**

මිහිරි හඬින් ගායනා කළ මෙම කවිය මෙන් ම එයින් කෙරෙන ප්‍රාර්ථනය ද මිහිරි ය. "දේවෝ වස්සතු කාලේන" බෞද්ධ අපගේ ප්‍රසිද්ධ ප්‍රාර්ථනා ගාථාවේ අන්තර්ගතය නොබිඳෙන අයුරින් නිර්මාණය කර ඇති මෙම කවිය බෙහෙවින් ම අර්ථවත් ය. රටක පාලකයා දැහැමි වීමේ ප්‍රාර්ථනාව මෙහි ඇතුළත් වේ. දැහැමි පාලනය යනු කුමක් ද යන ප්‍රශ්නයට ලබාදිය හැකි සරල පිළිතුර ජනතාවට සෙත සදන සර්ව සාධාරණ පාලනය යන්නයි. ජනතා හිතවාදී පාලනයකට උපදේශ රැසක් බුදු දහමෙහි ඇතුළත් ව ඇත. දසරාජ ධර්මය එයින් එකකි. ජාතක පාලියේ ඇතුළත් මහා හංස ජාතකයෙහි දසරාජ ධර්මය දක්වෙන්නේ මේ අයුරිනි.

**දානං සීලං පරිච්චාගං - අජ්ජවං මද්දවං තපං**
**අක්කෝධං අවිහිංසඤ්ච - ඛන්තිඤ්ච අවිරෝධනං**

| | | | | |
|---|---|---|---|---|
| 1. දානය | 2. සීලය | 3. පරිත්‍යාගය | 4. ඍජු බව | 5. මෘදු බව |
| 6. තපස | 7. අක්‍රෝධය | 8. අවිහිංසාව | 9. ඉවසීම | 10. විරුද්ධ නොවීම |

ජාතක පාලිය පදනම් කරගෙන කුරුණෑගල සාහිත්‍ය යුගයේ දී බිහි වූ සිංහල ජාතක පොතේ මෙම කාරණා දහය සඳහන් ව ඇත්තේ මේ අයුරිනි.

"ඒ අසා රජ්ජුරුවෝ හංස රජ්ජුරුවන් වහන්ස, නුඹ වහන්සේ විසින් විචාරන ලද්දා වූ සියල්ලෙහි ම විරෝධයක් නැතිව පවතිමින් සිටියෙමි. තවද ශ්‍රමණ බ්‍රාහ්මණාදි උත්තමයන් විෂයෙහි දානය ද නිරන්තර වශයෙන් පඤ්චශිලාදි වූ සිල් රැකීම ය, දුගීමගී යාචක පුත්‍ර මිත්‍ර කලත්‍ර බන්ධු වර්ගාදි සියලු සත්ත්වයින්ට උපභෝග පරිභෝගාදි වස්තු දීම ය, සලසිත් නැතිව ඍජු වූ පැවැතුම් ඇති බව ය. පෝයක් පාසා පෙහෙවස් රැකීම ය. කිපෙන සුළු නොවීම ය. අනුන්ට හිංසා පීඩා නොකිරීම ය. සහනසීලී බව, සර්ව සාධාරණ යයි කියන ලද දසරාජ ධර්මයන්ට විරෝධයක් නොකොට මා කෙරෙහි ම පිහිටියා දකිමි. මේ කාරණය හේතුකොට ගෙන හැම වේලෙහි සතුටුව වාසය කෙරෙමි ---" අපේ පෙර රජ දරුවන් මෙම දසරාජ ධර්මය ක්‍රියාවට නගමින් ඉතා සාර්ථක දැහැමි පාලනයක් සිදු කළ බවට නිදසුන් ඉතිහාසයෙහි බොහෝ ය.

## 1. දානය

දසරාජ ධර්මවල පළමුවැන්න දානයයි. මෙය බෞද්ධ ආචාර ධර්මයන්ට ඇතුළත් ඉගැන්වීම් ගණනාවක පළමුවෙන් ම ඉදිරිපත් වන්නකි. දානය යන්නෙහි ආගමික අර්ථය වන්නේ පූජාවක් වශයෙන් හෝ අනුග්‍රහයක් වශයෙන් තමා සන්තක ව පවත්නා වූ උපභෝග පරිභෝග වස්තූන් අන්‍යයන්ට ලබා දීම ය. පාලකයකුට එය ඉතා පහසු ය. නමුත් මෙයින් අදහස් කෙරෙන්නේ අවිධිමත් ලෙස නිර්ධනයින්ට සම්පත් බෙදාදීම නොවේ. කිසියම් පාලකයකු එසේ කළහොත් ඉතාමත් කෙටි කලක දී රාජභාණ්ඩාගාරය හිස්වනු ඇත. එය රට තුළ නැති ගැටලු බොහොමයක් නිර්මාණය වීමට හේතු වෙයි. රටවැසියන්ගේ දැඩි අප්‍රසාදයටත් රටේ පරිහානියටත් එය හේතු වේ. එබැවින් සැලසුම් සහගත ව රටවැසියන්ගේ ආර්ථික සමෘද්ධිය උදාකරලීමේ අරමුණින් සම්පත් බෙදාදීම දානයයි. ඒ අනුව කෘෂි කර්මාන්තයෙහි යෙදෙන්නන් හැඳින ඔවුනට අවශ්‍ය භූමිය, කෘෂි බීජ, කෘෂි උපකරණ ලබාදීම, වෙළෙඳාමෙහි නිරතවන්නන්ට අවශ්‍ය මූලික ධනය ලබාදීම, රාජ්‍ය සේවයේ නිරත වන්නන්ට අවශ්‍ය ආහාරපාන හා වැටුප් ලබාදීම ආදි වශයෙන් මූලික අවශ්‍යතාවන් සපුරාලන සුභ සාධනය මෙහි දානය නම් වේ. එසේම ජනතාවට සුවසේ ජීවත් වීමට අවශ්‍ය ආහාරපාන, ඇඳුම් පැලඳුම්, නිවාස, බෙහෙත් ආදී මූලික අවශ්‍යතා සලසාදීම ද දානයට අයත් වේ. ඒ අනුව දානය යන්නෙහි සරල අර්ථයට එහා ගිය පුළුල් ක්‍රියාකාරකමක් රාජ්‍ය පාලනයෙහි සමාජ අන්තර්ක්‍රියාවන්හි පවත්නා බව පැහැදිලි ය.

පාලකයකු හෝ නායකයකු නොවුණ ද අපට ද මෙබඳු ක්‍රියාකාරකම්වලට සමාන යමක් කළ හැකි ය. පන්තියේ පොතක්, පෑනක්, පැන්සලක් නැති අයකුට එවැන්නක් ලබාදිය හැකිනම්, වෙනත් කුමන හෝ අධ්‍යාපනික සත්කාරයක් කළ හැකිනම් එය ද දානයට ඇතුළත් වේ. එබැවින් කුඩා කල සිට ම අපි ද දානය යන සංකල්පය ප්‍රායෝගික යථාර්ථයක් බවට පත්කරලීමට අධිෂ්ඨාන කර ගනිමු.

## 2. සීලය

බුදු දහමට අනුව කය වචන දෙකෙහි සංවර භාවය සීලයයි. එනම් මනා හික්මීමක් ඇතුව කටයුතු කිරීමයි. ඒ සඳහා ගිහියන් උදෙසා නිර්දේශිත පඤ්ච සීලය ආරක්ෂා කිරීම අවශ්‍ය ය. එය පාලක පිරිසගේ ද සීලය විය යුතු ය. සාමාන්‍ය ජනතාවට වඩා කය වචනය දෙක්හි සංවර භාවය පාලක පිරිස තුළ පැවැතිය යුතු ය. එබැවින් නායකයා ප්‍රාණඝාතයෙන් ඈත්ව මිනිසුන් ඇතුළු සියලු සත්ත්ව සමූහයාට තම රාජධානිය තුළ නිදහසේ ජීවත්වීමට අවශ්‍ය වටපිටාව සකස් කර දිය යුතු ය. හිංසාකාරී ක්‍රියාවලට ඉඩ නොතැබිය යුතු ය. ජනතාවගෙන් යැපෙන පාලකයාට කුමන අවස්ථාවකවත් ජනතා සන්තක දේ අනිසි ලෙස පරිහරණය කිරීමට අයිතියක් නැත. රාජ්‍ය බලය යොදාගෙන ජනතා සන්තක දේ තමාගේ සුඛ විහරණය සඳහා පමණක් යොදාගන්නේනම් එය සොරකමකි; වංචාවකි. එබැවින් ජනතාව සන්තක දෙය විහාර සන්තක දෙයක් මෙන් සලකා ආරක්ෂා කිරීමට පාලකයා ක්‍රියාකළ යුතු ය. මේ ආකාරයට පාලකයා වැරැදි කාමසේවනයෙන් ඈත්ව, බොරුවෙන් වංචාවෙන් තොරව, මත්ද්‍රව්‍ය භාවිතයෙන් වෙන්ව කටයුතු කිරීම ඔහුට අදාළ සීලය වේ. එසේ ම රටක, අනාදිමත් කාලයක පටන් පවත්වාගෙන එනු ලබන චාරිත්‍ර වාරිත්‍ර ඇත. එම සද් චාරිත්‍ර වාරිත්‍ර ද සීලයට අයත් වේ. තම පාලන කාලය තුළ ඒවා කඩනොකොට ආරක්ෂා කිරීම ද පාලකයාගේ වගකීමකි. එය ද දස රාජධර්මයන්හි සීලය හා බැඳී පවතින්නකි. මේ ආකාරයට සමාජයේ පැවැත්මට අදාළ සාධු චර්යාවන් සමාජය, මෙන් ම ප්‍රජා හිතකාමී දේශපාලන ප්‍රතිපත්ති ද ආරක්ෂා කරමින් පාලකයකු ක්‍රියාකරන විට රට ද සංවර්ධනය කළ හැකි ය. මිනිස්සු සතුටින් වසති. කලට වැසි ලැබේ. රට සරු සාර වෙයි.

## 3. පරිත්‍යාගය

අපි සාමාන්‍ය ව්‍යවහාරයේ දී දානය හා පරිත්‍යාගය යන වචන දෙක එක ම අර්ථයෙහි ලා භාවිත කරමු. එකක් අනෙකට වඩා විශේෂ කොට කතාබහ කිරීමට යොමු නොවෙමු. එහෙත් දේශපාලන වශයෙන් එම සාරධර්ම දෙක්හි වෙනසක් ඇති බව දසරාජ ධර්මයන්හි එය වෙන වෙන ම දක්වා තිබීමෙන් පැහැදිලි වේ. පරිත්‍යාගය යනු පාලකයා සිය ධනය, කාලය, මෙන් ම කායික මානසික ශ්‍රමය, සුවපහසුව රටේත් ජනතාවගේත් යහපත සඳහා කැප කිරීමයි. කිසියම් නායකයකු මේ සියලු දේ කැපකරනුයේ තම පෞද්ගලික අභිවෘද්ධිය උදෙසානම් එය යුක්ති සහගත නොවේ. රටක නායකයකුට තමාගේ සුඛ විහරණය සඳහා අමුතුවෙන් හරිහම්බ කිරීමක් අවශ්‍ය නොවේ. එයට හේතුව රාජ්‍ය නායකයාට ස්වභාවයෙන් ම තමාට පමණක් නොව තම පවුලේ සියලු දෙනාගේ සුවපහසුවට අදාළ සියල්ල හිමිවන බැවිනි. එබැවින් පාලකයා තම පාලන කාලය තුළ සම්පූර්ණයෙන් ම ස්වකීය ජීවිතය කැපකළ යුත්තේ රටවැසියන්ගේ අභිවෘද්ධිය වෙනුවෙනි. පැරණි රජදරුවෝ මෙම සම්මතයෙහි පිහිටා කටයුතු කළහ. තමන් වෙනුවෙන් තම දරුවන් වෙනුවෙන් අයථා ලෙස ධනය ඉපැයීමට ඔවුහු යොමු නොවූහ. තම සම්පූර්ණ

කාලය ම ජනතා අභිවෘද්ධිය වෙනුවෙන් කැපකළහ. ධාතුසේන රජතුමාගේ පුත් කාශ්‍යප පිය රජතුමාගෙන් වස්තුව ඉල්ලූවිට එතුමන් කලා වැව අබියසට ඔහු කැඳවාගෙන විත් පෙන්නුවේ තමා සන්තක වස්තුව එය බවයි. පෙර රජදවස අහස් කුස සිපගන්නා තරමට දාගැබ් ගොඩ නැගුණේත් මහ මුහුදු සිරකරන තරමට වැව් අමුණු ඉදිවුණේත් බත බුලතින් රට සශ්‍රීක වූයේත් රජවරුන් තම කාලය, ශ්‍රමය, ධනය ජනතාව වෙනුවෙන් කැපකළ නිසා ය. එය පාලකයාගේ පරිත්‍යාගශීලී, ධාර්මික ප්‍රතිපත්තිය වේ.

වෙනත් අරමුණු ඇතිව පරිත්‍යාග කිරීමට ද පාලකයනට අවස්ථාව උදාවේ. නිදසුනක් වශයෙන් අසල්වැසි රාජ්‍යයන් සමග හොඳ හිත පවත්වාගෙන යාමට යම් යම් පරිත්‍යාග කිරීමට සිදුවේ. එසේ ම උසස් මෙහෙවරක් කරන පුද්ගලයන්ට හා ආයතනවලට ද රජය අවශ්‍ය පරිත්‍යාග කළ යුතු ය. එබඳු පරිත්‍යාගය වුව ද සිදු කිරීම රාජ්‍යයේ යහපතට හේතු වේ. මේ ගුණය සාමාන්‍ය ජනතාව කෙරෙහි ද පැවැතිය යුතු ය. ආධාරයක් උපකාරයක් අවශ්‍ය අයට නොපිරිහෙලා එය ඉටුකර දීමට අප ද පසුබට නොවිය යුතු ය. එහි දී තමාගේ කාලය, ශ්‍රමය, ධනය මෙන් ම තමාගේ සුවපහසුව ද අනුන් වෙනුවෙන් කැපකිරීමේ ගුණය තුළින් පුද්ගලයා තුළ පවත්නා වූ අසීමිත තණ්හාව පාලනය කර ගැනීමට ද හැකිවනු ඇත. මේ තත්ත්වය සමාජය තුළ ද ධාර්මිකත්වය නිර්මාණය වීමට හේතු වන්නේ ය.

## 4. ඍජු බව

පාලකයා රටේත් ජනතාවගේත් යහපත උදෙසා අනුගමනය කරන ප්‍රතිපත්ති, තීන්දු, තීරණ හා ක්‍රියාමාර්ග අවංක විය යුතු ය. මොන ම විදියේ බලපෑමකටවත් යටත් නොවී කෙළින් තීරණ ගෙන කටයුතු කිරීමේ හැකියාව ඔහුට තිබිය යුතු ය. එය ඍජු ගුණය වේ. එය පාලකයකුට අත්‍යවශ්‍ය වේ. ඡන්ද, ද්වේශ, භය, මෝහ යන අගතිගාමී දුර්ගුණ පාලකයකු වෙත පවතීනම් ඔහුට ඍජු ප්‍රතිපත්තියක පිහිටා කටයුතු කිරීමට නොහැකි වනු ඇත. රජයක් තුළ හෝ වේවා සමාජයක් තුළ හෝ වේවා නිර්මාණය වන ගැටලු විවිධාකාර වේ. එම ගැටලුවලට විසඳුම් සෙවීමට යාමේ දී පාලකයාට තම ඥාති වර්ගයාගෙන්, දේශපාලන හිතවතුන්ගෙන්, අසල්වැසි රාජ්‍යයන්ගෙන් විවිධ බලපෑම් එල්ලවිය හැකි ය. එපමණක් නොව තීරණ වෙනස් කරලීමේ අරමුණින් ඇතැම් පිරිස් පාලකයාට තෑගි බෝග වරප්‍රසාද ආදිය ලබා දීමට පවා යොමු වෙති. කිසියම් පාලකයකු ඒවාට ගිජු ව පාලන ප්‍රතිපත්ති නීති රීති අණපනත් වෙනස් කරන්නේනම් එය ඍජු ගුණයට පටහැනි වේ. එසේ ඍජු තීරණ ගැනීමටත් ඍජුව අවංකව කටයුතු කිරීමටත් අපොහොසත් පාලකයිනට තම නිලධාරීන්, සේවකයන් ආදීන්ගේ මෙන් ම මහජනයාගේ ද සහාය ලබා ගැනීමට නොහැකි වනු ඇත.

එබැවින් පාලකයා අයුක්තිය, අසාධාරණය පිටු දක යුක්තිය හා සාධාරණය ක්‍රියාත්මක කිරීමට තරම් වූ උජුපටිපන්න ගුණයෙන් යුක්ත අයකු විය යුතු ය. කියන දේ

කරන, කරන දේ කියන නායකයකු විය යුතු ය. එය ඍජු ගුණයෙහි ප්‍රමුඛ ලක්ෂණයකි. මතු දිනක ඔබ ද කිසියම් සමාජයක, ආයතනයක, රටක නායකයකු විය හැකි ය. ජනතා ආශීර්වාදය මධ්‍යයේ එම නායකත්ව භූමිකාව නිවැරැදි ව ක්‍රියාවට නැගීමට හැකි වනුයේ අද දවසේ පටන් ඍජු ගුණය පුරුදු පුහුණු කරගෙන යාමෙන් පමණි.

## 5 මෘදු බව

පාලකයා ඍජු ගුණයෙන් යුක්ත අයකු මෙන් ම මෘදු ගුණයෙන් ද යුක්ත අයකු ද විය යුතු ය. මෘදු ගුණය යනු හදවතේ ඇති මොළොක් ගතියයි; තෙත් බවයි; කාරුණික ගුණයයි. ජනතා හිතවාදී පාලකයකුට මෙය ද අවශ්‍ය ම ගුණාංගයකි. ජනතා ගැටලුවල දී ද සමාජ අර්බුදයන්හි දී ද එවාට හොඳින් අවධානය යොමු කිරීමට තරම් පාලකයා කාරුණික විය යුතු ය. සංවේදී විය යුතු ය. පාලනයට නීති රීති අවශ්‍ය ය. ඒ තුළින් ජනතාව වැරැදිවලට පෙලඹීමට තිබෙන ඉඩ අඩු වනු ඇත. එය රටක සංවර්ධනයට ද හේතු වනු ඇත. නමුත් ජනතාව පීඩනයට පත්වන අයුරින් හා රටට විපත්තිදායක ලෙස ගන්නා වූ රළු තීරණවලට කිසිවකු කැමැති නැත. එබැවින් දඬුවම ද මානුෂික විය යුතු ය. එල්ල වන ජනතා විරෝධයනට පාලකයා ඇහුම්කන් දිය යුතු ය. ඒවායෙහි කිසියම් අසාධාරණත්වයක් ඇත්නම් එම නීතිරීති සංශෝධනය හෝ අහෝසි හෝ කිරීම පාලකයකු කළ යුතු ය. බුදුරදුන් විසින් භික්ෂු සංවිධානය වෙනුවෙන් පනවන ලද ඇතැම් විනය නීති පවා වෙනස් කරනු ලැබුවේ ඒවායින් භික්ෂූන් වහන්සේලාට ඇතිවන පීඩා වළක්වා ගැනීමේ අරමුණිනි. රටක නායකයාට ද එසේ කිරීමේ හැකියාවක් තිබිය යුතු ය. එය මෘදු බවේ ලක්ෂණයකි. එය ප්‍රායෝගික යථාර්ථයක් බවට පත්වනුයේ පාලකයා හා පාලිතයන් අතර පිය පුතු සබඳතාවට සමාන බැඳීමක් පැවැතුණහොත් පමණි. අශෝක රජතුමා එසේ සලකා ක්‍රියා කළ පාලකයෙකි. ඔහුගේ සෙල්ලිපිවල සඳහන් ඇතැම් ප්‍රකාශවලින් ඒ බව පැහැදිලි වේ.

## 6. තපස

මෙහි මතුපිට අර්ථය වන්නේ පසිඳුරන් පිනවීමෙන් ඈත් ව භාවනානුයෝගී ව ක්‍රියා කිරීමයි. එහෙත් පාලනයට අදාළ සංකල්පයක් වශයෙන් ගත්විට එවැන්නක් අදහස් නොවේ. මෙහි දී අර්ථවත් කෙරෙනුයේ පාලකයා පසිඳුරන් පිනවීමට ගිජු නොවී ක්‍රියා කිරීමයි. සන්සුන් ඉඳුරන් ඇතිව කටයුතු කිරීමයි. සාමාන්‍ය ජනතාවට නැති බලයක් රාජ්‍ය උරුමයත් සමග පාලකයකුට හිමි වේ. පමණ ඉක්මවා රජ ඉසුරු විඳිමින් ඉඳුරන් පිනවීමට ම යොමු වුවහොත් ජනතා සේවයට කැපවීමට අවස්ථාවක් පාලකයන්ට නොලැබෙනු ඇත. ජනතාවගේ ප්‍රශ්නවලට විසඳුම් ලබාදීමට ඔවුන් අසමත් වනු ඇත. එවිට ජනතාවගේ අපේක්ෂා, බලාපොරොත්තු බිඳවැටේ. ප්‍රතිචාර දක්වීමට ජනතාව යොමුවනුයේ පාලකයාට එරෙහිව කැරලි ගැසීමෙනි. එය රටක අභ්‍යන්තර හා බාහිර වශයෙන් බොහෝ ගැටලු නිර්මාණය කරලීමට හේතු වන්නකි. එබඳු තත්ත්වයක් ඇති නොවීමට නම් පාලකයා

ඉන්ද්‍රිය දමනයෙන් යුතු ව පඤ්චකාම වස්තූන්ට ගිජුනොවී ක්‍රියා කළ යුතු ය. එය පාලකයාට අදාළ තපස වේ.

## 7. අක්‍රෝධය

ක්‍රෝධයෙන් තොරවීම අක්‍රෝධයයි. එනම් වෛරී චේතනාවෙන් තොර ව මෛත්‍රී සහගත ව කටයුතු කිරීමයි. කිසිදු පාලකයකුට රාජ්‍යයේ වෙසෙන සියලු දෙනාගේ ම සහාය තම පාලනය සඳහා යොදා ගැනීමට නොහැකි වනු ඇත. කොතරම් යහපත් පාලනයක් පැවැතිය ද එයට විරුද්ධ ව විවේචන එල්ල කරමින් විරෝධාකල්ප ඇති ව කටයුතු කරන පිරිස් ඕනෑ ම සමාජයක දැකිය හැකි ය. කායික ව හා මානසික ව පීඩන ඇති කරවනු ලබන එම බලවේගයන්ට පාලකයා මුහුණ දිය යුත්තේ ක්‍රෝධයෙන් තොර ව ය; මෛත්‍රී සහගත ව ය. කිසිවිටකත් ක්‍රෝධයෙන් ම ක්‍රෝධය ජයගත නොහැකි ය. එය ජයග්‍රහණය කළ හැකි වන්නේ මිත්‍ර ලීලාවෙන් කටයුතු කිරීමෙන් පමණි. බුදු වදනින් එය සනාථ කෙරේ. සිය එක ම පුතු රක්නා මවක මෙන් මෛත්‍රී සහගත ව ජනතාව ආරක්ෂා කිරීමට පාලකයා ක්‍රියා කළ යුතු ය. දරුවන් කුමන ආකාරයේ හිංසාවක් පීඩාවක් කළ ද ඔවුන් කෙරෙහි දෙමවුපියන් තුළ ක්‍රෝධයක් වෛරයක් ඇති නොවේ. ඔවුහු දිවා රාත්‍රී දෙකෙහි ම ඔවුනගේ සැපවත් බව ම ප්‍රාර්ථනා කරති. ඒ අයුරින් ම පාලකයින් ද ක්‍රියා කිරීමට යොමු වුවහොත් සමස්ත රාජ්‍යය ම සමෘද්ධිමත් වනු ඇත.

## 8. අවිහිංසාව

හිංසාකාරී ක්‍රියාකාරකම්වලින් තොර වීම අවිහිංසාවයි. හිංසාව දෙයාකාර ය. ඒ කායික හිංසනය හා මානසික හිංසනය වශයෙනි. නීතියට අනුකූල නොවී, අසාධාරණ ලෙස දඬු මුගුරු ආදියෙන් පහරදීම හා අත් පා සිඳීම ආදී වධ බන්ධනයන්ට පුද්ගලයා ලක්කිරීම කායික හිංසනයයි. ජනතාවගෙන් අසාධාරණ ලෙස බදු අය කිරීම, ජනතා විරෝධී අණපනත් ඉදිරිපත් කිරීම, සමානාත්මතාවෙන් තොර ව කටයුතු කිරීම, සාධාරණ පදනමක පිහිටා රැකියා ලබා නොදීම, ආක්‍රෝශ පරිභව කිරීම ආදිය තුළින් සිදුවනුයේ මානසික හිංසනයයි. දරදඬු හිතුවක්කාර පාලකයෝ මේ දෙඅංශයෙන් ම ජනතාව පීඩනයට ලක්කරති. මිනිසා ඇතුළු සෑම සත්ත්වයෙක් ම හිංසනයට අකැමැති ය. අවිහිංසාවට කැමැති ය. පෙර රජදරුවෝ මේ ආදර්ශයේ පිහිටා ක්‍රියා කළහ. අශෝක රජතුමා බෞද්ධයකු වීමෙන් අනතුරුව සත්ත්ව හිංසනයෙන් හා ඝාතනයෙන් වැළකී රාජ්‍ය පාලනය කළ බව සඳහන් ය. ලංකාවේ අමණ්ඩගාමිණී අභය වැනි පාලකයන් කිසිදු සත්ත්වයකු නොමැරිය යුතු බවට **මාඝාත ආඥාව** පනවන ලද්දේත් බුද්ධදාස වැනි පාලකයින් මිනිසුන්ට පමණක් නොව තිරිසන්ගත සත්ත්වයින්ට පවා ප්‍රතිකාර කිරීමට යොමු වූයේත් ඔවුන් තුළ පැවැති අවිහිංසාවාදී හැඟීම නිසා ය. විශේෂයෙන් ඒ සඳහා ඔවුනට මග පෙන්වීම ලැබුණේ බුදු දහමිනි.

## 9. ඉවසීම

ඉවසීම හෙවත් ක්ෂාන්තිය යන උතුම් ගුණය දස රාජධර්මවල මෙන් ම පාරමිතාවල ද දක්නට ලැබෙන්නකි. මෙය රාජ්‍ය පාලකයින් සඳහා විශේෂයෙන් නිර්දේශ වුව ද ලොකු කුඩා සැම අයකු විසින් ම ප්‍රගුණ කළ යුත්තකි. **ඉවසීමෙන් සැනසීම ලැබේ ය** යන ආප්තෝපදේශය යථාර්ථයක් බවට පත් කර ගත හැකි වන්නේ එවිට ය. පාලකයකුට මුහුණ දීමට සිදුවන ගැටලු අසීමිත ය; ඇසුරු කිරීමට ලැබෙන පිරිස විෂම ය. විරුද්ධ පාර්ශ්වයන්ගෙන් එල්ල වන අභියෝග අපමණ ය. මේ සියල්ල නිවැරැදි ව කළමනාකරණය කරගෙන විසඳුම් සෙවීමට නම් ඉවසීම නැමැති ගුණධර්මය අත්‍යවශ්‍ය වේ. ඉවසීම නැමැති කඩුව යමකු ගේ අතේ පවතීනම් දුර්ජනයන්ට කළ හැකි දෙයක් නොමැති බව සංස්කෘත පඬිවරුන්ගේ අදහසයි. "**ඉවසන දනා රුපු යුදයට ජය කොඩිය.**" යන උපදේශාත්මක ප්‍රකාශයෙන් ද ජනිත වනුයේ ඉවසීමේ ඇති වැදගත්කමයි .

ධනය, බලය, තරුණමදය, අත්තුක්කංසනය (තමා උසස් කොට සැලකීම) පරවම්භනය (අනුන් පහත් කොට සැලකීම) පුද්ගලයාගෙන් ඉවසීම පලවා හරින සාධකවලින් කිහිපයකි. මේවායින් එකක් හෝ කිහිපයක් හෝ හිතට ගත් පාලකයකුගෙන් ඉවසීම නැමැති ගුණ ධර්මය ක්‍රියාත්මක නොවේ. ඉවසීම නොමැති ව විවේක බුද්ධියෙන් තොර ව ගනු ලබන තීරණ රටකට බෙහෙවින් ම විපත්තිදායක ය. එය පුද්ගලයාගේ මෙන් ම සමාජයේත් රටේත් විනාශයට හේතු වේ. දීඝිති කෝසල ජාතකයේ දී දීඝායු කුමරුට **ළඟ නොබලන්න දුර බලන්න** යනුවෙන් පිය රජතුමා ලබාදුන් උපදේශයෙන් ද පැහැදිලි කරනුයේ ඉවසීමේ හා බුද්ධිමත් භාවයේ වැදගත්කමයි. වර්තමානයේ බොහෝ ගැටලු හා විනාශකාරී ක්‍රියාවලට ප්‍රමුඛතම හේතුවක් වී ඇත්තේ මිනිසුන් තුළ ඉවසීම නොමැතිකමයි. ඉවසීම නිවටකමක් ලෙස නොසිතා ලොකු කුඩා සැම දෙන ම ඉවසීමේ ගුණය ප්‍රගුණ කළහොත් ඉන් සමාජයේ පවතින බොහෝ ගැටලුවලට විසඳුම් ලැබෙනු ඇත.

## 10. අවිරෝධතාව

දසරාජ ධර්මවල දහවෙනි ගුණාංගයෙන් අදහස් කරනුයේ කිසිවකුටත් විරුද්ධ නොවීමයි. කිසිවකු සමග හෝ නොගැටීමයි. පාලකයකුට කටයුතු කිරීමට සිදුවනුයේ සැමවිට ම සමාන අදහස් දරන පිරිස් සමග පමණක් ම නොවේ. විරුද්ධ අදහස් දරන පිරිස් සමග ද කටයුතු කිරීමට සිදු වේ. විරුද්ධ අදහස් දරන එම පිරිසගේ අදහස් නොසලකා හැරීමටවත් ඔවුන් මර්දනය කිරීමටවත් පාලකයා යොමු නොවිය යුතු ය. ජනතා හිතවාදී පාලන ක්‍රමයක ද ප්‍රතිවිරුද්ධ බලවේග ක්‍රියාත්මක විය හැකි ය. ඇතැම් විට පාලනය නිවැරැදි දිසාවට යොමු කරවීමේ හැකියාව ඇත්තේ එවන් විරෝධයන්ටයි. ජනතා හිතවාදී නොවන අණපනත්, නීති හා රෙගුලාසි ඉදිරිපත් වන විට ඒවාට ජනතාව එකඟ නොවේ. එවන් අවස්ථාවල දී පාලක පිරිස මහජනයා මර්දනය කිරීමට කටයුතු කරන්නේ නම්

එය ශිෂ්ට සම්මත සමාජය විසින් කිසිසේත් අනුමත නොකරනු ඇත. එබැවින් පාලකයා විවේචන ඉවසමින් කටයුතු කිරීම අවිරෝධතාවයි. කුමන පාලන තන්ත්‍රයක වුව ද පැවැත්ම රඳා පවතිනුයේ මෙම ගුණයෙන් යුතුව කටයුතු කළහොත් පමණි. පන්ති කාමරයේ දී හෝ බාහිර සමාජයේ දී හෝ අපට ද විවිධ අදහස් උදහස් දරන පිරිස් මුණ ගැසෙනු ඇත. ඇතැම් විට අප විසින් ඉදිරිපත් කරනු ලබන සුබවාදී අදහස් ද ඔවුන් විසින් ප්‍රතික්ෂේප කරනු ඇත. එවන් අවස්ථාවන්හි දී සාධාරණ ව කරුණු ඉදිරිපත් කරමින් ඔවුන් නිවැරැදි මතයට ගැනීමට අප උත්සාහ ගත යුතු ය. එසේ නොමැති වුවහොත් බහුතරයේ මතයට ඉඩ දෙමින් ඔවුන් සමග අමනාපයකින් තොර ව කටයුතු කිරීම ද අවිරෝධතාවේ ලක්ෂණයක් වේ.

මේ ආකාරයට දසරාජ ධර්ම පිළිබඳ ව විමසා බැලීමෙන් පැහැදිලි වනුයේ ඒවා හුදෙක් පාලන මූලධර්ම පමණක් ම නොවන බවයි. ඕනෑ ම සමාජයක පැවැත්මට හේතුවන සදාචාර ධර්ම පද්ධතියක් ද වන බවයි.

## සාරාංශය

ජාතක පාලියේ සඳහන් දසරාජ ධර්ම බුදු දහම පිළිගන්නා පාලකයකුට පමණක් නිර්දේශ වී නැත. ඒවා ඕනෑ ම ආගමික විශ්වාසයක් දරන පාලකයකුට ගුරුකොට ගත හැකි ය. මේ දසරාජ ධර්මයට අනුගත ව කිසියම් පාලකයකු තම පාලන තන්ත්‍රය මෙහෙයවන්නේ නම් එම සෑම රාජ්‍යයක් ම සංවර්ධිත රාජ්‍යයක් වනු ඇත. සාමාන්‍ය ජනතාව ද මෙම ගුණ ධර්මයන්හි පිහිටා කටයුතු කිරීමට යොමු වුවහොත් පෞද්ගලික ව තමාගේ ආධ්‍යාත්මික සංවර්ධනයටත් පොදුවේ සමාජ සංවර්ධනයටත් මග පෑදේ.

## ක්‍රියාකාරකම


1. දසරාජ ධර්ම අතරින් ඔබ තුළ ඇතැයි උපකල්පනය කළ හැකි ගුණ ධර්ම නම් කරන්න.
2. අවිහිංසාවාදී ව ක්‍රියා කළ ලාංකීය පාලකයින් දෙදෙනකු නම් කරන්න.
3. "ඉවසීමෙන් සැනසීම ලැබේ" යන මාතෘකාව යටතේ ලියන රචනාවකට නිදසුන් ලෙස දැක්විය හැකි සිද්ධියක් කෙටියෙන් හඳුන්වා දක්වන්න.

## පැවරුම

- මහා හංස ජාතකය කියවා එහි තේමාව චිත්‍රයට නගන්න.

# 24 නිවන් මගෙහි බීජය ශ්‍රද්ධාවයි

අප බුදුරජාණන් වහන්සේ දිනක් මගධ ජනපදයෙහි ඒකනාලා නම් බ්‍රාහ්මණ ගමට වැඩි සේක. ඒ කුඹුරු සී සාන, වපුරන කාලයකි. එම ගමෙහි කසීභාරද්වාජ නම් ධනවත් බමුණෙක් සිය පිරිස ද සමගින් පන්සියයක් නගුල් යොදා ගනිමින් තම කුඹුරු යාය සී සාමින් සිටියේ ය. අප භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ මෙම ස්ථානයට පිඬු පිණිස වැඩම කළේ ඒ අතරතුරයි. එම දර්ශනයෙන් බොහෝ දෙනා ප්‍රසාදයට පත් වුව ද කසීභාරද්වාජ බමුණාට තරහ ගියේ ය. එහි දී ඇතිවූ සංවාදයේ කොටසක් මෙසේ ය.



බමුණා :- "ශ්‍රමණය, මම සී සාමි. වපුරමි. සී සා වපුරා අනුභව කරමි. ඔබ ද එසේ කරන්න. සී සාන්න, වපුරන්න, සී සා වපුරා අනුභව කරන්න."

බුදුරජාණන් වහන්සේ :- "බ්‍රාහ්මණය, මම ද සී සාමි. වපුරමි. සී සා වපුරා අනුභව කරමි"

බමුණා :- "ශ්‍රමණය මට ඔබගේ වියගහ හෝ නගුල් හෝ හීවැල හෝ කෙවිට හෝ ඔබගේ ගවයන් හෝ නොපෙනේ."

බුදුරජාණන් වහන්සේ :- "බ්‍රාහ්මණය, ශ්‍රද්ධාව මාගේ බීජයයි. තපස මගේ වැස්සයි. ප්‍රඥාව මගේ වියගස සහ නගුලයි. ලජ්ජාව මගේ නගුලිසයි. මනස යොතයි. සිහිය මාගේ සීවැල හා කෙවිටයි."

මේ ආකාරයට අප බුදුරජාණන් වහන්සේ බුදු දහම අනුව සී සෑම කුමක් දැයි කසීභාරද්වාජ බමුණාට පැහැදිලි කොට දුන්හ. "බමුණ, මාගේ මේ සීසෑම අමෘත ඵලය නම් වූ නිවන පිණිස වෙයි. මේ සී සෑම සිදු කිරීමෙන් සියලු දුකින් මිදිය හැකි ය." මෙම දේශනාව ශ්‍රවණය කිරීමෙන් අනතුරුව කසීභාරද්වාජ බමුණා බුදුරජාණන් වහන්සේ, ධර්ම රත්නය මෙන් ම සංඝ රත්නය කෙරෙහි ද ප්‍රසාදයට පත්ව තෙරුවන් සරණ ගියේ ය. උපාසකයකු බවට පත්වී ය. මෙම බුද්ධ දේශනාව අනුව, ඒ අමාඵල නෙළා ගැනීමට අප වගා කළයුතු බීජය නම් ශ්‍රද්ධාව ය. නිවන් මග ගමන් කිරීම ඇරඹෙනුයේ ශ්‍රද්ධා වෙති.

## ශ්‍රද්ධාව

බුදු දහමේ පරම නිෂ්ඨාව නිර්වාණයයි; ප්‍රඥා ප්‍රතිලාභයයි. එනම් ඇති තතු ඇති සැටියෙන් දැකීමයි. එහි ආරම්භය ශ්‍රද්ධාව ය. ප්‍රබුද්ධ ආගමික සංවේදී භාවයයි. ත්‍රිවිධ රත්නයෙහි ගුණ දැන උපදවාගත් ප්‍රසාදයයි. ත්‍රිවිධ රත්නය පිළිබඳ භක්තිය විශ්වාස මාත්‍රය හෝ ඇදහිලි නොවේ. එම නිසා බුදු දහමේ ශ්‍රද්ධාව පිළිබඳ සුවිශේෂී අවධානයක් යොමු කෙරේ. එය විවිධාකාරයෙන් විස්තර වෙයි.

### 1. බුදුගුණ දැක තේරුම් ගෙන ඇති වන පැහැදීම ශ්‍රද්ධාවයි

"සද්ධා සම්පදාව කවරේ ද, මෙලොවෙහි කුලපුත්‍රයෙක් සැදැහැවත් වූයේ තථාගතයන් වහන්සේගේ බුද්ධත්වය පිළිගනියි. ඒ භාග්‍යවතුන් වහන්සේ අරහත් වෙති. සම්මා සම්බුද්ධ වෙති. විජ්ජාචරණ සම්පන්න වෙති. සුගත වෙති. ලෝකවිදූ වෙති. අනුත්තර පුරිසදම්ම සාරථී වෙති. දෙව් මිනිසුනට ශාස්තෘ වෙති. බුද්ධත්වයට පත් වූවෝ වෙති. භාග්‍යවත් වෙතියි දනියි, දකියි. මෙය ශ්‍රද්ධා සම්පදා නම් වේ," යැයි බුදුරජාණන් වහන්සේගේ ගුණ දැන බුද්ධත්වය පිළිබඳව ඇති වන්නා වූ අවබෝධයෙන් යුත් පැහැදීම ශ්‍රද්ධාව නමින් හැඳින්වේ.

## 2. තෙරුවන් ගුණ, කර්මය සහ කර්ම පල පිළිබඳ ඇදහීම ශ්‍රද්ධාවයි

යම් සැදැහැවතකු තුළ බුදුරජාණන් වහන්සේ නව අරහාදී බුදු ගුණවලින් යුක්ත ය, උන් වහන්සේ විසින් දේශිත ශ්‍රී සද්ධර්මය ස්වක්ඛාතාදී සයවැදෑරුම් දහම් ගුණයන්ගෙන් යුක්ත ය, එමෙන් ම භික්ෂූන් වහන්සේලා සුපටිපන්න ආදි නව වැදෑරුම් සඟ ගුණයන්ගෙන් යුක්ත ය, යන පිළිගැනීමෙන් කර්මය සහ එහි පල විපාක පිළිගැනීමත් ශ්‍රද්ධා නම් වෙයි. (සද්ධෝ හෝති සද්දහති - රතනත්තයං කම්මඵලන්ති) මෙම නිර්වචනයට අනුව තෙරුවන් ගුණ දැන හැඳින ගැනීම හා කර්මය සහ කර්ම ඵලය දැන හැඳින පිළිගැනීම ශ්‍රද්ධාව නමින් හැඳින්වේ.

මේ පැහැදීම නැත්නම් කිසිවකු ශාස්තෘවරයා වෙත ඇදී එන්නේවත්, උන් වහන්සේගේ දහමට ඇහුම්කන් දෙන්නේවත් නැත. මෙය අදෘශ්‍යමාන බලවේගයකට හෝ ජීවමාන පුද්ගලයකුට හෝ වස්තුවකට හෝ බිය වීමෙන් සිදු වන්නක් නොවේ. "සද්ධා" නම්, අවබෝධය හේතු කොට ගෙන ඇති වන පැහැදීම ය. එය කුසල පක්ෂයෙහි උපදනා ශෝභන චෛතසිකයකි. ශ්‍රද්ධාව බුද්ධ දේශනාවන්හි විවිධාකාරයෙන් දක්වා තිබේ. එනම් ශ්‍රද්ධා ව බලයක්, ඉන්ද්‍රියක්, චරණ ධර්මයක්, සම්පදාවක්, ආර්ය ධනයක්, බෝධි පාක්ෂික ධර්මයක් යනාදි වශයෙනි.

බෞද්ධයකු විසින් බල පහක් වැඩිය යුතු යැයි දෙසූ බුදුරජාණන් වහන්සේ, ඒවා නම් සද්ධා බලය, විරිය බලය, සති බලය, සමාධි බලය හා පඤ්ඤා බලය යයි වදාළහ. ශ්‍රද්ධාව **ඉන්ද්‍රිය** ධර්මයක් ලෙස ද දක්වා ඇත. එයින් එහි වැදගත්කම පැහැදිලි වේ. 'ඉන්ද්‍ර' යනු 'නායක' 'ප්‍රධාන' යන අරුත් ඇති පදයකි. ශ්‍රද්ධාව කුසල ධර්ම විෂයයෙහි ප්‍රධානත්වයක් උසුලන හෙයින් ද, කුසල සිතිවිලිවලට පෙරටු වන හෙයින් ද එසේ ඉන්ද්‍රිය ධර්මයක් ලෙස දක්වා ඇත. නව අරහාදී බුදුගුණ අතර තෙවැන්න 'විජ්ජාචරණ සම්පන්න' යන්නයි. **චරණ** ධර්ම නම් වූ පිළිපැදිය යුතු කරුණු පහළොවක් එහි එයි. ශ්‍රද්ධාව ද එහි ඇතුළත් වේ. 'චරණ' යනු පාදයට නමකි. හැසිරීම සඳහා, ගමන් යාම සඳහා පාදය අවශ්‍ය වේ. නිර්වාණ නමැති නිෂ්ඨාව කරා යන ගමනට චරණ ධර්ම උපකාරී වෙයි. ශ්‍රද්ධා, ශීල, ශ්‍රැත, ත්‍යාග, ප්‍රඥා ආදී වැඩිය යුතු ගුණ ධර්ම පහක් ඇතැයි වදාළ තැන්හි ද මුලට දක්වා ඇත්තේ ශ්‍රද්ධාවයි. බුදුරජාණන් වහන්සේ දීඝජානුකෝලිය පුත්‍රයාට පරලොව දියුණුවට, මෙලොව දී වැඩිය යුතු සම්පදා හතරක් වදාළහ. සද්ධා **සම්පදා**, සීල සම්පදා, චාග සම්පදා, පඤ්ඤා සම්පදා යනුවෙනි. මෙය දියුණුව ඇති කරන ධනයකි. ගිහි දිවියක් ගත කරන පුද්ගලයා සැදැහැවත් විය යුතු ය. සද්ධාව **ධනයක්** වනුයේ එහි ඇති අගය නිසා ය. ධනයක්, වස්තුවක් ඇති තැනැත්තා දිළින්දෙක් නොවේ. එසේම සද්ධා ධනය නිසා කායික, මානසික වශයෙන් දුකක් ඇති නොවේ. සද්ධාව, ශීලය, හිරි, ඔත්තප්ප, සුත, චාග, ප්‍රඥා යන සප්තාර්ය ධනය යමකු තුළ ඇත්නම් ඔහු ආධ්‍යාත්මික වශයෙන් ධනවත් පුද්ගලයකු ලෙස බුදු දහමෙහි දක්වා තිබේ.

සත්ත්වයා සසරට බැඳ තබන කාම, භව, දිට්ඨි සහ අවිජ්ජා යන සැඬ පහරින් එතෙර වීමට ද ශ්‍රද්ධාව තිබිය යුතු ය. එය පුද්ගලයාට දෙලොව සලසන සිතුමිණකි.

## ශ්‍රද්ධාවේ මූලික ප්‍රභේද

සරණ යෑම යනු හුදෙක් ඇදහීමක්, විශ්වාසයක් හෝ නොවිමසා කරනු ලබන පිළිගැනීමක් නොවේ. එසේ ම එය නොපෙනෙන බලයක් කෙරෙහි භය නිසා ඇති වන භක්තියක් ද නොවේ. බෞද්ධයකු තෙරුවන් සරණ යා යුත්තේ ද සියලු බෞද්ධ පිළිවෙත් සම්පූර්ණ කළ යුත්තේ ද ශ්‍රද්ධාව පෙරදැරි කොට ගෙන ය. එහි මූලික ප්‍රභේද දෙකකි.

1. අමූලිකා ශ්‍රද්ධා
2. ආකාරවති ශ්‍රද්ධා

### 1. අමූලිකා සද්ධා

අමූලිකා සද්ධාව භක්තිය යන්නට සමීප ය. එය අවිචාරවත්, පදනමක් නැති ඇදහිල්ලකි. හුදු පිළිගැනීම් මාත්‍රයකි, නොවිමසා පිළිගැනීමකි. හේතු යුක්ති සහගත නොවන, අවිචාරශීලී, පදනම් විරහිත අප්‍රබුද්ධ ප්‍රසාදයකි. වරක් බමුණු පිරිසක් කැටිව බුදුරදුන් හා මන්ත්‍රණය කරනු පිණිස චංකී බ්‍රාහ්මණ තෙමේ පැමිණියේ ය. මෙහි දී බුදුරදුන් කෙරෙහි ප්‍රසාදයට පත්ව සිටි චංකී බමුණා අසල සිටි, වේදයෙහි හසළ කාපටික මානවකයා හා බුදුරදුන් අතර සංවාදයක් ඇති විය. මෙම සංවාදය අනුව තම ශාස්තෘවරයා කෙරෙහි මොවුන්ගේ පිළිගැනීම පදනමක් නැති පිළිගැනීමක් බව පැහැදිලි විය. එය බුදු සමයෙහි ප්‍රතික්ෂේප කරනු ලැබේ. **"යම් සේ එකිනෙකාට බැඳුණු අන්ධයින් වැලක් වේ ද? එහි පළමු අන්ධයා ද මග නොදකියි. මැද සිටින අන්ධයා ද නොදකියි. අග සිටින්නා ද නොදකියි."** ඊට සමාන වූ බමුණන්ගේ අන්ධානුකරණය, අනවබෝධය සහිත අවිචාරවත් පිළිගැනීම බුදුසමය ප්‍රතික්ෂේප කරයි.

### 2. ආකාරවති සද්ධාව

බුද්ධ ධම්ම සංඝ යන ත්‍රිවිධ රත්නය පිළිබඳ විචාරශීලී, පදනම් සහිත ප්‍රබුද්ධ ප්‍රසාදය ආකාරවති සද්ධාව ය. කරුණු දැන හේතු යුක්ති පදනම් සහිතව තෙරුවන් පිළිගැනීම ය. කරුණු දැන උපදවාගත් පැහැදීම (පසාද) නම් වේ. "අමූලිකා ශ්‍රද්ධාව" බැහැර කරන බුදු සමය අගය කරන්නේ ආකාරවතී ශ්‍රද්ධාවයි. "ආකාර" යනුවෙන් හේතු සහගත බව කියැවෙයි. යම් පුද්ගලයෙක් භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බුද්ධ යැයි ද ධර්මය මැනවින් ප්‍රකාශිත යැයි ද සංඝයා නිවැරදි මගට පිවිස ඇතැයි ද සකාරණව පහදී නම් ඒ ආකාරවතී ශ්‍රද්ධාව ය. මේ ශ්‍රද්ධා ප්‍රතිලාභයට පැමිණෙන්නේ සදහම් ඇසීමෙනි. ශාස්තෘන්

වහන්සේ මනා ලෙස, පැහැදිලිව, ප්‍රණීතව, පච්-පිං පහදමින් ධර්ම දේශනා කරන කල්හි ඒ ධර්මයෙහි පැහැදී, භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බුද්ධ බව, ධර්මය ස්වාක්ඛාත බව, සංඝයා සුප්‍රතිපන්න බව නිශ්චය කර ගනියි. ශාස්තෘ ප්‍රසාදයට පැමිණෙයි. මෙය ආකාරවතී ශ්‍රද්ධාව නම් වෙයි. ශ්‍රද්ධාව පිළිබඳ ප්‍රභේද සයක් පෙළ අටුවායෙන් දත හැකි ය.

1. සම්පසාදන ලක්ඛණ සද්ධා
2. සම්පක්කන්ධන ලක්ඛණ සද්ධා
3. සද්දහන සද්ධා
4. ඔක්කප්පන සද්ධා
5. ආගම සද්ධා
6. අධිගම සද්ධා යනුයි.

**සම්පසාදන ලක්ඛණ සද්ධා** යනු අපිරිසිදු ජලය පිරිසිදු කිරීමට හැකි මැණිකක් සේ සිත පිරිසිදු කෙරෙන ස්වභාවයයි. සක්විති රජකු සතු උදක ප්‍රසාද මාණික්‍යය, කැළඹී. අපිරිසිදු වූ ජලයකට දැමූ විට එම ජලය පිරිසිදු වේ. එසේ ම සිත පහදවන ස්වභාවය සම්පසාදන ලක්ඛණයයි. පැහැදුණු ජලය පිරී ඇති වැවක අවට ඇති ගස්වල ඡායාව ඒ ජලයෙහි පිරිසිදුව වැටෙන්නාක් මෙන් පහන් සිත්හි ද තෙරුවන් ගුණ මනාව පිහිටයි. **සම්පක්කන්ධන ලක්ඛණ සද්ධා** යනු පුද්ගලයකුට කුසල් සිදු කර ගැන්මට ද කළ කුසල් තවතවත් දියුණු කර ගැනීමට ද උපකාර වන ශ්‍රද්ධාවයි. යම්කිසි වැදගත් කාර්යයකට ඉදිරිපත් වීමට බියෙන් සිටින පිරිසක් මැදට පැමිණෙන වීර පුරුෂයෙක් එම පිරිස එම වැදගත් කාර්යයෙහි යොදවා සාර්ථක ප්‍රතිඵල පෙන්වා දෙන්නාක් මෙන් යම්කිසි ධර්මතාවක් යමකුට කුසල ධර්ම කිරීමටත් මනස තුළ සත් ගුණයන් වර්ධනය කර ගැනීමටත් පූර්වංගමව පවතී ද, එය සම්පක්කන්ධන ලක්ඛණ ශ්‍රද්ධාවයි. **සද්දහන සද්ධා** යනු කිසිදු සැකයක් නැතිව තෙරුවන් ගුණ පිළිගැනීම ලක්ෂණ කොට ඇති ශ්‍රද්ධාවයි. කර්ම ඵල, පටිච්ච සමුප්පාද ආදී ධර්ම කෙරෙහි සැකයකින් තොර පිළිගැනීම සද්දහන ලක්ෂණය වේ. බුද්ධාදී රත්නත්‍රය පිළිබඳව ඇති දිව්‍ය, බ්‍රහ්ම, මාර, මනුෂ්‍ය ආදි වූ කිසිවකුටත් නොසෙල්විය හැක්කේ **ඔක්කප්පන සද්ධාව ය.** යම් දෙයක් පිළිබඳව ඇති අවබෝධය හේතු කොටගෙන සකාරණව සිතා අනුභූතියෙන් ඇතිකර ගන්නා නිසැක බව කිසිවකුටත් බිඳිය නොහැකි ය. කවර හෝ හේතුවක් නිසාවත් යමකු තෙරුවන් කෙරෙහි ඇති කරගත් ශ්‍රද්ධාව නොබිඳේ නම් එබඳු වූ ශ්‍රද්ධාව 'ඔකප්පන ශ්‍රද්ධාව' නමින් හැඳින්වේ. බුද්ධත්වය, පසේ බුද්ධත්වය හෝ මහරහත් බව යන තුන්තරා බෝධියෙන් එකක් අධිගම කොට ගෙන ම සසර දුක් නසමි'යි යන අදහස ඇතිව කුසල් දහම් පිරීම් වශයෙන් පවත්නා ශ්‍රද්ධාව **ආගම ශ්‍රද්ධාව** ය. **අධිගම ශ්‍රද්ධා** යනු මාර්ග ඵලාදිය ලබාගත් මහෝත්තමයන් වහන්සේලා තුළ උපදින ශ්‍රද්ධාවයි. විශේෂයෙන් සිව් මඟින් කළ යුතු කාර්යය නිමකළ සෝවන් ආදි මඟ ඵල ලැබූ ආර්ය උතුමන්ගේ ශ්‍රද්ධාව මෙනමින් හැඳින්වේ. බෞද්ධ දරුවන් වශයෙන් අප ද සැදැහැවත් විය යුතු ය. එය බෞද්ධ ජීවිතයක මූලික ලක්ෂණය වේ. අනාගත අභිවෘද්ධියට අවශ්‍ය ආශීර්වාදය ලැබෙන්නේ ද බාධක ජය ගෙන ඉදිරියට යාමට හැකි වන්නේ ද අප සැදැහැවත් වූ විටයි. කෛරාටික, රළු, නපුරු ගති පැවතුම් හැර දමා සිනිඳු සිත් ඇති සංවේදී ප්‍රියශීලී දරුවන් වීමට ද සැදැහැවත්කම අපට උපකාරී වෙයි.

## සාරාංශය

පැහැදීම, ප්‍රසාදය යන වදන්වල කියැවෙන ශ්‍රද්ධාව බෞද්ධ ප්‍රතිපදාවේ මූල බීජයයි. තුණුරුවන්හි ගුණ දැනගෙන අවබෝධයෙන් ක්‍රියා කිරීම ශ්‍රද්ධාවෙහි ලක්ෂණයයි. අන්ධ විශ්වාසයෙන්, අනවබෝධයෙන් ක්‍රියා කිරීම බුදු දහම අගය නොකරයි. කරුණු දැනගෙන අවබෝධයෙන් විචාරශීලීව ක්‍රියා කිරීම අගයයි. ඒ තුළින් අපට බුද්ධ රත්නය, ධර්ම රත්නය, සංඝ රත්නය කෙරෙහි මෙන් ම කර්මය, කර්ම ඵලය කෙරෙහි අවබෝධයක්, විශ්වාසයක් ගොඩ නැගෙයි. එය අපගේ ලෞකික මෙන් ම ලෝකෝත්තර ජීවිතයේ සුවපත් භාවය සඳහා පදනම නිර්මාණය කරයි.

## ක්‍රියාකාරකම

01. ශ්‍රද්ධාව යනු කුමක් දැයි සරලව පැහැදිලි කරන්න.

02. අමූලිකා ශ්‍රද්ධාවට වඩා ආකාරවතී ශ්‍රද්ධාවෙහි දැකගත හැකි වෙනස ගෙනහැර දක්වන්න.

03. ශ්‍රද්ධාවෙහි ප්‍රභේද අතරින් දෙකක් විස්තර කරන්න.

## පැවරුම

- බුදුරදුන් පිළිබඳව ඔබ තුළ ඇති වූ සැදැහැති සිතිවිල්ලක් කවියට නගන්න.

## පුහුණුවට

"කතමාච ගහපති සද්ධා සම්පදා ඉධ ගහපති අරිය සාවකෝ සද්ධෝ හෝති සද්දහති තථාගතස්ස බෝධිං ඉතිපි සෝ භගවා අරහං සම්මා සම්බුද්ධෝ විජ්ජාචරණ සම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිසදම්ම සාරථී සත්ථා දේවමනුස්සානං බුද්ධෝ භගවා'ති. අයං වුච්චති ගහපති සද්ධා සම්පදා"

(අංගුත්තර නිකාය, ව්‍යග්ඝපජ්ජ සූත්‍රය)